329 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 329 - இல. 10
Volume 329 - No. 10

2026 සැප්තැම්බර් 23වන බදාදා
2026 செப்ரெம்பர் 23, புதன்கிழமை
Wednesday, 23rd September, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 1815]

වරප්‍රසාද: 2026.09.06 දින "දිනමිණ" ෆේස්බුක් පිටුවේ පළ කරන ලද වීඩියෝව [තීරුව 1815]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1817]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1818]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1819-1855]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

"දිට්වා" සුළි කුණාටුවෙන් පසු රට යළි ගොඩනැඟීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය [තීරුව 1856]

මඩකලපුව දිස්ත්‍රික්කයේ තණබිම්වල බලහත්කාරයෙන් පදිංචි වීම සහ වගා කිරීම [තීරුව 1859]

**නැඟෙනහිර පළාතේ ධීවරයින් මුහුණ දෙන ගැටලු:**

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1864]

**අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 1871-1983]

**පරිපූරක මුදල:**

විදුලිබල කර්මාන්තය සඳහා සහනාධාරයක් ලබා දීම [තීරුව 1983]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 1984-1993]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1994-2008]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 1815]

சிறப்புரிமை: 06.09.2026 அன்று 'தினமின' முகநூல் பக்கத்தில் வெளியிடப்பட்ட காணொளி [ப: 1815]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1817]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1818]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1819-1855]

**தனி அறிவித்தல் மூல வினா:**

தித்வா சூறாவளியின் பிறகு நாட்டை மீட்டெடுப்பதற்கான நிதி மற்றும் பௌதிக முன்னேற்றம் [ப: 1856]

மட்டக்களப்பு மாவட்டத்தில் மேய்ச்சல் நிலங்களில் அத்துமீறி குடியேறுதல் மற்றும் பயிரிடல் [ப: 1859]

**கிழக்கு மாகாண மீனவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள்:**

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று [ப: 1864]

**ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1871- 1983]

**குறைநிரப்புத் தொகை:**

மின்சாரத் துறைக்கு மானியம் வழங்குதல் [ப: 1983]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1984-1993]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1994-2008]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 1815]

Privilege: Video Posted on "Dinamina" Facebook Page on 06.09.2026 [Col. 1815]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1817]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1818]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1819-1855]

QUESTION BY PRIVATE NOTICE:

Financial and Physical Progress of Restoring the Country after Cyclone "Ditwah" [Col. 1856]

Encroachment and Cultivation of Pasturelands in Batticaloa District [Col. 1859]

ISSUES FACED BY FISHERMEN IN EASTERN PROVINCE:

Statement by Minister of Fisheries, Aquatic and Ocean Resources [Col. 1864]

PROMOTION OF EXPORT AGRICULTURE (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed [Cols.1871-1983]

SUPPLEMENTARY SUM:

Provision of Subsidy to Electricity Industry [Col. 1983]

ADJOURNMENT QUESTIONS [Cols. 1984-1993]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols.1994-2008]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 සැප්තැම්බර් 23වන බදාදා***
*2026 செப்ரெம்பர் 23, புதன்கிழமை*
*Wednesday, 23rd September, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 සැප්තැම්බර් 22 දින "ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### වරප්‍රසාද: 2026.09.06 දින "දිනමිණ" ෆේස්බුක් පිටුවේ පළ කරන ලද වීඩියෝව
### சிறப்புரிமை: 06.09.2026 அன்று 'தினமின' முகநூல் பக்கத்தில் வெளியிடப்பட்ட காணொளி
### PRIVILEGE: VIDEO POSTED ON "DINAMINA" FACEBOOK PAGE ON 06.09.2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී.වී. චානක මහතා විසින් 2026 සැප්තැම්බර් 09 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සබරගමුව පළාත් සභාව යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 489) සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492) සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the Supplementary Sum under Head 119 of Programme 01 of the Appropriation Act, No. 23 of 2025 for the services of the financial year commencing on 01$^{st}$ January, 2026 and ending on 31$^{st}$ December, 2026, which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත; සහ

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, වත්තේගම, මීගම්මන උතුර, අංක 33 යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මණ්ඩාවල, පැල්පිට, අංක 136/ඒ යන ලිපිනයෙහි පදිංචි ඒ.පී.අයි. අත්තනායක මහත්මිය සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කිරිදිවැල, මයිලවලාන, අංක 105/බී යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පොල් වගාවට බලපාන සුදු මැස්සන්: ව්‍යාප්තිය පාලනය කිරීම
### தெங்குப் பயிர்ச்செய்கையைத் தாக்கும் வெள்ளை ஈக்கள்: பரவலைக் கட்டுப்படுத்தல்
### WHITEFLIES AFFECTING COCONUT CULTIVATION: CONTROL OF SPREAD

1066/2025

**1. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) උතුරු පළාතේ පොල් වගාවට බලපාන සුදු මැස්සන් පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) බලපෑමට ලක්වූ පොල් වගාකරුවන් සඳහා වන්දි/ මූල්‍ය ආධාර ලබා දීමට සැලසුම් කර තිබේද;

(iii) සුදු මැස්සාගේ පැතිරීමට හේතු වන දේශගුණික තත්ත්වයන් සම්බන්ධයෙන් පාරිසරික ඇගැයීම් සිදු කර තිබේද;

(iv) ජෛව පාලකයක් ලෙස එන්කාර්සියා ග්වාඩලූප් (*Encarsia guadeloupe)* නැමති කෘමියා ලැබී ඇති කලාප සංඛ්‍යාව කොපමණද;

(v) එම මැදිහත්වීමෙහි ඵලදායීතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සුදු මැස්සා අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තිබේද;

(ii) ජීව විද්‍යාත්මක පාලන ක්‍රම සහ විකල්ප පිළියම් පිළිබඳ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(iii) පොල් වගාවේ පළිබෝධ පාලනය සඳහා අවශ්‍ය කරන හදිසි අරමුදල් මීළඟ අය වැයෙන් වෙන් කරන්නේද;

(iv) නව පළිබෝධ පාලන ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(v) කෘෂි කාර්මික ව්‍යසනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ එයට විසඳුම් සෙවීම සඳහා අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණයක් ඇති කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மாகாணத்தில் தெங்குப் பயிர்ச்செய்கையைத் தாக்கும் வெள்ளை ஈக்களைக் கட்டுப்படுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(ii) பாதிக்கப்பட்ட தெங்குப் பயிர்ச்செய்கையாளர்களுக்கு இழப்பீடு/ நிதி உதவி வழங்கத் திட்டமிடப்பட்டுள்ளதா;

(iii) அதன் பரவலுக்கான காலநிலைக் காரணங்கள் குறித்து சுற்றுச்சூழல் மதிப்பீடுகள் நடத்தப் பட்டனவா;

(iv) உயிரியல் கட்டுப்பாட்டு முறையாகிய ஒட்டுண்ணிக் குளவியைப் *(Encarsia guadeloupe)* பெற்றுக்கொண்ட பிராந்தியங்களின் எண்ணிக்கை யாவை;

(v) அத்தகைய தலையீட்டின் செயல்திறன் குறித்து;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அது ஏனைய மாவட்டங்களுக்குப் பரவுவதைத் தடுப்பதற்கு ஒரு தேசிய செயற்றிட்டம் உள்ளதா;

(ii) உயிரியல் கட்டுப்பாட்டு முறைகள் மற்றும் மாற்று சிகிச்சைகள் தொடர்பான விரிவாக்க நிகழ்ச்சித்திட்டங்கள் செயற்படுத்தப்பட்டு வருகின்றனவா;

(iii) தெங்குப் பயிர்ச்செய்கைக்குத் தேவையான பூச்சிக் கட்டுப்பாட்டுக்காக, அடுத்த வரவு செலவுத்திட்டத்தில் அவசரகால நிதி ஒதுக்கீடு செய்யப்படுமா;

(iv) புதிய கட்டுப்பாட்டு முறைகளை உருவாக்கு வதற்கான ஆராய்ச்சித் திட்டங்கள் நடைபெற்று வருகின்றனவா;

(v) இதை ஒரு விவசாய இடராக அறிவித்து, அதனைத் தீர்ப்பதற்கு அமைச்சுகளுக்கு இடையேயான ஒருங்கிணைப்பை ஏற்படுத்து வதற்கு அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the measures taken to control the whitefly affecting coconut cultivations in the Northern Province;

(ii) whether compensation/financial assistance has been planned for affected coconut cultivators;

(iii) whether environmental assessments were conducted on climatic causes of its spread;

(iv) the number of regions which received the biological control agent *Encarsia guadeloupae*; and

(v) the effectiveness of such intervention?

(b) Will he also inform this House -

(i) whether a national action plan exists to prevent its spread to other districts;

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

(ii) whether extension programmes on biological control methods and alternative treatments are being implemented;

(iii) whether emergency funding will be allocated in the next Budget for pest control necessary for coconut cultivation;

(iv) whether research programmes are underway to develop new control methods; and

(v) the Government initiatives to declare this an agricultural disaster and establish inter-ministerial coordination to address it?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

- පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව කොහොඹ තෙල් මිලි ලීටර 10ක් සහ සබන් කුඩු ග්‍රෑම් 5ක් ජලය ලීටරයකට මිශ්‍ර කර පොල් කොළවලට ඉසීම ඇතුළු භෞතික ක්‍රම, ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම සහ අවශ්‍ය අවස්ථාවල අවම වශයෙන් රසායනික මර්දන ක්‍රම භාවිත කිරීම පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

- ඊට අමතරව 2025 වර්ෂයේදී, උතුරු පළාතේ සුදු මැස්සා ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ "පොල් දෙසතිය" වැඩසටහනට සමගාමීව, යාපනය දිස්ත්‍රික්කයේ අක්කර 1,410ක් ආවරණය කරමින්, අධිබලැති දියර ඉසින යන්ත්‍ර 100ක් භාවිත කර පොල් ගස් 44,283කට කොහොඹ තෙල් ඉසීම සිදුකර ඇත.

- එමෙන්ම 2025 වර්ෂය තුළ දීප ව්‍යාප්තව "පොල් දෙසතිය" වැඩසටහන් 228ක් පවත්වා, පොල් ගස් 100,182කට කොහොඹ ප්‍රතිකාර සිදුකර ඇත.

- 2026 වර්ෂයේ අගෝස්තු මස දක්වා, දීප ව්‍යාප්තව "පොල් දෙසතිය" වැඩසටහන් මේ වනකොට 72ක් පවත්වා තිබේ.

(ii) සුදු මැස්සාගේ හානිය නිසා බලපෑමට ලක් වූ පොල් වගාකරුවන් සඳහා වන්දි හෝ මූල්‍යාධාර ලබා දීමේ ක්‍රමයක් මේ වනකොට අනුගමනය නොකරයි. නමුත් එම හානිය මර්දනය කර නැවත පොල් වගාව යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවශ්‍ය සහයෝගය පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ලබා දෙනු ලබනවා.

ඒ වාගේම මේ වනකොට අධිබලැති දියර ඉසින යන්ත්‍ර 700ක් දිවයින පුරා පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට ලබා දීලා තිබෙනවා. ඔවුන් එමඟින් මෙම රෝගය මර්දනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.

(iii) පහතරට අතරමැදි කලාපය තුළ මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් පොල් පර්යේෂණ ආයතනය විසින් සිදු කර තිබෙනවා.

මෙහිදී වසර දෙකක කාලයක් තුළ වර්ෂාපතනය සහ පරිසර උෂ්ණත්වය වෙනස්වීම මත සුදු මැස්සන්ගේ ගහනය ක්ෂේත්‍රයේදී වෙනස් වන ආකාරය අධ්‍යයනය කර ඇත. එම පර්යේෂණයේ දැනට විශ්ලේෂණය කරන ලද දත්ත අනුව පැහැදිලි වන්නේ වියළි කාලය තුළදී පරිසරයේ සුදු මැස්සන්ගේ ගහනය වැඩිවන බවත්, වර්ෂා කාලයේදී අඩුවන බවත්ය. පර්යේෂණයේ වැඩිදුර දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

(iv) දැනට සුදු මැස්සා ජීව විද්‍යාත්මකව පාලනය සඳහා ජෛව පාලකයක් ලෙස එන්කාර්සියා ග්වාඩලූප් - *Encarsia guadeloupae* - නමැති කෘමියා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ගුණනය කර පොල් වගා ක්ෂේත්‍රය වෙත ලබා දෙනු ලැබේ. මේ සඳහා භාවිත කරන ක්‍රමවේදයම පොල් පර්යේෂණ ආයතනය මඟින් භාවිත කර මෙම ජෛව පාලකය නිෂ්පාදනය කිරීමට උත්සාහ දැරුවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව භාවිත කරන ක්‍රමය අනුව සුදු මැස්සන් හා ජෛව පාලකයා බෝ කිරීම සිදු කළ නොහැකි බැවින් පොල් පර්යේෂණ ආයතනය විසින් මේ සඳහා පර්යේෂණ සිදු කර නොමැත. එබැවින් ඒ සඳහා නිර්දේශයක් නිකුත් කර නොමැති නමුත්, මෙම ජෛව පාලකයා පරිසරයට මුදා හැරීමෙන් හානියක් නොවන බව පොල් පර්යේෂණ ආයතනය පවසයි.

(v) සුදු මැස්සා ජීව විද්‍යාත්මකව පාලනය සඳහා එන්කාර්සියා ග්වාඩලූප් - *Encarsia guadeloupae* - ජෛව පාලකයක් ලෙස භාවිත කරන බැවින් මෙහි ඵලදායිතාව මැනීම සඳහා සැලකිය යුතු කාල සීමාවක් ගතවන අතර, එම මැදිහත්වීමේ ඵලදායිතාව ඇගැයීම් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් කටයුතු සිදු කරමින් පවතිනවා.

(ආ) (i) පොල් වගාකිරීමේ මණ්ඩලය හරහා 2025 වර්ෂයේදී අමාත්‍යාංශයීය ප්‍රතිපාදන යටතේ වෙන්වූ රුපියල් මිලියන 40.5ක මුදලට අදාළ වන අනුමත ක්‍රියාකාරී සැලැස්ම යටතේ රෝගී ගස් හඳුනා ගැනීම, ප්‍රතිකාර කිරීම හා හදිසි තත්ත්වය යටතේ රෝග පාලනය සඳහා කටයුතු සිදු කරන ලදී.

තවද, 2026 වර්ෂයේ අමාත්‍යාංශයීය ප්‍රතිපාදන යටතේ වෙන් වූ රුපියල් මිලියන 40ක මුදලට අදාළ වන අනුමත ක්‍රියාකාරී සැලැස්මට අදාළ කටයුතුද පොල් වගා කිරීමේ මණ්ඩලය හරහා ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

(ii)

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිෂ්පාදනය කරන එන්කාර්සියා ග්වාඩලූප් - *Encarsia Guadeloupae* - ජෛව පාලකය පොල් වගා ක්ෂේත්‍රයට ලබා දෙන අතර, පොල් වගාකිරීමේ මණ්ඩලය එය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ සිදුකරනු ලබනවා.

- "පොල් දෙසතිය" වැඩසටහන උතුරු පළාත ඇතුළු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලද ක්‍රියාත්මක කරමින්, සුදු මැස්සා පාලනය සඳහා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරනවා.
- ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත් පත්, අත්පත්‍රිකා සහ අනෙකුත් මාධ්‍ය ඔස්සේ සුදු මැස්සා හානිය සහ පාලන ක්‍රම පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම සිදුකරනු ලබනවා.
- 1916, 1920, 1928, 032-3135255 ඇතුළු දුරකථන සේවා, 070-4001928 වට්ස්ඇප් අංකය සහ තොරතුරු මධ්‍යස්ථාන හරහා වගාකරුවන්ට උපදේශන හා තොරතුරු සේවා ලබා දෙනවා. ඒ අංක, පෙර කී මාධ්‍ය හරහා අදාළ වගාකරුවන්ට ප්‍රචාරය කර තිබෙනවා.
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 20ක් හරහා ප්‍රාදේශීය කළමනාකරුවන්, පොල් සංවර්ධන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් දිවයින පුරා දැනුවත් කිරීම සිදු කරනවා.
- පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශවලට අනුව කොහොඹ තෙල්, සබන් කුඩු සහ ජලය මිශ්‍රකර, පොල් කොළවලට ඉසීමට අමාත්‍යාංශය හැටියට, පොල් වගාකිරීමේ මණ්ඩලය හැටියට වගාකරුවන් දිරිමත් කරනවා.
- විකල්ප පාලන ක්‍රම ලෙස ග්‍රීස් ආලේප කළ කහ පැහැති ඉටිකොළ භාවිතය සහ සවස් කාලයේදී දුම් ගැසීම වැනි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමද භාවිත කරනවා.
- පොල් පර්යේෂණ ආයතනය මඟින් සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා අවශ්‍ය දැනුවත් කිරීම් වේගවත්ව අපි සිදු කරනවා.

(iii) ඔව්.

2026 වර්ෂයේ පොල් වගා කිරීමේ මණ්ඩලය හරහා විශේෂ ව්‍යාපෘති යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 40ක් ලබා දී තිබෙනවා.

(iv) පොල් වගාවේ දිලීර රෝග කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නව ක්‍රම අධ්‍යයනය කර තිබෙනවා. රතු කුරුම්ණියා - RPW - පාලනය කිරීම සඳහා වාණිජමය වශයෙන් ලබා ගත හැකි කෘමිනාශක පිළිබඳ අධ්‍යයනය කර තිබෙනවා.

(v) පොල් වගාවේ රෝග හා කෘමි උවදුරු මඟින් සිදු වන ආපදා අවම කිරීම සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමට පිහිටුවනු ලබන පොල් වගා ජාතික ආපදා කළමනාකරණ මෙහෙයුම් ඒකකයක් පිහිටුවීම පිළිබඳව සලකා බලා තිබෙනවා.

(ඈ) අදාළ නොවේ.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

வடக்கு மாகாணத்தில் வெள்ளை ஈக்களின் தாக்கம் பாரியளவில் இருப்பதன் காரணமாகவே இந்தக் கேள்வி கேட்கப்பட்டது. இந்த வெள்ளை ஈக்களின் தாக்கத்தைக் கட்டுப்படுத்துவதற்கு, Indian Council of Agricultural Research, National Bureau of Agricultural Insect Resources ஆகிய நிறுவனங்களால் உருவாக்கப்பட்டுள்ள கட்டுப்பாட்டு முறைகள் மிகச் சிறந்தவையாகக் காணப்படுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிட்டதுபோல, இந்த விடயத்தில் *Encarsia guadeloupae* போன்ற இயற்கை எதிரிகள் மிகச் சிறப்பாகச் செயற்படுகின்றன. இதனை வேகமாகவும் வினைத்திறனாகவும் செயற்படுத்துவதற்கு மேற்குறித்த நிறுவனங்களோடு இணைந்து நீங்கள் செயலாற்றுவீர்களா என்பதை இந்தச் சபைக்கு அறிவிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරන්නේ ඉන්දියාවේ රාජ්‍ය ආයතන ගණනාවක් සුදු මැස්සන් පාලනය කරන්න යම් ප්‍රතිකාර කරනවාය කියන එකයි. නමුත්, අපේ රටේ පවතින නීතිරීති අනුව අපි මොනවා හෝ පළිබෝධ නාශක පාවිච්චි කරන්නේ විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අනුමත නිර්දේශවලට යටත්ව පමණයි. ඒ නිසා අපේ පවතින නීතිවලට අනුව ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව ආයතනයත් නිර්දේශ කළ පළිබෝධනාශකය අපේ රටේ නිර්දේශ කර තිබෙනවා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ அமைச்சர் அவர்களே, பதில் அளித்தமைக்கு நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1193/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ඉරක්කාමම් ප්‍රා.ලේ. කොට්ඨාසයේ ගැටලු පැවති කෘෂිකාර්මික ඉඩම්: ගොවීන් වෙත නැවත ලබා දීම
இறக்காமம் பிரதேச செயலாளர் பிரிவில் பிணக்குகள் உள்ள விவசாயக் காணிகள்: விவசாயிகளிடம் ஒப்படைத்தல்
AGRICULTURAL LANDS WITH DISPUTES IN IRAKKAMAM DS DIVISION: RETURN TO FARMERS

1268/2025

3. **ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාවලඩිවට්ටෛ ප්‍රදේශයේ 1986, 1989, 1991 සහ 1997 වර්ෂවල එම දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ඉඩම් කච්චේරියක් පවත්වා, ඉඩම් කොමසාරිස්

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

ජනරාල්වරයාගේ අනුමැතිය මත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගොවීන් 21කට බලපත්‍ර ලබා දී ඇති බව දන්නේද;

(ii) පසුගිය වර්ෂ 30 මුළුල්ලේ කෘෂි කාර්මික හා ගොඩ ඉඩම් වගා කටයුතුවල නිරත වූ ගොවීන් 21දෙනෙකුට, අම්පාර දිසාපතිවරයාගේ නියෝග අනුව ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එම ඉඩම්වල කෘෂි කාර්මික කටයුතු නොකරන ලෙස දන්වා වරින් වර බාධා කර ඇති බව දන්නේද;

(iii) එම ගොවීන්ට අයත් ඉඩම් හඳුනාගෙන නැවත භාර දීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සහ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කණ්ඩායමක් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් පත්කර එම ප්‍රදේශයට යවා ඇති අතර, එම ඉඩම් භාර දීම වැළැක්වීම සඳහා පිරිසක් බාධා කර ඇති බව දන්නේද;

(iv) එම ඉඩම් අදාළ ගොවීන්ට නැවත ලබා දීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப் பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின், இறக்காமம் பிரதேச செயலாளர் பிரிவின், நாவலடிவட்டை பிரதேசத்தில் 1986, 1989, 1991 மற்றும் 1997ஆம் ஆண்டுகளில், அம்மாவட்டத்தின் மாவட்டச் செயலாளரால் காணிக் கச்சேரி நடத்தப்பட்டு, காணி ஆணையாளர் நாயகத்தின் அங்கீகாரத் தின் பிரகாரம், அம்பாறை மாவட்டச் செயல கத்தின் ஊடாக 21 விவசாயிகளுக்கு அனுமதிப் பத்திரங்கள் வழங்கப்பட்டமையை அவர் அறிவாரா என்பதையும்;

(ii) அம்பாறை மாவட்டச் செயலாளரின் பணிப் புரைக்கமைவாக, இறக்காமம் பிரதேச செயலா ளரால், மேற்படி காணிகளில் கமத்தொழில் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டாமென கடந்த 30 வருடங்களாக கமத்தொழில் சார்ந்த மற்றும் மேட்டுநிலச் செய்கை நடவடிக்கைகளில் ஈடுபட்ட 21 விவசாயிகளுக்கு அவ்வப்போது இடையூறுகள் விளைவிக்கப்பட்டமையை அவர் அறிவாரா என்பதையும்;

(iii) மேற்படி விவசாயிகளுக்குச் சொந்தமான காணிகளை இனங்கண்டு, அவற்றை மீண்டும் கையளிப்பதற்காக, அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுவால் பிரதேச செயலாளர் மற்றும் இலங்கை நில அளவையாளர் திணைக் களத்தின் உத்தியோகத்தர்களைக் கொண்ட குழுவொன்று நியமிக்கப்பட்டு, அப்பிரதேசத் துக்கு அனுப்பப்பட்டுள்ளதுடன், மேற்படிக் காணிகள் கையளிக்கப்படுவதை தடுக்கும் விதமாக ஆட்கள் சிலர் இடையூறு விளைவித் துள்ளமையை அவர் அறிவாரா என்பதையும்;

(iv) மேற்படிக் காணிகளை உரிய விவசாயி களுக்கு மீண்டும் கையளிப்பதற்கு நடவடிக்கை மேற் கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House whether -

(i) he is aware that the District Secretary of the Ampara District has held a land kachcheri in the Navaladiwattai area of the Irakkamam Divisional Secretary's Division in the years 1986, 1989, 1991 and 1997 and that permits had been issued to 21 farmers by the Ampara District Secretariat with the approval of the Commissioner General of Lands;

(ii) he is aware that 21 farmers who have been engaged in agricultural and highland cultivation activities for the past 30 years have been repeatedly obstructed from time to time by the Divisional Secretary of Irakkamam, acting on the orders of the District Secretary, Ampara by instructing them not to engage in agricultural activities on those lands;

(iii) he is aware that a team including the Divisional Secretary and officers of the Survey Department of Sri Lanka had been appointed by the District Coordinating Committee, Ampara and sent to that area to identify and return the lands belonging to those farmers, and that a group of people have obstructed the handover of those lands to the farmers concerned; and

(iv) whether steps will be taken to return those lands to the said farmers?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)

(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ලබා දී ඇති බලපත්‍ර 21ම නීත්‍යානුකූල බලපත්‍ර බව අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංක අම්/දි.ලේ./පොදු හා 2014.11.03 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. එම ලිපිය ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(ii) අදාළ ඉඩම් කොටස ඉරක්කාමම් සහ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක අතර මායිමට ආසන්නව පවතින බැවින් හා අදාළ ඉඩම් කොටස්වල පිහිටීම ආසන්නයෙන් සමෝච්ච

රේඛා පරිද්දෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක අතර මායිම් සලකුණු කිරීම හේතුවෙන් භෞතිකව එම මායිම් හඳුනා ගැනීමේදී ගැටලු පැන නැඟී තිබුණි. එම නිසා මෙම ඉඩම් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වී වගා කටයුතු නැවතී තිබුණි.

(iii) ඉරක්කාමම් 02 ග්‍රාම නිලධාරි වසමේ නාවල්අඩි කුඹුරු යායේ පිහිටා ඇති අදාළ ඉඩම් සම්බන්ධව 2025.10.28වන දින ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් පත් කළ අනුකමිටුව ගත් තීරණයකට අනුව ඉඩම් බෙදා දීමට අදාළව කට්ටි කැඩීමේ සැලැස්ම සඳහා මැනුම් ඉල්ලීම් ඉරක්කාමම් හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක මඟින් මිනින්දෝරු අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. එහි සැලැස්ම මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක වෙත ලැබී ඇත. ඉරක්කාමම් හා දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහි මායිම් පිළිබඳව ගැටලු පවතින බැවින් සර්වේයර් ජනරාල් විසින් දළ අනුරේඛනයක් හා වාර්තාවක් සකස් කර ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනාට පිටපත් යොමු කර ඇත.

(iv) කමිටුවේදී ගත් තීරණයට අනුව කට්ටි කැඩීමේ සැලැස්ම පරිදි වගා කටයුතුවල නිරත වූ ගොවීන් 21දෙනෙකු සඳහා අක්කර දෙකක ඉඩම් ප්‍රමාණයක් ලබා දීමට ඉදිරියේදී කටයුතු සිදු කරන බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා ඇත. එය ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, அம்பாறை மாவட்டத்தின் இறக்காமம் பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்ட நாவலடிவட்டை பிரதேசத்தில் 1986, 1989, 1991 மற்றும் 1997ஆம் ஆண்டுகளில் அம்பாறை மாவட்ட அரசாங்க அதிபரால் காணிக் கச்சேரி நடத்தப்பட்டு, காணி ஆணையாளர் நாயகத்தின் அங்கீகாரத்துடன் 21 விவசாயிகளுக்கு உத்தரவுப் பத்திரங்கள் வழங்கப்பட்டன. அது தொடர்பான ஆவணங்களை நான் இந்தப் பாராளுமன்றத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இறக்காமம் - தமன எல்லைப் பிரச்சினை பற்றி சொன்னீர்கள். அதில் பிரச்சினை இல்லை. நாங்கள் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் இது சம்பந்தமாகக் கலந்துரையாடி ஒரு முடிவு எடுத்திருக்கின்றோம். உண்மையிலேயே இந்த 21 ஏழை விவசாயிகளும் நீண்டகாலமாக விவசாயம் செய்து வந்தவர்கள்; பயங்கரவாத பிரச்சினை காரணமாக விவசாய நடவடிக்கைகளை நிறுத்தியவர்கள். இவ்விடயம் சம்பந்தமாக முடிவு எடுக்கப்பட்ட மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் நானும் இருந்தேன்; மாவட்ட அரசாங்க அதிபரும் இருந்தார். இந்தக் காணிச் சொந்தக்காரர்களுக்கு - permit வழங்கப்பட்ட 21 பேருக்கு - 2 ஏக்கர் வீதமும், அந்தக் காணிக்குள் அத்துமீறிப் பிரவேசித்த தமன பிரதேசத்தைச் சேர்ந்தவர்களுக்கு ஓர் ஏக்கர் வீதமும் காணிகளை வழங்கும் விதத்தில் நாங்கள் சமாதானமான ஓர் ஏற்பாட்டைச் செய்திருக்கிறோம். அதாவது, ஒற்றுமையாக வாழ வேண்டும் என்ற நோக்கத்துக்காக அந்தக் காணிகளை இரண்டு இனத்தினரும் பாவிக்கக்கூடிய வகையில் முடிவொன்றை எடுத்திருக்கின்றோம். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இந்த இரண்டு தரப்பினருக்கும் அந்தக் காணிகளுக்கான உத்தரவுப் பத்திரங்களை எவ்வளவு காலத்துக்குள் வழங்குவீர்கள் என்பதைச் சொல்ல முடியுமா?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ඇත්තටම මේ ගොවීන් 21දෙනා සඳහාම අක්කර දෙකක ප්‍රමාණයක් ලබා දීම සඳහා ඒ අවශ්‍ය කරන දැනුවත් කිරීම්, මැදිහත්වීම් ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගේ මට්ටමෙන් සිදු කර තිබෙනවා. ඒ නිසා එක් කණ්ඩායමකට විතරක් අක්කර දෙක දෙන්න නොවෙයි, 21දෙනාටම අක්කර දෙක බැගින් දෙන්න තමයි කටයුතු සූදානම් කර තිබෙන්නේ. මෙහිදී තිබෙන මායිම් ප්‍රශ්න සහ Surveyor Generalගේ අනුරේඛනවල ගැටලු හොඳින් අධ්‍යයනය කරලා කඩිනමින් මේ 21දෙනා සඳහා අවශ්‍ය කරන නියමානුකූල කිරීම් කිරීමට අපි අමාත්‍යාංශය විධියට කටයුතු කරමින් සිටිනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

பிரதேச செயலகத்தின் எல்லைகளைத் தீர்மானிக்கும் பணிகளை குறித்த குழு செய்துகொண்டு இருக்கின்றது. நான் கேட்பது என்னவென்றால், இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு, உங்களுடைய அமைச்சு குறித்த 21 பேருக்கும் 2 ஏக்கர் வீதம் கொடுக்கப்பட்டுள்ள காணிகளுக்கான permitsஐ - உத்தரவுப் பத்திரங்களை - எவ்வளவு காலத்துக்குள் வழங்கும்? என்பதைத்தான்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ යන ක්‍රියාවලිය තුළ මෙන්න මේ දිනයට මේ කටයුත්ත අවසන් කරනවා කියලා අපට නිශ්චිත උත්තරයක් දෙන්න බැරි වෙයි. හැබැයි, අපි ඉඩම් කොමසාරිස්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමා සහ ඉඩම් සම්බන්ධ නිලධාරින් එක්ක සාකච්ඡා කරමින් ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ගැටලුවට වාගේම දිස්ත්‍රික්ක 25ටම අදාළ වන පරිදි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. කඩිනමින්, ඒ කියන්නේ ලබා දීමට හැකි අඩුම කාලයක් තුළ ඔබතුමා මේ යොමු කරපු ගොවීන්ගේ ප්‍රශ්නයට අදාළ නියමානුකූල කිරීම් කරන්න අපි සැලසුම් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1529/2025- (1), ගරු තුරෛරාසා රවිකරන් මහතා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1661/2025- (1), ගරු වානක මාදුගොඩ මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

## කුරින්ජක්කේනි පාලම ඉදිකර අවසන් වන තෙක් ක්‍රියාත්මක පාලම් පාරු සේවාව: විස්තර
## குறிஞ்சாக்கேணி பாலம் நிர்மாணிக்கப்படும்வரை பயன்படுத்தப்படும் படகுப் பாதைச் சேவை: விபரம்
FERRY SERVICE DEPLOYED UNTIL COMPLETION OF KURINCHAKERNY BRIDGE: DETAILS

1682/2025

**6. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කින්නියා, කුරින්ජක්කේනි පාලම ඉදිකර අවසන් වන තෙක් තාවකාලිකව පාලම් පාරු සේවාවක් යොදවා ඇති බව දන්නේද;

(ii) එම පාලම් පාරුව මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන්වූ පසු, සේවයේ යොදවා ඇති එම පාලම් පාරුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන්නේද, නැතහොත් කොන්ත්‍රාත් සමාගමට අයත් වන්නේද;

(iv) එම පාලම් පාරුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අනාරක්ෂිත මුහුදු ප්‍රවාහන කටයුතු සිදුවන ප්‍රදේශවල ප්‍රවාහන කටයුතු සඳහා යෙදවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிண்ணியா குறிஞ்சாக்கேணி பாலம் நிர்மாணிக் கப்படும் வரை தற்காலிக படகுப் பாதைச் சேவை ஆரம்பிக்கப்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி படகுப் பாதையை கொள்வனவு செய்வதற்கு ஏற்பட்ட செலவு எவ்வளவு என்பதையும்;

(iii) பாலத்தின் நிர்மாணப் பணிகள் நிறைவடைந்த பிறகு, சேவையில் ஈடுபடுத்தியுள்ள குறித்த படகுப் பாதை வீதி அபிவிருத்தி அதிகார சபைக்குச் சொந்தமாகுமா; இன்றேல், ஒப்பந்ததார நிறுவனத்துக்குச் சொந்தமாகுமா என்பதையும்;

(iv) மேற்படி படகுப் பாதையை திருகோணமலை மாவட்டத்தின் பாதுகாப்பற்ற கடல் போக்கு வரத்து நடவடிக்கைகள் இடம்பெறுகின்ற பிரதேசங்களில் போக்குவரத்து நடவடிக்கை களில் ஈடுபடுத்துவதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that a temporary ferry service has been deployed until the construction of the Kinniya, Kurinchakerny Bridge is completed;

(ii) the amount spent on purchasing the aforesaid ferry;

(iii) whether the aforesaid ferry which has been deployed will come into the possession of the Road Development Authority or the contracting company, upon completion of the bridge construction; and

(iv) whether steps will be taken to deploy the aforesaid ferry for transportation in areas where unsafe sea transport activities are carried out in the Trincomalee District?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) රුපියල් මිලියන 44.50කි.

(iii) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වේ.

(iv) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු දැනට සිදු කරමින් පවතින බැවින්, මෙම පාලම් පාරුව මෙම ස්ථානයේ ප්‍රවාහන කටයුතු සඳහා තවදුරටත් යොදවා ඇති අතර, මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ඉදිරියේදී පවතින අවශ්‍යතාව අනුව වෙනත් ස්ථානයකට යෙදවීමට කටයුතු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சொன்னது போன்று இப்பொழுது அங்கு பல மில்லியன் ரூபாய் செலவில் படகுப் பாதைச் சேவை நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அவ்வளவு தொகை செலவழித்திருந்தாலும், அதற்கேற்ப நல்ல விடயங்கள் அந்த இடத்தில் நடைபெறுகின்றதா? என்பதுதான் என்னுடைய கேள்வியாக இருக்கின்றது. ஏனெனில், அங்கு நடைபெறுகின்ற அந்தப் படகுப் பாதைச் சேவையானது, அந்த இடத்துக்குச் சரியாகப் பொருந்தாத ஒரு நிலைப்பாடு காணப் படுகின்றது. குறிப்பாக, நீர் மட்டம் குறைவடையும்போது அவற்றைச் செலுத்துவதற்கு முடியாமல் இருக்கின்றது. அண்மையில்கூட, அந்த இடத்திலிருந்து மண்ணை வெட்டி அகற்றினார்கள். இவ்வாறு கஷ்டப்படுகின்ற ஒரு நிலைப்பாடு அங்கு காணப்படுகின்றது. அதுமாத்திரமன்றி, இந்தப் படகுப் பாதையில் காணப்படுகின்ற motors தொடர்ச்சியாகச் செயலிழக்கின்ற நிலைப்பாடும் காணப்படுகின்றது. இந்தப் படகுப் பாதை அந்த இடத்துக்குப் பொருத்தமானது என்பதை யார் சிபாரிசு செய்தார்கள்? அந்த இடத்துக்கு இது சரியான தொரு படகுப் பாதையாக அமையப்பெற்று இருக்கின்றது என்பதை நீங்கள் ஏற்றுக்கொள்கின்றீர்களா? இந்தப் பாலத்தின் நிர்மாணப் பணிகள் எப்பொழுது நிறைவுபெறும் என்பதைக் கூற முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට මම පිළිතුර ලබා දෙනවා. මේ කාරණයට හේතු වුණු පසුබිම මම ඉතා ඉක්මනින් කියන්නම්. මෙතැන පාලමක් ඉදිකරන්න 2021 වර්ෂයේදී VVK Construction Limited වෙත පවරා තිබෙනවා. ඒ කාලයේදීත් තාවකාලික බෝට්ටු සේවාවක් යොදවා තිබෙනවා. හැබැයි, ඒ බෝට්ටුව අවශ්‍ය ප්‍රමිතින් අනුව නොතිබුණු නිසා, 2021 නොවැම්බර් 23වන දා අධික බර පැටවීම හේතුවෙන් අනතුරට පත් වෙලා දියේ ගිලිලා, ළමුන් ඇතුළු පුද්ගලයන් 6දෙනෙකුගේ ජීවිත අහිමි වෙලා තිබෙනවා. ඒ අනුව තමයි, පාලම හදනකල් මේ කියන ferry service එක දාලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, දැනට එම පාලමේ ඉදි කිරීම් කටයුතු කරගෙන යනවා. මමත් ඒක නිරීක්ෂණය කරන්න ගියා. ඒක 2027 මාර්තු මාසයේ අවසන් කිරීමට නියමිතයි. දැනට ඒකේ ඇත්ත භෞතික ප්‍රගතිය සියයට 63ක් තිබෙනවා. සියයට 9ක් පස්සෙන් ඉන්නේ. අපි විශ්වාස කරනවා, තවත් මාස 6කට, 7කට ආසන්න කාලයකදී අපට ඒ පාලම සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙයි කියලා. එතකොට ඒ ferry service එක අපට අවශ්‍ය වන එකක් නැහැ කියලා මම හිතනවා. දැන් ඒ ferry service එක වෙනස් කරන්න ගියොත් ඇති වන දුෂ්කරතාව ගැන ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. මොකද, ferry service එකත් එක්ක විශාල engineering course එකක් තිබෙනවා. ඒ නිසා මම හිතනවා, දැන් ඒක සිදු කිරීම දුෂ්කර වෙන්න පුළුවන් කියලා. ඔබතුමා මේ පෙන්වා දෙන කරුණුත් එක්ක, පාලමේ වැඩ කටයුතු ඉක්මන් කරලා හරියට කරවන්න, නැවත ඒ කටයුතු අධීක්ෂණය කරවන්න අපි කටයුතු කරන්නම්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ அமைச்சர் அவர்களே, பதில் அளித்தமைக்கு நன்றி! என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

நீங்கள் சொன்னதுபோன்று, 2021ஆம் ஆண்டு நவம்பர் மாதம் 23ஆம் திகதி அந்த இடத்தில் இடம்பெற்ற விபத்தில் 8 பேர் மரணமடைந்தார்கள். நாங்கள் இந்த விடயம் சம்பந்தமாக எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் கிண்ணியா பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் பேசியிருக்கிறோம். குறித்த விபத்தில் மரணித்த 8 பேரின் குடும்பங்களுக்கான நட்டஈடு இன்னும் வழங்கப்படாமல் இருக்கின்றது. நாங்கள் இது சம்பந்தமாக DCCஇல் கேட்டால், இவ்விடயம் தொடர்பில் நீதிமன்றத்தில் வழக்கு இருப்பதால் அவர்களுக்கு நட்டஈடு வழங்க முடியாதெனச் சொல்லப் படுகின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, பிள்ளைகளை, தந்தைமாரை, தாய்மாரை இழந்த அந்தக் குடும்பங்கள் மிகவும் கஷ்டத்திலே இருக்கின்றன. நான் இந்த இடத்தில் கௌரவ சஜித் பிரேமதாஸ அவர்களுக்கு நன்றி தெரிவிக்க வேண்டும். ஏனெனில், அப்போது எதிர்க்கட்சித் தலைவராக இருந்த அவர், சம்பவ இடத்துக்கு வருகை தந்து தன்னால் முடியுமான கொடுப்பனவை வழங்கியிருந்தார். எனினும், அந்த நேரத்தில் இருந்த அரசாங்கம் அதற்கான முன்னெடுப்புகளை எடுக்கவில்லை. ஆகையால், நாங்கள் எதிர்பார்க்கின்றோம், இந்தப் புதிய அரசாங்கத்திலாவது அவர்களுக்கான நட்டஈடு வழங்கப்படும் என்று. அதற்குரிய நடவடிக்கைகளை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன். ஏனென்றால், அந்த வழக்கு எப்போது முடிவடையுமெனத் தெரியாது. நீங்கள் நேரில்வந்து பார்த்தால் தெரியும், அந்தக் குடும்பங்கள் எவ்வளவு கஷ்டப் படுகின்றன என்பது. எனவே, அந்தக் குடும்பங்களுக்கான நட்டஈட்டை வழங்குவதற்கு இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்குமா? என்பதுதான் என்னுடைய கேள்வியாகும்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම කියපු විධියට ඒක අධිකරණය තුළ තිබෙන කටයුත්තක් නම් යම් rush එකක් තිබෙන්න පුළුවන්. මේ සභාවේ අපේ ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමා ඉන්නවා. එතුමන්ලා යටතේ තමයි ඔය reparations සම්බන්ධයෙන් යම් යම් මැදිහත්වීම් කරන්නේ. ඒක අතීතයට බලපාන ලෙස කරන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, DCC එකේ තිබෙන ඒ proposal එක සම්බන්ධයෙන් Deputy Minister of Defence, the Hon. Major General (Rtd.) Aruna Jayasekera මැතිතුමාත් එක්ක කථා කරන්න කියලා. සමහර විට relief එකක් ගන්න පුළුවන් වේවි.

## කාලගුණික බලපෑම් සහ වන සතුන් හේතුවෙන් කෙසෙල් ගොවීන් මුහුණ දෙන දුෂ්කරතා: වන්දි/ රක්ෂණ

## மோசமான காலநிலையாலும் வன விலங்குகளாலும் வாழை பயிரிடும் விவசாயிகள் எதிர்கொள்ளும் சிரமங்கள்: இழப்பீடு/ காப்புறுதி

DIFFICULTIES FACED BY BANANA CULTIVATORS DUE TO BAD WEATHER AND WILD ANIMALS: COMPENSATION/ INSURANCE COVERAGE

1912/2026

**7. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ කෙසෙල් වගා කරන ප්‍රදේශ කවරේද;

(ii) කෙසෙල් වගාවේ නිරත ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

[ගරු බී. ආරියවංශ මහතා]

(iii) කාලගුණික බලපෑම් සහ වන සතුන්ගෙන් සිදු වන හානි හේතුවෙන් කෙසෙල් ගොවීන් දැඩි දුෂ්කරතාවලට මුහුණ පාන බව දන්නේද;

(iv) එම හානි සඳහා ගොවීන්ට වන්දි හෝ රක්ෂණ ආවරණයක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் வாழை பயிரிடப்படுகின்ற பிரதேசங்கள் யாவை என்பதையும்;

(ii) வாழை பயிர்ச்செய்கையில் ஈடுபடுகின்ற விவசாயக் குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) காலநிலை மாற்றங்களாலும் வன விலங்கு களாலும் ஏற்படுகின்ற சேதங்கள் காரணமாக வாழை பயிரிடும் விவசாயிகள் பாரிய சிரமங் களை எதிர்கொள்கின்றனர் என்பதை அறிவாரா என்பதையும்;

(iv) மேற்படி சேதங்களுக்காக விவசாயிகளுக்கு இழப்பீடு அல்லது காப்புறுதி வழங்குவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the names of the areas where banana is cultivated in Sri Lanka;

(ii) the number of farmer families engaged in banana cultivation;

(iii) whether he is aware that banana cultivators face severe difficulties due to adverse weather conditions and due to damages caused by wild animals; and

(iv) the measures that are taken to provide compensation or insurance coverage to farmers for such damages?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෙවතු හා වාණිජ මට්ටමින් කෙසෙල් වගා කිරීම සිදු කරනු ලබන අතර, දිස්ත්‍රික්ක වශයෙන් ගත් කළ මොනරාගල, හම්බන්තොට, කුරුණෑගල, අනුරාධපුරය, මහනුවර සහ රත්නපුර දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් වගා කිරීම සිදු කරයි. මුළු කෙසෙල් වගා වපසරියෙන් සියයට 55ක් පමණ මෙම දිස්ත්‍රික්ක තුළ පැතිර පවතී.

(ii) කෙසෙල් වගාවේ වපසරිය සම්බන්ධව දත්ත නඩත්තු වන නමුත් වගාවේ නිරත ගොවි පවුල් සංඛ්‍යාව සම්බන්ධව නිශ්චිත දත්ත සපයා ගැනීම අපහසු වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන දත්තවලට අනුව 2025 වර්ෂයේ හෙක්ටෙයාර 38,206ක කෙසෙල් වගාවක් පැවතුණු අතර, දිස්ත්‍රික්ක වශයෙන් එම වගා වපසරිය පහත පරිදි වේ. මුළු වගා වපසරිය වාර්ෂිකව සුළු වශයෙන් වෙනස් වීමට ලක් වේ.

| **දිස්ත්‍රික්කය** | **වගා වපසරිය (හෙක්ටෙයාර)** |
|---|---|
| මොනරාගල | 4,896 |
| හම්බන්තොට | 3,773 |
| කුරුණෑගල | 3,732 |
| අනුරාධපුරය | 3,259 |
| මහනුවර | 2,855 |
| රත්නපුර | 2,625 |
| ගම්පහ | 2,146 |
| කෑගල්ල | 1,973 |
| මාතලේ | 1,434 |
| බදුල්ල | 1,366 |
| පුත්තලම | 1,351 |
| ගාල්ල | 1,331 |
| මාතර | 1,297 |
| අම්පාර | 1,146 |
| කළුතර | 1,094 |
| පොළොන්නරුව | 648 |
| ත්‍රිකුණාමලය | 509 |
| යාපනය | 430 |
| නුවරඑළිය | 428 |
| මඩකලපුව | 419 |
| මුලතිව් | 346 |
| වවුනියාව | 337 |
| කොළඹ | 299 |
| කිලිනොච්චිය | 263 |
| මන්නාරම | 249 |
| **මුළු වගා වපසරිය** | **38,206** |

ඉහත වගුව අනුව, මොනරාගල, හම්බන්තොට, කුරුණෑගල සහ අනුරාධපුරය කියන දිස්ත්‍රික්කවල තමයි ලංකාවේ වැඩියෙන්ම කෙසෙල් වගා කරන්නේ. මන්නාරම, කිලිනොච්චිය, කොළඹ, වවුනියාව, මුලතිව්, මඩකලපුව, නුවරඑළිය සහ යාපනය කියන දිස්ත්‍රික්කවල තමයි ලංකාවේ

අඩුවෙන්ම කෙසෙල් වගා කරන්නේ. සමස්ත එකතුව ගත්තාම තමයි 38,206ක ප්‍රමාණයක් එන්නේ.

(iii) ඔව්.

(iv) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කෙසෙල් වගාව සඳහා රක්ෂණාවරණය ලබා දෙනු ලබන අතර, රක්ෂිත මුදල අක්කර 1ක් සඳහා රුපියල් 300,000කි. මෙම රක්ෂිත මුදල වගා කරනු ලබන කෙසෙල් වර්ගය අනුව වෙනස් විය හැකි අතර, අක්කරයක් සඳහා කෙසෙල් වගාකරුට වියදම් වන වගා පිරිවැය ආවරණය වන පරිදි රක්ෂණාවරණය ලබා ගත හැකිය. මේ සඳහා ගොවි මහතා ගෙවිය යුතු වාරික මුදල වනුයේ රක්ෂිත මුදලින් සියයට 7ක ප්‍රමාණයකි. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයීය දිස්ත්‍රික් කාර්යාල 30ක් හරහා ඕනෑම කෙසෙල් වගාවක් සිදු කරනු ලබන ගොවි මහතෙකුට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායක විය හැකිය.

මීට අමතරව "දිට්වා" සුළි කුණාටු අවස්ථාවේ සිදු වූ හානි ආවරණයේදී කෙසෙල් වගා හානි වෙනුවෙන්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම් සිදු කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මා ජීවත් වන ප්‍රදේශයේ වලව කලාපයේ තමයි වැඩියෙන්ම කෙසෙල් වගා කරන්නේ. රත්නපුර, හම්බන්තොට සහ මොනරාගල ඇතුළු දිස්ත්‍රික්කවල විශාල වශයෙන් කෙසෙල් වගා කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වගා හානි සඳහා ගොවීන්ට රක්ෂණ වන්දි ගෙවනවා කියලා ඔබතුමා කිව්වා. පසුගිය කාලයේ පැවති නියඟයත් සමඟ කෙසෙල් වගාව විශාල වශයෙන් විනාශ වීම හේතුවෙන් මේ වනකොට කෙසෙල් මිල විශාල ලෙස ඉහළ ගිහිල්ලා තිබෙනවා.

මේ විනාශ වුණු වගාවලට රක්ෂණ වන්දි ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වනවා. විශේෂයෙන්ම පුවාලු, එහෙම නැත්නම් කෝලිකුට්ටු කියන කෙසෙල් වගාව සඳහා මේ වනකොට දිලීර සහිත ලෙඩක් හැදෙනවා. ඒකට "කහ ලෙඩ" කියලා කියනවා. ඒකෙන් කෙසෙල් වගාව විශාල වශයෙන් විනාශ වෙලා යනවා.

එවැනි කෙසෙල් වගාවන් සඳහා පොහොර සහනාධාරයක් දෙනවා කියලා මම ඉස්සෙල්ලා කථා කරපු වෙලාවේදී ඔබතුමා කිව්වා. කුඹුරු ඉඩම්වල කෙසෙල් වගා කරන අය සඳහා තමයි පොහොර සහනාධාරය ලබා දී තිබෙන්නේ. ඒ වුණාට ඒ පොහොර සහනාධාරය මේ වනකොට සෑම ගොවි සංවිධානයකටම ලැබිලා නැහැ. හම්බෙගමුව ප්‍රදේශයේත්, ඇඹිලිපිටිය ප්‍රදේශයේත් කුඹුරුවල වාගේම ගොඩබිම්වේත් විශාල වශයෙන් කෙසෙල් වගා කරනවා. ගොඩබිම කෙසෙල් වගා කරන ගොවියාට මේ වෙනකම් පොහොර සහනාධාරයක් ලබා දීලා නැහැ. ඒ වාගේම කහ ලෙඩ ඇවිල්ලා වගා විනාශ වන නිසා පටක රෝපණ පැළ නිෂ්පාදනය කරන්න රජය විසින් යම් වැඩ පිළිවෙළක් සකස් කරලා, ගොවීන් සඳහා ඒවා බෙදා දුන්නොත් හොඳයි කියන කාරණය මම මේ අවස්ථාවේදී ඔබතුමාට කියනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඔබතුමා පොහොර සම්බන්ධයෙනුත් කාරණයක් මතු කළා. අපේ ආණ්ඩුව බලයට එනකොට තිබුණු පොහොර සහනාධාරය මේ වනකොට අපි දෙගුණයක් කරලා ගෙවන්න පටන්ගෙන තිබෙනවා. මොනවා හරි තාක්ෂණික හේතුවක් නිසා වෙන්න පුළුවන්, වෙන මොනවා හරි ගැටලුවක් නිසා වෙන්න පුළුවන්, සමහර තැන්වල පොහොර සහනාධාර ලැබිච්ච නැති ගොවියෙක් ඉන්නවා නම් ඒ ගැන අපිට වාර්තා කළාට පස්සේ ඒවාට මැදිහත් වෙන්න අපට පුළුවන්කම තිබෙනවා.

මෙතෙක් වී සඳහා තමයි පොහොර සහනාධාරය දුන්නේ. හැබැයි, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ වී වගා කරන ඉඩම්වල අතිරේක භෝග වගා කරනවා නම් කන්න රැස්වීමේ තීන්දුවක් අනුව ඒ අයටත් පොහොර සහනාධාරය දෙන්න පටන් ගත්තා. ඒ අනුව පසුගිය කන්නයේදීත්, ඊට කලින් කන්නයේදීත්, මේ කන්නයේදීත් පොහොර සහනාධාරය ලබා දුන්නා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන අනෙක් කාරණය හරි. ඇත්තටම කෙසෙල් වගාවට අදාළව රක්ෂණාවරණයක් මේ විධියට අපි හඳුන්වා දී තිබෙනවා. ඒ පිළිබඳව දැනුවත් ගොවීන්ට ඒ සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් තිබෙනවා.

විශේෂයෙන්ම ලංකාවේ වැඩියෙන්ම කෙසෙල් වගා කරන කලාපය තමයි, වලව කලාපය. ඔබතුමා කිව්ව ඒ කාරණයත් නිවැරැදියි. විශේෂයෙන්ම කෝලිකුට්ටු කෙසෙල්වලට ඇති වන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, "පැනමා" කියන ලෙඩේ. ඒ නිසාම අඩි පහෙන්, හයෙන් විතර කෙසෙල් කැනක් ගන්න තනි ගහක් තමයි හිටවන්නේ. අනෙක් කුඩා පැළ ඔක්කෝම මර්දනය කරලා තනි කෙසෙල් කැනක් ගන්න තමයි ගොවියා පෙලඹිලා තිබෙන්නේ. මොකද, මේ ලෙඩ එන නිසා. එහෙම ගැටලුවක් තිබෙනවා. ඇත්තටම ඒ සමහර ලෙඩවලට මේ වනතුරු ස්ථිරසාර බෙහෙත් හොයාගෙන නැති තත්ත්වයක් තිබෙන්නේ. කොහොම නමුත්, කෙසෙල් ගොවියා සම්බන්ධයෙන් ගත්තොත්, ඇත්තටම මේ වනකොට ඒ ගොවියාට සතුටු වෙන්න පුළුවන් මිලක් කෙසෙල්වලට ලැබිලා තිබෙනවා. ඒ වාගේම කෙසෙල් ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. අපේ ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විධියට කටයුතු කරනවා. ඒ වාගේම උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේත් මැදිහත්වීම යටතේ මේ වනකොට කෙසෙල් අපනයන සැකසුම් මධ්‍යස්ථානයක් සකස් කිරීමට අදාළ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම ඇඹිලිපිටිය ප්‍රදේශය පදනම් කරගෙන කෙසෙල් කඳට අගය එකතු කරන කර්මාන්තයකට යෑමේ කටයුත්තටත් මේ වනකොට සම්බන්ධ වෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය ඉස්සරහට ක්‍රියාත්මක වනකොට මම හිතන විධියට කෙසෙල් ගොවියාට හොඳ තත්ත්වයක් නිර්මාණය කර ගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා කිව්වා, දැන් කෙසෙල්වලට හොඳ මිලක් තිබෙනවා, ගොවියා සතුටින් ඉන්නවා කියලා. පසුගිය නියං සමයේ කෙසෙල් වගාව විශාල වශයෙන් විනාශ වෙලා ගියා. එම නිසා තමයි අස්වැන්න අඩු වුණේ. ඒ නිසා කෙසෙල් ගොවියාට මිලක් ලැබිලා තිබෙනවා. ඒ වුණාට සියයට 75කින් විතර අස්වැන්න අඩු වෙලා තිබෙන බව ඔබතුමා දන්නවාද දන්නේ නැහැ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. මේ වනකොට ඒ කෙසෙල් ගොවීන්ට යම් සහනයක් ලබා දෙන්න ඕනෑ, ඉදිරියේදී නැවත පැළ සිටුවන්න. මාස් කන්නය එනකොට වහිනවා. ඒ නිසා පැළ සිටුවලා නැවත වගා කරන්න අවශ්‍යයි. එහෙම නැති වුණොත්, අනිවාර්යයෙන්ම කෙසෙල් කිලෝවක් රුපියල් 500කට වැඩි මිලකට යනවා. ඒක පාරිභෝගිකයාටත් ප්‍රශ්නයක් වෙනවා.

[ගරු බී. ආරියවංශ මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කෙසෙල් කැන් ඉදවන්නේ රසායනික ද්‍රව්‍යයක් යොදලා බව අපි දන්නවා. එතකොට කෙසෙල් කැන දවස් තුනෙන්, හතරෙන් පර වෙලා යනවා. ඒ නිසා සියයට 50ක විතර කෙසෙල් අස්වැන්නක් පාරිභෝගිකයන්ට ලබා ගන්න බැරි වෙනවා. ගොවියා කෙසෙල් කැන කපලා දෙනවා. අතරමැදියා ඒ කෙසෙල් කැන්වලට රසායනික ද්‍රව්‍ය යොදලා ඒවා ඉදවනවා. ඇඹිලිපිටියෙන් කෙසෙල් කැන් පටවාගෙන කොළඹට එනකොට ඒවා ඉදිලා. එතකොට පාරිභෝගිකයාට වසවිස තමයි පරිභෝජනය කරන්න වෙන්නේ. එම නිසා මේ වෙනුවෙනුත් යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න. මොකද, ලබා ගන්නා අස්වැන්නෙන් සියයට 90ක් දක්වා හරි පරිභෝජනය සඳහා යොදවන විධියේ වැඩ පිළිවෙළක් හදන්න. කෙසෙල් කඩයක් පිටුපසට ගියාම බලා ගන්න පුළුවන්, පර වෙච්ච කෙසෙල් කැන් ප්‍රමාණය වැඩි බව. කඩේ ඉස්සරහ එල්ලලා තිබෙනවාට වැඩිය කඩේ පිටුපස තිබෙන්නේ පර වෙච්ච කෙසෙල් කැන්. ඒක නිසා ගොවියාට සාධාරණ මිලකුත්, පාරිභෝගිකයාට ඒවා මිලදී ගන්න සාධාරණ මිලකුත් ලැබෙන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

විශේෂයෙන්ම නියඟයත් - පැවිල්ලත් - සියලු වගාවන්ට බලපානවා. කෙසෙල්වලටත් ඒක අඩු-වැඩි වශයෙන් බලපානවා. විශේෂයෙන්ම වලව කලාපය තුළ ගොඩක් වෙලාවට වාරි ජලයෙන් තමයි ගොවීන් කෙසෙල් වගා කරන්නේ. කුඹුරුවලත් කෙසෙල් වගා කරනවා. ගොඩ ඉඩම්වල කෙසෙල් වගා කරන ගොවීන්ට වාරිමාර්ග හරහා වතුර ලබා දෙන ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, ඒක හැම තැනටම අදාළ වන්නේ නැහැ. ඒ නිසා එම ගොවීන්ට මේ ගැටලුව බලපා තිබෙනවා. ඒ නිසා කෙසෙල් කැන කුඩා වෙන්න, ගෙඩි කුඩා වෙන්න, බර අඩු වෙන්න බලපෑමක් ඒ තුළින් සිදු වෙලා තිබෙනවා. එහෙම බලපෑමක් නැතුවා නොවෙයි කියන එක අපි පිළිගන්නවා. ඒ කාරණය ගැන අපි වෙනම අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, කෙසෙල් ඉදවීම සඳහා විවිධ රසායනික ද්‍රව්‍ය - chemicals - පාවිච්චි කිරීම කාලයක සිට පැවතගෙන ආපු දෙයක්. ඇත්තටම ඒ පිළිබඳව දැන් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. එලෙස රසායනික ද්‍රව්‍ය පාවිච්චි කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් අදාළ දැනුම හා අවබෝධය ලබා දීලා, ඊට අදාළ ක්‍රියාවන් තුළින් ඔවුන් ඉවත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් මේ වනවිටත් සකස් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයන් තුළ, අපිට ඉදිරි කාලයේදි මේක සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කරගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තිබෙනවා.

## ස්වාභාවික සම්පත් භාවිතයෙන් විදුලිය උත්පාදනය: දිගුකාලීන සැලැස්ම

### இயற்கை வளங்களைப் பயன்படுத்தி வலுசக்தி உற்பத்தி: நீண்டகாலத் திட்டம்

### ELECTRICITY GENERATION UTILIZING NATURAL RESOURCES: LONG-TERM PLAN

1942/2026

**8. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින ස්වාභාවික සම්පත් උපයෝගී කරගනිමින් රටට අවශ්‍ය විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා දිගු කාලීන සැලසුමක් රජය සතුව තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම යටතේ එක් එක් ස්වාභාවික සම්පත මඟින් ලබා ගැනීමට අපේක්ෂිත මුළු විදුලි බල ප්‍රමාණයේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදුලිබල නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමට ගත වන අපේක්ෂිත කාලය කොපමණද;

(iv) සූර්ය බලශක්ති නිෂ්පාදන සැලසුම යටතේ වහල මත සූර්ය පැනල සවි කිරීම සහ භූමිය මත සූර්ය පැනල සවි කිරීම සඳහා අපේක්ෂිත කාල රාමුව කවරේද;

(v) භූමිය මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘති සඳහා සාරවත් සහ නිසරු ඉඩම් භාවිත කිරීම හේතුවෙන් ස්වාභාවික පරිසර පද්ධතියට බලපෑමක් සිදු වන්නේද;

(vi) වහල මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබා දී ඒවා දිරිගැන්වීමට බාධා තිබේද;

(vii) එසේ නම්, එම බාධා කවරේද;

(viii) සහන පදනම යටතේ ක්‍රියාත්මක වන සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා මේ වනවිට පහසුකම් සැපයීම සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் காணப்படுகின்ற இயற்கை வளங் களைப் பயன்படுத்தி நாட்டுக்குத் தேவையான வலுசக்தியை உற்பத்தி செய்வதற்கான ஏதேனும் நீண்டகாலத் திட்டம் அரசிடம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி திட்டத்தின்கீழ் ஒவ்வோர் இயற்கை வளத்தையும் கொண்டு உற்பத்தி செய்ய எதிர்பார்க்கின்ற மொத்த வலுசக்தியின் சதவீதம் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) வலுசக்தி உற்பத்தியில் தன்னிறைவடைவதற்கு எவ்வளவு காலம் செல்லுமென எதிர்பார்க்கப் படுகின்றது என்பதையும்;

(iv) சூரிய வலுசக்தி உற்பத்தித் திட்டத்தின்கீழ் கூரைகளின்மீதும் நிலத்தின்மீதும் சூரிய படலங் களைப் பொருத்துவதற்கு எதிர்பார்க்கின்ற காலவரையறை யாது என்பதையும்;

(v) நிலத்தின்மீது சூரிய படலங்களைப் பொருத்தும் கருத்திட்டத்துக்காக செழிப்பான மற்றும் வளமற்ற நிலங்களைப் பயன்படுத்துவதன் காரணமாக இயற்கைச் சூழல் கட்டமைப்பின்மீது தாக்கம் ஏற்படுமா என்பதையும்;

(vi) கூரைகள்மீது சூரிய படலங்களைப் பொருத்தும் கருத்திட்டத்துக்கு முன்னுரிமையளித்து அதனை ஊக்குவிப்பதில் தடைகள் ஏதும் உள்ளதா என்பதையும்;

(vii) ஆமெனில், அந்தத் தடைகள் யாவை என்பதையும்;

(viii) மானிய அடிப்படையில் செயற்படுத்தப்படும் சூரிய வலுசக்தி கருத்திட்டத்துக்கு தற்பொழுது வசதிகள் வழங்கப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether the Government has a long-term plan to generate the electricity required for the country by utilizing the natural resources available in Sri Lanka;

(ii) if so, the expected percentage of the total electricity generation to be obtained separately from each natural resource under the said plan;

(iii) the expected time that will be taken to achieve self-sufficiency in electricity generation;

(iv) the expected timeline for the installation of rooftop solar panels and ground-mounted solar panels under the solar energy generation plan;

(v) whether the natural ecosystem is affected by the use of fertile and barren lands for ground-mounted solar panel projects;

(vi) whether there are obstacles that impede the prioritization and promotion of rooftop solar panel installation projects;

(vii) if so, such obstacles; and

(viii) whether facilities are currently being provided for solar energy projects implemented on a concessionary basis?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

ලංකාවේ පවතින ස්වාභාවික සම්පත් උපයෝගී කර ගනිමින් රටට අවශ්‍ය වන විදුලි බලය ජනනය කිරීම සඳහා රජය විසින් දීර්ඝ කාලීන සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම 2026 විදුලිබල ප්‍රතිපත්තිය අනුව පුනර්ජනනීය බලශක්තිය මත පදනම් වූ විදුලි ජනන ප්‍රතිශතය වැඩි කිරීම ප්‍රධාන අරමුණක් ලෙස හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම ඒ සම්පත්වල පිරිවැය, තාක්ෂණික සීමාවන් සහ අනෙකුත් කරුණු සැලකිල්ලට ගනිමින් තීරණය කරන ලද ප්‍රමුඛතා සීමාවන් අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝගී කරගන්න ඒ සැලැස්ම තුළ අපි කටයුතු කරමින් ඉන්නවා.

(ii) 2029 වනකොට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලි ජනනය කරන අපේක්ෂිත ප්‍රතිශතයන් මම සඳහන් කරන්නම්.

| ප්‍රභවය | අපේක්ෂිත ප්‍රතිශතය (%) |
|---|---|
| සූර්ය බලශක්තිය | 29 |
| සුළං බලශක්තිය | 09 |
| ජල විදුලිය | 29 |
| ජෛවස්කන්ධ (biomass) | 02 |

මේ ආදී වශයෙන් තමයි ජනන සැලැස්ම තුළ ඒ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රතිශතාත්මකව ලබා ගැනීම සඳහා බලාපොරොත්තු වෙන්නේ.

(iii) 2026 විදුලිබල ප්‍රතිපත්තියට අනුව විදුලි බලය සපයා ගැනීම සහ සැපයීම සම්බන්ධයෙන් වැඩි ස්වයං විශ්වාසයක් - self-reliance - ළඟා කර ගැනීමට අපේක්ෂා කරනවා. මෙතැනදී ගරු මන්ත්‍රීතුමා අදහස් කරන්නේ තාක්ෂණික, ආර්ථික, පාරිසරික සහ සමාජීය බාධක විසඳා ගැනීමට යටත්ව, ආනයනික සම්පත් අවම කරමින්, යොදා නොගනිමින් ලංකාවේ විදුලි බලය ජනනය කිරීම නම්, ඒ යැපීම අවම කිරීම සඳහා දේශීය බලශක්ති සම්පත් උපරිම මට්ටම දක්වා සංවර්ධනය කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. නමුත්, අපට ඒ සඳහා නිශ්චිත කාලයක් සඳහන් කිරීමේ හැකියාවක් නැහැ.

(iv) ඉදිරි වසර තුන සඳහා වහල මත සහ භූමිය මත සූර්ය පැනල සවිකිරීම සඳහා යෝජිත සැලැස්ම මම ඉදිරිපත් කරන්නම්.

| | වහල මත සූර්ය බලශක්ති පද්ධති (MW) | භූමිය මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති (MW) |
|---|---|---|
| 2027 | 200 | 442 |
| 2028 | 150 | 150 |
| 2029 | 150 | 300 |

(v) භූමිය මත සවි කරන සූර්ය බලාගාර ඉදිකිරීමට පෙර, අපි ඒ ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ඉඩම්වලට මධ්‍යම පරිසර අධිකාරියේ සහ අනිකුත් අදාළ ආයතනවල අනුමැතිය ලබාගෙන ස්වාභාවික පරිසර පද්ධතීන්ට සිදුවන බලපෑම් පිළිබඳව අධ්‍යයනයක් කරලා, එවැනි බලපෑමක් ඇත්නම් එම බලපෑම අවම කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරමින් තමයි ඒ ව්‍යාපෘතිය සංවර්ධනය කරන්නේ.

ඒ වාගේම මම මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. අපි අවධානය යොමු කරලා තිබෙනවා, සූර්ය පැනල සවිකිරීම සඳහා ඉඩම් භාවිත කරනවාට වඩා ලංකාව තුළ විශාල වශයෙන් භාවිත කරන, වාරිමාර්ග කටයුතු සඳහා සෘජුවම යොදා නොගන්නා ජලාශවල ජලය මත පාවෙන සූර්ය විදුලි බලාගාර ඇති කරලා ඒ සූර්ය බලය තුළින් විදුලිය ජනනය කිරීම සම්බන්ධව. අපි ඒ සඳහා දැනටමත් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමා දකින්නත් ඇති, අපි පසුගිය දවසක ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දඹුල්ල ඉබ්බන්කටුව ජලාශය මතුපිට මෙගාවොට් 5ක බලාගාරයක් ඉදි කළා. ඉදිරියේදී අපි මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරලා

[ගරු අනුර කරුණාතිලක මහතා]

කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. අපි දැනටමත් ස්ථාන 10ක් හඳුනාගෙන තිබෙනවා, floating solar power plantsවලට. ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කරමින් යනවා. අපි හිතනවා, වැඩි අවධානයක් ඒ පැත්තට යොමු කරන්න පුළුවන් වෙයි කියලා.

(vi) ඔව්.

පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යෑමේදී තාක්ෂණික ගැටලු තමයි තිබෙන්නේ. නමුත් අපි හිතනවා, විශේෂයෙන් battery energy storage system එක හඳුන්වා දීමත් එක්ක දවල් කාලයේ මේ අතිරික්තව තිබෙන සූර්ය බලය බැටරි ආරෝපණය සඳහා භාවිත කර මේ පවතින සීමාවලට යම් යම් ලිහිල් කිරීම් ඇති කරන්න පුළුවන් වෙයි කියලා.

(vii)
- බෙදාහැරීමේ පද්ධතියේ ධාරිතා සීමා.
- එම සූර්ය බල පද්ධති විශාල සංඛ්‍යාවක් පවතින බැවින් වෙන් වෙන්ව පාලනය කිරීමේ අපහසුතා.
- එම සූර්ය බල පද්ධති නිසා බෙදාහැරීමේ පද්ධතියේ සිදුවන වෝල්ටීයතා විචලන - voltage variations.

(viii) මෙගාවොට් එකකට වැඩි ව්‍යාපෘති සඳහා බන්ධිත ගුදම් - bonded warehouse - ක්‍රමවේදය යටතේ බදු සහන ලබා දෙන අතර, වහල මත සවිකරන සූර්ය බල ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම් සඳහා වසර 5ක් යනතුරු ආදායම් බදු සහන ලබා දෙනු ලබනවා.

ඒ වාගේම ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා, විශේෂයෙන් මේ ගෘහස්ථ වහල මත තිබෙන සූර්ය පැනල සඳහා battery system එකක් හඳුන්වා දෙන්න. එතකොට ඒ අයට කිසියම් විධියක බදු සහනයක් ලබා දීමේ හැකියාව පිළිබඳත් මේ වනකොට රජය හැටියට අවධානයෙන් කටයුතු කරනවා.

(ආ) අදාළ නැත.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ அமைச்சர் அவர்களே, விரிவான பதிலை வழங்கியமைக்கு நன்றி!

நீங்கள் வழங்கிய பதிலில் சொல்லியிருந்தீர்கள், எதிர்பார்க்கின்ற மொத்த உற்பத்தியில் 29 சதவீதத்தை சூரிய சக்தியிலிருந்து பெறுவதற்கு உத்தேசித்து இருப்பதாக. நல்ல விடயம்! இப்பொழுது எங்களுடைய பிரதேசங்களில் அடிக்கடி மின்வெட்டு இடம்பெறுகின்றது. மக்களுக்கு அறிவிக்கப்படாத நிலையில் ஒரு நாளைக்கு 20 - 25 தடவை மின்வெட்டு இடம்பெறுகின்றது. ஏற்கனவே கூரைமீது solar panelsஐப் பொருத்தி இருப்பவர்கள்கூட, இந்த மின்வெட்டுகளால் பாதிக்கப்படுகின்றார்கள். அதாவது, அவற்றின் மூலமான மின் உற்பத்தி பாதிக்கப்படுகின்றது. மின்சாரம் இல்லையென்றால், grid வேலைசெய்யாது என்பது உங்களுக்குத் தெரியும். இதுவொரு பாரிய பிரச்சினையாக இருக்கின்றது. இவ்வாறு அடிக்கடி மின்வெட்டு இடம்பெறுவதால், மின் உற்பத்தி பாதிக்கப்படுவது மாத்திரமல்லாமல், வீடுகள், அரசாங்க திணைக்களங்கள், தனியார் நிறுவனங்களில் பாவிக்கப் படுகின்ற மின் உபகரணங்களும் பழுதடைவதாகக் கூறுகின் றார்கள். எங்களுடைய வடக்கு மாகாணத்தில் இவ்வாறு அடிக்கடி மின்வெட்டு இடம்பெறுவதற்குக் காரணம் என்ன? அதனை எவ்வளவு சீக்கிரம் உங்களால் சீர்செய்ய முடியும்? எனக் கேட்கின்றேன்.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමා ඇහුවේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අපේ distribution linesවල, ඒ වාගේම සම්ප්‍රේෂණ පද්ධතිවල තිබෙන යම් යම් සීමා කිරීම් නිසා තමයි සමහර ප්‍රදේශවල කල්තියා දැන්විය නොහැකිව - හිටි හැටියේම - විදුලිය විසන්ධි වන්නේ. නමුත් අපි ඒ සඳහා දැන් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අපේ සම්ප්‍රේෂණ පද්ධතියත්, ඒ වාගේම බෙදා හැරීමේ පද්ධතියත් - ජාල පද්ධතිය - upgrade කළාට පස්සේ, විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ නංවන්න පුළුවන් වනවා. ඒ තුළින් අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා දීමට තමයි අපි උත්සාහ කරන්නේ. එතකොට, මම කලින් සඳහන් කළා වාගේ අපේ distribution network එකේත්, transition network එකේත් ගුණාත්මකභාවය ඉහළ නැංවූවාට පස්සේ අපට වැඩිපුර උපපොළ සංඛ්‍යාවක් ඇති කරමින්, ඒ වාගේම enhancements කිරීමෙන් ඒ තත්ත්වයට ළඟා වෙන්න පුළුවන්.

දැනට විදුලිය විසන්ධි වන අවස්ථාවලදී වහල මත ඇති සූර්ය පැනලවලින් නිෂ්පාදනය වන විදුලිය ප්‍රධාන පද්ධතියට ඇතුළත් කරන්න බැහැ. එක පැත්තකින් ඒකෙන් පාරිභෝගිකයින්ටත් අවාසියක් සිද්ධ වනවා. ඒ වාගේම විදුලිබල අවශ්‍යතාව සපුරා ගත නොහැකි වීම නිසා NSO එක පැත්තෙන්, විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගමක් හැටියට ඔවුන්ටත් බාධාවක් ඇති වනවා. දැන් අපි ඒ බාධාව හඳුනාගෙන තිබෙන්නේ; පවතින ගැටලු හඳුනාගෙන තිබෙන්නේ. මම කලිනුත් මගේ පිළිතුරේදීත් සඳහන් කළා වාගේ, ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා මේ සම්ප්‍රේෂණ පද්ධතියත්, ඒ වාගේම බෙදා හැරීමේ පද්ධතියත් - distribution line එකත් - upgrade කළාට පස්සේ මේ ගැටලුවට යම් ප්‍රමාණයක විසඳුමක් ලැබෙයි කියලා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

எமது பிரதேசங்களில் மின் இணைப்புக்கு விண்ணப் பித்தவர்கள் அதற்குரிய பணத்தைச் செலுத்திய பிறகும் ஆறு மாதங்கள் - ஒரு வருடம் வரை காத்திருக்கவேண்டிய நிலை இருக்கின்றது. இது சம்பந்தமாக மக்கள் Ceylon Electricity Boardஇல் கேட்டால், மின் இணைப்புக்கான வயர், மின்மாணி போன்ற உபகரணங்களின் பற்றாக்குறை மிகவும் மோசமாக இருப்பதால் மின் இணைப்பை வழங்க முடியாமல் இருப்பதாகச் சொல்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, மின் இணைப்புக்கான பணத்தையும் செலுத்திய பின்னர், இவ்வாறு மாதக் கணக்கில், வருடக் கணக்கில் காத்திருக்கின்ற மக்களுக்கு நீங்கள் வழங்குகின்ற பதில் என்ன? எனக் கேட்கின்றேன்.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන ගැටලුව ඉතාම සාධාරණ ගැටලුවක්. පාරිභෝගිකයෙක් මේ සම්බන්ධතාව මුදල් ගෙවලා ලබා ගන්න එක මාස හයක වාගේ කාලයක් ප්‍රමාද විය යුතු නැහැ. ක්‍රම කිහිපයක් ඔස්සේ අපි මේක හඳුනා ගන්න උත්සාහ කරනවා. අපේ procurement system එක, මිලදී ගැනීම් ක්‍රියාවලිය ටිකක් මධ්‍යගත ක්‍රියාවලියක් ඔස්සේ තමයි ක්‍රියාත්මක වෙමින් පවතින්නේ. අපි මේ වනකොට සැලැස්මක් සකස් කරලා තිබෙනවා, මේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කරලා ප්‍රාදේශීය වශයෙන් ඒ අවශ්‍ය මිලදී ගැනීම් කිරීම සඳහා කටයුතු කරන්න. ඒක, එක ක්‍රමයක්.

ඊළඟ ක්‍රමය මේකයි. පිරිස් බලය ගත්තාම, අදාළ තාක්ෂණික ශිල්පීන් පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. ඒ සඳහා cadre approval එක අරගෙන, අදාළ බඳවා ගැනීම් කිරීමට අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, අනෙක් තාක්ෂණික ගැටලුව මෙයයි. විශේෂයෙන් මෙම සම්බන්ධතා ලබා දීම සඳහා අවශ්‍ය වන වයර් ඇතුළු අනෙකුත් තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා මම කලින් සඳහන් කළා වාගේ මේ Procurement Guidelinesවල කිසියම් විධියක වෙනසක් ඇති කරලා, තත්ත්වය විමධ්‍යගත කරලා, කඩිනමින් මිලදී ගැනීම් කරලා, විදුලි සම්බන්ධතා ඉක්මනින් ලබා දීම සඳහා කටයුතු කරන සැලැස්මක් අපි ඊළඟ අවුරුද්දේ ඉඳලා ක්‍රියාත්මක කරනවා.

## පළාත් සභා මට්ටමින් දේපළ සඳහා මුද්දර ගාස්තු ගණනය කිරීම: විස්තර

### மாகாண சபை மட்டத்தில் ஆதனங்களுக்கான முத்திரைத் தீர்வையைக் கணக்கிடுதல்: விபரம்

### CALCULATION OF STAMP DUTY FOR PROPERTY AT PROVINCIAL COUNCIL LEVEL: DETAILS

2271/2026

**9. ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුද්දර ගාස්තු ගණනය කිරීම සම්බන්ධයෙන් පළාත් සභා මට්ටමේ වගකීම දරන ආයතන කවරේද;

(ii) එම ගාස්තු ගණනය කිරීමේදී එක් එක් දේපළ වෙන වෙනම තක්සේරු කරනු ලබන්නේද;

(iii) මෙම ගාස්තු ගණනය කිරීම සඳහා දේපළ තක්සේරු කිරීමේදී ඉඩම්වල පිහිටි ගොඩනැඟිලිද සැලකිල්ලට ගනු ලබන්නේද;

(iv) මුද්දර ගාස්තු සඳහා දේපළ තක්සේරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් සුදුසුකම්ලත් නිලධාරින් පළාත් සභා මට්ටමේ ආයතනවල සේවයේ නියුතුව සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉඩම් හා දේපළ තක්සේරුව සඳහා බලයලත් පුද්ගලයන් සහ ආයතන කවරේද;

(ii) දේපළ තක්සේරුව නිසි පරිදි සිදු වන බවටත් ඒ අනුව අයවිය යුතු මුද්දර ගාස්තු පළාත් සභාවලට ලැබෙන බවටත් තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முத்திரைத் தீர்வையை கணக்கிடுவதற்கு மாகாண சபை மட்டத்திலுள்ள பொறுப்பான நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி தீர்வையை கணக்கிடும்போது, ஒவ்வோர் ஆதனமும் தனித்தனியாக மதிப்பீடு செய்யப்படுமா என்பதையும்;

(iii) மேற்படி தீர்வையை கணக்கிடுவதற்காக ஆதனங்களை மதிப்பீடு செய்யும்போது, காணிகளில் அமைந்துள்ள கட்டடங்களும் கருத்திற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(iv) முத்திரைத் தீர்வைக்காக ஆதனங்களை மதிப்பீடு செய்யும் நடவடிக்கைகளில் ஈடுபடுவதற்குத் தகைமையுடைய உத்தியோகத்தர்கள் மாகாண சபை மட்டத்திலான நிறுவனங்களில் சேவையில் ஈடுபட்டுள்ளனரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் காணிகளையும் ஆதனங்களையும் மதிப்பீடு செய்வதற்கு அதிகாரமளிக்கப்பட்ட ஆட்கள் மற்றும் நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) ஆதன மதிப்பீடு உரிய முறையில் இடம்பெறுவதையும், அதற்கமைய அறவிடப்பட வேண்டிய முத்திரைத் தீர்வை மாகாண சபைகளுக்குக் கிடைக்கப் பெறுவதையும் உறுதிசெய்வதற்காக நடைமுறைப்படுத்தப்பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the institutions responsible at the provincial council level for the calculation of Stamp Duty;

(ii) whether each property is separately assessed in calculating the said duty;

(iii) whether buildings situated on lands are also taken into account when assessing property for the calculation of this duty; and

(iv) whether qualified officers are employed in institutions at the provincial council level regarding property assessment for Stamp Duty purposes?

(b) Will he also inform this House the -

(i) persons and institutions authorized for the valuation of land and property in Sri Lanka; and

(ii) mechanism that has been established to ensure that property valuation is carried out properly and that the Stamp Duty due accordingly is received by the provincial councils?

(c) If not, why?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දහනව වන උපලේඛනය අනුව, පළාත් සභාවට ඉඩම් හා මෝටර් රථ වැනි දේපළ පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු විෂයය පළාත් සභාවට පවරා ඇති අතර, ඒ අනුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබෙනවා. ඒ අනුව, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව තමයි මෙම අය කර ගැනීම් සිදු කරනු ලබන්නේ.

(ii) ඔව්.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉඩම් හා දේපළ තක්සේරුකරණය සඳහා බලයලත් පුද්ගලයන් හා ආයතන ලෙස වරලත් තක්සේරුකරුවන් හා තක්සේරු දෙපාර්තමේන්තුව තිබුණද, නිශ්චල දේපළ පැවරීමේදී මුද්දර ගාස්තු ගෙවීම් කාර්යය සඳහා දේපළ වටිනාකම තීරණය කිරීමේ බලය පැවරී ඇත්තේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන්ට පමණි.

(ii) උදාහරණයක් වශයෙන්, සබරගමුව පළාත මේ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන මම කෙටි විස්තරයක් කරන්නම්. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය හරහා ලියාපදිංචි කරනු ලබන ඔප්පුවලට අදාළ තොරතුරු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම හා එම ඔප්පුවලට අදාළ දේපළ තක්සේරු කරමින් නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා තිබේද යන්න සැසඳීමක් සිදු කරනු ලැබේ. එහිදී ඔප්පුවල මුහුණත වටිනාකමට අනුව මුද්දර ගාස්තු ගෙවා නොමැති අවස්ථා හඳුනා ගනිමින් එම ගාස්තු අය කර ගැනීම මෙන්ම අඩු වටිනාකම මත ලියා සහතික කර ඇති ඔප්පු හඳුනා ගනිමින් අතිරේක මුද්දර ගාස්තු අය කිරීමද සිදු කරනු ලැබේ. ඒ අනුව, පළාත් නවයම මුද්දර ගාස්තු අය කර ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක විස්තරය ඇමුණුම මගින් දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, අපි දන්නවා දේපළක් තක්සේරු කරලා ඔප්පුව ලිව්වාට පසුව තමයි දේපළ අවතක්සේරුවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් නඩු යන්න හරි අවශ්‍ය ක්‍රියාමාර්ග හරි ගන්න වෙන්නේ. ඒ අවස්ථාවේදී රජය පැත්තෙන් නඩු ක්‍රියාවලියට වියදමක් යනවා. ඒ වාගේම දේපළ ගත්ත කෙනාත් නඩු කටයුත්තක පැටලෙනවා. එම නිසා අපට ඒ සඳහා යම් ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් හොඳයි. යම් ඉඩමක් පැවරීමට කලින් ඒ වෙනුවෙන් තක්සේරු වාර්තාවක් අරගෙන, එම තක්සේරු වාර්තාව පදනම් කරගෙන අපට ඔප්පුව ලියන්න පුළුවන් නම් මේ ගැටලුව ඇති වෙන්නේ නැහැ. එය හුඟක් වෙලාවට සිද්ධ වෙන්නේ නොතාරිස් ගාස්තුව සහ රජයට ගෙවන මුද්දර බද්ද අඩුවෙන් ගෙවීම සුදුසුයි කියලා ඉඩම ගන්න කෙනා හිතන නිසායි. නමුත්, ඉන් පසුව සිදු වන හානිය වළක්වා ගන්න පුළුවන් අපට තක්සේරු වාර්තාව පදනම් කරගෙනම ඔප්පුවක් ලියන්න පුළුවන් නම්. ඒ සඳහා මුළු රටටම වැඩ පිළිවෙළක් යෝජනා කරන්න නොහැකිද කියලා මම අහනවා.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් කිව්වා වාගේ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ තමයි මෙම විෂය පළාත් සභාවට පවරා තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ. (1) ව්‍යවස්ථාව යටතේ, මුදල් අය කිරීම සම්බන්ධව මුදල් ප්‍රඥප්ති පනවලා තිබෙනවා. උදාහරණයක් වශයෙන්, 1990 අංක 6 දරන සබරගමු පළාතේ මුදල් ප්‍රඥප්තිය දක්වන්න පුළුවන්. ඒ ආකාරයට පළාත් නවයම ප්‍රඥප්ති සම්මත කරලා තිබෙනවා. අපට යම් සංශෝධනයක් කර ගනිද්දි ප්‍රඥප්තිවලට සංශෝධන එකතු කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, එම ව්‍යවස්ථා සංශෝධනය අනුව. ඔබතුමා ඉදිරිපත් කරන කාරණා අනුව, ඉදිරි කාල සීමාව තුළ අපට සැලකිල්ලට ලක් කරන්න පුළුවන්, කුමන ආකාරයෙන්ද සංශෝධනය කර ගන්න ඕනෑ කියලා. ඒක තමයි මූලික අදහස.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දේපළ තක්සේරුකරණයේදී අවතක්සේරුකරණය තමයි අපි කවුරුත් දන්නේ. හැබැයි, ඇතැම් අවස්ථාවල අධිතක්සේරුවකුත් සිද්ධ වනවා. යම් කෙනෙකුට ඉඩමක් වෙනුවෙන් වැඩි ප්‍රතිශතයක ණය මුදලක් ගන්න ඕනෑ නම් ඒ අවස්ථාවේදී ඉඩම අධිතක්සේරුවක් කරනවා. එම අධිතක්සේරුව ඒ අවට ඉඩම්වල මිලටත් බලපානවා. අන්න ඒ නිසා අධිතක්සේරුව සහ අවතක්සේරුව කියන දෙකම වැළැක්වීම සඳහා තක්සේරුකරණය පිළිබඳ වෘත්තීය කණ්ඩායමක් අතට තක්සේරුකරණය පත් විය යුතුයි කියන යෝජනාව මම කරනවා.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ඔබතුමා මතු කළ කාරණාව නිවැරදියි, ගරු මන්ත්‍රීතුමනි. ඒ කාරණය පිළිබඳව අපි අවධානය යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වළුක්කියාරු, අරාලි සහ පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා මාර්ගය: ප්‍රතිසංස්කරණය
## வழுக்கியாறு, அராலி மற்றும் புங்குடுதீவு ஊடாக குறிகட்டுவான் வரையான வீதி: புனரமைப்பு
## ROAD TO KURIKADDUWAN VIA VALUKKAIARU, ARALY AND PUNGUDUTIVU: RENOVATION

1193/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වළුක්කියාරු, අරාලි, වේලනෛ සහ පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා ඇති මාර්ගය එම ප්‍රදේශයේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය බව දන්නේද;

(ii) එසේ නම්, එම මාර්ගයේ මුළු දිග කොපමණද;

(iii) එම මාර්ගය අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද දිනය කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ කවුරුන්ද;

(vi) එම මාර්ගය දිගු කලක් ප්‍රතිසංස්කරණය නොකිරීමට බලපා ඇති හේතු කවරේද;

(vii) ප්‍රතිසංස්කරණ කටයුතු පමා වීම හේතුවෙන් එහි ජනතාව මුහුණ පා සිටින දුෂ්කරතා කවරේද;

(viii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தின் வேலணை பிரதேச செயலாளர் பிரிவில் வழுக்கியாறு, அராலி, வேலணை மற்றும் புங்குடுதீவு ஊடாக குறிகட்டுவான் வரை அமைந்துள்ள வீதியானது அப்பிரதேசத்தின் பிரதான போக்குவரத்து வீதி என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அந்த வீதியின் முழுமையான நீளம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி வீதி இறுதியாக புனரமைப்புச் செய்யப் பட்ட திகதி யாது என்பதையும்;

(iv) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) புனரமைப்பு நடவடிக்கைகளுக்காக நிதி ஒதுக்கீடு செய்தது யார் என்பதையும்;

(vi) மேற்படி வீதியானது நீண்டகாலமாக புனரமைப் புச் செய்யப்படாதுள்ளமை தொடர்பில் தாக்கம் செலுத்தியுள்ள காரணங்கள் யாவை என்பதையும்;

(vii) புனரமைப்பு நடவடிக்கைகள் தாமதமடைவதன் காரணமாக அங்குள்ள மக்கள் முகம்கொடுக் கின்ற அசௌகரியங்கள் யாவை என்பதையும்;

(viii) குறித்த வீதியின் புனரமைப்பு நடவடிக்கைகள் ஆரம்பிக்கப்படவுள்ள திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the road to Kurikadduwan via Valukkaiaru, Araly, Velanai and Pungudutivu in Velanai Divisional Secretary's Division in the Jaffna District is the main transport route in that area;

(ii) if so, the total length of the said road;

(iii) the date on which the said road was last renovated;

(iv) the amount of funds spent on the said renovation;

(v) the name of the authority that allocated funds for the renovations;

(vi) the reasons for not renovating the said road for a long time;

(vii) the difficulties faced by the people of these areas due to the delay in commencing the renovation work; and

(viii) the date on which the renovation work of the said road is scheduled to be commenced?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මාර්ගයේ මුළු දිග කිලෝමීටර 24.54කි. (අරාලි කලපුව පාලම/පාර නොමැති කිලෝමීටර 2 හැර)

(iii) 1. 2023 වර්ෂයේ කිලෝමීටර් 100,000 වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග කොටස්

- 14+500 km සිට 16+000 km දක්වා
- 16+000 km සිට 19+000 km දක්වා

[ගරු බිමල් රත්නායක මහතා]

2. 2024 වර්ෂයේ මාර්ග නඩත්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග කොටස්
   - 10+500 km සිට 14+500 km දක්වා
   - 16+000 km සිට 19+0000 km දක්වා
3. 2026 වර්ෂයේ මාර්ග නඩත්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග කොටස්
   - 6+000 km සිට 10+500 km දක්වා
4. 2026 වර්ෂයේ "දිවිචා" ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද මාර්ග කොටස්
   - 21+250 km සිට 24+540 km දක්වා
5. 0+000 km සිට 6+000 km දක්වා කොටස මේ දක්වා කිසිදු සංවර්ධනයක් සිදු කර නොමැත.

(iv) රුපියල් මිලියන 580ක් පමණ.

(v) ශ්‍රී ලංකා රජය (GoSL) විසින්.

(vi) ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් සඳහා මෙම මාර්ගය ඇතුළත් නොවීම.

(vii)
- මාර්ගය පටු වීම නිසා වාහන දෙකකට එකවර මාරු වීමට අපහසු වීම නිසා ප්‍රදේශවාසීන්ට සහ සංචාරකයන්ට විශාල බාධාවක් ඇති වීම.
- දැනට සෘජු මාර්ග සබඳතාවක් නොමැති බැවින්, සියලුම වන්දනාකරුවන් සහ සංචාරකයන් පන්නෙයි - කේට්ස් මාර්ගයේ 13වන කිලෝමීටරය දක්වා ගමන් කර, එතැනින් වළුක්කෙයාරු - පුංගුඩුතිවු - කුරිකට්ටුවාන් මාර්ගයේ 7වන කිලෝමීටරයට සම්බන්ධ වී එම මාර්ගය ඔස්සේ කුරිකට්ටුවාන් ජැටිය (Jetty) වෙත යාමට සිදු වීම.

(viii) ප්‍රතිපාදන ලබා ගැනීමේ අපේක්ෂාව මත 2027 වර්ෂයේදී ඉදිකිරීමට යෝජනා කර ඇත. දළ ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 2,500ක් පමණ වනු ඇත.

(ආ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකාවේ මාසික සහල් අවශ්‍යතාව: විස්තර
## இலங்கையின் மாதாந்த அரிசித் தேவை: விபரம்
## MONTHLY REQUIREMENT OF RICE IN SRI LANKA: DETAILS

1661/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මාසික සහල් අවශ්‍යතාව සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මාසික සහල් අවශ්‍යතාව පරිභෝජන අංශ අනුව බෙදී යන ආකාරය සහ එක් එක් අංශය සඳහා අවශ්‍ය සහල් වර්ගය හා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙරට නිෂ්පාදනය කරනු ලබන සහල් වර්ග කවරේද;

(iv) එම එක් එක් සහල් වර්ගය වාර්ෂිකව නිෂ්පාදනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025 වර්ෂයේ යල කන්නය තුළ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී වර්ග, ප්‍රමාණ සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම මණ්ඩලය සතු වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවා පිහිටි ප්‍රදේශ සහ එම එක් එක් මධ්‍යස්ථානය මඟින් 2025 යල කන්නය තුළ මිලදී ගෙන ඇති වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මණ්ඩලයට අයත් සක්‍රිය හා අක්‍රිය වී ගබඩා සංඛ්‍යාව සහ ඒවා පිහිටි ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மாதாந்த அரிசித் தேவையானது அரிசி வகைகளின் அடிப்படையில் வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மாதாந்த அரிசியின் தேவையானது நுகர்வுப் பிரிவின் அடிப்படையில் எவ்வாறு அமைந் துள்ளது என்பதையும், ஒவ்வொரு பிரிவுக்கும் தேவையான அரிசி வகை மற்றும் அளவு வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) உள்நாட்டில் உற்பத்தி செய்யப்படும் அரிசி வகைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஒவ்வோர் அரிசி வகையின் வருடாந்த உற்பத்தியின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டில் சிறுபோகத்தில் நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்யப்பட்டுள்ள நெல் வகைகள், அவற்றின் அளவு மற்றும் அதற்காகச் செலவிடப்பட்ட தொகை வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி சபையின் வசமுள்ள நெல் கொள்வனவு நிலையங்களின் எண்ணிக்கை, அவை அமைந்துள்ள பிரதேசங்கள் மற்றும் ஒவ்வொரு நிலையத்தினாலும் 2025ஆம் ஆண்டின் சிறுபோகத்தில் கொள்வனவு செய்யப் பட்டுள்ள நெல்லின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iii) நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான இயங்கு நிலையிலுள்ள மற்றும் இயங்காத நிலையிலுள்ள நெற்களஞ்சியங்களின் எண்ணிக் கையும் அவை அமைந்துள்ள இடங்களும் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) monthly requirement of rice in Sri Lanka, classified separately by variety;

(ii) breakdown of the monthly rice requirement according to the consumption sectors, and the variety and quantity of rice required for each such sector, separately;

(iii) varieties of rice produced in Sri Lanka; and

(iv) annual production of each such variety of rice, separately?

(b) Will he also inform this House the -

(i) varieties and quantities of paddy purchased by the Paddy Marketing Board during the 2025 Yala Season and the expenditure incurred thereon, separately;

(ii) number and locations of the paddy purchasing centres currently operated by the Board, and the quantity of paddy purchased by each such centre during the 2025 Yala Season, separately; and

(iii) number and locations of active and inactive paddy stores belonging to the Board, separately?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - household income and expenditure survey - සෑම වසර 5කට වරක් සිදු කරන අතර මෑත කාලීනව 2012, 2016, 2019 හා 2025 වර්ෂවලට අදාළව සිදු කර ඇත. එහි 2025 වසරට අදාළ නිල දත්ත ප්‍රකාශයට පත් වනතුරු 2019ට අදාළව දත්ත අනුව ඒක පුද්ගල සහල් පරිභෝජනය - per capita rice consumption - වසරකට කිලෝග්‍රෑම් 112 ලෙස සලකමින් (ආප්ප, ඉදිආප්ප, පිට්ටු, බිරියානි, ෆ්‍රයිඩ් රයිස් වැනි සහල් ආශ්‍රිත වෙනත් ආහාර ද ඇතුළත්ව) ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මධ්‍ය වාර්ෂික ජනගහනය යොදා ගනිමින් පුද්ගල පරිභෝජනය සඳහා රටේ සහල් අවශ්‍යතාව ගණනය කරනු ලබයි.

ඒ අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි දත්ත පදනම් කර ගනිමින් සහල් වර්ග අනුව 2025 වර්ෂයේ සහල් පරිභෝජන ඇස්තමේන්තුව පහත දැක්වේ.

වගු අංක 1

| **සහල් වර්ගය** | **මාසික සහල් අවශ්‍යතාව (මෙට්‍රික් ටොන්)** | **ප්‍රතිශතය %** |
|---|---|---|
| සුදු කැකුළු | 32,843.90 | 16 |
| සුදු කැකුළු සම්බා | 4,120.46 | 2 |
| රතු කැකුළු | 43,982.25 | 22 |
| රතු කැකුළු සම්බා | 1,915.49 | 1 |
| සම්බා | 28,705.36 | 14 |
| රතු නාඩු | 6,434.13 | 3 |
| සුදු නාඩු | 62,095.34 | 30 |
| බාස්මතී | 374.65 | 0 |
| වෙනත් සහල් වර්ග | 3,556.10 | 2 |
| **ගෘහස්ථ සහල් පරිභෝජනය** | **184,027.68** | **90** |
| **සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය** | **19,937.97** | **10** |
| **එකතුව** | **203,965.64** | **100** |

ඉහත දත්ත අනුව පරිභෝජනය සඳහා මාසික සහල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 203,965.64කි.

ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ දත්ත අනුව 2025 වර්ෂයේ මෙරටට සංචාරකයන් 2,362,521ක් පමණ සංචාරයට පැමිණ ඇති අතර ඔවුන්ගේ සහල් පරිභෝජන තොරතුරු හා සහල් අවශ්‍යතාව මෙහි ඇතුළත් කර නොමැත.

(ii) ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් 2026 ඉදිරිපත් කළ නවතම සංඛ්‍යාලේඛන දත්ත අනුව මාසික සහල් අවශ්‍යතාව පහත දක්වා ඇත.

| **පරිභෝජන අංශය** | **ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය 2026 අනුව (මෙට්‍රික් ටොන්)** |
|---|---|
| සෘජු පරිභෝජනය සඳහා | 203,965.64 |
| කර්මාන්ත සඳහා මාසික අවශ්‍යතාව | 61,416.67 |
| මුළු මාසික සහල් අවශ්‍යතාව | 265,133.31 |

සෘජු පරිභෝජනය සඳහා අවශ්‍ය මාසික සහල් ප්‍රමාණය එක් එක් සහල් වර්ගය හා ප්‍රමාණය ඉහත (අ) (i) පිළිතුරෙහි අංක 01 වගුවේ දක්වා ඇති අතර කර්මාන්ත අංශය සඳහා මාසිකව අවශ්‍ය සහල් ප්‍රමාණය සහල් වර්ගය අනුව ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත.

(iii) ලංකාවේ සහල් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා වී වර්ග ප්‍රධාන වශයෙන් කොටස් 3ක් යටතේ එනම් නාඩු, සම්බා හා කීරි සම්බා ලෙස දැක්විය හැකිය. මෙම වර්ග තුන යටතේ නිෂ්පාදනය කරන වී වර්ග සහල් බවට පරිවර්තනය කිරීමේදී සහල් තැම්බීම හෝ නොකිරීම (කැකුළු) මත නිෂ්පාදනය කරන සහල් වර්ග හඳුන්වන නාමයන් පහත දක්වා ඇත.

| **නාඩු** | **සම්බා** | **කීරි සම්බා** |
|---|---|---|
| සුදු නාඩු | සුදු සම්බා | කීරි සම්බා කැකුළු |
| රතු නාඩු | රතු සම්බා | කීරි සම්බා |
| සුදු කැකුළු | සුදු සම්බා කැකුළු | |
| රතු කැකුළු | රතු සම්බා කැකුළු | |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) ඔව්.

2025 වර්ෂයේදී වී වර්ගය අනුව වගා කරන ලද වී ප්‍රමාණයන් පහත දක්වා ඇත.

| සහල් | වී වගා කළ ප්‍රමාණය (හෙක්ටෙයාර) | | එකතුව |
|---|---|---|---|
| **වර්ගය** | **2024/25 මහ** | **2025 යල** | **(හෙක්ටෙයාර)** |
| සුදු නාඩු | 472,516 | 332,535 | 805,051 |
| රතු නාඩු | 163,901 | 112,894 | 276,795 |
| සුදු සම්බා | 66,599 | 38,102 | 104,701 |
| රතු සම්බා | 12,233 | 8,751 | 20,984 |
| කිරි සම්බා | 85,223 | 49,139 | 134,362 |
| එකතුව | **800,472** | **541,421** | **1,341,893** |

(ආ) (i)

| | මිලදී ගත් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | | වැය වූ මුදල (රුපියල් මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| **2025 යල** | **කිරි සම්බා** | **සම්බා** | **නාඩු** | **කිරි සම්බා** | **සම්බා** | **නාඩු** |
| | 12.666 | 237.384 | 49,302.239 | 1,671.91 | 29,673.00 | 5,916,292.60 |

(ii)

| කලාපය | දිස්ත්‍රික්කය | ගබඩාව | වී වර්ගය සහ ප්‍රමාණය(මෙ.ටො.) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | සුදු නාඩු | රතු නාඩු | සුදු සම්බා | රතු සම්බා | කිරි සම්බා |
| අම්පාර | අම්පාර | අඩ්ඩාලච්චෙන | 513.055 | 335.808 | | | |
| | | පොතුවිල් 1 | 229.651 | 289.847 | 0 | | |
| | | අක්කරපත්තු 2 | 481.951 | 219.72 | | | |
| | | පානම | 55.59 | 310.031 | | | |
| | | ලාහුගල | 15.458 | 326.822 | | | |
| | | මාන්තොට්ටම | 1291.859 | 280.747 | 1.027 | | |
| | | සමන්තුර 01 | 509.945 | 1562.84 | | | |
| | | පාලම් කදවුර 02 | 399.454 | 530.948 | 0.978 | | |
| | | අම්පාර 02 | 781.431 | 1365.698 | | | |
| | | කොහොඹාන 02 | 416.344 | 378.082 | | | |
| | | කොහොඹාන 01 | 292 | 234.797 | | | |
| | | ගොනගොල්ල | 748.641 | 356.058 | 0.784 | | |
| | | තම්බැට්ට | 501.367 | 520.975 | | | |
| | | රජගලතැන්න | 438.972 | 196.487 | | | |
| | | නෙල්ලිකැලේ | 544.195 | 703.02 | | | |
| | | වීරගොඩ 01 | 687.503 | 463.28 | 1.068 | | |
| | | පරගහකැලේ | 170.993 | 385.087 | | | |
| | | පොල්වත්ත | 416.46 | 453.529 | 5.992 | | |
| | | සඳුන්පුර | 978.858 | 201.839 | | | |
| | | පන්නල්ගම | 130.359 | 52.708 | | | |
| | | දොලකන්ද | 36.386 | 59.819 | | | |
| | | කුඩාගල | 52.249 | 81.863 | | | |
| | | පාලමුනේ | 62.099 | 325.184 | | | |
| | | මහඔය 01 | 321.433 | 29.381 | 1.53 | | |
| | | දමන | 440.178 | 651.005 | | | |
| | | එරගම | 368.744 | 990.663 | | | |
| | | කෝමරිය 02 | 845.105 | 612.313 | | | |
| | මහනුවර | මොරයාය | 194.67 | 0.68 | | | |
| | බදුල්ල | ගිරාදුරුකෝට්ටෙ | 230.232 | 22.072 | | | |
| | | මහියංගනය | 48.745 | 12.846 | | | |
| | එකතුව | | 12203.927 | 11954.149 | 11.379 | 0 | 0 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | කල්ලාරු 01 | 374.071 | 292.357 | 2.664 | | |
| | මඩකලපුව | මුල්ලාමනේ | 8.033 | | | | |
| | | මනල්පෙඩ්ඩි | 77.678 | | | | |
| | | තුම්පකරනි | 179.059 | 15.968 | 4.21 | | 2.445 |
| | එකතුව | | 638.841 | 308.325 | 6.874 | 0 | 2.445 |
| වයඹ | කුරුණෑගල | නිකවැරටිය 02 | 98.507 | | 1.779 | | |
| | | මා-එලිය | 21.195 | | | | 0.192 |
| | | මහව | 41.53 | 0.393 | | | |
| | | වරාවැව 02 | 80.707 | 3.022 | 3.24 | | |
| | | ගල්ගමුව | 15.044 | | 0.909 | | |
| | පුත්තලම | තබ්බෝව 1 | 494.934 | | | | |
| | | රාජකදළුව | 400.63 | | 10.268 | | 2.532 |
| | | ඉපලෝගම | 0.597 | | | | |
| | | නවගත්තේගම | 108.718 | | | | |
| | | ආනමඩුව 02 | 206.877 | | | | |
| | | ආනමඩුව 01 | 707.085 | | 11.509 | | |
| | ගම්පහ | මරදගහමුල | 77.383 | 2.695 | 10.927 | | 0.21 |
| | එකතුව | | 2253.207 | 6.11 | 38.632 | 0 | 2.934 |
| දකුණ | හම්බන්තොට | වීරකැටිය | | 89.564 | | | |
| | | සූරියවැව | | 207.706 | | | |
| | | වීරවිල 01 | | 142.602 | | | |
| | | පල්ලෙමලල | | 103.548 | | | |
| | | කච්චිගල්ආර | | 138.091 | | | |
| | | සිනිමූන්න | | 167.639 | | | |
| | | දෙහිගහලන්ද 03 | 7.242 | 219.36 | | | |
| | මොණරාගල | මුතුකණ්ඩිය | 205.381 | 326.8025 | 9.549 | 4.347 | |
| | | හුලංදාව | 89.133 | 307.856 | | | |
| | | වැල්ලවාය | | 108.173 | | | |
| | | අලුත්වැව | 24.008 | 485.871 | | | |
| | රත්නපුර | කුට්ටිගල 02 | | 398.399 | | | |
| | | කල්තොට | 11.695 | 264.479 | | 3.547 | |
| | | මොරකැටිය 02 | 18.519 | 298.731 | | | |
| | එකතුව | | 355.978 | 3258.8215 | 9.549 | 7.894 | 0 |
| අනුරාධපුරය | අනුරාධපුරය | තලාව | 279.8205 | 22.267 | 6.21 | | |
| | | කැකිරාව | 72.558 | | | | |
| | | පදවි ශ්‍රී පුර | 583.239 | 75.078 | 25.332 | | |
| | | රබෑව | 842.027 | 6.756 | 17.523 | | |
| | | ජේමඩුව | 219.321 | 4.077 | 8.893 | | 0.728 |
| | | ශ්‍රාවස්තිපුර | 225.804 | 34.972 | 3.165 | | |
| | | වාහල්කඩ D02 | 276.136 | | | | |
| | | වාහල්කඩ D05 | 107.361 | | | | |
| | | වාහල්කඩ D04 | 237.107 | | | | |
| | | පදවි පරාක්‍රමපුර | 873.363 | 13.108 | 5.598 | | |
| | | කටියාව | 182.137 | | 1.87 | | |
| | | තබුත්තේගම | 438.365 | 69.931 | | | |
| | | බුල්නෑව | 42.474 | | | | |
| | | හැලබෑව | 71.255 | | | | |
| | | රාජාංගනය | 76.178 | 3.5 | | | |
| | | සේනපුර | 21.019 | | | | |
| | | නෑගම | 95.14 | | 1.947 | | |
| | | ගල්කිරියාගම | 44.425 | | 3.902 | | |
| | | පහලහල්මිල්ලෑව | 16.725 | 3.235 | | | |
| | | ඇදගල | 152.548 | 1.27 | | | |
| | | මැදවච්චිය | 17.425 | | | | |
| | | සේනානායක | 12.601 | 10 | | | 1.026 |
| | | නොච්චියාගම | 234.86 | 3.276 | | | |
| | | සම්පත් නුවර | 509.879 | | | | |
| | | ගලෙන්බිඳුණුවැව | 875.099 | | | | |
| | | හොරොව්පතාන | 1223.213 | 122.329 | 2.966 | | |
| | මාතලේ | කණ්ඩලම | 32.5385 | | | | |
| | | පැල්වෙහෙර | 1.143 | | | | |
| | එකතුව | | 7763.761 | 369.799 | 77.406 | 0 | 1.754 |
| පොළොන්නරුව | පොළොන්නරුව | අඹගස්වැව | 496.084 | | | | |
| | | මනම්පිටිය | 16.274 | | | | |
| | | වැලිකන්ද 01 | 1014.412 | 223.534 | | | |
| | | වැලිකන්ද 04 | 1185.679 | 121.286 | | | |
| | | ජයන්තිපුර | 167.172 | | | | |
| | | කුසුම්පොකුන | 48.794 | | | | |
| | | බකමූණ | 11.23 | | | | |
| | | විජයපුර | 8.685 | | | | |
| | | සිරිපුර | 13.781 | 24.566 | | | |
| | | හිඟුරක්ගොඩ | 18.72 | | | | |
| | | අභයපුර සමුපකාර | 3.486 | | | | |
| | | මැදිරිගිරිය | 21.655 | | 1.103 | | |
| | | විරපුර | 423.595 | 24.953 | | | |
| | | පන්සල්ගොඩැල්ල | 18.337 | | | | |
| | | කදුරුවෙල 04 | 265.23 | 111.085 | | | |
| | මාතලේ | හෙට්ටිපොල 01 | 331.97 | | | | |
| | එකතුව | | 4045.104 | 505.424 | 1.103 | 0 | 0 |
| උතුර | මුලතිව් | කෝම්පාවිල් | 23.522 | 161.42 | | | |
| | | උඩයාකට්ටු | 36.402 | 229.277 | | | |
| | | විද්‍යාපුරම් | 100.135 | 1126.755 | | | |
| | | තන්නිරිවටූ | | 120.507 | | | |
| | | පුදුකුඩිරිප්පු | | 165.181 | | | |
| | | මුල්ලියාවේලි 2 | 116.65 | 967.005 | | | |
| | කිලිනොච්චිය | ආර්ථික මධ්‍යස්ථානය | 292.239 | 342.052 | 0.86 | | 2.559 |
| | | රාමනාදන්පුරම් 2 | 64.631 | 290.152 | | | |
| | වවුනියාව | නෙදුන්කර්නි | 114.719 | 666.288 | 6.619 | 4.318 | 2.974 |
| | මන්නාරම | අල්කඩවේලි | 162.625 | 659.432 | | 72.75 | |
| | එකතුව | | 910.923 | 4728.069 | 7.479 | 77.068 | 5.533 |

(iii) ඔව්.

සක්‍රිය තත්ත්වයේ පවතින ගබඩා සංඛ්‍යාව -

| අ.අ | දිස්ත්‍රික්කය | ගබඩා සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුරාධපුර | 37 |
| 2 | මාතලේ | 8 |
| 3 | ත්‍රිකුණාමලය | 22 |
| 4 | මොනරාගල | 7 |
| 5 | රත්නපුර | 6 |
| 6 | හම්බන්තොට | 16 |
| 7 | මාතර | 1 |
| 8 | අම්පාර | 73 |
| 9 | බදුල්ල | 5 |
| 10 | මහනුවර | 5 |
| 11 | පොළොන්නරුව | 34 |
| 12 | මඩකලපුව | 9 |
| 13 | කුරුණෑගල | 14 |
| 14 | පුත්තලම | 7 |
| 15 | ගම්පහ | 1 |
| 16 | වවුනියාව | 8 |
| 17 | මුලතිව් | 25 |
| 18 | මන්නාරම | 3 |
| 19 | කිලිනොච්චිය | 13 |
| එකතුව | | 294 |

අක්‍රිය තත්ත්වයේ පවතින ගබඩා සංඛ්‍යාව -

| කලාපය | අක්‍රිය තත්ත්වයේ පවතින ගබඩා සංඛ්‍යාව |
|---|---|
| වයඹ | 02 |
| නැඟෙනහිර | 02 |
| දකුණ | 01 |
| අනුරාධපුර | 03 |
| උතුර | 03 |
| පොළොන්නරුව | 05 |
| අම්පාර | 04 |
| එකතුව | 20 |

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### "දිට්වා" සුළි කුණාටුවෙන් පසු රට යළි ගොඩනැඟීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය
### தித்வா சூறாவளியின் பிறகு நாட்டை மீட்டெடுப்பதற்கான நிதி மற்றும் பௌதிக முன்னேற்றம்
### FINANCIAL AND PHYSICAL PROGRESS OF RESTORING THE COUNTRY AFTER CYCLONE "DITWAH"

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

2025 නොවැම්බර් මස මෙරටට බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ජීවිත හානි, ජනතාව අවතැන්වීම් මෙන්ම නිවාස, මාර්ග, වාරිමාර්ග, කෘෂි කර්මාන්තය හා ජීවනෝපායන් ඇතුළු ක්ෂේත්‍ර රැසකට දැඩි හානි සිද්ධ වුණා. රජයේ පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව - Post-disaster Needs Assessment, PDNA - අනුව එහි භෞතික හානිය රුපියල් බිලියන 618.1ක්, ආර්ථික පාඩුව රුපියල් බිලියන 416ක් හා රට යථා තත්ත්වයට ගෙන ඒමට සහ වඩාත් ඔරොත්තු දෙන ආකාරයෙන් නැවත ගොඩනැඟීමට අවශ්‍ය මුදල රුපියල් බිලියන 1,022.5ක් ලෙස ඇස්තමේන්තු කරලා තිබෙනවා.

ඒ කියන්නේ, මුළු වියදම ගත්තොත්, රුපියල් බිලියන 2,056ක්. ඒක තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් අපි යථා තත්ත්වයට පත් වෙන්නට රජයේ පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව - Post-disaster Needs Assessment - මඟින් යෝජනා කර තිබෙන මුදල.

මේ අනුව, මා පහත ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

(1) ලෝක බැංකුව විසින් සිදු කළ මූලික තක්සේරුව මඟින් 2025.12.17වන දිනට "දිට්වා" හේතුවෙන් සිදු වූ හානිය ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1ක් ලෙස ඇස්තමේන්තු කෙරුණු අතර, 2026 මාර්තු මස සිදු කළ ආපදා පසු අවශ්‍යතා තක්සේරුව මඟින් රුපියල් බිලියන 618.1ක දේපළ හානි සහ රුපියල් බිලියන 416ක ආර්ථික පාඩු සිදු වී ඇති බවට ඇස්තමේන්තු කර තිබෙනවා.

විශේෂයෙන්ම රට යථා තත්ත්වයට පත් කර ගැනීම සහ වඩාත් ඔරොත්තු දෙන ආකාරයෙන් නැවත ගොඩනැඟීම කියන ඒ කරුණු මත ඇත්තවශයෙන්ම රුපියල් බිලියන 1,022.5ක මුදලක් මේ තක්සේරු වාර්තා මඟින් ඇස්තමේන්තුගත කරලා තිබෙනවා.

අපි අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් අවසන් තක්සේරු වාර්තාවක් නිකුත් කරලා තිබෙනවාද, ඒ අනුව සිදුවූ ජීවිත හානි, අතුරුදහන්වීම්, අවතැන්වීම්, නිවාස හා දේපළ හානි සහ ජනතාවගේ ජීවනෝපායට සිදුවූ බලපෑම පිළිබඳව අවසන් සත්‍යාපිත දත්ත කවරේද කියා.

(2) "දිට්වා" හේතුවෙන් පූර්ණ ලෙස හෝ අර්ධ වශයෙන් හානි වූ නිවාස, දේපළ සඳහා වන්දි ලබා ගැනීමට සුදුසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව, මේ වන විට වන්දි ලබා දී ඇති සංඛ්‍යාව සහ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තවදුරටත් වන්දි නොලැබූ සංඛ්‍යාව වෙන් වෙන්ව දක්වන්නේද? වන්දි ලබා දීමේ කටයුතුවල වත්මන් මූල්‍ය ප්‍රගතිය, ඒ වාගේම නැවත ගොඩනැඟීමේ භෞතික ප්‍රගතිය කුමක්ද කියන එකත් අපි අහන්න කැමැතියි.

(3) "දිට්වා" ප්‍රතිසාධන ව්‍යාපෘති 1,028ක් සඳහා රුපියල් බිලියන 515.46ක් සහ පළාත් සභා ව්‍යාපෘති 38ක් සඳහා රුපියල් බිලියන 102.22ක් ඇස්තමේන්තුගත වියදමක් යටතේ ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලබාදී ඇති බව වාර්තා වෙනවා. අපි මේ පාර්ලිමේන්තුවෙනුත් බිලියන 500කට වැඩි මුදලක් සඳහා අනුමැතියක් ලබා දීලා තිබෙනවා. එම මුදලින් මේ වන විට වැය කර ඇති මුදල හා සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද?

මොකද, මුදල් වෙන් කළාට මදි. ඒ මුදල් උපයෝගී කරගෙන ඒ සංවර්ධන කටයුතු මහපොළොවේ සත්‍යයක්, යථාර්ථයක් වෙන්නට ඕනෑ. අපි කැමැතියි, දැන ගන්න මූල්‍ය සහ භෞතික ප්‍රගතිය.

(4) "දිට්වා" සුළි කුණාටුවෙන් පසු මෙරටට එක්සත් ජාතීන්ගේ සංවිධානය - the United Nations, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - the International Monetary Fund, ලෝක බැංකුව - the World Bank, ආසියානු සංවර්ධන බැංකුව - the Asian Development Bank - සහ අනෙකුත් ජාත්‍යන්තර බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය - both multilateral and bilateral - ආයතන විසින් ලබා දීමට එකඟ වූ, රටවල් විසින් ලබා දීමට එකඟ වූ මූල්‍ය හා ද්‍රව්‍යමය ආධාර ආයතන අනුව වෙන් වෙන්ව කොපමණද? එයින් මේ වන විට සැබැවටම ලැබී ඇති ආධාර ප්‍රමාණය කොපමණද, මේ වන විට වැය කර හෝ බෙදා හැර ඇති ප්‍රමාණය කොපමණද?

(5) "දිට්වා" ව්‍යසනයෙන් හඳුනාගත් අවදානම් හා අභියෝග සැලකිල්ලට ගනිමින්, පවතින ආපදා කළමනාකරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කර, ප්‍රතිචාර දැක්වීමෙන් ඔබ්බට ගොස් විද්‍යාත්මක පුරෝකථන, පූර්ව අනතුරු ඇඟවීම්, අවදානම් අවම කිරීම හා පූර්ව සූදානම මත පදනම් වූ ඒකාබද්ධ ජාතික යන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද?

(6) මේ වන විට එල් නිනෝ තත්ත්වය ස්ථාපිත වී තවදුරටත් ශක්තිමත් විය හැකි බවත්, 2027 පෙබරවාරි දක්වා පැවතීමට ආසන්න - නොයෙකුත් අය පුරෝකථන කරනවා, 2027 පෙබරවාරි කියලා. ඉන් ඔබ්බටත් වෙන්නට පුළුවන් - සහ සියයට 100ක සම්භාවිතාවක් පවතින බවත් ලෝක කාලගුණ විද්‍යා සංවිධානය - the World Meteorological Organization, WMO - පෙන්වා දී ඇති පසුබිමක, මෙය ඉහළ ආපදාවක් සිදුවිය හැකි තත්ත්වයක් ලෙස සලකා එමඟින් ඇති විය හැකි නියඟ, ජල, ආහාර හා විදුලිබල අවදානම් සඳහා රජය සකස් කර ඇති නිශ්චිත පූර්ව සූදානම් හා හදිසි ප්‍රතිචාර සැලසුම් මොනවාද?

අපි මතක තබා ගන්න ඕනෑ නියඟයක් ඇති වෙන්නත් පුළුවන්, මහා ජල ගැලීම් ඇති වෙන්නත් පුළුවන් බව. ඒක තමයි La Niña කියන්නේ. මේ පිළිබඳව විශේෂඥයින් තවමත් අධ්‍යයනය කරනවා. El Niño, La Niña, ENSO - ඒ කියන්නේ, El Niño-Southern Oscillation - ඒ වාගේම IOD - Indian Ocean Dipole - කියලා අවස්ථා 4ක් ප්‍රධාන වශයෙන් තිබෙනවා. ඇත්තටම, ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදයට මමත්, අපේ (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මැතිතුමාත් විවිධ විශේෂඥයින් ගෙන්වලා මේ ගැන සාකච්ඡා කරනවා. ඇත්තවශයෙන්ම බරපතළ තත්ත්වයක් උද්ගත වෙනවා කියන එක තමයි ඔවුන් කියන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් රජයේ සූදානම මොකක්ද? El Niño, La Niña, ENSO and IOD වශයෙන් හඳුන්වන ඒ දේශගුණික විපර්යාස තත්ත්වය තුළ සිදු විය හැකි ව්‍යසනවලට අපි රටක් හැටියට මුහුණ දෙන්නේ කොහොමද, ඉහළ ආපදාවක් පැවතුණොත් එයට පෙර යම්කිසි පියවරක් ගන්නේ කොහොමද කියන එක මම අහන්න කැමතියි. මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, කල් දමන්නේ නැතුව මේ සඳහා අදම පිළිතුරක් ලබා දෙන්න කියලා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමනි, මේ සම්බන්ධව විස්තර තිබෙනවා. නමුත්, කාලයක් ඕනෑ. හැකි ඉක්මනට මේ විස්තර ටික ඔබතුමා වෙත ඉදිරිපත් කරන්න තව සුළු කාලයක් ලබා දෙන්න. දින කිහිපයකින් අපි උත්තර ලබා දෙන්නම්. විස්තර ටික තිබෙනවා. නමුත්, දත්ත ගොඩක් ඔබතුමා ඉල්ලනවා නේ. ඒ නිසා ඒ ටික compile කරලා questions අනුව හැකි ඉක්මනින් පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, "දිට්වා" පිළිබඳව මහා බරපතළ තත්ත්වයක් තිබෙන්නේ. රජය දන්නේ නැත්නම්, රජයට යාවත්කාලීන වූ දත්ත - up-to-date data - නැත්නම් කොහොමද රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හරහා අපේ රටට ආධාර උපකාර තවදුරටත් ගන්නේ? යෝජනා ඉදිරිපත් කරන්නේ? මේක බරපතළ ප්‍රශ්නයක්. මේ වාගේ සාධනීය ලෙස පිළිතුරු ලබාදිය හැකි ගැටලුවකට උත්තර දෙන්න කල් ඉල්ලනවා නම් ඒක බොහොම බරපතළ තත්ත්වයක්. එදා නම් කිව්වා, තහඩුවකටත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා. තහඩුවකට රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියන එක කිව්වා නම් මේ දත්ත ටික මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැරි ඇයි? ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ මැදිහත්වීම ඉල්ලුම් කරනවා, බොහොම සාධාරණව. අඩුම ගණනේ හෙටවත් උත්තර දෙන්න කියන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, එතුමා ඉතාම වගකීමෙන් නේ මේ ප්‍රශ්නය අහන්නේ. ඒ නිසා වගකීමෙන් යුතුව පිළිතුරු ටික සපයන්නත් ඕනෑ නේ. ඒක නිසා ඉක්මනට පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. අපි ඒ විධියට වැඩ කටයුතු කරමු.

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## II

## මඩකලපුව දිස්ත්‍රික්කයේ තණබිම්වල බලහත්කාරයෙන් පදිංචි වීම සහ වගා කිරීම
## மட்டக்களப்பு மாவட்டத்தில் மேய்ச்சல் நிலங்களில் அத்துமீறி குடியேறுதல் மற்றும் பயிரிடல்
ENCROACHMENT AND CULTIVATION OF PASTURELANDS IN BATTICALOA DISTRICT

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම අදම මේ ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මේ ගැටලුව ඉතාම උග්‍ර තත්ත්වයකට ඇවිල්ලා තිබෙන නිසායි හදිසි වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් විධියට කෘෂිකර්ම ඇමතිතුමාට ඉදිරිපත් කරන්නේ. ඒ වාගේම ඊයේ දවසේ මම ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය reject කරලා තිබුණා, ගරු විදේශ කටයුතු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට ඒ වෙනකොටත් පිළිතුරු සපයලා තිබුණා කියලා. හැබැයි, මම අහපු ගොඩක් ප්‍රශ්නවලට පිළිතුරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ පිළිතුරේ තිබුණේ නැහැ කියන එකත් සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

Hon. Speaker, Mayilaththamadu-Mathavanai traditional pasturelands in the Kiran and Chenkalady Divisional Secretaries' Divisions have been used by Batticaloa livestock farmers for centuries. Despite protests, litigation and repeated Government assurances, encroachment, cultivation and destruction continue. Similar concerns affect pasturelands in the Porativu Pattu and Paddipalai DS Divisions, while farmers also face restrictions accessing the Divulana Reserve.

கௌரவ சபாநாயகர் அவர்களே, நாங்கள் இந்த விடயம் சம்பந்தமாகப் பல சந்தர்ப்பங்களில் பேசியிருக்கிறோம். "மயிலத்தமடு - மாதவனை, மயிலத்தமடு - மாதவனை" என்று சொல்லிச் சொல்லி நாங்கள் களைத்துப்போய் இருக்கின்றோம். எனினும், வேறு வழி இல்லை. கௌரவ அமைச்சர் அவர்கள் இதற்கொரு தீர்வைத் தருவாரென நாங்கள் எதிர்பார்த்தோம். கடந்த மே மாதம் மாண்புமிகு சனாதிபதி அவர்கள் மட்டக்களப்புக்கு வருகை தந்தபோது, தீர்வொன்றை வழங்கினார். எனினும், இதுவரை அது அமுலுக்கு வரவில்லை. அந்தப் பின்னணியில்தான் நான் இந்தக் கேள்விகளை எழுப்புகின்றேன். I, therefore, ask the following Question from the Government:

1. What is the exact extent and legal status of the traditional pasture lands in Mayilaththamadu-Mathavanai, Porativu Pattu and Paddipalai? How much of extent remains available for grazing and how much of extent has been occupied, cultivated or allocated for other purposes?

   கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் இதுவரை வர்த்தமானிமூலம் மேய்ச்சல் தரையென நிலம் எதுவும் ஒதுக்கப்படவில்லை. மயிலத்தமடு - மாதவனை என்ற பிரதேசம் ஒரு நூற்றாண்டுக்கும் மேலாக மேய்ச்சல் தரையாகப் பயன்படுத்தப்பட்டு வருகின்றது. மாவட்டத்தில் மேய்ச்சல் தரையென ஓர் இடத்தை வர்த்தமானிமூலம் அறிவிக்கவில்லை என்பதற்காக, அங்கு மேய்ச்சல் தரை இல்லை என்று கூற முடியாது. நான் மேற்சொன்ன பிரிவுகளில் மேய்ச்சல் தரைக்கு எவ்வளவு ஏக்கர் நிலத்தை கமத்தொழில், கால்நடை வளங்களுக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் ஒதுக்கியிருக்கிறார்?

2. The President directed that 1,570 acres be made available to Mayilaththamadu-Mathavanai livestock farmers. Why has that directive not been fully implemented? Who is responsible for the delay, and on what exact date will it be implemented?

   ගරු කථානායකතුමනි, රටේ ජනාධිපතිතුමා මැයි මාසයේ මඩකලපුවේ පැවැති විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක වාඩි වෙලා කිව්වා, මහවැලි ඉඩම් අක්කර 1,570ක් තෘණ භූමිවලට ලබා දෙනවා කියලා. ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පිළිපදින්නේ නැත්තේ කවුද මේ රටේ? ගරු ජනාධිපතිතුමා දුන්නු උපදෙස් පිළිපදින්නේ නැතිව මේ රටේ නිලධාරින් වැඩ කරන්නේ කොහොමද? ගරු ජනාධිපතිතුමා මැයි මාසයේදී මඩකලපුවේදී අර විධියට කිව්වා. දැන් ඔක්තෝබර් මාසයටත් ළංවෙලායි තිබෙන්නේ. මේ වනකල් ඒකට කිසිම action එකක් අරගෙන නැහැ, ගරු ඇමතිතුමා. ගරු ඇමතිතුමා නොවෙයි, අමාත්‍යාංශයේ නිලධාරින්.

3. Who authorized cultivation or occupation of these pasturelands? Will the Government table the names of the present occupants, the extent occupied and permits or other legal authority relied upon?

   ගරු අමාත්‍යතුමාගේ අවධානයට මම මේ කාරණය යොමු කරනවා. මේ රටේ මහවැලි ඉඩම්වලට හෝ රජයේ ඕනෑම ඉඩමකට, කුඹුරුවලට ඕනෑම කෙනෙකුට හිතුමතේ ගිහිල්ලා ගිනි තියලා ට්‍රැක්ටර් දාලා හාලා, වගා කරන්න නීතියක් තිබෙනවාද, ගරු අමාත්‍යතුමනි? මේ බලන්න, මා ළඟ තිබෙන මේ photos ටික. මම මේවා සභාගත කරන්නම්. මෙහි මේ පෙනෙන තෘණ භූමිය ගිනි තියලා. පාර්ලිමේන්තුවේ colour printouts ගන්න පහසුකම් නැති නිසා black and white විධියට මේ ටික අරගෙන තිබෙන්නේ. මේ බලන්න, ට්‍රැක්ටර් දාලා හාන හැටි. මම ඔබතුමාට මේ ටික දෙන්නම්. මේ, රජයේ ඉඩම්. කවුද මේවාට අනුබල දෙන්නේ? මම ඔබතුමාට මේ ඡායාරූප ටික එවන්නම්, ගරු අමාත්‍යතුමනි; වට්ස්ඇප් හරහාත් එවන්නම්.

4. When an agriculture committee or other competent government body directs farmers to take cattle to the Divulana Reserve, but the Department of Forest Conservation refuses access, what are farmers expected to do? Which authority has the final decision, and will the Government issue binding instructions permitting access?

   ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා මඩකලපුව දිස්ත්‍රික්කයේ පෝරතිව් පත්තු, පට්ටිපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදියෙහි ගොවි රැස්වීම් පවත්වන බව. ඒ වාගේම හැම දිස්ත්‍රික්කයකම ගොවි රැස්වීම් පවත්වනවා. ඒ ගොවි රැස්වීමේදී කියනවා, "මේ කන්නයේදී ගොවිතැන් පටන් ගන්න කොට ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ කිරි හරක් ටික අරගෙන යන්න, මෙන්න මේ area එකට" කියලා. ඒ ගෙන යන්න කියන්නේ දිවුලාන කියන forest reserve එකකට. ඒ කියන්නේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කිරි ගොවීන්ට ගොවි රැස්වීමේදී රජයෙන් කියනවා, ඒ

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

තැනට කිරි හරක් ගෙනියන්න කියලා. පොළොන්නරුවේත් ඔය ප්‍රශ්නය තිබෙනවා. ගරු ඇමතිතුමා දන්නවා, කැලෑවට හරක් දමන්න බැහැ කියන ප්‍රශ්නය තිබෙන බව. එහෙම නම් විකල්පයක් දෙන්න එපායැ. මම මේ පිළිබඳව Department of Forest Conservation අයත් අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමා එක්කත් සාකච්ඡා කළා. එතුමා කිව්වා, මේකට මැදිහත් වෙන්නම් කියලා. දැන් කිරි හරක් ගෙනියන්න තැනක් නැහැ. මෙහෙන් ගොවිතැන් පටන් ගන්න ගොවීන් කියනවා කිරි හරකුන් ටික අරගෙන යන්න කියලා. පොළොන්නරුවේ අපේ ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේක පොළොන්නරුවේත් තිබෙන ප්‍රශ්නයක් බව.

5. How much of extent of pastureland in Kiran, Chenkalady, Porativu Pattu and Paddipalai has been claimed or restricted by the Mahaweli Authority, the Department of Forest Conservation, the Department of Wildlife Conservation or other State institutions, and on what legal basis?

ගරු ජනාධිපතිතුමා මඩකලපුව දිස්ත්‍රික්කයේදී මේ ප්‍රශ්නය අහලා, මහවැලියේ ඉඩම් කොච්චර තිබෙනවාද, Forest Conservation Department එකට අයිති ඒවා කොච්චර තිබෙනවාද කියලා අහලා ඉතා පැහැදිලිව කිව්වා, අක්කර 1,570ක් නිදහස් කරන්න කියලා. නමුත්, ගරු ඇමතිතුමා, මහවැලියෙන් අද මොනවාද කරලා තිබෙන්නේ? ඒ අක්කර 1,570ට වඩා දෙගුණයක ප්‍රමාණයක නීති විරෝධී ලෙස වගා කරන්න ඉඩ දීලා තිබෙනවා.

6. Farmers allege that outsiders cultivating pasturelands receive political or financial support. Will the Government investigate who is financing, facilitating or protecting them, including any involvement of politicians, Buddhist monks or State officials?

ගරු අමාත්‍යතුමනි, මේක පිටුපස ඉන්නේ කණ්ඩායමක්. සිංහල හා දෙමළ ජනතාව අතර ගැටුමක් ඇති කරන්න ඕනෑ කියන මුවාවෙන් වැඩ කරන, දේශපාලන පසුබිමක් තිබෙන කණ්ඩායමක් මේක පිටුපස ඉන්නවා. මේක පිටුපස නැගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාර අනුරාධා යහම්පත්, යම් ස්වාමීන් වහන්සේලා කිහිපනමක් ඉන්නවා. අපේ ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා දැන් මේ සභාවේ ඔබතුමාගේ පිටුපසින් වාඩි වෙලා ඉන්නවා. එතුමා ඔබතුමාට මෙය පැහැදිලි කරලා කියයි. මම මේ කියන්නේ බොරු නොවෙයි, සත්‍යය. ඒ කණ්ඩායමට මාසයකට රුපියල් 10,000ක් ගෙවනවා, ගිහිල්ලා වගා කරන්න. රුපියල් 10,000ක් සල්ලි අරගෙන කරන වගාවක් නැහැ. කුඹුරු ටික හානවා, ගිනි තියනවා, කිරි ගොවීන්ට ඉඩම් ටික නැති කරන එක තමයි කරන්නේ.

7. What action has been taken regarding unlawful occupation, burning of cultivated lands and the killing or injury of cattle? How many arrests, prosecutions and removals have occurred?

ගරු ඇමතිතුමනි, ඒ කිරි ගොවීන්ගේ එක කිරි හරකෙක් මැරුවොත්, ඒ ගොවියාගේ අවුරුද්දක ආදායම ඉවරයි. නමුත් කිරි හරක් මරනවා. සාමාන්‍යයෙන් රට තුළ නීති විරෝධී ලෙස රාජ්‍ය ඉඩමකට ඇතුළු වුණොත් මොනවාද කරන්නේ? රජයේ නීතිය ක්‍රියාත්මක වෙනවා නේ. නමුත්, ඒගොල්ලන්ට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒගොල්ලෝ කියනවා උසාවියේ තීන්දුවක් තිබෙනවා, ඒගොල්ලන්ගේ ලියකියවිලි පරීක්ෂා කරන්න කියලා. ලියකියවිලි පරීක්ෂා කරන්න මහවැලියෙන් දිනයක් දීලා තිබෙනවා. ඒ තමයි සැප්තැම්බර් මාසයේ 20වන දා; පළමු දා. අගෝස්තු මාසයේ ඉඳන් සැප්තැම්බර් මාසයේ 20 වනකල් ලියකියවිලි පරීක්ෂා කරන්න ගත්තාම, ඒ කාලය තුළ ගොවිතැන් කරලා ඉවරයි. එතකොට ආයෙත් ඒගොල්ලන්ට එතැනින් එහාට remove කරන්න කිව්වාම මොකද වෙන්නේ? පව්, ඒ මිනිස්සු! ඒ මිනිසුන්ගේ වැරැද්දක් නොවෙයි. ඒ මිනිස්සු පව්! ඒ මිනිසුන්ට ඉඩමක් දෙන්න. හැබැයි, තෘණ භූමිය දෙන්න එපා.

8. Will the Government provide a definite deadline to remove unlawful occupiers, restore affected lands and permanently demarcate and gazette sufficient pasturelands for Batticaloa livestock farmers?

கௌரவ சபாநாயகர் அவர்களே, இன்னும் ஒரு நிமிடத்தில் முடித்துக் கொள்கின்றேன்.

மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை பிரச்சினை சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் நான் உட்பட எங்களுடைய கௌரவ பாராளுமன்ற முன்னாள் மற்றும் தற்போதைய பாராளுமன்ற உறுப்பினர்கள் பேசிப் பேசி களைத்துப்போய் இருக்கின்றார்கள். கடந்த காலத்தில் நான் நீதிமன்றத்தை நாடி, நீதிமன்றக் கட்டளை ஊடாக 2022ஆம் ஆண்டில் அந்தப் பண்ணையாளர்களின் மேய்ச்சல் தரையை அபகரிப்புச் செய்கின்றவர்களை அங்கிருந்து வெளியேற்றி இருந்தேன். தற்பொழுது நாங்கள் மீண்டும் சட்ட நடவடிக்கையை நாடப்போகின்றோம். அந்த இடத்தில் ஓர் இன முரண்பாட்டை உருவாக்குவதற்கான சகல ஆயத்தங் களும் நடந்திருக்கின்றன. இது தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கும் பாதிப்பாக அமையும். எங்களுடைய தமிழ் பேசும் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையில் இன ரீதியான முறுகல் ஏற்படுவதைத் தவிர்க்க முடியாத அளவுக்கு அங்கு ஒரு பிரச்சினை வரப்போகின்றது. எனவே, இந்தப் பிரச்சினைக்கு உடனடியாக ஒரு தீர்வை வழங்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, பண்ணையாளர்களின் பொறுமைக்கும் ஓர் எல்லை இருக்கும். எனவே, இந்தப் பிரச்சினைக்கான ஒரு தீர்வை நீங்கள் உடனடியாக வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණු සියල්ලම සත්‍යයි. මඩකලපුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා දැනුම් දීලා තිබෙනවා හෙට පාර්ලිමේන්තුවේදී ඔය ප්‍රශ්නය සාකච්ඡා කර ගන්න පැමිණෙන බව. ඒවාත්, තමුන්නාන්සේ ඉදිරිපත් කළ ඒවාම තමයි. තමුන්නාන්සේටත් ඒක දැනුම් දෙයි. මම දන්නේ නැහැ දැනටත් දැනුම් දීලා තිබෙනවාද කියලා. හෙට උදේ 11.00ට කාරක සභා කාමර අංක 8දී අදාළ නිලධාරින් සහ සියලුදෙනා එක්ක සාකච්ඡාවක් දාලා තිබෙනවා. අපි හෙට එතැනදී ඔය කරුණු ටික කථා කරමු. තමුන්නාන්සේ කියපු කාරණා ඔක්කෝම ඇත්ත; ප්‍රතික්ෂේප කරන්න මොකවත් නැහැ. අපි ඒක ගැන කථා කරලා විසඳුමක් හදා ගනිමු.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පොඩි පැහැදිලි කර ගැනීමක් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු අමාත්‍යතුමනි, මේ අහපු ප්‍රශ්නවලට ඔබතුමා මට ඉදිරි දවසකදී පිළිතුරු ලබා දෙන එක හොඳයි. මොකද, අපට උසාවි ක්‍රියාමාර්ගයට යන්න ඔබතුමා දෙන ප්‍රකාශය වැදගත්. ඒ නිසා මම ඉල්ලා සිටිනවා පාර්ලිමේන්තුව තුළ ඒ පිළිතුර ලබා දෙන්න කියලා.

හෙට රැස්වීම ගැන අපට කිව්වේ නැහැ, ගරු අමාත්‍යතුමනි.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
දැනුම් දෙයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
දැන් ඔබතුමා කියපු නිසා අපේ මන්ත්‍රීවරු අනිවාර්යයෙන් හෙට උදේ 11.00ට එනවා. කාරක සභා කාමර අංකය අපට කියන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
කාරක සභා කාමර අංක 8.

ඔබතුමාගේ ප්‍රශ්නවලටත් උත්තර දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ස්ථාවර නියෝග 27(2) යටතේ කලින් අහපු ප්‍රශ්නයකුත් තිබෙනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඒවා යල් පැන ගිහිල්ලා, ගොඩක් කල් ගිහිල්ලා නේ තිබෙන්නේ. අපේ විපක්ෂ නායකතුමා ඊට පස්සේ ඒ හා සමාන ප්‍රශ්න ගොඩක් කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් ඇහුවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
එතකොට, කිවුල් ඔය සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නය?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
කිවුල් ඔය මහවැලි ව්‍යාපෘතිය සම්බන්ධව නේද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඒ සම්බන්ධව ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට තවමත් පිළිතුර ලැබිලා නැහැ, ගරු ඇමතිතුමා. ඒකත් ඉක්මනට ලබා දෙන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඒක මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඒක ක්‍රියාත්මක වෙනවා කියලා ඒ දිස්ත්‍රික්කයේ නිලධාරින් කියනවා. ඔබතුමා පිළිතුරක් දෙන්න, ගරු ඇමතිතුමනි.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි ඒකට උත්තරය දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා.

2026.07.10 දින ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම.

## නැගෙනහිර පළාතේ ධීවරයින් මුහුණ දෙන ගැටලු: ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கிழக்கு மாகாண மீனவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள்: கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று
## ISSUES FACED BY FISHERMEN IN EASTERN PROVINCE: STATEMENT BY MINISTER OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் 2026.07.10ஆம் திகதி கௌரவ (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப் பட்ட வினாவுக்கான விடை பின்வருமாறு:

மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்கள் மற்றும் வடக்கு, கிழக்கு மாகாணங்களின் ஏனைய கரையோர மாவட்ட மக்களின் பிரதான வாழ்வாதாரம் கடற்றொழில் ஆகும்.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

மட்டக்களப்பு மாவட்டத்தில் இயந்திரமற்ற பாரம்பரிய கடற்றொழில் படகுகள் 3,494உம், வெளிப்பக்க இயந்திரம் பொருத்தப்பட்ட கண்ணாடிநார் படகுகள் - fibreglass boats - 1,560உம், பலநாள் படகுகள் 409உம், இயந்திரம் பொருத்தப்பட்ட பாரம்பரிய படகுகள் 10உம், உட்பக்க இயந்திரம் பொருத்தப்பட்ட ஒருநாள் படகுகள் - one-day boats - 06உம் என அனைத்து வகைகளையும் உள்ளடக்கியதாக சுமார் 5,546 படகுகள் உள்ளன. அவ்வாறே அம்பாறை மாவட்டத்தில் சுமார் 2,110 படகுகள் உள்ளன. இவ்விரு மாவட்டங்களிலும் அண்ணளவாக 58,510 மீனவர்கள் உள்ளனர். இதற்கு மேலதிக மாக, கடற்றொழிலுடன் தொடர்புடைய சார்புத் தொழில்களில் ஈடுபடும் பெருமளவான மக்களும் இம்மாவட்டங்களில் வசிக்கின்றனர். இதுதான் இந்த இரண்டு மாவட்டங்களிலும் இருக்கின்ற நிலைமை!

கடற்கொள்ளையர்களைக் கட்டுப்படுத்துவதற்கு எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள்: இவ்விடயம் தொடர்பில் நாங்கள் மட்டக்களப்பு மாவட்டத்தில் மீனவர்களுக்கான ஒருங்கிணைப் புக் குழுக் கூட்டம் ஒன்றை நடாத்தினோம். அதுமாத்திரமல்ல, அங்கிருக்கின்ற எங்களுடைய பிரதிப் பணிப்பாளரும் சேர்ந்து அந்தந்தப் பிரதேசங்களில் இருக்கின்ற பிரச்சினைகள் தொடர்பாகப் பேசினார். மேலும், அங்கிருக்கின்ற கடற் படையினரோடு தொடர்புகொண்டு இது சம்பந்தமாகப் பேசப்பட்டு இருக்கின்றது. அதேபோன்று, கடற்படை, பொலிஸ், கடற்றொழில் திணைக்களம் உள்ளிட்ட அனைவருடனும் இது சம்பந்தமாகத் தொடர் பேச்சு வார்த்தைகள் நடாத்தப்பட்டு இருக்கின்றன.

அந்தப் பேச்சுவார்த்தைகளின் அடிப்படையில் எடுக்கப் பட்ட விடயங்களை உங்களுடைய கவனத்துக்குக் கொண்டு வருகின்றேன். மட்டக்களப்பு மற்றும் அம்பாறை மாவட்டங்களை அண்டிய கடற்பரப்பில் தொழில்புரியும் பலநாள் படகுகளால் மீன்களைப் பிடிப்பதற்காக கடலில் விரிக்கப்பட்டுள்ள வலைகளில் சிக்கும் மீன்களை வேறு நபர்கள் திருடுவது தொடர்பாகப் பல சந்தர்ப்பங்களில் முறைப்பாடுகள் கிடைக்கப்பெற்று இருக்கின்றன. இந்த மீன் திருட்டானது கடலில் இடம்பெறுவதால், அது தொடர்பில் தேவையான நடவடிக்கைகளை மேற் கொள்ளுமாறு இலங்கை கடற்படைக்கு அறிவிக்கப் பட்டுள்ளதுடன், இவ்விடயம் சம்பந்தமாகப் பேசப்பட்டும் இருக்கின்றது. இது ஒரு திருட்டுச் செயல் என்பதால், நாட்டின் பொதுவான சட்டத்துக்கு அமைவாகவே நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். இது தொடர்பில் உரிய சட்ட நடவடிக்கை எடுக்குமாறு பொலிசாருக்கும் உத்தரவுகள் பிறப்பிக்கப்பட்டுள்ளன. அதற்கமைய, 2025.06.26ஆம் திகதியன்று மட்டக்களப்பு உதவி கடற்றொழில் பணிப்பாளர், இலங்கை பொலிஸ், இலங்கை கடற்படை, மட்டக்களப்பு மாவட்டச் செயலாளர், மண்முனை பிரதேச செயலாளர், இலங்கை கரையோரப் பாதுகாப்புத் திணைக்கள அதிகாரிகளின் பங்குபற்றுதலுடன் இது தொடர்பாக ஒரு கூட்டம் நடாத்தப்பட்டு, இச்செயலைத் தடுப்பதற்காகச் சட்டத்தை மிகக் கடுமையாக அமுல்படுத்துவதாகத் தீர்மானிக் கப்பட்டது.

இருப்பினும், இத்திருட்டானது இரவு வேளையில் இடம் பெறுவதாலும், சிறிய படகுகளைப் பயன்படுத்தி முன்னெடுக் கப்படுவதாலும், இந்தச் சட்டவிரோத செயல் தொடர்ந்தும் இடம்பெற்று வருவதாகத் தகவல்கள் தெரிவிக்கின்றன. பலநாள் படகுகள் தமது வலைகளைக் கடலில் விரித்திருக்கும் வேளையில், அங்கு வரும் சிறிய படகுகள் இவ்வலைகளில் சிக்கியுள்ள மீன்களைச் சேகரித்துச் செல்கின்றன. இது தொடர்பில் அங்கிருக்கின்ற மீனவர்களால் தொடர்ந்து முறைப்பாடுகள் முன்வைக்கப்படுகின்றன. இதன் காரணமாக, இது தொடர்பில் 2026.06.14ஆம் திகதி மட்டக்களப்பு மற்றும் அம்பாறை மாவட்ட உதவிப் பணிப்பாளர்களின் பங்குபற்றுதலுடன், இலங்கை கடற்படைத் தளபதியின் தலைமையில் கலந்துரையாடல் ஒன்று நடாத்தப்பட்டதுடன், அனைத்துத் தரப்பினரதும் பங்களிப்புடன் சட்டத்தை அமுல்படுத்தும் நடவடிக்கைளை விரிவுபடுத்துவதற்கும் தீர்மானிக்கப்பட்டது. இந்தத் திருட்டு நடவடிக்கையால் அதிகளவு மீனவர்கள் பாதிக்கப்பட்டு இருப்பது உண்மை! இது தொடர்பாக மேலதிக நடவடிக்கைகள் எடுக்கப்பட்டு இருக்கின்றன.

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் இந்தக் கேள்வியைக் கேட்டு பல வாரங்கள் ஆகிவிட்டன. இப்பொழுது இந்தக் கடற்கொள்ளை சம்பந்தமான பிரச்சினை ஓரளவு தீர்ந்திருக்கும் என்றே நான் நினைக்கின்றேன். எது எவ்வாறு இருந்தபோதிலும், இந்தப் பிரச்சினை தொடருமாக இருந்தால், நிச்சயமாக உரிய நடவடிக்கைகளை எடுப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்.

அடுத்து, நீங்கள் கேட்டிருக்கும் முக்கியமான கேள்விதான் VMS இயந்திரம் பொருத்துவது தொடர்பானது. இது தொடர்பாக நாங்கள் இதற்கு முன்னரும் பேசியிருக்கின்றோம்.

- படகு கண்காணிப்பு முறைமை - VMS - உபகரணங் களுக்கான மாதாந்தக் கட்டணங்கள் மற்றும் அதிகளவான திருத்தச் செலவுகளை மீளாய்வு செய்து குறைப்பதற்கும் மின்கல - battery - பாதுகாப்புக்கான வசதிகளைச் செய்து கொடுப்பதற்குமான நடவடிக்கைகள்:

இலங்கையானது, இந்தியப் பெருங்கடல் சூரை மீன் ஆணையத்தின் - IOTC - ஓர் உறுப்பு நாடாகும். அதற்கமைய, இந்தியப் பெருங்கடலில் கடற்றொழிலில் ஈடுபடும் உள்நாட்டுப் படகுகள் சர்வதேச விதிகளுக்கு அமைவாகவே கடற்றொழிலில் ஈடுபட வேண்டும். கடற்றொழில் திணைக் களத்தில் பதிவு செய்யப்பட்டுள்ள அனைத்து பலநாள் படகுகளும் படகு கண்காணிப்பு முறைமையை - VMS - பொருத்துவது கட்டாயமாகும். இப்படகுகளில் VMS உபகரணங்களைப் பொருத்துவதற்காக, அவுஸ்திரேலியா அரசாங்கத்தின் நன்கொடையாக 4,200 படகு கண்காணிப்பு உபகரணங்களைக் கொண்ட முழுமையான படகு கண்காணிப்பு முறைமையொன்று 2021ஆம் ஆண்டு கடற் றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்துக்குக் கிடைத்தது. 2021.01.01ஆம் திகதிக்கு முன்னர் பதிவு செய்யப்பட்ட படகுகளுக்கு இவ்வுபகரணங்கள் இலவசமாகப் பொருத்தப்பட்டன. அதன் பின்னர் பதிவு செய்யப்படும் படகுகளுக்கு, பணத்தைச் செலுத்தி VMS உபகரணங்களைக் கொள்வனவு செய்து பொருத்திக்கொள்ள வேண்டும்.

அவுஸ்திரேலியா அரசாங்கம் இவ்வாறான VMS படகு கண்காணிப்பு முறைமையொன்றை வழங்குவதற்கு முக்கிய காரணம், அன்றைய காலகட்டங்களில் இலங்கையிலிருந்து கூடுதலான மக்கள் அவுஸ்திரேலியாவுக்கு சட்டவிரோதமாகச் சென்றமைதான். அதனைத் தடுக்க வேண்டிய தேவை

அவுஸ்திரேலியா அரசாங்கத்துக்கு இருந்தது. அதற்காகவே, இந்த காண்காணிப்பு இயந்திரங்கள் பொருத்தப்பட்டன என்பதை நாங்கள் யாவரும் அறிவோம். VMS உபகரணங் களின் திருத்தச் செலவானது அத்திருத்தத்தின் தன்மையைப் பொறுத்தே தீர்மானிக்கப்படும். VMS உபகரணங்களைச் செயலிழக்கச் செய்வதற்காக, மின்கலத்திலிருந்து VMS உபகரணங்களைக் கழற்றி அகற்றும் சம்பவங்கள் இடம்பெறுவது, VMS பிரிவுக்குக் கிடைக்கும் சமிக்ஞைகள் - signals - மூலம் உறுதிப்படுத்தப்பட்டுள்ளது. எனவே, VMS உபகரணங்களால் படகின் மின்கலத்துக்கு எந்தவிதமான பாதிப்பும் ஏற்படுவதில்லை.

VMS உபகரணங்களைப் பொருத்துவதற்கு மீனவர்கள் பெரியதொரு தொகையைச் செலுத்தவேண்டி இருக்கின்றது. அதற்கு ஏதாவது நிவாரணத்தைப் பெற்றுக்கொடுக்க முடியுமா என நீங்கள் கேட்டிருந்தீர்கள். எங்களுடைய கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சானது மறுபடியும் இது சம்பந்தமாக அவுஸ்திரேலியா அரசாங்கத்துடனும் நோர்வே அரசாங்கத்துடனும் அங்கிருக்கின்ற பல நிறுவனங்களுடனும் பேச்சுவார்த்தை நடத்தியிருக்கின்றது. எங்களுடைய மீனவர்கள் இந்த உபகரணத்தைப் பொருத்திக்கொள்வதற்கு ஏதுவான உதவிகளைச் செய்வதாக அவை உறுதியளித்து இருக்கின்றன. அவ்வாறாக உதவி கிடைக்கின்றபோது, நிச்சயமாக நாங்கள் எங்களுடைய மீனவர்கள் தொடர்பில் கூடுதலான கவனத்தைச் செலுத்துவோம் என்பதை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

- கச்சான் காற்று வீசும் காலத்தைக் கருத்திற்கொண்டு, மீனவர்களின் ஓய்வு நேரத்துக்கு ஏற்படும் தடைகளைத் தவிர்ப்பதற்காக அனுமதிப்பத்திரச் செயன்முறையை எளிதாக்கி, Canan படகுகளுக்கு முன்னர் நடைமுறை யிலிருந்த 14 நாட்கள் செல்லுபடியாகும் அனுமதிப் பத்திர முறையை மீண்டும் அறிமுகப்படுத்தல்: இது தொடர்பாக இப்போதும்கூட அங்கிருக்கின்ற மீனவர்கள் பேசி இருக்கின்றார்கள். நாங்கள் இது குறித்து அவர்களுடன் கலந்துரையாடி வருகின்றோம். இது தொடர்பில் கூடிய சீக்கிரம் அவர்களுக்குச் சாதகமான பதில்களைப் பெற்றுக்கொடுக்க இருக்கின்றோம். இவ்வாறான படகுகளைப் பயன்படுத்துவதற்கான காலஎல்லை, ஒழுங்குவிதிகள் மற்றும் ஒழுங்குமுறைகள் இருக்கின்றன. அவற்றின்கீழ் நிச்சயமாக நாங்கள் மீனவர்களுக்கான சகல விடயங்களையும் செய்வதற்குத் தயாராக இருக்கின்றோம்.

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் கேட்ட கேள்வி மிகவும் முக்கியமானது. பதில் வழங்குவதற்குத் தாமத மானாலும், நாங்கள் கடந்த காலங்களில் எடுத்த நடவடிக்கைகள் பயனளித்து இருப்பதாகவே எங்களுக்குத் தெரியவருகின்றது. எது எவ்வாறு இருந்தபோதிலும், இந்தப் பிரச்சினை தொடர்ந்து இருக்குமாக இருந்தால், அது தொடர்பில் கூடுதலான கவனத்தைச் செலுத்தி, உரிய தீர்வைக் காண்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமென நான் இங்கு உறுதியளிக்கின்றேன்.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களுக்கு எங்களுடைய மக்கள் சார்பில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனெனில், அவர் மிகத் தெளிவான பதிலை எங்களுக்கு வழங்கினார். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அந்த மீனவர்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு எடுக்கின்ற முயற்சிகளை நாங்கள் உண்மையிலேயே பாராட்டுகின்றோம். எனினும், இந்தப் பிரச்சினை தொடர்ந்தும் காணப்படுகின்றது. Steamboat என்று சொல்லப்படுகின்ற சிறிய படகில் சென்று மீன்களைக் கொள்ளையடிக்கின்ற செயல் இன்றும் இடம்பெற்றுக் கொண்டுதான் இருக்கின்றது.

நேற்று நீங்கள், இன்று பதில் அளிப்பதாகச் சொன்னீர்கள். அதற்கிணங்க, இன்று காலையில் நான் மீனவர்களைத் தொடர்புகொண்டு இவ்விடயம் பற்றி கேட்டபோது, இந்தச் செயல் கடந்த ஒரு வாரகாலமாக அதிகரித்து இருப்பதாகச் சொன்னார்கள். நேற்று இரவுகூட, வாழைச்சேனை, வாகரை கடற்பரப்பில் பல நாள் படகுகளில் சென்று வலைகளை விரித்திருந்த மீனவர்களின் கொப்பரா, தளப்பத் போன்ற பெரிய மீன்களை கொள்ளையர்கள் வலைகளுடன் சேர்த்து வெட்டிக்கொண்டு போயிருக்கிறார்கள். அவ்வாறு அவர்கள் செல்லும்போது, அந்த மீனவர்களிடம் சவால்விட்டுச் சென்றிருக்கிறார்கள். அதாவது, அந்தக் கொள்ளையர்கள் முகக்கவசம் அணிந்து, படகு உரிமையாளர்களின் அருகில் வந்து, "நீங்கள் எங்கு வேண்டுமானாலும் போய் சொல்லுங்கள்! நாங்கள் இதை நிறுத்தப் போவதில்லை" என்று அச்சுறுத்திவிட்டுப் போயிருக்கிறார்கள்.

கௌரவ அமைச்சர் அவர்களே, இது உங்களுடைய காலத்தில் ஏற்பட்ட பிரச்சினை அல்ல; 10 வருடங்களுக்கும் மேலாக இடம்பெற்று வருகின்ற விடயம்! கடற்படையினரும் பொலிசாரும் இராணுவத்தினரும் தொடர்ச்சியாக இவ்வாறான வர்களைக் கைதுசெய்வதும், அவர்கள் இரண்டு - மூன்று நாட்களில் பிணையில் வெளியில் வருவதும் வழக்கமான ஒரு விடயமாக மாறிவிட்டது.

இன்று இது ஒரு தொழிலாகப் போய்விட்டது. முதலில் 2-3 ஊர்களில் இருந்த இந்தக் கொள்ளையடிக்கும் தொழில் - இரவு நேரத்தில் boatஇல் கடலுக்குச் சென்று வலைகளை வெட்டி மீன்களைக் கொள்ளையடிக்கின்ற தொழில் - இப்போது கிழக்கு மாகாணத்தின் பல பகுதிகளிலும் பரவியிருக்கின்றது. இலட்சக் கணக்கான ரூபாய் செலவு செய்து கடலுக்குச் சென்று, பல நாட்கள் மீன்பிடியில் ஈடுபட்டு, பிடித்த அவ்வளவு மீன்களையும் கரைக்குத் திரும்புவதற்கு முதல்நாளில் எல்லாப் பிரதேசங்களில் இருந்தும் சிறிய boatஇல் வருகின்றவர்கள் கொள்ளையடித்துச் செல்கின்றார்கள். இதனால் அந்த மீனவர்கள் எந்தவொரு வருமானமும் இல்லாமல் வெறும் கையுடனே வீட்டுக்கு வருகின்றார்கள். இன்று அந்த மீனவர்கள் மிகவும் கஷ்டத்திலே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். Boat உரிமையாளர்களுக்கு மாத்திரமல்ல, அந்த boatஇல் மீன்பிடிக்கச் செல்கின்றவர்களுக்கும் எந்த விதமான வருமானமும் இல்லாத நிலைமையே இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, இதற்கு ஒரேயொரு வழி pass நடைமுறையைக் கொண்டுவருவதுதான். இப்பொழுது நீங்கள் IMUL boatக்கு - பெரிய boatக்கு - pass நடைமுறையை வைத்திருக்கிறீர்கள். இதனால் அந்த boatஇல் எத்தனை பேர் போகிறார்கள், எந்த engineஐப் பாவிக்கிறார்கள் என்று Sri Lanka Navy check பண்ணுகிறது. ஆனால், இந்தச் சிறிய boatஇல் அதையெல்லாம் check பண்ணுவதில்லை. எனவே, சிறிய boatக்கும் pass நடைமுறையைக் கொண்டுவாருங்கள்! கொள்ளையடிக்கப் போகின்றவர்கள் boatஇல் high-speed engineஐ மேலதிகமாகக் கொண்டுபோகிறார்கள். அதுமாத்திர மன்றி, மேலதிகமாக டீசலையும் கொண்டுபோகிறார்கள்.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

சின்ன boatஇல் - steamboatஇல் - போகின்றவர்களுக்கு அவ்வாறான தேவையில்லை. எனவே, நீங்கள் கடற்படையினூடாக அல்லது police post ஊடாக pass நடைமுறையைக் கொண்டுவாருங்கள்! Pass நடைமுறையைக் கொண்டுவந்தால், சிறிய boat உரிமையாளர்களும் passஐக் கொண்டுசெல்ல வேண்டிவரும். இன்று multi-day boats உரிமையாளர்கள் - பல நாட்கள் கடலில் இருந்து மீன்பிடிக்கின்ற மீன்பிடிப் படகு உரிமையாளர்கள் - தங்களுடைய தொழிலைக் கைவிடுகின்ற அளவுக்கு நிலைமை இருக்கின்றது. பலர் இன்று இந்தத் தொழிலைக் கைவிட்டு இருக்கிறார்கள். *[இடையீடு]* இதில் பாதுகாப்புப் படையினருக்கும் தொடர்பு இருக்கின்றது. நான் இதைச் சொல்லாமல் இருந்தேன். இன்று அதையும் சொல்லவேண்டி இருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරීම අවසන් කරන්න.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Sir, give me a minute. This is a very important matter. I will wind up.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயத்தில் அங்கிருக்கின்ற பாதுகாப்புப் பிரிவினருக்கும் தொடர்பு இருக்கின்றது. ஏனென்றால், ஒன்றுமே இல்லாமல் கடலுக்குச் சென்று, 2 இலட்சம் ரூபாய் - 5 இலட்சம் ரூபாய் பெறுமதியான மீன்களைக் கொள்ளையடித்து வருகின்றவர்கள் கரைக்கு வந்த பின்னர், தங்களை அனுமதித்த பாதுகாப்புப் பிரிவினருக்கும் சில உதவிகளைச் செய்கிறார்கள். எல்லோரும் அல்ல, ஒரு சிலர்! கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுத்து, pass நடைமுறையை உடனடியாக அமுல்படுத்துங்கள்! அதனைக் கொண்டுவர முடியுமாக இருந்தால், இந்தக் கொள்ளை நடவடிக்கையை எங்களால் கட்டுப்படுத்த முடியும். இல்லாவிட்டால், மிக மோசமான நிலைமையே ஏற்படும். இப்பொழுது, நீங்கள் IDAY boatக்கு டீசல் மானியம் வழங்குகின்றீர்கள். அதேபோன்று, IMUL boatக்கும் அந்த மானியத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பதாக நாங்கள் கேள்விப்படுகின்றோம். ஆனால், மீனவர்களிடம் இருந்து அது தொடர்பான எந்தத் தகவலும் இல்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் IMUL boatக்கும் டீசல் மானியத்தை வழங்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, VMS தொடர்பான விடயத்தை நாங்கள் கட்டாயம் ஏற்றுக்கொள்கின்றோம். எனினும், அதற்காகச் செலுத்துகின்ற annual fees, maintenance costs மிக அதிகமாக இருக்கின்றது. அதில் இருக்கின்ற gadgetsஐத் திருத்துவது என்றால், மிகக் குறைந்த செலவில் திருத்த முடியும். இந்த உபகரணத்தைக் கொழும்பில் இருந்து வந்து திருத்துவதால், அதிக செலவு ஏற்படுகின்றது. இது கிழக்கு மாகாணத்தில் மாத்திரம் உள்ள பிரச்சினை அல்ல; நாடு முழுவதிலும் உள்ள பிரச்சினை! கௌரவ அமைச்சர் அவர்களே, அந்தந்த மாவட்டங்களில் அந்த உபகரணத்தைத் திருத்துவதற்கான ஏற்பாடுகளைச் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය ඇසීමට ඔබතුමා විනාඩි පහක් ගත්තා.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே!

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், இது மிகவும் முக்கியமானதொரு பிரச்சினையாக இருக்கின்றது. கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களே, 'சண்டியன் இல்லாத சந்தியில் நொண்டியனும் சண்டியனாம்' என்று சொல்வார்கள். மட்டக்களப்பு மாவட்டத்தில் இவ்வாறான கடற்கொள்ளையில் ஈடுபடுகின்றவர்கள் யார் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும். கடந்த காலங்களில் இது பற்றி வெளியில் சொல்வதற்குக்கூட பயமாக இருந்தது. நீங்கள் சொன்ன இந்த விடயம் சம்பந்தமாக நேற்று எனக்கும் தெரிய வந்தது. உடனடியாக நாங்கள் பாதுகாப்பு அதிகாரிகளுடன் இது சம்பந்தமாகப் பேசினோம். அதுமாத்திரமல்ல, இது தொடர்பில் உடனடியாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்ற அடிப்படையில், நாங்கள் பாதுகாப்புப் படையினருடன் மீண்டும் விசேட கலந்துரையாடல் ஒன்றை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுத்திருக்கின்றோம். இந்தக் கொள்ளையர்களின் செயற்பாடுகளைத் தடுப்பதற்கு, நீங்கள் சொல்வதுபோல இந்தப் படகுகளுக்கான pass நடைமுறையைக் கொண்டுவர வேண்டும். அதுமாத்திரமல்ல, சிறிய படகுகளுக்கான நிறத்தை மாற்றுவதற்குக்கூட நாங்கள் இப்பொழுது நடவடிக்கை எடுத்து வருகின்றோம். கூடிய சீக்கிரத்தில் இவை அமுலாக்கப்படும். இதன்மூலம் கடற்கொள்ளையர்களிடமிருந்து மீனவர்களை மீட்டெடுக்க முடியுமென நாங்கள் நம்புகின்றோம்.

கௌரவ உறுப்பினர் அவர்களே, அங்கு இருக்கின்ற பாதுகாப்புப் படையினருக்கும் இதில் தொடர்பு இருப்பதாக நீங்கள் இன்னுமொரு குற்றச்சாட்டை முன்வைத்தீர்கள். அங்கே இருக்கின்ற ஒரு சிலர் இதில் ஈடுபடுவதாக அங்கிருக்கின்ற மீனவர்கள் எங்களிடமும் முறையிட்டு இருக்கிறார்கள். பாதுகாப்புப் படையினருக்கு இதில் தொடர்பு இருக்குமாக இருந்தால், அவர்கள் எந்தப் பிரதேசத்தில் இருக்கிறார்கள், எங்கிருந்து வந்தார்கள் என்பதை ஆதாரங்களோடு முன்வைத்தால், நிச்சயமாக அது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுப்பதாக பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்களும் கூறி இருக்கின்றார்கள்.

அடுத்து, VMS இயந்திரம் சம்பந்தமான விடயத்தில் நாங்கள் flexibleஆன - நெகிழ்வான - போக்கைக் கையாள இருக்கின்றோம். அது தொடர்பாக நாங்கள் மீனவர்களுடனும் மீனவச் சங்கங்களுடனும் பேசி வருகின்றோம். இது தொடர்பில் நாங்கள் வெகு சீக்கிரத்தில் நல்ல முடிவுகளை எடுப்போமெனக் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி. வணக்கம்!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, ගරු කේ.ඩී. ලාල් කාන්ත අමාත්‍යතුමා. Hon. Minister, you have 16 minutes.

## අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
## ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம்
## PROMOTION OF EXPORT AGRICULTURE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.10]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - පරිපූරක මුදල - ශීර්ෂය 119 - වැඩසටහන 01 ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙන්න වටපිටාව සකස් වෙලා තිබෙන්නේ මූලික කරුණු දෙකක් නිසායි. එකක් තමයි, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තනතුරු නාමවල යම් ගැටලු ප්‍රමාණයක් තිබීම. ඒ නාම වෙනස් කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අනුව ඒවා වෙනස් කර ගැනීම සඳහා වන සංශෝධන අද දින ඉදිරිපත් කර තිබෙනවා.

ඊට අමතරව, අපනයන කෘෂි භෝග නාමකරණය කර ගැනීම සම්බන්ධයෙන් එතෙක් තිබුණු පනත තුළ අපට වෙනස් කරගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා. මෙන්න මේ මූලික කාරණා දෙක සම්බන්ධ කරගෙන තමයි මේ සංශෝධනයට අවශ්‍ය වටපිටාව සකස් වුණේ.

1972දී ආරම්භ කරන ලද සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව 1992 අංක 46 දරන පාර්ලිමේන්තු පනත මඟින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලෙස නම් කිරීමෙන් පසුව සංවිධානාත්මක ක්‍රමවේදයකින් සංවර්ධන හා පර්යේෂණ කටයුතු දියත් කරනු ලැබුවා. 1992 අංක 46 දරන පාර්ලිමේන්තු පනත ගෙන ඒම සම්බන්ධයෙන් එවකට මේ වෙනුවෙන් මැදිහත් වුණු නිලධාරින්ටත්, විෂය භාර ඇමතිවරයාටත් යම් ප්‍රශංසාවක් මම කරන්න ඕනෑ. 1972දී තිබුණේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව කියලා. ඒකෙදි "සුළු" කියලා කොටසක් ඇතුළත් කරලා තිබෙනවා. මෙන්න මේ "සුළු" කියන කොටස දැන් අයින් කරලා තිබෙනවා. "සුළු" කියන එකෙන්ම ඒකේ වටිනාකම හැල්ලු වීමක් වෙනවා. 1992 අංක 46 දරන පාර්ලිමේන්තු පනත මඟින් "සුළු" කියන කොටස අයින් කරලා, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නමින් නාමකරණය කිරීම ඇත්තටම ප්‍රශංසනීය කටයුත්තක්.

වාර්ෂික නිෂ්පාදනයෙන් සියයට 32කට අධික පරිමාවක් අපනයනය කරනු ලබන තේ, පොල්, රබර් හා කජු යන ප්‍රධාන භෝග හැර, වාර්ෂික භෝග හා අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් කළ යුතු යැයි නම් කරන ඕනෑම භෝගයක් අපනයන කෘෂි භෝගයක් ලෙස සලකන අතර, ගම්මිරිස්, සාදික්කා, කරාබු නැටි, කරදමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැඟිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී සම්ප්‍රදායික භෝග, දෙපාර්තමේන්තුවේ වර්තමාන විෂය පථයට අයත් වෙනවා. ඔය ටික තමයි දැනට තිබෙන්නේ.

වර්තමානය වනවිට හෙක්ටෙයාර 82,000ක පමණ වපසරියක මෙම භෝග ව්‍යාප්තව පවතින අතර, මිලියනයකට ආසන්න පාර්ශ්වකරුවන් පිරිසක් අපනයන කෘෂි භෝග ආශ්‍රිත වගාවන්හි හා කර්මාන්තයන්හි නියැළී සිටිනවා. වර්තමාන රජයේ දැක්ම වන, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන දැක්ම යටතේ ක්‍රියාත්මක වන දිළිඳුකම පිටුදැකීම, Clean Sri Lanka, Digitalization Sri Lanka යන ප්‍රතිපත්තීන් තුනටම කැපී පෙනෙන දායකත්වයක් දැක්විය හැකි වන පරිදි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැඩසටහන් සැලසුම් කර තිබෙනවා. ඒ අනුව 2030 වර්ෂය වනවිට දැනට පවතින අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 455ක් දක්වා සියයට 80කින් වර්ධනය කිරීමටත්, අපනයන පරිමාව සියයට 30කින් වර්ධනය කිරීමටත් මාර්ග සිතියමක් සකස් කර තිබෙනවා.

ඉදිරි පස් වසර තුළ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් වන නව වගා වැඩසටහන යටතේ වසර 2030 වනවිට අපනයන කෘෂි භෝග නව වගාවන් ලෙස හෙක්ටෙයාර 13,045ක වගාවන් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ හෙක්ටෙයාර 21,915ක් සඳහා පාළු පැළ ලබා දීමට අපේක්ෂා කෙරෙනවා. ඇත්තටම හෙක්ටෙයාර 21,915ක් කියන්නේ විශාල ඉඩම් ප්‍රමාණයක්. නමුත් ඒ භූමිය විශාල වශයෙන් නාස්ති වෙලා තිබෙනවා. පාළු වුණු ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගස් අඩුයි. ඒ නිසා පාළු සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අපි ආරම්භ කර තිබෙනවා වාගේම ඒ කටයුතු වේගවත් කර තිබෙනවා. මේවා කවදාත් යම් මට්ටමකින් සිද්ධ වෙච්ච දේවල්. අපි කියන්නේ නැහැ, අපිම මේවා කරනවා කියලා. නමුත් අපි ඒ කටයුතු ඉදිරි කාලය තුළදී සම්පූර්ණ කරන්න වේගවත්

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

වැඩසටහනක් සකස් කරලා තිබෙනවා. අලුතින්ම හෙක්ටෙයාර 13,045ක වගාවන් ස්ථාපිත කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ.

වසර 2030 වනවිට මධ්‍යම හා ලියාපදිංචි පැළ තවාන් සංවර්ධනය යටතේ ඒකක 1,442ක් ඉදිකිරීමට හා අලුත්වැඩියාවන් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, අපනයන කෘෂි භෝග පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ රූපවාහිනී සන්නිවේදන වැඩසටහන් 986ක් පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා. එමෙන්ම වසර 2030 වනවිට ධාරිතා වර්ධන වැඩසටහන් යටතේ ගොවි පුහුණු කටයුතු, ක්ෂේත්‍ර දින හා ආදර්ශන 16,781ක් පැවැත්වීමට අපේක්ෂිතයි. ගුණාත්මය ඉහළ නැංවීමේ වැඩටසටහන යටතේ පසු අස්වනු තාක්ෂණ ඒකක 1,719ක් වසර 2030 වනවිට ලබා දීමට අපේක්ෂිතයි.

මීට සති දෙකකට කලින් මහනුවර නගරයේ "සහස් උයන" කියන ප්‍රදේශයේ - ඒ වපසරිය තුළ - නව ව්‍යවසායකයන්ගේ වැඩසටහනක් පැවැත්වුවා. ඒගොල්ලන් දැනට වැඩ කරගෙන යන අය. ඒගොල්ලන් ලොකු අභියෝගයක් භාර අරගෙන මේ අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු කිරීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරනවා. මම ඒ වැඩසටහනට සහභාගි වුණා. ඔවුන්ගේ ඇසුරුම්කරණ කටයුතු එහෙම දැන් හොඳ නවීන තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒ අතර යම් ව්‍යවසායකයන් ප්‍රමාණයක් - මහා පරිමාණ ව්‍යවසායකයන් ගැන නොවෙයි මම කියන්නේ - අගය එකතු කරපු නිෂ්පාදන යම් මට්ටමකින් සෘජුවම විදේශ වෙළෙඳ පොළට සපයමින් තිබෙනවා. ඒක ආස්වාදජනක තත්ත්වයක්. ඒ වාගේම විදේශ වෙළෙඳ පොළට භාණ්ඩ අපනයනය කරන අපනයනකරුවන්ට, අලුත් ව්‍යවසායකයන්ට - අලුත් කිව්වාට, අලුත්ම නොවෙයි - ඒ සඳහා යම් කාලයක් ගත වෙනවා; යම් කාලයක් ගත කරලා තිබෙනවා. ඒ අය අපනයන භෝග සම්පාදනය කිරීමකුත් කරනවා. ඒ වාගේම දේශීය වෙළඳ පොළටත් සැලකිය යුතු මට්ටමකට ඒ භාණ්ඩ සපයනවා. ඒ වෙළෙඳ ප්‍රදර්ශනය නැරඹුවාට පස්සේ මට දැනුණු දේ තමයි, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගෙවුණු කාලය තුළ යම් කාර්යභාරයක් කරලා තිබෙනවා කියන එක. අපනයන කෘෂිකර්මය ගැන අපේ රටේ සාකච්ඡා වෙන පැත්ත ටිකක් අඩුයි. හැම දාම කථා කරන්නේ වී සහ පොහොර ගැනයි. කෘෂි කර්මාන්තයේ ප්‍රධාන සාකච්ඡා බවට පත් වෙලා තිබෙන්නේ එයයි. මොකද එතැන නිරන්තරයෙන් ගැටලු ඇති වෙන නිසා. එවැනි තත්ත්වයක් තුළ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බොහෝ දුෂ්කරතා මැද ඒ කටයුතු කරගෙන යනවා. ඔවුන්ගේ සේවක ප්‍රමාණයත් බොහොම අඩු මට්ටමකයි තිබෙන්නේ. අපි ඒ අය බඳවා ගැනීම්වලට අවශ්‍ය මැදිහත්වීම් කරලා තිබෙනවා; බඳවා ගන්නවා. ඒ වාගේම ඒ අයට ප්‍රවාහන පහසුකම් වාගේ දේවල්වලත් අඩුපාඩු තිබෙනවා. ඒ අඩුපාඩු තිබෙද්දීත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් කරලා තිබෙනවා.

මම මුණ ගැහුණු මේ කර්මාන්තයේ යෙදෙන අය, එහෙම නැත්නම් මේ සම්බන්ධව මැදිහත් වෙච්ච අය ප්‍රකාශ කරපු දේ තමයි, ඒගොල්ලන් මේ ක්ෂේත්‍රයට අවතීර්ණ වුණේ සෘජුවම විදේශ වෙළඳ පොළට සපයන්නත්, සැපයුම්කරුවන්ට සපයන්නත්, දේශීය වෙළඳ පොළට මැදිහත් වෙලා මෙම කටයුතු කරන්නත්ය කියන එක. ඒ සඳහා සම්පූර්ණයෙන්ම සහයෝගය ලබා දුන්නේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවයි කියලා ඒගොල්ලන් මට බොහෝ වෙලාවට පැහැදිලි කිරීම් කළා. යම් ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒවා ඉදිරියේදී විසඳා ගැනීමට අදාළ මැදිහත්වීම් කරමින් තිබෙනවා.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් 2026 වසරේ සිට, ඒ කියන්නේ මේ අවුරුද්දේ ඉඳලා සංවර්ධන වැඩසටහන් ඒකාබද්ධ කරලා - ඒ කියන්නේ මෙතෙක් යමක් කරලා තිබෙනවා - "අපනයන කෘෂි මහිම - පොකුරු ගම්මාන" නමින් වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. අපේ නිෂ්පාදකයෝ, නැත්නම් අපනයන කෘෂිකර්මයට සම්බන්ධ ගොවීන් ගත්තාම, බොහෝ දුරට තනි තනි ගොවීන් තමයි ඉන්නේ. ඒ අය ටිකක් හුදෙකලා වෙච්ච අය. ඒ අය අතර එකඟතාවක්, ඒකාබද්ධතාවක්, එකිනෙකා අතර සම්බන්ධයක් ගොඩනැඟිලා නැති තත්ත්වයක් තිබෙනවා. ඒ තත්ත්වය තුළ සංවර්ධන වැඩසටහන් ඒකාබද්ධ කරලා, ඒ අයත් ඒකාබද්ධ කරලා "අපනයන කෘෂි මහිම - පොකුරු ගම්මාන වැඩසටහන" ලෙස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරලා තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ මීට මාස හතරකට, පහකට විතර ප්‍රථම පැවති ආරම්භක උත්සවයට මමයි සහභාගි වුණේ. ඒ වැඩසටහන ආරම්භ වෙලා දැන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

මෙම වැඩසටහන මඟින් ප්‍රධාන අපනයන කෘෂි භෝගයක් හෝ භෝග දෙකක් පදනම් කරගනිමින් භූගෝලීය වශයෙන් ආසන්න ගම්මානවල විසිරී සිටින වගාකරුවන්, නිෂ්පාදකයන් පොකුරක් ලෙස සංවිධානය කර ඔවුන්ව සෘජුවම දේශීය වෙළෙඳ පොළට, අපනයනකරුවන්ට හා ජාත්‍යන්තර වෙළඳ පොළ සමඟ සම්බන්ධ කිරීම සිදු කරනවා. ඒක තමයි ඒ වැඩසටහනේ මූලික කාරණය. මේ කියන අපනයන කෘෂි ද්‍රව්‍ය, එහෙම නැත්නම් වගාවන්වල නිෂ්පාදන මිලදී ගන්න කවුරු හරි කෙනෙක් ඇවිල්ලා, "ගම්මිරිස් අවශ්‍යතාවක් තිබෙනවා, කොහෙන්ද ගම්මිරිස් ලබා ගන්න පුළුවන්?" කියලා අපෙන් ඇහුවොත්, අපි මොකක්ද කියන්නේ? ඒක රට පුරාම තැන් තැන්වල විසිරිලා, පැතිරිලා තිබෙන්නේ. අපට කියන්න පුළුවන්, රත්නපුරට ගියොත් ගන්න පුළුවන් කියලා. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම අයට සෘජුව ගිහිල්ලා ගන්න තැන් නැහැ. ඒ නිසා අපි මේ ඒකාබද්ධ වැඩසටහන යටතේ, පොකුරු ගම්මාන වැඩසටහන යටතේ එක භෝගයක් හෝ භෝග දෙකක් මූලික වශයෙන්, ප්‍රධාන වශයෙන් දියුණු කරනවා. උපරිම, භෝග දෙකක් දියුණු කරනවා. දැනට තිබෙන භෝග තිබෙන අතර, උපරිම භෝග දෙකක් ඒ ඒ ගම්මානවල වගා කරන්න, ගොඩ නඟන්න, ස්ථාපිත කරන්න තමයි සැලැස්ම තිබෙන්නේ. එතකොට අපිට එක තැනක ඉඳලා කියන්න පුළුවන්කම තිබෙනවා, අහවල් ප්‍රදේශයට ගියා නම්, අහවල් පොකුරු ගම්මානයට ගියා නම් එතැනින් සාදික්කා ගන්න පුළුවන්, අසවල් ප්‍රදේශයට ගියොත් ඒ ප්‍රදේශයේ තිබෙන්නේ එනසාල් කියලා. එතකොට ඒගොල්ලන්ට ඒ ප්‍රදේශවලට ගියොත් ඒවා ගන්න පුළුවන්. අන්න ඒ විදියට මේ විසිරී පැතිර තිබෙන එක්තරා අවිධිමත්භාවයක් නැති කරමින් තමයි මේ කටයුත්ත කරන්නේ. ඒක අවිධිමත්ව තමයි එන්නේ; ඒක වළක්වන්න බැහැ. නමුත් ඒ අවිධිමත්භාවය නැති කරලා මේ වැඩසටහන තුළින් උපරිම භෝග දෙකක් පදනම් කර ගනිමින් භූගෝලීය වශයෙන් ළඟ ළඟ - ආසන්න - ගම්මානවල විසිරී සිටින වගාකරුවන්, නිෂ්පාදකයන් එකට එකතු කරලා වැඩකටයුතු කිරීමක් මේ වැඩසටහන තුළින් කරනවා.

මෙහිදී නිෂ්පාදන, සැලසුම් සහ වෙළඳ සම්බන්ධතා එකම අගය දාමයක් තුළ සම්බන්ධ කිරීමට අපේක්ෂා කරනවා. මේ යටතේ 2030 වන විට පොකුරු ගම්මාන 500ක් ස්ථාපනය කිරීම මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, තෝරා ගත් සෑම පොකුරු ගම්මානයකම අපනයන කෘෂි භෝග නිෂ්පාදන සමිති පිහිටුවීමට සැලසුම් කර ඇති අතර, ලියාපදිංචි ගොවි සංවිධාන හරහා වගාකරුවන්ගේ අස්වැන්න ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වැඩි කිරීම සහ සහතිකකරණය කෙරෙහි අවධානය යොමු කිරීම, අගය එකතු කිරීම, අමුද්‍රව්‍ය විකිණීම වෙනුවට ප්‍රාථමික සැකසුම් - පොකුරු මට්ටමින් - සඳහා පසු අස්වනු

තාක්ෂණ වැඩසටහන සමඟ සම්බන්ධීකරණය කිරීම, ගොවි පුහුණු, භෝග සායන, ප්‍රදර්ශන සහ ක්ෂේත්‍ර දින, වගාකරුවන්ට ප්‍රායෝගික පුහුණුව සහ රෝග පළිබෝධ සඳහා ක්ෂේත්‍රයේදීම විසඳුම් ලබාදීම, ශ්‍රමිකයින් පුහුණුව, නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අස්වනු සැකසීම සඳහා පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.

මෙම කටයුතු කරගෙන යෑමේදී අවශ්‍ය කරන නෛතික පදනම ලබා ගන්න ඕනෑ. ඒ වාගේම අර නිලධාරින් මුහුණ දීලා තිබෙන ගැටලු තිබෙනවා; ඒගොල්ලන්ගේ නාමකරණයන් තුළ ඇතිවෙලා තිබෙන ප්‍රශ්න. "ජනරාල්" කියලා තිබෙනවා. දැන් ඒක දෙපාර්තමේන්තුවක් නිසා "අධ්‍යක්ෂ ජනරාල්" වෙන්න ඕනෑ. ඒවා එහෙම හරියට සම්පූර්ණ වෙලා නැහැ. අණ පනත්වල අඩුපාඩු තිබෙනවා. එහෙම නේ, මේවා කොහොමටත් ක්‍රියාවලියක් ඇතුළේ එන්නේ, ඒ ඒ අවධිවලට සාපේක්ෂව. ඒ නිසා මේක යාවත්කාලීන කරගන්න තිබෙන අවශ්‍යතාව මත තමයි මේ පනත් සංශෝධනය ගේන්නේ. ඒකට පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරු සැම දෙනාගේම සහාය ලැබෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Hector Appuhamy. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.28]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ මොහොත විශේෂ වූ අවස්ථාවක්. අද දිනයේදී අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ගරු අමාත්‍යතුමා මේ අපනයන කෘෂි කර්මාන්තය පිළිබඳව විශිෂ්ට දේශනයක් කළා කියලා මම හිතනවා. ඒ, දේශීය වශයෙන් කරන කටයුතු සම්බන්ධයෙන්. හැබැයි, ගරු ඇමතිතුමනි, ඔය දේශනයේ සඳහන් කාරණාවල ප්‍රායෝගික තත්ත්වය ඔය කියන තරම් සුන්දර නැහැ. අනෙක් කාරණාව තමයි, විශේෂයෙන්ම ඔබතුමා ඕකට එකතු කළ යුතු තව කාරණාවක් තිබෙනවා. අපනයන කෘෂි කර්මාන්තයේදී අනිවාර්යයෙන්ම විදේශීය වෙළෙඳ පොළ සම්බන්ධව විශේෂ වැඩසටහනක් ඇතුළත් විය යුතුයි. විදේශ වෙළෙඳ පොළ සම්බන්ධව සම්බන්ධීකරණයක් නැත්නම්, එහෙම නැත්නම් විදේශ වෙළෙඳ පොළ සොයා දෙන්න - පෞද්ගලික අංශයට වෙන්න පුළුවන්, රාජ්‍ය අංශයට වෙන්න පුළුවන් - රජය මැදිහත් වෙන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැත්නම් ඒක බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ඒ රටවල තිබෙන තානාපති කාර්යාලවල වෙළෙඳ අමාත්‍යාංශයේ විශේෂ නියෝජිතයෙක් ඉන්නවා. එම නියෝජිතයාගේ විශේෂ කාර්යභාරයක් තිබෙනවා.

ඒ කාර්යභාරය හරියට සිද්ධ වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ කාරණාව ගැන කථා කරද්දී මුලින්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව එද්දීත් ගරු විපක්ෂ නායකතුමා ඔබතුමන්ලාට කරුණු පැහැදිලි කරලා යෝජනා ගොඩක් ඉදිරිපත් කළා. එතකොටත් ඔබතුමන්ලාට පොඩි හිනාවක් ගියා. අද එල්නිනෝ තත්ත්වය ගැන කියද්දීත් ඔබතුමන්ලා හිනා වුණා. මතක තියාගන්න, ඒ හිනා වුණේ ජනතාවට කියලා. ඒ නිසා බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වුණොත්, දවසක ඒ හිනාවට වග කියන තත්ත්වයකට පත් වේවි. ඒ නිසා මේ කරුණු කාරණා ඔබතුමන්ලා හිනාවට ලක් කරන්න එපා. මොකද, මේක ඉතාම වැදගත්.

කෘෂි කර්මාන්තය සම්බන්ධව තිබෙන ප්‍රශ්නය ගත්තොත්, කොහුබත් සම්බන්ධයෙන් Chinaවල regulation එකක් amend කරලා තිබෙනවා. කොහුබත් පිටරට යවන ශ්‍රී ලාංකිකයන්ට ඒක බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙච්චර කාලයක් Chinaවල register වෙලා හිටියාට, China registration එක දැන් amend කරලා තිබෙනවා, වෙනත් ක්‍රමවේදයකට. එහිදී අවශ්‍ය ලිපිගොනු අලුතින් ලබා දීලා අලුතින් ඒ ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය, තානාපති කාර්යාල හරහා ලැබිලා නැහැ. ඒ අවස්ථාව නැතිව ගියොත් මොකද වෙන්නේ? ඒ කර්මාන්තය මෙච්චර කාලයක් ඩොලර් මිලියන 40ක විතර ආදායමක් ලබා ගත්තා. නමුත්, ඩොලර් මිලියන 20යි මේ අවුරුද්දේ දැනට අරගෙන තිබෙන්නේ. අර කියපු අවස්ථාව නැතිව ගියොත් ඒ ඩොලර් මිලියන 20 ඊට වඩා ඉහළ නඟින්නේ නැති වෙයි. මේ අවස්ථාවේදී චීනය තමයි ශ්‍රී ලංකාවේ කොහුබත්වල ප්‍රධාන ගැනුම්කරු. හැබැයි, ඒ ගැනුම්කරු අද ඒක නතර කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. හේතුව, ඒ ක්‍රියාදාමයට රජයෙන් අවශ්‍ය කරන සහයෝගය තානාපති කාර්යාල හරහා ලබා නොදීමයි කියන එක මම විශේෂයෙන් මතක් කරනවා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, පොල් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ගැනත්. මොකද, එය අපේ දිස්ත්‍රික්කයට විශේෂයි. ඒ වාගේම, වැදගත්. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේදී ඔබතුමන්ලා එක ව්‍යාපාරිකයෙකුට විතරක් - නම කියලාම කිව්වොත් හේලීස් ආයතනයට විතරක් - මේ රටේ ඒකාධිපති විධියට වැඩ කරන්න ඉඩ දෙන්න එපා. අනෙක් අයටත් තරගකාරිත්වයට අවස්ථාව දෙන්න. මොකද, එහෙම තරගකාරිත්වයට අවස්ථාව දීලා නැහැ. පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන export කරන ආයතනයක් වෙන්න පුළුවන්, DC වෙන්න පුළුවන්, අනෙකුත් නිෂ්පාදන කරන ආයතනයක් වෙන්නත් පුළුවන්. බොහෝ වෙලාවට ඒ නිෂ්පාදන සිදු කරන අනෙක් අයට, ඒ අයගේ ගැනුම් අවශ්‍යතාව සීමා කරන්න නීතිමය වශයෙන් බාධා කරමින් යනවා. ඒකට රජයෙන් සහයෝගය ලබා දෙනවා, ඒ ආයතනයට. හැබැයි, මතක තබා ගන්න, ඒකට විවිධාකාර විධියට තරගකාරී වෙළෙඳ පොළක් ඇති කළොත් තමයි නිෂ්පාදකයාට වැඩියෙන් ප්‍රතිලාභ ලැබෙන්නේ කියන එක. ඒ නිසා නිෂ්පාදකයාට ප්‍රතිලාභ ලැබෙන විධියට මේ කියන වැඩසටහන හදන්න ඕනෑ. අතරමැදියා, එහෙම නැත්නම් මැද export කරන කෙනා විතරක් නොවෙයි, නිෂ්පාදකයාත් රැකෙන්න ඕනෑ. නමුත් අද නිෂ්පාදකයා රැකිලා නැහැ. අද පොල් මිල අඩු වෙලා තිබෙනවා. පොල් මිල අඩු වෙලා තිබෙන නිසා අද බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, පොල් කර්මාන්තයට.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඊළඟට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. ලංකාවේ පරිභෝජනයට ගන්නා පොල් ගෙඩියක් සාමාන්‍යයෙන් රුපියල් 120යි. නමුත් ඒකෙන් අතුරු නිෂ්පාදන සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි, ඒකට value addition කළා නම්, ඒකෙන් export කරන වැඩසටහනක් හැදුවා නම් පොල් ගෙඩියකට සාමාන්‍යයෙන් රුපියල් 360ක විතර අගයක් එකතු වෙනවා. එතකොට ශ්‍රී ලංකාවේ ආදායම වැඩි වෙනවා විතරක් නොවෙයි, පෞද්ගලික ව්‍යාපාරිකයාට ලැබෙන ආදායමත් වැඩි වෙනවා.

ඒත් එක්කම, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අරගෙන තිබෙන පියවර මොනවාද? ඉන්දුනීසියාව, වියට්නාමය, පිලිපීනය ආදි රටවල් ඒ අයගේ නිපදවීම්, විශේෂයෙන්ම පොල් ආශ්‍රිත නිෂ්පාදන වාගේම අතුරු නිෂ්පාදන මේ වෙලාවේදී විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. ඒවාට ඒ රටවල රජයවලින් විශාල සහයෝගයක් ලබා දීලා තිබෙනවා. හැබැයි, අපට තවම ඒ සහයෝගය හරි විධියට ලබා දීලා නැහැ. අපි 2022-2023දී ඩොලර් මිලියන 850ක විතර ආදායමක් ලබා ගත්තා. ඊට පස්සේ 2025දී ඩොලර් මිලියන 1,350ක විතර ආදායමක් ලබා ගත්තා. පොල් ආශ්‍රිත නිෂ්පාදන එක්ක අතුරු නිෂ්පාදනත් ආවොත් ඩොලර් බිලියන 2ක ආදායමක් ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඒකට අවශ්‍ය කරන වැඩසටහන සකස් කරන්න කියලා මම ඔබතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා යෝජනා ගොඩක් ගෙනාවා. හැබැයි, ඒ යෝජනාවලින් පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ගත යුතු තීන්දු තීරණ හරියට ගත්තා ද කියන එක සම්බන්ධයෙන් බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන ගත්තාම, පොල් කිරි ආශ්‍රයෙන් නිෂ්පාදන කටයුතු කරන කණ්ඩායම් ඉන්නවා. ඒ වාගේම පිටි කළ පොල් කිරි ආශ්‍රයෙන් නිෂ්පාදන සිදු කරන කර්මාන්තකරුවන් ද ඉන්නවා. ඒ අය ශ්‍රී ලංකාවේ ඒ කර්මාන්තය කරන කොට අතුරු නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ඇති වෙනවා. ඒ අතුරු නිෂ්පාදනවල ප්‍රතිඵලයක් හැටියට පොල් නිපදවන, එහෙම නැත්නම් පොල් ගස සිටුවා ඒකෙන් ප්‍රතිලාභ ලබන ගොවියාට විශාල ශක්තියක් ලැබෙනවා වාගේම මේ රටේ නිෂ්පාදකයාටත් විශාල වශයෙන් ශක්තියක් ලැබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ කර්මාන්තය සම්බන්ධව, විශේෂයෙන්ම අපනයන ක්ෂේත්‍රයේ යෙදී සිටින ව්‍යාපාරිකයන්ට තරගකාරිත්වයකට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ අනුව තමයි පොල් මිල සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල තීන්දු වෙන්නේ. ඒ මිල තීන්දු වීම නිසා ගොවියාට සහ විශේෂයෙන් ඒ ගොවියා එක්ක ඉන්න අතරමැදියන්ට විශාල සහයෝගයක් ලැබෙනවා. ඒ අයට තමන්ගේ ඉදිරි ගමන හොඳට යන්න පුළුවන් වෙනවා. හැබැයි, තමුන්නාන්සේලා එක් ආයතනයක් විතරක් ඉස්සරහට තබාගෙන, ඒ ආයතනයට අලුතින් සලකන්න ගත්තොත්, ඒක බරපතළ ප්‍රශ්නයක් කියන එක මම මතක් කරනවා. මොකද, මේ වෙලාවේදී මේ පනත් කෙටුම්පත ගැන කථා කරනවාත් එක්කම ඒ කරුණත් එකතු කරන්න ඕනෑ කියලා මම හිතුවා.

මේ මාතෘකාවට අදාළ නැති වුණත් මේත් එක්කම මට තව පොඩි කථාවක් කියන්න තිබෙනවා. මොකද, මේ රටේ තිබුණු බරපතළ ප්‍රශ්නයක් වන පාස්කු ඉරුදින මහා ප්‍රහාරය සම්බන්ධයෙන් පැවැති එක් නඩුවක තීන්දුවක් ඊයේ දිනයේදී ලැබුණා. ඔබතුමන්ලා මතක තබාගන්න, ඒ තීන්දුව ලැබුණු නඩුව සම්බන්ධව මේ ආණ්ඩුව කරපු කිසි දෙයක් නැහැ. ඔබතුමන්ලා කෑ මොර දුන්නාට ඒ සම්බන්ධව කරපු දෙයක් නැහැ. මොකද, එදා අල්ලා ගත්තු මිනිසුන්ගෙන් පිරිසකට තමයි අධිකරණයෙන් ඒ දඬුවම් දුන්නේ. සාරා ඉන්දියාවේ ඉන්නවා කියලා ඔබතුමන්ලාගේ කටින් එදා කිව්වා. ඔබතුමන්ලා ඉන්දියාව එක්ක ගැහුවා, ගිවිසුම් 10ක්. ඒ ගිවිසුම් 10 ඇතුළත සාරා ගෙන්වා ගන්න ගහපු ගිවිසුමක් තිබෙනවාද? දැන් තමුන්නාන්සේලා මහ මොළකාරයා ගැන මොනවාද කියන්නේ? දැන් මහ මොළකරුවෙක් අහුවෙලා තිබෙනවාද? මතක තබාගන්න, ඒ පාස්කු ඉරුදින මහා ප්‍රහාරය සම්බන්ධව ලබා දුන් මේ නඩු තීන්දුවත් එක්කම ඒ වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වුණේ කාලයි. තව තුන්කාලක් තිබෙනවා. කෝ, ඒ ප්‍රහාරයේ මහ මොළකරුවන් යැයි කියපු අය? ඒ වාගේම, ඒකට මුදල් යොදවපු කණ්ඩායම, එයින් ප්‍රයෝජනය ගත්තු මිනිස්සු ටික කෝ? ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වුණාද? ඒ නිසා ඔබතුමන්ලාගෙන් විශේෂයෙන් ඉල්ලනවා, ඒ සම්බන්ධවත් කටයුතු කරන්න කියලා.

විපක්ෂයේ අය පාර්ලිමේන්තුවේ කථා කරපු, කියපු දේවල් සම්බන්ධව සමහර වෙලාවට අධිකරණයේදී කථා කරනවා. විපක්ෂ නායකතුමා ප්‍රමුඛ අපේ මේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙන්නේ කාරක සභාවලදී ගත්තු තීන්දු තීරණ ගැනයි. කාරක සභාවලදී ගත්තු තීන්දු තීරණ ටික හරි විධියට පරිශීලනය කරලා අවශ්‍ය වැඩ කටයුතු ටික කළා නම් තමුන්නාන්සේලාට ඒ ප්‍රශ්නය විසඳන්න හරිම ලේසියි. ඒ නිසා විශේෂයෙන් ඉල්ලනවා, මේ සම්බන්ධව ඔබතුමන්ලාගේ තීන්දුව හරි විධියට කියන්න කියලා. කතෝලික සභාවට යුක්තිය ඉෂ්ට කළා කියලා තමුන්නාන්සේලා කයිවාරු ගැහුවාට මේ කාරණයත් මතක තබාගන්න. කතෝලික සභාව කියන්නේ අපි. අපට යුක්තිය හරියට ඉෂ්ට වුණේ නැහැ කියන එක මම තමුන්නාන්සේලාට මේ වෙලාවේදී විශේෂයෙන් මතක් කරනවා.

ඒ වාගේම, මම මේ කාරණයත් මතක් කරනවා. දැන් ඉන්දියාවේ ඇතැම් ධීවරයෝ මන්නාරමේ ඉඳලා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ හැම තැනකම trawling බෝට්ටුවලින් ඇවිල්ලා බලහත්කාරයෙන් අපේ මුහුද සූරාගෙන මත්ස්‍ය සම්පත අරගෙන යනවා. ඉන්දියාවත් එක්ක ගිවිසුම් ගහන කොට ඒ ගැන අවධානය යොමු කළාද? ඒ trawling බෝට්ටු එන එක නතර කරන එක සම්බන්ධව ඉන්දියාව එක්ක කථා කරලා තමුන්නාන්සේලා හදපු වැඩසටහනක් සම්බන්ධ ගිවිසුමක් තිබෙනවාද? ඒකෙන් විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයා බරපතළ විධියට හානියට ලක් වෙනවා විතරක් නොවෙයි, අපේ ධීවරයාට බරපතළ බලපෑම් සිද්ධ වෙනවා. ඒ අය ආයුධ අරගෙන එන්නේ. මේ ළඟදී ඒ අය trawling ක්‍රමය අනුව මන්ද ඇදගෙන යන කොට අපේ ධීවරයෙක් හසු වුණා ඒ මන්දට. මන්ද කපලා තමයි ඔහුව ගලවා ගත්තේ. එහෙම කළේ නැත්නම් අපේ ඒ ධීවරයාගේ කෑලි කෑලි තමයි අහුවෙන්නේ. සමහර වෙලාවට අපේ ධීවරයා දාලා තිබෙන දැල සම්පූර්ණයෙන්ම ඒ trawler එක අරගෙන යනවා. මා ළඟ වීඩියෝ තිබෙනවා, තමුන්නාන්සේලාට පෙන්වන්න පුළුවන්. කෑගහලා කියනවා, මේක නවත්වන්න කියලා. හැබැයි, නවත්වන්නේ නැතිව ඇදගෙනම යනවා. තමුන්නාන්සේලා ගිවිසුම් ගහන්න ගිහිල්ලා ඉන්දියාව ළඟ දණ ගහලා, හොටු පෙරාගෙන වඳිනවා. හැබැයි, මේ රටේ ශ්‍රී ලාංකිකයාට බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන කරුණු කාරණා සම්බන්ධව ඉන්දියාව එක්ක යම්කිසි ගිවිසුමක් ගැහුවාද කියන එක තමුන්නාන්සේලාගෙන් විශේෂයෙන් අහන්න කැමැතියි.

ඒ වාගේම, විශේෂයෙන් මේ කාරණයත් මතක් කරනවා. ජාවාරම් ගොඩක් සිද්ධ වෙනවා. ඉන්දියාවෙන් නීත්‍යානුකූලව එන බඩුවලට වඩා බරපතළ විධියට smuggling හරහා ජාවාරම් විධියට

බඩු එනවා. කල්පිටිය ප්‍රදේශයේ ඉඳලා මන්නාරම ආදි ප්‍රදේශ සියල්ලේම හැම දාම බඩු බානවා. බඩු තොග ගණන් බාන්නේ. ඒවාට බදුත් නැහැ, කිසි දෙයක් නැහැ. ලංකාවේ ව්‍යාපාර කරන මිනිහාට කන පැළෙන්න බදු ගහනවා. හැබැයි, අරහෙන් ජාවාරම්වලින් බඩු ඔක්කොම එනවා; හැම දෙයක්ම එනවා. හැබැයි, ඒවා නතර කරන්න ඔබතුමන්ලා යම්කිසි සාකච්ඡාවක් ආරම්භ කරලා තිබෙනවාද? එහෙම ආරම්භ කරලා නැහැ. ඒ නිසා එය බරපතළ විධියට බලපානවා කියන එක විශේෂයෙන් මතක් කරනවා.

ඒ වාගේම, මේ මොහොතේම මම ඉදිරිපත් කරනවා තවත් එක කාරණාවක්. පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවන් සම්බන්ධව කථා කරද්දී සාරා ගැනයි, ඊබ්‍රාහිම් ගැනයි මොකක්ද සිද්ධ වුණේ කියලා තමුන්නාන්සේලා මේ සභාවට විතරක් නොවෙයි, රටටම කියන්න ඕනෑ.

ඒ වාගේම, මම තවත් විශේෂ කාරණාවක් කියන්න ඕනෑ. පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ බව මම දිගින් දිගටම කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමා ඉස්ලාම් ආගම නියෝජනය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කට කැඩෙන කල් මේ පාර්ලිමේන්තුවේත් කිව්වා, පුත්තලම රෝහලේ මෝචරියේ ශීතාගාරය හදන්න කියලා. මේ මෑතකදී විශේෂයෙන්ම මුස්ලිම් තැනැත්තන්ගේ මෘතදේහ ආගමික කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක තිබුණේ නැහැ. මොකද, සමහර ශරීර කොටස් වතුර වාගේ දිය වෙලායි තිබුණේ. ඒ, එහි ශීතාගාරය නැති නිසා. සාමාන්‍යයෙන් මාළුන්ට විතරයි අයිස් දමන්නේ. දැන් මිනිසුන් මැරුණාම - එල්ලිලා මැරුණාම, කවුරු හෝ කපා කොටා මැරුණාම, මුහුදේ ගිලිලා මැරුණාම, ගඟේ ගිලිලා මැරුණාම - ඒ මිනිය මෝචරියේ ගෙනිහින් තැබුවාට පසුව ඒකට අයිස් දමලායි තබා ගන්නේ. මොන කරුමයක්ද ඒක? ඇයි එහෙම කරන්නේ, මේ රටේ පුරවැසියන්ට? පුත්තලම රෝහලේ එහෙම සිද්ධ වෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ ප්‍රදේශයේ ජීවත් වන ඉස්ලාම්, හින්දු, කතෝලික, බෞද්ධ ජනතාවට - සමස්ත ප්‍රජාවට - ඒක බරපතළ ප්‍රශ්නයක්. මොකද, එම මෘතදේහ සම්බන්ධයෙන් එක පැත්තකින් ආගමික කටයුතු කරන්න තිබෙනවා. තවත් පැත්තකින්, දරුවන් වේවා, දෙමව්පියන් වේවා ඒ මැරිච්ච පුද්ගලයාට අවශ්‍ය ගෞරවය දක්වන්න ඕනෑ. නමුත් ඒ වැඩ කටයුතු කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඉතින් ඇයි, ඒ විධියට අයිස් දමලා මිනී ටික ආරක්ෂා කරන්නේ? ඇයි, ඔබතුමන්ලාට ඒ ශීතාගාරය හදන්න සල්ලි දෙන්න බැරි? හැබැයි, හැම තැනම ගිහිල්ලා කයිවාරු ගහනවා. ජනාධිපතිතුමා ගිහිල්ලා හැම වේදිකාවේම වචන වරද්ද වරද්දා කථා කරනවා. එතුමා stress වෙලා ඉන්නේ. Stress වෙලා ඉන්න හේතුව අපට පෙනෙනවා. වැරදි තිබෙන කොට stress වෙන්නේ නැද්ද? ඒ විතරක් නොවෙයි. මාරවිල රෝහලේත් ඒ විධියමයි. අයිස් දමලා තමයි මිනී ටික තබා ගන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hector Appuhamy, your time is up now.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව මේවා දිහා බලන්න ඕනෑ. කයිවාරු ගහන එක නොවෙයි වැඩේ. එක් එක්කෙනාට මඩ ගහන එක නොවෙයි වැඩේ. වේදිකාවල ගිහිල්ලා එක එකාව හෝදන එක නොවෙයි වැඩේ. වේදිකාවට ගිහිල්ලා හරියට කියන්න මේ රටට කරන්න යන දේ මොකක්ද කියන එක. එය නිවැරදිව කියන්න. නැවත නැවත, එක එක වේදිකාවෙන් වේදිකාවට වරද්ද වරද්දා බොරු කිය කියා ගියාට පස්සේ රට ගැන ඇති වන අභිමානය මොකක්ද, ගෞරවය මොකක්ද? අන්න එය කෙළෙසන්න එපා කියලා මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anura Karunathilaka. You have 13 minutes and the Floor is yours.

[පූ.භා. 11.42]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
අද දවසේ සාකච්ඡා කරන, පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් වන යෝජනාව පිළිබඳව තමයි මම වැඩියෙන්ම අවධානය යොමු කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දන්නවා, මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුද්මය වාතාවරණයත් එක්ක පසුගිය කාලයේ, විශේෂයෙන්ම පෙබරවාරි මාසයේදී ලෝක තෙල් මිල විශාල වශයෙන් ඉහළ ගිය බව. එහි බලපෑම නිසා අපේ විදුලි ජනනය සඳහා යන පිරිවැය ද විශාල වශයෙන් ඉහළ ගියා. ඒත් එක්කම අකමැත්තෙන් වුණත් අපට සිද්ධ වුණා, විදුලි පාරිභෝගිකයන්ගෙන් කොටසකගේ විදුලි බිල තරමක් වැඩි කරන්න. විශේෂයෙන්ම විදුලි ඒකක 180කට වඩා වැඩියෙන් භාවිත කරන පාරිභෝගිකයන්ගේ විදුලි බිල වැඩි කරන්න අපට සිද්ධ වුණා. හැබැයි, ඒකක 180ට වඩා අඩුවෙන් විදුලිය භාවිත කරන පාරිභෝගිකයන්ගේ විදුලි බිල වැඩි කිරීම සඳහා අපි කටයුතු කළේ නැහැ. ඒකත් එක්ක විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගමක් වන National System Operatorට සිදු වන පාඩුව මහ හරවා දීම සඳහා 2026.07.13වන දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගත්තා, ඒ සඳහා අවශ්‍ය වන රුපියල් මිලියන 17,213ක - රුපියල් බිලියන 17.213ක - මුදල එයට ලබා දෙන්න කියලා මහා භාණ්ඩාගාරයට නියම කරන්න. මේකේ තිබෙන වැදගත්ම කාරණය මේකයි. ඒ සහනය ලබා දීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වාර්ෂික අය වැයෙන් වෙන් කරලා නොමැති නිසා, 2026 වර්ෂය සඳහා ලබා දීලා තිබෙන, ඒ වාගේම මේ වර්ෂය තුළ භාවිත නොවේ යැයි උපකල්පනය කරලා, උපයෝජනය නොවේ යැයි රේඛීය අමාත්‍යාංශය විසින් හඳුනා ගෙන තිබෙන මුදල් තමයි මේ රුපියල් බිලියන 17.213ක ප්‍රතිපාදනය සඳහා භාවිත කරන්නේ. ඒ අනුව මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම හරහා ජාතික අය වැයට අතිරේක බරක් ඇති වෙන්නේ නැහැ. ඒ වාගේම 2025 අංක 23 දරන විසර්ජන පනත මඟින් අනුමත කරලා තිබෙන සමස්ත වියදම් සීමාවට සහ රජයේ උපරිම ණය ගැනීමේ සීමාවට කිසිම බලපෑමක් සිදු වන්නේ නැති විධියට තමයි මේ මුදල් වෙන් කිරීම කරන්නේ. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ අපට පාලනය කරන්න බැරි සිදුවීමක් අවස්ථාවකදීත්, එහෙම නැත්නම් රටට බලපාන ස්වාභාවික ව්‍යසනයක් වැනි අවස්ථාවකදීත්, විශේෂයෙන්ම මැද පෙරදිග යුද්මය වාතාවරණය වැනි අපට පාලනය කරන්න බැරි වාතාවරණයකදීත් රටේ ජනතාවට කිසියම් බලපෑමක් එල්ල වුණොත්, අපේ ආර්ථිකයට විශාල වශයෙන් බලපෑමක් එල්ල වෙලා, ඒ ආර්ථික පීඩනය බැරි වෙලාවත් රටේ ජනතාවට යොමු

[ගරු අනුර කරුණාතිලක මහතා]

කරන්න අපට සිද්ධ වුණොත්, ඒ සමස්ත බර රටේ ජනතාව මත පටවන්නේ නැතුව වග කිවයුතු රජයක් හැටියට ඒ කොටස අවශෝෂණය කර ගත්තු බවක් තමයි මේ දිහා බලන කොට අපට පෙනෙන්නේ. අපට මතකයි, ඉන්ධන මිල ඉහළ යද්දී වෙච්ච දේ. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල සියයට 120කින් වාගේ ප්‍රමාණයකින් ඉහළ ගියා. නමුත්, අපේ රටේ දේශීය වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි කළේ සියයට 45-50 අතර ප්‍රමාණයකට. මුලින් අපට සියයට 55ක වාගේ ප්‍රමාණයකට තෙල් මිල වැඩි කරන්න සිද්ධ වුණා. එතැනින් පස්සේ, තෙල් මිල යම් ප්‍රමාණයකට ලෝක වෙළෙඳ පොළේ අඩු වෙච්ච වෙලාවේ අපි තෙල් මිල සියයට 46ක් දක්වා අඩු කරලා තිබෙනවා. හැබැයි, මෙතැනින් ඒ සමාගම්වලට දරන්න වන පාඩුව මහ හරවා ගැනීම සඳහා අපි රුපියල් බිලියන 57ක සහනාධාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළුව ඒ ඒ සමාගම්වලට ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා මේ වන කොටත් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල නැවත වරක් විශාල වශයෙන් ඉහළ ගිහින් තිබෙන බව. අපි හැම මාසයක් අවසානයේදී තමයි මිල සමාලෝචනය කරන්නේ. අපි ඒ පිළිබඳ තොරතුරු ජනතාවට ඉදිරිපත් කරන්න කැමැතියි. බොහෝ වෙලාවට අද දවසේ ඒ තොරතුරු මහ ජනතාවට ලබා දීම සඳහා අපි කටයුතු කරනවා. අන්න ඒ වාගේ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ ගියත් මේ සමස්ත බර රටේ ඉන්ධන පාරිභෝගිකයාට ලබා දෙන්න අපි කටයුතු කරන්නේ නැහැ. පසුගිය අප්‍රේල්, මැයි, ජුනි වාගේ කාලවල ඒ පීඩනයෙන්, බරෙන් කොටසක් රජය භාර ගත්තා වාගේම අපි බලනවා මේ මාසය අවසානයේදී ඉන්ධන මිල සමාලෝචනය කරලා ඒ අනුව කටයුතු කරන්න. නමුත්, අපි හිතනවා මේ සමස්ත බර රටේ ඉන්ධන පාරිභෝගිකයන්ට ලබා දෙන්නේ නැතිව වග කිව යුතු රජයක් හැටියට ඒ බරෙන් කොටසක් රජය විසින් දරන්න.

මේ කටයුතු කරගෙන යද්දී විශේෂයෙන් පසුගිය කාලවල අපට ආපු විවේචනයක් තමයි, රජය ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙනවා නම්, විශේෂයෙන් මහා භාණ්ඩාගාරයේ වැඩිපුර මුදල් තිබෙනවා නම්, මේ ප්‍රතිලාභය ජනතාවට දෙන්නේ නැත්තේ ඇයි කියන එක. ඒ විවේචනය විපක්ෂය ඇතුළු බොහෝ කණ්ඩායම්වලින් අපට අහන්න ලැබුණා. පසුගිය අවුරුදු 2ක කාලය තුළ ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපි මිනිසුන්ට සහනාධාර දුන්නා වාගේ, සංවර්ධන ව්‍යාපෘති, යටිතල පහසුකම් වර්ධනය කිරීම් ආදිය පැත්තකින් තියලා, "දිට්වා" සුළි කුණාටුව ආ වෙලාවේ රුපියල් බිලියන 500ක මුදලක් වෙන් කරලා රටේ මිනිසුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය නැවත ආරම්භ කරන්න, කැඩුණු ගෙය හදා ගන්න, බිඳ වැටුණු වෙළෙඳ ව්‍යාපාරය නැවත ගොඩනඟන්න කටයුතු කළා වාගේ මේ අවස්ථාවේදීත් විදුලි බිල ඉහළ යාමත්, විදුලි ජනන පිරිවැය ඉහළ යාමත් ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වීමත් නිසා ඇති වූ පීඩනයේ බර ජනතාවට දුන්නේ නැහැ. ඒ පීඩනය සම්පූර්ණයෙන්ම ජනතාව මත පටවන්නේ නැතිව අපි ඒ කොටස මහා භාණ්ඩාගාරය හැටියට අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය සමහර වෙලාවට අපට කරන තවත් විවේචනයක් තමයි, "ආණ්ඩුව බදු පිට බදු ගහලා තිබෙනවා" කියන එක. අපේ රටේ විපක්ෂයේ බොහෝ නායකයන් එය මේ ගරු සභාව තුළත්, එළියේදීත් නැවත නැවතත් කියනවා; පුනරුච්චාරණය කරනවා. 2024දී තිබුණු බදු සහ අපේ ආණ්ඩුව කාලයේ දැන් පවතින බදු දෙස බැලුවොත්, 2024න් පස්සේ ගත වූ මේ කාලය තුළ කිසිම අමතර බද්දක් මේ රටේ ජනතාව මත පටවන්න කටයුතු කරලා නැහැ, එක් අවස්ථාවකදී හැර. ඒ අවස්ථාව මේකයි. අපි වාහන ආනයනය කිරීම සඳහා තීරණයක් ගත්තු වෙලාවේ කිසියම් අමතර බද්දක් පැනෙව්වා. හැබැයි, ඒක කළේත් පෞද්ගලිකව ආනයනය කරන වාහන සඳහායි. කාලයක් තිස්සේ වාහන ආනයනය නොකර සිටි තත්ත්වය හමුවේ වාහන ආනයනයට අවසර දීමත් එක්ක, විශාල වශයෙන් වාහන ආනයනය කිරීම වැළැක්වීම සඳහා යම්කිසි පියවරක් වශයෙන් තමයි අපි ඒ බදු පැනෙව්වේ.

ඒ වාගේම පසුගිය මාර්තු මාසයේ මැද පෙරදිග යුද්ධය උත්සන්න වීමත් එක්ක ඒ වෙලාවේ ඩොලරයට ආ පීඩනය වළක්වා ගැනීම සඳහා නැවත වරක් වාහන ආනයනයේදී අමතර බද්දක් අය කරන්න අපට සිදු වුණා. එහෙම නැතිව, සාමාන්‍ය ජනතාවට කිසිම විධියකින් අමතර බද්දක් පනවන්න මේ කාලය තුළ රජය හැටියට අපි කටයුතු කරලා නැහැ. එහෙම තිබියදීත්, එනම් එසේ අමතර බද්දක් පනවන්නේ නැතිවත් රාජ්‍ය ආදායම වැඩි කර ගන්න අපි කටයුතු කර තිබෙනවා. ඒක බොහෝ වෙලාවට අපේ රටේ විපක්ෂයේ සමහර අය දකින්නේ නැහැ. රජයේ දේශපාලනඥයන් හැටියට අප එය කියනවාට වඩා සමස්ත ලෝකයේම තිබෙන වග කිව යුතු ආයතනවල නිර්ණායක තුළින් අපට බලන්න පුළුවන්, මේ රටේ ආර්ථිකය කොයි තරම් දුරට මේ අවුරුදු 2ක කාලය තුළ ශක්තිමත් වෙලා තිබෙනවාද කියලා. විශේෂයෙන්ම ඒක පුද්ගල ආදායම ගත්තාම, 2024දී තිබුණේ ඩොලර් 3,860යි. 2025 වනකොට වර්ෂයක් ඇතුළත ඩොලර් 4,670 දක්වා, සියයට 20.98කින් ඒක පුද්ගල ආදායම වැඩි වුණා. 2025 වර්ෂය අවසානයේදී - මේ වනකොට - ඒක පුද්ගල ආදායම ඩොලර් 5,003 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, අර්බුද කාලයේ ශ්‍රී ලංකාවේ බංකොලොත්භාවය නිසා ණය ගෙවීමේ හැකියාවක් තිබුණේ නැහැ. ඇත්තටම ලංකාව 2024 මුල් කාලයේ තිබුණේ, ණය පැහැර හැරීමේ සහ බංකොලොත්භාවයේ අවදානම පෙන්නුම් කරන පහළ ශ්‍රේණිගත කිරීමක. ඒ කියන්නේ, Selective Default - SD - එකේ CCC කියන level එකේ තමයි ලංකාව තිබුණේ. හැබැයි, 2025දී, ඒ වාගේම 2026දී, ශ්‍රී ලංකාවේ Credit Rating එක CCC+/C කියන level එකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ වනකොට ණය ගෙවීම සම්බන්ධව අපි ස්ථාවර තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, B- කියන මට්ටම දක්වා ඇවිල්ලා තිබෙනවා. සංඛ්‍යාලේඛන අරගෙන අපි ඒ ගැන කියනවාට වඩා, ලෝකයේ තිබෙන Fitch Ratings වැනි පර්යේෂණ කරන ආයතන ඉදිරිපත් කරන දර්ශක දිහා බලන්න. ඒ දර්ශක දිහා බලා තීරණය කරන්න, මේ ආර්ථික අර්බුදය යම් ප්‍රමාණයකට ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව ගත් පියවර මොනවාද කියලා.

ඒ වාගේම දූෂණ අවබෝධතා දර්ශකයේ 2024දී ලංකාව සිටියේ ඉතිහාසයේ සිට ගත්තාම අඩුම මට්ටමක. 2025දී අපි ස්ථාන 14කින් ඉදිරියට ඇවිල්ලා, දූෂණ අවබෝධතා දර්ශකයේ 107 වන ස්ථානය දක්වා පැමිණෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථිකය ශක්තිමත් කරන්න රජය හැටියට මේ කාලය තුළ අපි කොහොමද පියවර අරගෙන තිබෙන්නේ කියලා පෙන්වන්න අපට ඕනෑ තරම් කාරණා තිබෙනවා. හැබැයි, මෙවැනි තත්ත්වයක් තිබෙන අතර අපේ විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් කටයුතු කරන්නේ කොහොමද? අපට ඊයේත් අහන්න ලැබුණා, 2027දී අපේ ණය ගෙවීම් ආරම්භ කළායින් පස්සේ නැවත ආර්ථිකය කඩා වැටෙනවා කියලා ජනතාව අතර බොරු බියක් ඇති කරන්න කටයුතු කරලා තිබෙනවා කියලා. ඇත්තටම මම ඒ පිළිබඳව හොයා බැලුවා.

ඒ අනුව 2026 වර්ෂයේ අපේ සම්පූර්ණ ණය ගෙවීමේ අවශ්‍යතාව ඩොලර් මිලියන 2,504යි. 2027දී ඩොලර් මිලියන 2,603යි. 2028දී ඩොලර් මිලියන 3,259යි. 2029 වනකොට ඩොලර් මිලියන 3,521යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම පෙනෙනවා, අපේ ණය ගෙවීමේ අවශ්‍යතාව විශාල වශයෙන් වැඩි නොවන බව. හැබැයි, ඊට සාපේක්ෂව අපේ අපනයන ආදායම වැඩි කරගෙන, සංචාරක ව්‍යාපාරයෙන් අපි ලබා ගන්නා ආදායම වැඩි කරගෙන, අපේ විදේශ ප්‍රේෂණ වැඩි කරගෙන ඩොලර් ආදායම ඉහළ නැංවීම සඳහා අපි කටයුතු කරනවා. හැබැයි සමහරු කියනවා, ඩොලර් යම් ප්‍රමාණයක් ගෙවද්දි අපේ සංචිත සම්පූර්ණයෙන්ම අවසන් වී යයි කියලා. එහෙම බැලුවොත්, 2025 වර්ෂයේ අපේ ආනයන වියදම ඩොලර් බිලියන 20කුත් ගණනක්. එහෙම ආනයන වියදමක් තිබෙනවා නම්, ඒ සඳහා පාවිච්චි කරන්නේ අපේ සංචිත නම් මේ වනකොට සංචිත සෘණ අගයකට ගිහිල්ලා තිබෙන්න ඕනෑ. හැබැයි, ඇත්ත කථාව ඒක නොවෙයි.

එක පැත්තකින් ඩොලර් ආදායම රටට එනවා. අනෙක් පැත්තෙන් ආනයන වියදම් ඇතුළුව ණය ගෙවීම සඳහා ඩොලර් වියදම් කරන්න අපට සිද්ධ වනවා. ඒකට තමයි ආර්ථිකය කළමනාකරණය කරනවා කියන්නේ. එම නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, ජනතාව අතර බොරු බියක් පතුරුවන්න උත්සාහ කරන්න එපා. මේ දර්ශක දිහා බලන්න. J.P. Morgan හා S&P Global කියන දර්ශකවල ඇති අපේ රටේ ආර්ථිකයේ ස්ථාවරභාවය ඉහළ නැංවුණු ආකාරය දිහා බලන්න. බලා, රටක් හැටියට, සමාජයක් හැටියට මේ ආර්ථිකය පවතින තත්ත්වයෙන් ඉහළ නැංවීම සඳහා අපි ඔක්කෝම එකතු වෙලා කටයුතු කරමු කියන ආරාධනය කරමින්, මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition. You have been allotted five minutes and the Floor is yours.

[පූ.භා. 11.55]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ පාර්ශ්වයෙන් කියනවා, බාහිර බලපෑම් නිසා ඇති වන සිද්ධිවලට කරන්න දෙයක් නැහැයි කියලා. එහෙම නැතිව ඉතාම හොඳින් සහ කාර්යක්ෂමව රට පාලනය කරනවාලු. ඔබතුමන්ලා බලයට ආවේ ජනතාවත් එක්ක සමාජ ගිවිසුමක් ඇති කරගෙන system එක change කරනවා කියලායි. ඔව්, පැහැදිලියි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය system change එකක්. විධායකය, රටේ අධිකරණය තමන්ගේ වහලෙක්, සුවච කීකරු ගෝලයෙක්, යටත්භාවයට, වහල්භාවයට පත් කිරීම, ඔව්, system change එකක්. ඒ වාගේම අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරලා ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරලා, අධිකරණයේ ගරු විනිසුරුවරුන් පිළිබඳව තිබෙන විශ්වාසය නැති කරලා, එහෙම නැත්නම් credibility එක නැති කරලා, එවන් තත්ත්වයක් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ නිර්මාණය කිරීම, ඔව්, ඒක system change එකක්. දැන් මොකෙන් මොකටද මේ system එක change වන්නේ?

ප්‍රජාතන්ත්‍රවාදයෙන් ඒකාධිපතිත්වයට යාමක් තිබෙන්නේ. මානව අයිතිවාසිකම් සුරක්ෂා කරන, මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ ඒ තිබෙන ආයතන පලුදු කරලා තනි පක්ෂයක් රට පාලනය කරන system change එක තමයි ඔබ කරන්නේ. ප්‍රජාතන්ත්‍රවාදයෙන් ඒකාධිපතිත්වයට. ඇත්තවශයෙන්ම ඔබගේ මේ ක්‍රියාවලිය රටේ ව්‍යවස්ථාවේ ඉතිහාසයේ ලියැවෙනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ ඝාතකයින් හැටියට. ඇත්තවශයෙන්ම ඔබගේ නම, මේ ආණ්ඩුවේ නම, මේ ජනාධිපතිවරයාගේ නම ප්‍රචලිත වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ඝාතනය කිරීමේ පේටන්ට් බලපත්‍රයත් ඔබට ලැබෙනවා. ඕනෑ නම් copyright registration එකත් ඔබතුමන්ලාට කර ගන්න පුළුවන්. ඒ තරමටම ඉතාම නින්දිත ආකාරයෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය කෙලෙසන, ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල ඒ බලය බෙදීම සහ සංවරණ තුලන ක්‍රමවේදය විනාශ කරන, ඒකාධිපති වියරුවෙන් ක්‍රියාත්මක කරන මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඔබ පොරොන්දු වුණු system change එක නොවෙයි. ඔබ පොරොන්දු වුණේ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරලා, රටට වග කියන සාධනීය ප්‍රගතිශීලී අලුත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයයි.

රජයේ පාර්ශ්වයෙන් කරුණු එළි දක්වපු අපේ ගරු ඇමතිතුමා කියනවා, Fitch Ratings බලන්නලු, Standard & Poor's බලන්නලු, Moody's බලන්නලු, ශ්‍රේණිගත කිරීම් හොඳයිලු, ඉතාම හොඳ තත්ත්වයක ඉන්නවාලු. මම ඔබතුමාට අභියෝගයක් කරනවා, විසිඑක් ලක්ෂයක් වන ගොවි ජනතාවගෙන් පොඩ්ඩක් අහන්න කියලා Fitch Ratings කොහොමද කියලා. ගොයම් කකා පොරොන්දු වුණු වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කියපු පොරොන්දුව අදටත් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඔය Fitch Ratings, Standard & Poor's, Moody's කියන ratings ගැන අහන්නකෝ, ත්‍රිරෝද රථ රියදුරාගෙන්, ස්වයං රැකියා කරන පුද්ගලයින්ගෙන්, කර්මාන්තකරුවන්ගෙන්, ව්‍යවසායකයින්ගෙන්.

අද කර්මාන්තකරුවන් රටේ කර්මාන්තශාලා වහලා පිට රට ගිහිල්ලා කර්මාන්තශාලා නොවෙයි අරින්නේ, කර්මාන්ත කලාප අරින්නේ. Factory එකක් නොවෙයි අරින්නේ. අපේ රටේ කර්මාන්තශාලා කරපු දේශීය බහුජාතික සමාගම් ගිහිල්ලා සම්පූර්ණ enterprise zones පිට රට විවෘත කරනවා. ඒකට හේතුව මොකක්ද? අපේ රටේ සෘජු විදේශ ආයෝජනවලට හිතකර පරිසරයක් නැහැ, අපනයන ප්‍රවර්ධනයට වැඩ පිළිවෙළක් නැහැ. මොනවා කියනවාද, ඇමතිතුමනි? ඔබතුමා කියනවා, රට හොඳ තත්ත්වයක තිබෙනවාලු. ඔබතුමන්ලාම කියනවා, එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්නට රුපියල් 17,315ක් ඇති කියලා. මොන බොරුවක්ද? මොන ටොන් පවයක්ද? මොන රැවටිල්ලක්ද? මොන ඇන්දවිල්ලක්ද? ඒක මත පදනම් වෙලා තමයි ඔබතුමන්ලා රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් කරන්නේ.

අද පොල්දූව හන්දියට ගිහිල්ලා බලන්න, මොකක්ද එතැන වෙන්නේ කියලා. අද අවන්හල් ක්ෂේත්‍රයේ තරුණයෝ 135ක් අනාථ වෙලා ඉන්නවා. 2025 පෙබරවාරි ඉඳලා ඒ අයව විදේශ රැකියා ලබා දෙන ලොතරැයියට යොමු කරන්නේ නැතිව, ක්‍රමවේද වෙනස් කරලා ඒ අයගේ මූලික අයිතිය, මානව අයිතිය උල්ලංඝනය කරලා තිබෙනවා. රජයෙන් විදේශ රැකියාවකට යනකොට රුපියල් ලක්ෂ 10යි. නමුත්, පෞද්ගලික ක්ෂේත්‍රයෙන් යනකොට රුපියල් ලක්ෂ 35ක් ගෙවන්නට ඕනෑ. ඔබ පොඩි මිනිහාගේ ආණ්ඩුවයි කියලා කියා ගත්තාට, ඔබ ප්‍රවර්ධනය කරන්නේ අර රුපියල් ලක්ෂ 35න් ඊශ්‍රායල යන වැඩසටහනයි.

ගරු ඇමතිවරයෙකුට අපි යෝජනා කරනවා, අඩුම ගාණේ පොල්දූව හන්දියට ගිහිල්ලා, ඒ අවන්හල් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා අහිමි වුණු අයව හමු වෙන්න කියලා. එතැන තාරුණ්‍යයේ පසුවන 135දෙනෙක් ඉන්නවා. ඒ අය හමු වෙලා කථා කරන්න. ඒ අයගේ ප්‍රශ්න විසඳන්නට ඔබ කටයුතු කරන්න. විපක්ෂයේ ඉන්නකොට ජනතාව අතරට ගියා සේම දැන් රාජ්‍ය බලය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ලැබුණාට පස්සේ ඔබට කයිවාරු ගහන්න බැහැ, සන්දර්ශන කරන්නට බැහැ, සෝබන ක්‍රියා සිදු කරන්න බැහැ. ප්‍රශ්නවලට උත්තර දෙන්නට ඕනෑ; ගැටලුවලට විසඳුම් ලබා දෙන්නට ඕනෑ. ඒකයි ඔබේ වගකීම. ඒ යුතුකම ඉෂ්ට කරන්නට ඔබ කටයුතු කරන්න.

මීට පෙර කථා කරපු ඇමතිතුමාට මම යෝජනාවක් කරන්න කැමැතියි. අපේ රටට ඔච්චරම හොඳ නම්, ලක්ෂ 220ක ජනතාව හොඳින්, සතුටින් ජීවත් වෙනවා නම්, හොඳ litmus test එකක් තිබෙනවා, ජනතාවගේ මතය හොයා බලන්න. ඒ තමයි, පළාත් සභා මැතිවරණය. ඇයි, පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැත්තේ? ඇයි, විශේෂ කාරක සභාවක් පත් කරලා, පළාත් සභා මැතිවරණය කල් දමන්නේ? ක්‍රමය වෙනස් කරන්න ඕනෑලු, කාලය ගන්න ඕනෑලු, නියෝජනත්වය අවශ්‍යයිලු. එක එක හේතු, කරුණු කාරණා ඉදිරිපත් කරලා ඔබ කරන්නේ පළාත් සභා මැතිවරණය කල් දැමීම. ඔච්චරම රටේ ජනතාවට හොඳ නම්, ඔවුන් සතුටින් ජීවත් වෙනවා නම්, ජීවන මට්ටම ඉහළ ගිහිල්ලා තිබෙනවා නම් අපි අභියෝග කරනවා, භය නැතුව පළාත් සභා මැතිවරණය පවත්වන්න කියා. එතකොට රටේ ජනතාව ඔබට දෙන්න ඕනෑ හොඳම උත්තරය දෙයි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. "දිට්වා" ආපදාවෙන් විපතට පත් වුණු ජනතාව පිළිබඳව මම ප්‍රශ්නයක් ඇහුවා. හැබැයි, ආණ්ඩුවට ඒකට උත්තර නැහැ. තව කල් ඕනෑලු. පුන පුනා ඒ ගැන අහනකොට මේ ඉදිරි පේළියේ ඉන්න ගරු ඇමතිවරු හතර පස්දෙනෙක් හිනා වෙනවා. ඔව්, ඉතින් ඔබට හිනා වෙන්න පුළුවන්. ජනාධිපතිකමත් බොරු කියලා ගත්තා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකත් බොරු කියලා ගත්තා, පළාත් පාලන ආයතනවල වැඩිපුර ප්‍රමාණයක බලයත් බොරු කියලා ගත්තා. "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාව ගැන දැන් ප්‍රශ්න කරනකොට, ඒ අයට දෙන සහන ගැන කථා කරනකොට උත්තර නැහැ. හිනා වෙනවා, ඔච්චම් කරනවා, විහිළු තහළු කරනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ලක්ෂ 220ක් වන ජනතාවගේ ජන ජීවිත ඔබ විහිළුවට භාර ගන්න එපා කියන කාරණාව. ජනතාව අසීමිත පීඩනයකින්, කම්පනයකින් සහ අසහනයකින් ජීවත් වෙනවා. ඒ නිසා වහාම පොරොන්දු වුණු ආකාරයට ඔබ නිර්මාණය කරනවා කියපු පොහොසත් රටයි, ලස්සන ජීවිතයයි නිර්මාණය කරන්න. තවදුරටත් ටොන් පව කීමෙන් වැළකී සිටින්න. මොකද, මේ බොරුකාර, රැවටිලිකාර ඇන්දවිල්ලට ආයුෂ බොහොම අඩුයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sunil Biyanwila. You have eight minutes.

[අ.භා. 12.04]

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන්නේ 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳවයි. මේ පනත් කෙටුම්පත ගැන කථා කරන්න පෙර විශේෂයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ.

අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ මේ විපක්ෂයේ බොහෝ අය කිව්වා, මේ ආණ්ඩුවට ලොකු කාලයක් යන්න බැහැ, මේ ආණ්ඩුව මාස තුනකින් ඉවරයි කියලා. ආපසු ටික දවසක් යනකොට කිව්වා, මේ ආණ්ඩුව මාස හයකින් ඉවරයි කියලා. විපක්ෂයේ අය ඔහොම කියනකොට අපි, අපේ වැඩ පිළිවෙළ රට තුළ ක්‍රියාත්මක කළා. හැබැයි, ඒ වෙලාවේදී විපක්ෂයේ අය එහෙම කියපු එක ගැන පොඩි සාධාරණත්වයකුත් තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? කෘෂිකර්මයට අවශ්‍ය පොහොර ටික ගන්න බැරිව, තෙල් පෝලිම්වල සිටිමින්, විවිධ ප්‍රශ්නත් එක්ක තමයි ඒ මොහොතේදී අපේ රටේ ජනතාව හිටියේ. ඒ නිසා මේගොල්ලන් හිතුවා, අපට මේ තත්ත්වයන් වෙනස් කරන්න ආණ්ඩුවක් හැටියට ක්‍රියාමාර්ග ගන්න බැරි වෙයි කියලා. නමුත්, අපි මොකද කළේ? අපි 2024 අවුරුද්ද ඇතුළත ඒ ඉලක්ක සම්පූර්ණ කර ගත්තා. ඒ වාගේම 2025 අවුරුද්ද ඇතුළත අපේ ඉලක්ක අපි සම්පූර්ණ කර ගත්තා. පසුගිය කාලයට සාපේක්ෂව ගත්තාම, 2026 අවුරුද්දේ කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළත්, විවිධ ක්ෂේත්‍ර තුළත් ඉතාම දියුණු තත්ත්වයක් යටතේ අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබුණා. අපට දැන් වී අතිරික්තයක් තිබෙනවා. අපි ගොවීන්ට පොහොර සඳහා සහනාධාර දුන්නා. නිෂ්පාදන වියදම අඩු කරගන්න ඕනෑ කරන විවිධ ක්‍රමවේද අපි හැදුවා. ඒ හරහා අපට පුළුවන් වුණා, වී නිෂ්පාදනය වැඩි කර අපේ රටට වී අතිරික්තයක් ගෙනෙන්න.

ඒ විතරක් නොවෙයි, අපේ රටට පිට රටින් ගෙනෙන ද්‍රව්‍ය බොහොමයක් නතර කරගන්නත් අපට හැකියාව ලැබුණා. අපි දැන් සැමන් වාගේම මුංඇට පිට රටින් ගෙනෙන්නේ නැහැ. අපේ වැඩ පිළිවෙළ තුළින් අපට පුළුවන් වුණා, බොහොමයක් ද්‍රව්‍ය පිට රටින් ගෙනෙන එක නතර කරගන්න. ඒ තුළ අපේ විදේශ සංචිත වැඩිකර ගන්නත් අපට පුළුවන්කම තිබුණා. අපි දැන් තව පියවරක් ඉස්සරහට තියමින් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ විශාල පරිවර්තනයක් කරන්න යනවා.

අපනයන ක්ෂේත්‍රයට අදාළ ගම්මිරිස් වාගේ වගාවන් ගොවීන්ට ඕනෑ හැටියට කරගෙන යන්න පසුගිය කාලයේ ඉඩ දීලා තිබුණා. හැබැයි, අපි මොකද කළේ? ඒ වගාවන්ට පොහොර දාලා, විවිධ ක්‍රම තුළින් නිෂ්පාදනය වැඩි කරගන්න අපි කටයුතු කළා. ඒ හරහා අපට පසුගිය කාලයේදී පුළුවන් වුණා, අපේ නිෂ්පාදනය බොහෝ දුරට වැඩි කරගන්න. ඒ විතරක් නොවෙයි, ප්‍රතිඅපනයනය කිරීම නිසා පසුගිය කාලයේ අපේ නිෂ්පාදනවලට - විශේෂයෙන්ම අපනයන භෝග නිෂ්පාදනවලට - තිබුණු ඉල්ලුම සහ ගුණාත්මකභාවය අඩු වෙලා තිබුණා. ඒ ඉල්ලුම සහ ගුණාත්මකභාවය වැඩි කරගන්නත් අපි පසුගිය කාලයේ සමත් වුණා. "ප්‍රජා ශක්ති" වැනි විවිධ වැඩසටහන් තුළින් ගොවීන්ට ප්‍රතිලාභ ලබා දීලා, ඒගොල්ලන්ට තමන්ගේ කර්මාන්තය ශක්තිමත් කරගන්න අපි අවස්ථාව අරගෙන දුන්නා.

මම මාතලේ දිස්ත්‍රික්කයයි නියෝජනය කරන්නේ. මාතලේ දිස්ත්‍රික්කයේ අපනයන භෝග නිෂ්පාදනවලට හොඳ මිලක් ලබා දීම සඳහා වෙළෙඳ පොළක් - ආර්ථික මධ්‍යස්ථානයක් - ගොඩනඟන්න අපි වැඩ කටයුතු කරගෙන යනවා. මාතලේ දිස්ත්‍රික්කයේ අපනයන භෝග නිෂ්පාදකයන් 32,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්න බව අපි දන්නවා. ඒ දිස්ත්‍රික්කය තුළ විතරක් මේ කටයුත්තට සවිය දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ හින්දා අපනයන භෝග සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුළ ආර්ථික මධ්‍යස්ථානයක් ගොඩනඟන්න අපි වැඩ කටයුතු කරමින් යනවා. පසුගිය කාලයට සාපේක්ෂව මේ වසර තුළ අපි අපනයන භෝග ප්‍රවර්ධනය කරන්න අවශ්‍ය ශක්තිය ගොවීන්ට ලබා දීලා තිබෙනවා.

බොහෝ අය මේ සභාවේදී කරුණු මතු කළා, පොල් වගාව සම්බන්ධයෙනුත්. පසුගිය කාලයේ පොල් වගාවට විවිධ රෝග ඇති වුණේ පොහොර නැති වුණු නිසායි. ඒ වාගේම සුදුමැස්සාගේ හානියට සහ වෙනත් හානිවලට පොල් වගාව භාජන වුණේ

පොහොර සහනාධාරය නැති වුණු නිසායි. වෙළෙඳ පොළෙත් පොහොර නැති වුණු හින්දා ඒ තත්ත්වයට ගොවීන්ට මුහුණ දෙන්න සිද්ධ වුණා. අපි මොකද කළේ? අපි ඒ තත්ත්වය වෙනස් කළා. අපි ගොවීන්ට පොහොර සහනාධාරය දුන්නා. අපේ ආර්ථිකයේ අමාරුම අවස්ථාවක අපි මොකද කළේ? පොල් ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීලා, ඔවුන්ගේ ඉලක්ක අපි සම්පූර්ණ කර තිබෙනවා. ඒ තුළින් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. නිෂ්පාදනය වැඩි වීම තුළ මිල ඉහළ පහළ යෑම අපට පාලනය කරන්න බැරි වෙලා තිබෙනවා. නමුත් අපි මිල ඉහළ පහළ යෑමත් ඉදිරියේදී පාලනය කරනවා. මේ තත්ත්වයන් තුළ අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරලා, ඒ ආර්ථික ප්‍රතිලාභ අපනයන භෝග වර්ධනය කර ගැනීම සඳහා අපි පාවිච්චි කරනවා. ඒ හරහා අපේ විදේශ සංචිත වැඩි කරගෙන, අපනයන භෝගවලට අදාළ මිල ඒ ගොවීන්ට ලබා දීලා, ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරලා, ඔවුන් ශක්තිමත් කරලා, අපේ ආර්ථිකයේ වැඩි කොටසක් අපනයන භෝග තුළින් ලබා ගන්න අපි උත්සාහ කරනවා. පසුගිය කාලයේදී අපනයන භෝග සංවර්ධනය සඳහාත්, අපනයන භෝග වගා කරන ගොවීන් ශක්තිමත් කිරීම සඳහාත් අපි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. විශේෂයෙන්ම ගම්මිරිස් ගොවීන් සඳහා පොහොර සහනාධාර ලබා දීම වාගේම ඒගොල්ලන්ගේ කර්මාන්තයට අදාළ විවිධ තත්ත්වයන් අත්පත් කර දෙන්නත් අපි පසුගිය කාලයේදී සමත් වුණා.

අපේ රටේ කුරුඳුවලට ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙන බව අපි දන්නවා. අනෙක් රටවලට සාපේක්ෂව අපේ රටේ කුරුඳු ඉහළම මට්ටමක තිබෙනවා. අන්න ඒ මට්ටමට අනෙක් අපනයන භෝග වගාවනුත් ගෙනෙන්න තමයි අපි උත්සාහ කරන්නේ. අපේ උත්සාහය ඒකයි. ඒ හරහා ගොවීන් ශක්තිමත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක් ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

පසුගිය කාලය පුරාවටම අපේ රටේ කෘෂිකර්මයට ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් අපි අත්පත් කර දුන්නා. විශේෂයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රය ඇතුළේ ගොවීන්ට පොහොර සහනාධාරය නැති වීමත් එක්ක ඔවුන් වී වගාව සහ අනෙකුත් වගා කටයුතු අතහැර දමලායි තිබුණේ. මොකද, ඒගොල්ලන්ගේ නිෂ්පාදන වියදම වැඩියි. නිෂ්පාදන වියදම වැඩිවීමත් එක්ක ඒගොල්ලන්ට මේ වගාවන් පවත්වාගෙන යන්න බැහැ. හැබැයි, අපි කල්පනා කළා, රටක් හැටියට මෙන්න මේ වෙලාවේ අපට අල්ලන්න පුළුවන් ලෝකයේ තිබෙන වෙළඳ පොළවල් ගැන. අපේ රටේ කෘෂිකර්මය ඇතුළේ අපට නිෂ්පාදනය කරන්න පුළුවන් බොහෝ දේවල් තිබෙනවා. අපි ඒ බොහෝ දේවල්වලට සහනාධාර දීලා, නිෂ්පාදන වියදම අඩු කරලා ගොවීන් ශක්තිමත් කළා. ඒකේ ප්‍රතිලාභය රටටත් තිබෙනවා; ගොවීන්ටත් තිබෙනවා.

අපේ මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, ආර්ථික සංවර්ධනය සඳහා දායක වන සුළු අපනයන භෝග 15ක් තිබෙනවා. ඒක දැන් 14ක් වුණා. මොකද, කුරුඳු භෝගය වෙනුවෙන් අපි වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කළා. අනෙක් සුළු අපනයන භෝග 14ම තිබෙන දිස්ත්‍රික්කයක් තමයි මාතලේ දිස්ත්‍රික්කය. මාතලේ දිස්ත්‍රික්කය තුළ ඒ සුළු අපනයන භෝග 14ම නඟා සිටුවන්න, ශක්තිමත් කරන්න, සංවර්ධනය කරන්න "ප්‍රජා ශක්ති" වැඩසටහන ඇතුළේ, වෙනත් වැඩ පිළිවෙළවල් ඇතුළේ විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ ක්‍රියාමාර්ග ඔස්සේ අපි මේ වෙලාවේ දිස්ත්‍රික්කයක් හැටියට විශාල ජයග්‍රහණ අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම පොකුරු ගම්මාන හදලා 2030 වෙනකොට පොකුරු ගම්මාන 500කට යන්න අපේ ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කය සම්පූර්ණ කරලා, අපේ රටේ අපනයන භෝග නිෂ්පාදකයන්ගේ ප්‍රමාණය වැඩි කරලා, ඒ හරහා අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරලා ඩොලර් සංචිත වැඩි කරලා අපේ රටට ජයග්‍රහණ ගේන්න අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gnanamuththu Srineshan. You have eight minutes.

[பி.ப. 12.12]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, விவசாய ஏற்றுமதியோடு தொடர்புடைய இன்றைய விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

வள ரீதியாகப் பார்க்கின்றபோது - நீர் வளம், நில வளம், காலநிலை பொருத்தப்பாடு என்பவற்றின் அடிப்படையில் பார்க்கின்றபோது - இந்த நாடு விவசாயப் பொருளாதாரத்துக்கு மிகவும் பொருத்தமுடையதாகக் காணப்படுகின்றது. விவசாயத்தின்மூலம் ஏற்றுமதியை அதிகரித்து இறக்குமதியைக் கட்டுப்படுத்துகின்றபோதுதான் பற்றாக்குறையை அல்லது துண்டுவிழும் தொகையைத் தவிர்த்துக்கொள்வதற்கு வாய்ப்பு இருக்கின்றது. 2025ஆம் ஆண்டின் புள்ளிவிபரத்தைப் பார்க்கின்றபோது, இறக்குமதிச் செலவினம் 21.5 பில்லியன் அமெரிக்க டொலராக இருக்கின்ற அதேவேளை, ஏற்றுமதி மூலம் கிடைத்த வருவாய் 17.25 பில்லியன் அமெரிக்க டொலராக இருக்கின்றது. இந்த இரண்டு தொகைகளையும் ஒப்பிட்டுப் பார்த்தால், 21.5 பில்லியன் அமெரிக்க டொலராகக் காணப்படுகின்ற இறக்குமதிச் செலவினத்திலிருந்து ஏற்றுமதி மூலமாகக் கிடைத்த 17.25 பில்லியன் அமெரிக்க டொலரைக் கழித்தால், 4.25 பில்லியன் அமெரிக்க டொலர் பற்றாக்குறையாக இருக்கின்றது. இது மறை கணியமான ஒரு விளைவாக இருக்கின்றது.

நாங்கள் அபிவிருத்தியடைந்த நாடுகளை எடுத்துப் பார்த்தால், அங்கு ஏற்றுமதி வருமானம் அதிகமாக இருக்கின்ற அதேவேளை இறக்குமதிச் செலவினம் குறைவாகக் காணப் படுகின்றது. ஏற்றுமதி வருமானத்தைவிட இறக்குமதிச் செலவினம் அதிகரித்துக் காணப்படுவது அபிவிருத்தி அடைந்துவரும் நாடுகளின் பொதுவான இயல்பாக இருக்கின்றது. கடந்த ஆண்டுகளுடன் ஒப்பிடுகின்றபோது, பற்றாக்குறை என்கின்ற துண்டுவிழும் தொகை குறைந்திருக் கின்றது. நாங்கள் விரைவாக முன்னேற்றமடைய வேண்டுமாக இருந்தால், ஏற்றுமதி விவசாய உற்பத்திகளின் அளவை மாத்திரமல்லாமல், அவற்றின் தரத்தையும் அதிகரிக்கவேண்டி இருக்கின்றது.

இங்கு இரண்டு விடயங்கள் இருக்கின்றன. ஒன்று அளவை அதிகரித்தல் - quantity increasing. இரண்டாவது, quality increasing - தரத்தை அதிகரித்தல். அளவை அதிகரித்தாலும் உற்பத்திப் பொருட்கள் தரமற்றவையாக இருக்குமாக இருந்தால், வெளிநாட்டுச் சந்தையில் எமது பொருட்களுக்குரிய மவுசு குறைவாக இருக்கும். அதாவது, நிரம்பலை அதிகரித்தாலும் கேள்வி குறைந்துவிடும். எனவே, எமது உற்பத்திப் பொருட்களின் தரத்தை அதிகரிக்கவேண்டிய கட்டாய கடப்பாடு இருக்கின்றது. அவ்வாறு தரத்தை அதிகரித்தால்தான் எமது பொருட்களுக்கான கேள்வி உலக சந்தையில் அதிகமாகக் காணப்படும்.

எங்களுடைய பாரம்பரிய ஏற்றுமதிப் பொருட்களாக தேயிலை, இறப்பர், தெங்குப் பொருட்கள் காணப்படுகின்றன. அதேவேளை, சிறு ஏற்றுமதிப் பயிர்கள் என்று நாங்கள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

சொல்கின்ற வாசனைத் திரவியங்களும் காணப்படுகின்றன. உதாரணத்துக்கு, ஏலம், கறுவா, கராம்பு, மிளகு, சாதிக்காய் முதலியவற்றைக் குறிப்பிடலாம். இந்த உற்பத்திப் பொருட் களின் அளவையும் தரத்தையும் நாங்கள் அதிகரிக்கின்றபோது, எமது ஏற்றுமதி வருவாயை அதிகரித்துக் கொள்வதற்கு வாய்ப்பு இருக்கின்றது.

கிராமிய மட்டத்தில் 70 சதவீதமான மக்களும் நகர மட்டத்தில் 30 சதவீதமான மக்களும் வசிப்பதாகக் கூறப்படு கின்றது. நாங்கள் கிராமியப் பொருளாதாரத்தை அல்லது கிராமிய விவசாயப் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதன் மூலம்தான் ஏற்றுமதியை அதிகரித்து, பொருளாதாரத்தை உயர்த்தக்கூடியதாக இருக்கும். எனவே, ஊழல், மோசடி, வீண்விரயங்களைத் தவிர்த்து, உற்பத்தியை அதிகரிப்பதற்கான செயற்பாடுகளை நாங்கள் முன்னெடுக்க வேண்டும். அதேவேளை, எமது நாடு தற்சார்புப் பொருளாதாரத்துக்குள் - சுயசார்புப் பொருளாதாரத்துக்குள் - வரக்கூடிய ஒரு சூழ்நிலையை உருவாக்க வேண்டும். நாங்கள் மற்றைய நாடுகளில் தங்கியிருக்கின்ற பொருளாதார நிலைமையில்தான் நீண்ட காலமாக இருந்துகொண்டு இருக்கின்றோம். இலங்கை சுதந்திரம் அடைகின்றபோது, ஆசியாவில் எமது நாட்டின் பொருளாதார நிலை சாதகமான நிலையில் இருந்ததாகக் கூறப்படுகின்றது. அதாவது, எமது நாடு பொருளாதாரத்தில் யப்பானுக்கு அடுத்ததாக இருந்ததாகச் சொல்லப்படுகின்றது. அந்நியர்கள் வெளியேறியதன் பின்னர், நமது நாட்டின் பொருளாதாரத்தை நாங்கள் எந்தளவுக்குக் கட்டியெழுப்பி இருக்கின்றோம் என்ற கேள்வியை நம்மை நாமே கேட்கவேண்டி இருக்கின்றது.

இனவாதம், மதவாதம், பிரதேசவாதம் காரணமாக இந்த நாட்டில் பல்வேறுபட்ட பிரச்சினைகள் காணப்பட்டன. அபிவிருத்தியை நோக்கிய செயற்பாடுகளைவிட, போராட்டம், கிளர்ச்சி அடிப்படையிலான செயற்பாடுகளே இங்கு அதிகமாக இருந்தன. இந்த நாட்டில் இருக்கின்ற தீர்க்கப்படாத பிரச்சினைக்குரிய தீர்வைக் காண்பதை விடுத்து, சம்பந்தப்பட்ட தரப்பினரை அடக்கி ஒடுக்குவதற்குப் பலத்தைப் பிரயோகிக்கிறோம். அதாவது, உற்பத்திக்காகப் பயன்படுத்த வேண்டிய பலத்தை நாங்கள் அழிவு ரீதியான செயற்பாட்டுக்குப் பயன்படுத்தி இருக்கின்றோம். இந்த நாட்டின் பொருளாதாரம் விவசாயப் பொருளாதாரமாக இருந்தால் என்ன, கைத்தொழில் பொருளாதாரமாக இருந்தால் என்ன, சுற்றுலாத்துறை சார்ந்த பொருளாதாரமாக இருந்தால் என்ன, நாட்டில் புரையோடிப்போய் இருக்கின்ற தேசிய இனப் பிரச்சினையைத் தீர்க்கின்றபோதுதான் இந்த நாட்டுக்கு முதலீட்டாளர்கள் மிகவும் இலகுவாக வந்து முதலீடுகளைச் செய்யக்கூடிய நிலைமை உருவாகும். எனவே, நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்குச் சாதகமான நிலைமைகளை ஏற்படுத்தவேண்டிய தேவை இருக்கின்றது.

இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். நேற்றைய தினம் உயிர்த்த ஞாயிறு தாக்குதல் தொடர்பான நீதிமன்றத் தீர்ப்பு கிடைத்திருக்கின்றது.

"எய்தவன் இருக்க அம்பை நோவதேன்" என்று தமிழில் ஒரு பழமொழி இருக்கின்றது. உண்மையில் உயிர்த்த ஞாயிறு தாக்குதல் என்பது, முக்கியமான புள்ளிகள் மூலமாகத் திட்டமிடப்பட்டு மேற்கொள்ளப்பட்டு இருக்கின்றது. அவர்கள் 'வில்லுகளாக' அல்லது வில்லர்களாக இருந்திருக்கிறார்கள். அந்த வில்லர்கள் அல்லது வில்லங்கமானவர்கள் இந்தத் தாக்குதலைச் செய்வதன் ஊடாக அரசியல் இலாபத்தை அடைந்திருக்கிறார்கள்.

தற்போது பார்க்கின்றபோது, 24 சந்தேக நபர்கள்மீது தொடுக்கப்பட்ட அந்த வழக்கில், ஒருவர் இறந்து விட்டார். மிகுதி 23 பேரில் 9 பேர் விடுதலை செய்யப்பட, 14 பேர் குற்றவாளிகளாகக் காணப்பட்டுள்ளார்கள். இந்த வழக்கில் வழங்கப்பட்ட தீர்ப்பானது, 2,076 சான்றுப்பொருட்கள் மற்றும் 22,270 குற்றச்சாட்டுகள் தொடர்பில் இரவு பகலாக விசாரணை நடத்தப்பட்டு வழங்கப்பட்டதாகச் சொல்லப்படு கின்றது. எனவே, மிகவும் உன்னிப்பாக ஆராய்ந்து தீர்ப்பு வழங்கப்பட்டுள்ளது. கிட்டத்தட்ட 268 அப்பாவிகள் வழிபாட்டுத் தலத்தில் படுகொலை செய்யப்பட்டு இருந்தார்கள்; 568 பேர் படுகாயமுற்று இருந்தார்கள். பாதிக்கப் பட்ட மக்கள் நீதி கிடைக்காத நிலையில் நீண்ட காலமாக ஏங்கிக்கொண்டு இருந்தார்கள். கடந்த காலங்களில் அம்மக்களுக்கான நீதி மறுக்கப்பட்டு இருந்தது. இப்போது ஓரளவுக்கு அந்த விடயத்தில் குற்றவாளிகள் கண்டுபிடிக்கப் பட்டு இருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gnanamuththu Srineshan, your time is up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Just one more minute, Sir.

சந்தேகநபர்கள் 8 பேர் சாட்சிகளாக மாறி - approver - சாட்சியமளித்து இருக்கிறார்கள். அந்தச் சாட்சியங்களை நீதிமன்றம் ஏற்றுக்கொண்டு, இந்தத் தண்டனையைக் கொடுத்திருக்கின்றது. குற்றவாளிகள் அடையாளம் காணப்பட்டு, 9 பேர் விடுதலை செய்யப்பட்டிருப்பது வரவேற் கத்தக்க விடயமாகும். தண்டிக்கப்பட்டவர்கள் பாதிக்கப்பட்டு இருந்தால் மேன்முறையீடு செய்வதற்கும் வாய்ப்பு இருக்கின்றது. அதேவேளை, இந்த உயர்த்த ஞாயிறு தாக்குதலின் முக்கிய சூத்திரதாரிகள் இன்னும் திரைமறைவில் இருந்துகொண்டு இருக்கின்றார்கள். அவர்களைத்தான் நான் வில்லுகள் என்று சொல்கின்றேன். 'அம்புகள்' தண்டிக்கப்படு கின்றபோது முக்கியமான 'வில்லுகளும்' - வில்லர்களும் - தண்டிக்கப்பட வேண்டும்.

இப்போது முன்னாள் புலனாய்வுத்துறை அதிகாரி ஒரு வில்லன் என்ற அடிப்படையில் இருக்கின்றார். அதேபோன்று, அவருக்குப் பின்னால் நின்று இயக்கியவர்களும் சட்டத்தின் முன் நிறுத்தப்படுகின்றபோதுதான் இந்த நாட்டில் சட்டவாட்சி இருக்கின்றது, ஜனநாயகம் இருக்கின்றது, குற்றவாளிகள் தண்டிக்கப்படக்கூடிய சூழ்நிலை இருக்கின்றது என்பதை நிரூபிக்க முடியும். ஆகவே, இதனைத்தொடர்ந்து முக்கியமான சூத்திரதாரிகள் யார் என்று கண்டுபிடிக்கப்பட்டு அவர்களுக் குரிய தண்டனை கொடுக்கப்படல் வேண்டும். குற்றவாளிகள் எந்தவொரு சந்தர்ப்பத்திலும் பாதுகாக்கப்படு கின்ற அல்லது பதவி உயர்த்தப்படுகின்ற அல்லது அவர்களை அதிகார நாற்காலிக்குக் கொண்டுவருகின்ற பழைய மரபுகள் இல்லாமல், உண்மையான குற்றவாளிகள் தண்டிக்கப்பட வேண்டும். இப்போது இருக்கின்ற அம்புகளைவிட, முக்கியமான வில்லர்கள் - வில்லங்கர்கள் - தண்டிக்கப்பட வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kitnan Selvaraj. You have eight minutes.

[பி.ப. 12.21]

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஏற்றுமதி கமத் தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மிகவும் சந்தோஷமடைகின்றேன்.

இந்த நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற பிரதான உற்பத்திப் பொருட்களை ஏற்றுமதிப் பொருட்களாக மாற்று வதன் ஊடாக அமெரிக்க டொலர்களைப் பெற்று, அதனூடாக இந்த நாட்டை அபிவிருத்தி செய்வதற்கான ஆரம்ப நடவடிக்கையாகவே நாங்கள் இதனைக் காண்கின்றோம்.

இந்தப் பாராளுமன்ற அமர்வில் பேசிய எதிர்க்கட்சியினரின் ஆலோசனைகள், அவர்களுடைய விமர்சனங்கள் அல்லது அவர்களுடைய கருத்துகளைப் பார்க்கின்றபோது, அவை இந்த நாட்டை 76 ஆண்டுகள் மாறி மாறி ஆட்சி செய்தவர்களின் எதிரொலியாகவே இருக்கின்றன. ஏன் அவ்வாறு கூறுகிறோம் என்றால், கடந்த காலங்களில் இந்த நாட்டை அபிவிருத்திப் பாதையில் கொண்டு செல்லாதவர்கள், எங்களுடைய அரசாங்கம் ஆட்சிபீடம் ஏறி 2 ஆண்டு காலத்தில் எல்லாவற் றையும் செய்ய வேண்டுமென்று அடுக்கடுக்காக ஆலோசனை களையும் விமர்சனங்களையும் முன்வைக் கின்றனர். அதனைப் பார்க்கின்றபோது கவலையாக இருக்கின்றது. 2030ஆம் ஆண்டில் இந்த நாட்டில் வறுமையொழிப்பை இந்த அரசாங்கம் மேற்கொள்ள இருக்கின்றது. இந்த நாட்டின் உற்பத்தியை அதிகரித்து, அதனூடாக நாட்டுக்கு 30 சதவீதமான அமெரிக்க டொலர்களைப் பெற்றுக்கொள்ள உள்ளோம். அந்த வகையில், இந்த நாட்டை அபிவிருத்தி செய்வதற்கான முன்னெடுப்புகளை அரசாங்கம் மேற்கொண்டு வருகின்றது.

இன்று கௌரவ அமைச்சரால் முன்வைக்கப்பட்டுள்ள கருத்துகளுக்கு அமைவாக மேலும் ஆராய்ந்து பார்க்கின்ற பொழுது, இலங்கையில் ஏற்றுமதிப் பொருட்களாக வரையறுக் கப்பட்டிருந்த தேயிலை, தென்னை, இறப்பர் ஆகியவற்றுள் தேயிலை உற்பத்தி தொடர்ச்சியாக வீழ்ச்சியடைந்து வருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. தேயிலை உற்பத்தியை மேலும் அதிகரித்து அதன்மூலம் வெளிநாட்டுச் செலாவணியை முன்னர் போன்று மீண்டும் பெற்றுக் கொள்வதற்கான வேலைத்திட்டமொன்றை அரசாங்கம் முன்னெடுத்திருக்கின்றது. அதுவே 500 "Ceylon Tea Villages" என்னும் வேலைத்திட்டமாகும். இந்தத் திட்டத்தின் முதற் கட்டமாக 144 தேயிலைக் கிராமங்களை - Ceylon Tea Villages - உருவாக்குவதற்குத் தற்பொழுது நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். பெருந்தோட்டப் புறங்களில் இருக்கின்ற கூடுதலான தேயிலைத் தொழிற்சாலைகள் இன்று மூடு விழாவைச் சந்தித்துவருகின்றபொழுது, எதிர்காலத் தேயிலை ஏற்றுமதி நிலை பற்றி நாங்கள் கவலைப்பட வேண்டியிருக்கின்றது.

1992ஆம் ஆண்டு 449 பெருந்தோட்டங்கள் 22 பல்தேசியக் கம்பனிகளுக்குத் தாரைவார்க்கப்பட்டன. இன்று நாங்கள் திரும்பிப் பார்க்கின்றபொழுது, இலங்கையில் 203 தேயிலைத் தொழிற்சாலைகள் முற்றாக மூடப்பட்டிருப்பதைக் காண்கின் றோம். இவ்வாறு 203 தேயிலைத் தொழிற்சாலைகளும் மூடப்படுவதற்குப் பிரதான கதாபாத்திரங்களாக இருந்தவர்கள் கடந்த கால ஆட்சியாளர்கள்தான். இரண்டு வருடங்களைப் பூர்த்திசெய்துள்ள இந்த அரசாங்கத்துக்கு அவர்கள் சில முன்மொழிவுகளை இந்தச் சபையில் முன்வைக்கின்றார்கள். இதன்மூலம் எதிர்க்கட்சியினரின் வங்குரோத்து நிலையை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது.

செவ்விளநீர் கிராமம் - 'තැඹිලි - 250' என்ற இன்னும் ஒரு திட்டத்தையும் நான் அறிமுகப்படுத்தி இருக்கிறோம். அந்த வகையில், இந்த வருடத்திற்குள் அத்தகைய 75 கிராமங்களை உருவாக்குவதற்கான நடவடிக்கைகளில் எமது அரசாங்கம் ஈடுபட்டுள்ளது. தென்னையின் வரலாற்றை எடுத்துப் பார்த்தால், 1928ஆம் ஆண்டின் 29ஆம் இலக்க, தெங்கு ஆராய்ச்சி கட்டளைச் சட்டத்தின்கீழ், 1929இல் தென்னை ஆராய்சி நிறுவனம் உருவாக்கப்பட்டது. இன்று அது 97 வருடங்களைப் பூர்த்தி செய்கின்றபொழுது, இந்த நாட்டில் தெங்கு உற்பத்தி எந்தளவில் இருந்திருக்கின்றது என்பது எம் அனைவருக்கும் தெரியும். 1971ஆம் ஆண்டில் இது ஓர் அபிவிருத்தி நிறுவனமாக பெருந்தோட்ட அமைச்சின்கீழ் கொண்டுவரப்பட்டு இருந்தபோதிலும், கடந்த காலத்தில் இதுவொரு நலிவடைந்த நிறுவனமாகவும் நலிவடைந்த துறையாகவுமே இருந்தது. குறிப்பாக, தென்னந்தோட்டங் களைச் சரிவரப் பராமரிக்காமல் இருந்ததன் காரணமாக இந்த நாட்டிலே பாரிய தேங்காய் தட்டுப்பாடும் உப உற்பத்திப் பொருட்களை ஏற்றுமதி செய்ய முடியாத நிலையும் காணப்பட்டது.

ஆட்சிபீடம் ஏறிய எங்களுடைய அரசாங்கத்துக்கு இது பெரும் சவாலாக இருந்தது. இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தச் சட்டமூலமானது, இலங்கையில் இருக்கின்ற சிறு மற்றும் நடுத்தர உற்பத்தியாளர்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கு ஏதுவான ஒரு சட்டமூலமாக அமையும். விசேடமாக, பெருந்தோட்டத்துறைக் கென இதற்கு முன்னர் பல அமைச்சர்களும் பிரதி அமைச்சர்களும் இருந்திருக்கின்றபோதிலும், மலையகத்திலோ அல்லது பெருந்தோட்டப் பகுதிகளிலோ சிறு ஏற்றுமதிப் பயிர்களை அபிவிருத்தி செய்வதற்கு எந்தவித வேலைத் திட்டங்களும் அவர்களால் முன்னெடுக்கப்படவில்லை. இதன் காரணமாக வெறுமனே தேயிலையை மட்டுமே நம்பியிருக்கின்ற நிலைமை இன்று பெருந்தோட்டத்துறைக்கு ஏற்பட்டுள்ளது.

மலைநாட்டில் கடந்த காலத்தில் தேயிலைத் தோட்டங் களாக இருந்து, இன்று பற்றைக்காடுகளாக மாறியிருக்கின்ற நிலங்களில், எதிர்காலத்தில் சிறு ஏற்றுமதிப் பயிர்களை உற்பத்தி செய்யும் நடவடிக்கைகளை எங்களுடைய அரசாங்கம் இந்தச் சட்டமூலத்தின்மூலம் முன்னெடுக்கும். அதனூடாகப் பெருந்தோட்டத்துறையில் மாற்றுப் பயிர்களை அபிவிருத்தி செய்வதற்கான நிலைமை உருவாகும். அதனூடாக இந்த நாட்டில் கிராமப்புற மற்றும் தோட்டப்புறங்களில் உள்ள மக்களின் ஏழ்மையை ஒழித்து, இந்த நாட்டு மக்களுக்கு ஒளிமயமான எதிர்காலத்தைப் பெற்றுக்கொடுப்பதற்கு எங்களுடைய அரசாங்கம் தயாராக இருக்கின்றது என்று கூறி, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of this House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.00]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு என்னுடைய கருத்துகளை இங்கு முன்வைக்கலாமென நினைக்கின்றேன்.

இலங்கையின் பொருளாதாரத்தில் ஏற்றுமதி என்பது முக்கியமானது. அதிலும் விவசாயம் மிக முக்கியமானது. இலங்கையின் விவசாயத்தில் மலையகப் பிரதேசத்தில் உற்பத்தியாகின்ற தேயிலையானது பெரும்பங்கு வகிப்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. அதுதான் இலங்கைக்கு அதிகளவு வருமானத்தை ஈட்டித்தரக்கூடிய துறைகளில் மூன்றாவது இடத்தில் இருக்கின்றது. எனினும், அத்துறை சார்ந்த தொழிலாளர்களின் சம்பளம் சொச்சமாக இருக்கின்றது என்பதை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த வேண்டும்.

இன்று தேயிலை உற்பத்தித் துறையில் சில பிரச்சினைகள் காணப்படுகின்றன என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். "Ceylon Tea" என்பது மிகவும் பிரசித்திபெற்றது. எனினும், வெளிநாடுகளில் இருந்து மட்டமான தேயிலையைக் கொண்டுவந்து, அதை இங்கிருக்கின்ற பெயர்பெற்ற தேயிலையோடு கலந்து, மீள் ஏற்றுமதி செய்கின்ற நடைமுறை இருப்பதால், இலங்கையின் தேயிலை வருமானம் வீழ்ச்சி யடைந்து வருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. தயவுசெய்து, இவ்வாறான நிகழ்வுகள் நடைபெறாமல் பார்த்துக்கொள்ள வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

நுவரெலியா மாவட்டத்தில் வருடத்தின் 365 நாட்களும் மரக்கறி உற்பத்தி நடைபெற்று வருகின்றது. இந்த மாவட்டத்திலுள்ள மரக்கறி விவசாயிகளின் நிலை இப்பொழுது கேள்விக்குறியாகி உள்ளதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. ஏனென்றால், ஒரு பக்கம் மழையின் தாக்கம்; மறுபக்கம் வெயிலின் தாக்கம்! இவற்றுக்கு அப்பால், விவசாயத்தில் ஈடுபடுகின்ற மக்கள் தங்களின் உற்பத்திக்குத் தகுந்த விலை கிடைக்காமல் மிகவும் கஷ்டப்படுகின்ற நிலையும் ஏற்பட்டு இருக்கின்றது. நீங்கள் கேட்கலாம், இப்பொழுது ஒரு கிலோகிராம் கிழங்கு 310 ரூபாய்க்கு விற்கப்படுவது உங்களுக்குப் போதாதா? என்று. இது தற்காலிகமான ஒரு நிலையாகத்தான் இருக்கின்றது. මේක තාවකාලිකයි. எனவே, இதனை முறையாக அமுல்படுத்து வதற்கு விவசாயத் திணைக்களம் அல்லது விவசாய அமைச்சு முயற்சிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று விவசாயத்தில் ஈடுபடுகின்றவர்களில் அநேக மானோர் குறிப்பிட்டதொரு விவசாயத்தைச் செய்யும் நிலை மாறி வருகின்றது. பொரகாஸ், வெலிமடை போன்ற பகுதிகளில் போஞ்சி உற்பத்தி செய்யலாம். ஆனால், இப்பொழுது அங்குள்ள விவசாயிகளும் நுவரெலியாவில் உற்பத்தியாகின்ற கரட், லீக்ஸ் போன்றவற்றைப் பயிரிடு வதால் நுவரெலியா விவசாயிகளின் மரக்கறி உற்பத்திகளின் விலை குறைவடைந்து இருக்கின்றது. மற்றவர்களுக்கும் சந்தர்ப்பம் கிடைக்க வேண்டும் என்பதற்காக கடந்த காலத்தில் ஒரு பொறிமுறை இருந்தது. அதாவது, அந்தந்தப் பிரதேசத்தில் அந்தந்த மரக்கறி வகைகளைத்தான் பயிரிட வேண்டும் என்பதுதான் அது. ஆனால், இப்பொழுது அப்படி இல்லாததாலும், hybrid விதைகள் கிடைப்பதாலும், எல்லாப் பிரதேசங்களிலும் மரக்கறி உற்பத்தி செய்யப்படுவதாலும் மிகவும் பாதிக்கப்படுகின்ற நிலை நுவரெலியா மாவட்ட விவசாயிகளுக்கு ஏற்பட்டு இருக்கின்றது.

அடுத்து, கிழங்கு உற்பத்தி பற்றி சொல்ல வேண்டும். உள்நாட்டில் 40 சதவீத கிழங்கு உற்பத்தியைச் செய்தால் மட்டுமே அதற்கு உரிய விலை கிடைக்கும். ஆனால், இன்று இலங்கையில் ஒட்டுமொத்தமாக 15 சதவீதமான கிழங்குதான் உற்பத்தி செய்யப்படுகின்றது. உள்நாட்டில் போதியளவு கிழங்கு உற்பத்தி செய்யப்படாத நிலையில், வெளிநாடுகளில் இருந்து கிழங்கு இறக்குமதி செய்யப்படுவதால் உள்ளூர் விவசாயிகளுக்கு உரிய விலை கிடைக்காமல் போகின்றது. இதைக் கருத்திற்கொண்டு, உள்ளூரில் 40 சதவீத கிழங்கு உற்பத்தியை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதை நான் இந்த நேரத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற சில பிரச்சினைகள் பற்றி நான் இங்கு காட்டாயம் பேச வேண்டும். விசேடமாக, ஹற்றன் கல்வி வலயத்தில் ஏற்பட்டிருக்கின்ற ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். இது உண்மையா, பொய்யா என்பது இன்னும் எங்களுக்குச் சரியாகத் தெரியாது. இருந்தாலும், நான் கேள்விப்பட்ட விடயங்களை இந்தப் பாராளுமன்றத்தில் சொல்ல நினைக்கின்றேன். அதாவது, ஹற்றன் கல்வி வலயத்தின் கல்விக் காரியாலயத்துக்கு 67 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டு இருப்பதாகவும், அந்தக் கல்விக் காரியாலயத்தை ஹற்றனிலிருந்து வெளியே கொண்டுபோய் கினிகத்தேன அல்லது வேறு பகுதியில் கட்டுவதற்கு நடவடிக்கை எடுக்கப்படுவதாகவும் நாங்கள் அறிகின்றோம். இது முற்றிலும் பிழையானதொரு விடயம் என்பதை நான் இந்த நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்தப் பகுதியிலுள்ள 150 பாடசாலைகளில் 130 பெருந்தோட்டப் பாடசாலைகள் இருக்கின்றன. அங்கு கிட்டத்தட்ட 43,016 students இருக்கிறார்கள்; 105 principals இருக்கிறார்கள்; 2,740 teachers இருக்கிறார்கள். எனவே, இந்தக் கல்விக் காரியாலயமானது ஹற்றனில் அமைய வேண்டும் என்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது.

இங்கு எங்களுடைய DCC Chairman மஞ்ஜுள சுரவீர ஆரச்சி அவர்கள் இருக்கிறார். அவருக்கு என்னுடைய யோசனையைச் சொல்லலாமென விரும்புகின்றேன். இப்பொழுது ஹற்றனில் இருக்கும் பெரும் பிரச்சினை குப்பைப் பிரச்சினையாகும்.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මම කථා කරලා ඉවර වුණාට පස්සේ ගරු මන්ත්‍රීතුමා උත්තර දෙන්න. කමක් නැහැ.

හැටන් නගරයේ තිබෙන්නේ කුණු ප්‍රශ්නයක්. මේ කුණු ප්‍රශ්නය ඉවර කරන්න ඕනෑ. හැටන් නගරයේ rest house එක තිබෙන ඉඩමට දැන් කුණු දමනවා. ඒ කුණු අයින් කරලා ඒ rest house එක තිබෙන තැන education office එක හදන්න පුළුවන්. Education office එක එතැන හදනවා නම්, ඔයගොල්ලන්ට කුණු දමන්න වෙන ඉඩමක් බලන්න. අපිත් ඒකට උදවු කරන්නම්. මට උදවු කරන්න පුළුවන්. ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමාත් ඉන්නවා නේ. එතුමාටත් උදවු කරන්න පුළුවන්. අපි සියලුදෙනාම එකතු වෙලා මේ කුණු දමන ප්‍රශ්නය ඉවර කරමු. හැබැයි, කලාප කාර්යාලය වෙන තැනකට ගෙනියන එකට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. ඒක හොඳ නැහැ කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

கொட்டகலையில் இருக்கின்ற Ceylon Petroleum Corporationக்குச் செல்கின்ற பாதை கிட்டத்தட்ட 30 வருடங்களாக மூடப்பட்டு இருக்கின்றது. யுத்த காலத்தில் மூடப்பட்ட இந்தப் பாதை மீண்டும் திறக்கப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், அது அதிகமான மக்கள் போக்குவரத்துச் செய்கின்ற பாதையாக இருக்கின்றது. கொழும்பில் இன்று அலரி மாளிகைக்கு அருகிலுள்ள பாதைகூட திறந்து விடப்பட்டு இருக்கின்றது. ஏன் கொட்டகலையிலுள்ள இந்தப் பாதையைத் திறக்காமல் இருக்கின்றீர்கள்? தயவுசெய்து, இந்தப் பாதையையும் திறந்து விடுங்கள்! இப்பொழுது நாட்டில் எந்தப் பிரச்சினையும் இல்லை. சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் எல்லோரும் ஒற்றுமையாக இருக்கிறார்கள்.

அரசாங்கமானது, அனேஜனின் விடயத்தில் எடுக்கின்ற நடவடிக்கையை நாங்கள் நிச்சயமாகப் பாராட்ட வேண்டும். சவூதியில் இருக்கின்ற அந்த இளைஞனை விடுவிப்பதற்கான நடவடிக்கையை அரசாங்கம் முழுமூச்சுடன் எடுத்து வருகின்றது. நேற்று உயிர்த்த ஞாயிறு தாக்குதல் தொடர்பான வழக்கின் தீர்ப்பு வழங்கப்பட்டு இருக்கின்றது. இவை எல்லாம் அரசாங்கத்துக்கு plus point என்பதைத் தெரிவித்துக்கொண்டு, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රාධක්‍රිෂ්ණන් මැතිතුමා මගේ නම සඳහන් කළා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විධියට මගෙන් එතුමා පිළිතුරු කිහිපයක් බලාපොරොත්තු වුණා. පළමුවැනි කාරණය මේකයි. හැටන් කලාප අධ්‍යාපන කාර්යාලය වෙනත් ප්‍රදේශයකට ගෙනියන්න හදනවා කියලා වැරදි සහගත ප්‍රකාශයක් මතු වුණා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. අපි ගිය අවුරුද්දේත් රුපියල් මිලියන 65ක් වෙන් කරලා හැටන් කලාප අධ්‍යාපන කාර්යාලය හැටන් නගරයේ ස්ථාපිත කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒකට විශේෂ බාධාවක් තිබෙනවා. ඒ, ඉඩම් ප්‍රශ්නයක්. ඒක ඔබතුමාත් දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අධ්‍යාපන නියෝජ්‍ය ඇමති වෙලා සිටි කාලයේ පවා අපට ඒ සඳහා තැනක් වෙන් කර ගන්න බැරි වුණා. නමුත් අපි ඒකට විකල්ප තුනක් යෝජනා කරලා, දැන් අදාළ කටයුතු සූදානම් වෙමින් තිබෙනවා. ඒක නිසා බිල්ලෝ මවන එක, වැරදි තොරතුරු කියන එක කරන්න එපා කියලා මම අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

මම කාලයක් තිස්සේ - අවුරුදු 20ක් - නුවරඑළිය දිස්ත්‍රික් ගුරු සංගමයේ ලේකම් විධියට කටයුතු කළා. ඒ නිසා මේකේ වටිනාකම මම හොඳටම දන්නවා. පාසල් 150ක් තිබෙනවා, හැටන් කලාපය ආශ්‍රිතව. ඒකේ centre එක වෙන්නේ හැටන් නගරය. මේ කලාප කාර්යාලය ඉතා පහසුවෙන් ඈතකට ගෙනියන්න පුළුවන්. නමුත් අපි ඒක කරන්න යන්නේ නැහැ. ගුරුවරුන්ටත්, අදාළ සේවා ලබා ගන්නා සියලුදෙනාටත් පහසු වෙච්ච හැටන් නගරයේ අපි ඒක අනිවාර්යයෙන් ස්ථාපිත කරනවා. ඒක තමයි මට කෙටියෙන් කියන්න තිබෙන්නේ.

දෙවැනි කාරණය මේකයි. ඔබත් දන්නවා, මමත් දන්නවා, අවුරුදු 36ක් තිස්සේ හැටන් නගරයේ කැළි කසළ ප්‍රශ්නයට විද්‍යාත්මක උත්තරයක් හොයන්න බැරි වෙලා තිබෙන බව. කාලයක් තිස්සේ කැකෑරෙමින් තිබිච්ච ඒ ප්‍රශ්නය අලුත් ආණ්ඩුව විධියට අපට තමයි විසඳන්න වෙලා තිබෙන්නේ. අපි ඒ වෙනුවෙනුත් විකල්ප ඉඩම් සඳහා විශාල වශයෙන් ඉල්ලීම් කළා. සංවේදී කලාපයක කැළි කසළ බැහැර කිරීමේ කටයුතු සකස් කිරීමට පරිසර අමාත්‍යාංශය සහ අනෙක් අමාත්‍යාංශ එක්ක සම්බන්ධීකරණයෙන් කටයුතු කරන්න ගියාම ගැටලු ටිකක් මතු වෙලා තිබෙනවා. නමුත් පරිසර අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව, ඉතාම සුරක්ෂිතව එහි නිර්දේශවලට යටත්ව අපි මේ ළඟදීම ඒකට මුල් ගල් තබනවා. අපි ඒ ප්‍රශ්නයටත් නිසි උත්තරයක් ලබා දෙනවා. කාලයක් තිස්සේ විසඳන්න බැරි වුණු ප්‍රශ්නයට නිසි උත්තරයක් දෙන්න ඒ අනුව අපි සූදානම් වෙලා තිබෙනවා. ඒකට තැනක් තෝරලා තිබෙනවා. ඒක පරිසර අමාත්‍යාංශයෙන් අනුමත කරලා තිබෙනවා. ඒ අනුව, කාලයක් තිස්සේ විසඳන්න බැරි වුණු ප්‍රශ්නයටත් අපි උත්තරයක් දෙනවා.

අනෙක් කාරණය කිව්වේ, කොටගල ප්‍රදේශයේ තිබෙන පාරක් සම්බන්ධවයි. ඔබතුමාගේ පැත්තෙන් මතු කළා, පසුගිය යුදමය කාලයේ වහලා තිබුණු, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ළඟින් යන පාරක් පිළිබඳව. එතැන ඒ පාර පුළුල් කරලා අදට ගැළපෙන විධියට සකස් කරන්න බැහැ. නමුත්, අපි ජනාධිපතිතුමා එක්කත්, DCC එකේදීත් කථා කරලා, මේ සම්බන්ධව ඉදිරියේදී තීන්දුවක් ගන්න බලාපොරොත්තු වනවා. ඒ අනුව ඊට අදාළ ක්‍රියාවලියක යෙදෙමින් සිටිනවා. ඒ ප්‍රශ්න ටික මතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා. කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ තිබෙන සුවිශේෂී වූ දෙපාර්තමේන්තුවක් තමයි, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. අද අපි සම්මත කරන්නේ, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක්. මෙහිදී සුවිශේෂීව සිද්ධ වන්නේ, පනතේ "අධ්‍යක්ෂවරයා" ලෙස සඳහන් වෙලා තිබෙන තනතුර "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සංශෝධනය වීමත්, ඒ වාගේම 3 වන වගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්" යන්න "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයන්, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්" ලෙස සංශෝධනය වීමත්, ඒ වාගේම ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "අපනයන කෘෂිකර්ම භෝගය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට " 'අපනයන කෘෂිකර්ම භෝගය' යන්නෙන්, ආහාර භෝග කාණ්ඩයට අයත් වන වී, එළවළු, පලතුරු, අල භෝග සහ අතිරේක ආහාර භෝග හැර" කියන සංශෝධනයයි. එම නිසා විශේෂයෙන්ම අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත ගත්තොත්, මේක කාලෝචිතව අනිවාර්යයෙන්ම වෙනස් විය යුතු බවත්, ඒ වාගේම මේ අවස්ථාව එය වෙනස් කිරීමට සුදුසු අවස්ථාව බවත් අපි විශ්වාස කරනවා.

ඒකට හේතුවත් මම කියන්නම්. 2025 අවුරුද්ද ගත්තොත්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ, අපේ රටේ හෙක්ටෙයාර 89,632ක පමණ භූමි ප්‍රමාණයක අපනයන භෝග වගා කළා. ඒ වාගේම ඒකෙන් අපට නිෂ්පාදනය හැටියට ලැබිලා තිබෙනවා, මෙට්‍රික් ටොන් 130,142ක විතර ප්‍රමාණයක්. හැබැයි, ඒ කරන නිෂ්පාදනයෙන් අපි අපනයනය කරන්නේ, මෙට්‍රික් ටොන් 40,288ක විතර ප්‍රමාණයක්. ආදායම හැටියට ගත්තොත්, රුපියල් මිලියන 87,121.13ක වාගේ ආදායමක් තමයි අපි ඒකෙන් ලබන්නේ. හැබැයි, ඒකෙදි අපි දැක්ක කරුණ තමයි, අපනයන භෝග විධියට අපි නිෂ්පාදනය කරන භෝග, නිසි නියාමනයක් නොවීම නිසා, ඒවායෙන් අපට හරියට ඒ අදාළ මිල ගන්න බැරි වීම. යුරෝපයේ වෙළෙඳ පොළත් එක්ක, එහෙම නැත්නම් අපට විදේශ වෙළෙඳ පොළත් එක්ක තරග කිරීමට තිබෙන බාධා ටිකත්, අපට මේ සංශෝධනයෙන් නිවැරදි කර ගන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ලංකාව පුරා අපනයන කෘෂිකර්ම භෝගයක් හැටියට ගම්මිරිස් වගා කරනවා. අපි 2030 වර්ෂය වනකොට ගම්මිරිස් වගා කරන ගම්මාන 500ක් ගොඩනඟා ගැනීමේ, ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙළක ඉන්නවා. මගේ දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක අපි පොකුරු ගම්මාන ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, යටිනුවර, කුණ්ඩසාලේ, උඩපළාත සහ මම ජීවත් වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් ඒ පොකුරු ගම්මාන සඳහා ගම්මාන කිහිපයක් තෝරා ගෙන තිබෙනවා. එක් ග්‍රාම නිලධාරි වසමක් නොවෙයි, පොකුරු ගම්මානයකට සම්බන්ධ වන්නේ. ගම්මාන කිහිපයක් තෝරා ගෙන, විශේෂයෙන්ම ගම්මිරිස් වගාව ගත්තොත්, ගම්මිරිස් වගාවට අවශ්‍ය පැළ ටික ලබා දෙනවා; ඒ අතු ටික කපා ගන්න අවශ්‍ය පහසුකම් අපි සපයනවා; ගම්මිරිස් ටික නෙළා ගන්න අවශ්‍ය ඉණිමඟ ලබා දෙනවා. ඒ පහසුකම් ටික අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලබා දෙන්න අපි සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම පොහොර ලබා දීමට අවශ්‍ය කටයුතුත් සිද්ධ කරනවා. හැබැයි, ඒ කටයුතු සියල්ල සිද්ධ කළත්, මේ නෙළා ගන්නා අස්වැන්න නිසි පරිදි ගබඩා කර ගැනීමේ පහසුකම් අපට තවම නැහැ. අද ගෙනෙන මේ පනතෙන් ඒ ගබඩා කර ගැනීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙනවා.

ඊළඟට අපි දැක්කා, ව්‍යාපාරික මහතුන් මේ අපනයන භෝග සංකලනයක්, ඒ කියන්නේ භෝග කිහිපයක් එක තැන ගබඩා කර ගන්නවා. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය බලපෑමට ලක් වෙන්න පුළුවන්. අපි හැම දාමත් වැඩි වශයෙන් - දැනට වුණත් - කරන්නේ කළු ගම්මිරිස් හැටියට ගම්මිරිස් අපනයනය කිරීමයි. අපට ලැබෙන්න තිබෙන විදෙස් ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඒ නිසා අහිමි වෙමින් තිබෙනවා. ඒකට අගය එකතු කරලා, අලුත් නිෂ්පාදන කරලා ලෝක වෙළෙඳ පොළේ අවශ්‍යතාවලට අනුව සපයන්න පුළුවන් නම් අද ගෙනෙන පනතේ ප්‍රතිලාභ හැටියට අපට වැඩි ආදායමක් ගන්න පුළුවන්කම තිබෙනවා. ගම්මිරිස්වලට අගය එකතු කිරීමේදී සියලු අපනයන භෝග නියාමනයට තිබුණු බාධා ඉවත් කර ගන්න සහ අඩුපාඩු ටික සම්පූර්ණ කර ගන්න අපට මේ පනත හරහා පුළුවන්කම ලැබෙනවා. ඒ අනුව බලනකොට මේ පනත ගෙනෙන එක ඉතාම කාලෝචිතයි.

උදාහරණයක් හැටියට මිනිපේ ගත්තොත්, වී ගොවිතැන තමයි එහි ප්‍රධාන ආදායම් මාර්ගය හැටියට තිබෙන්නේ. හැබැයි වී ගොවිතැනට වඩා ග්‍රාමීය ජන ජීවිතයේ පෞද්ගලික ආදායම් මාර්ග වැඩි කර ගන්න පුළුවන් විශේෂ භෝග හැටියට ගම්මිරිස්, කහ, ඉඟුරු වාගේ භෝග හඳුන්වන්න පුළුවන්. ජන ජීවිතයත් එක්ක ඉතාම ළඟ සම්බන්ධතාවක්, සෘජු සම්බන්ධතාවක් මේ භෝගවලට තිබෙනවා. අපේ විශේෂ සංකල්පයක් වන ග්‍රාමීය දුප්පත්කම නැති කිරීමේ සහ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩ නැඟීමේ පදනමේ මූලිකාංගයක් හැටියටත් අද සම්මත කරන මේ පනත විශේෂත්වයක් ගන්නා බව කියන්න පුළුවන්.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමාගෙන් අදහසක් ප්‍රකාශ වුණා, වතු ජනතාවගේ පඩිය මදි කියලා. ඔව්, ඒක අපි දන්නවා. හැබැයි ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපි මලෛයහම් ජනතාවගේ වැටුප රුපියල් 1,750 දක්වා ගෙනැල්ලා තිබෙනවා. මලෛයහම් ජනතාවගේ වැටුප වැඩි කළා විතරක් නොවෙයි, මේ වනකොට අපි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ඒ අයගේ ගෙවල් ටික හදන කටයුත්තත් පටන් අරගෙන තිබෙන්නේ, ඔවුන්ට ඉඩම් කොටසක් ලබා දීමේ කටයුත්තත් පටන් අරගෙන තිබෙන්නේ. ඒ වාගේම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු, සෞඛ්‍ය, මං මාවත් වාගේ ජන ජීවිතයට අවශ්‍ය පහසුකම්වලට අවශ්‍ය ප්‍රතිපාදන ටික සපයමින් ඉන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ අපේ ජීවිත තුළ තිබුණු වුවමනා, අපේ හැඟීම් සහ අපේ අවශ්‍යතා. බිමේ ජීවත් වුණු මිනිස්සු හැටියට, වතු ආශ්‍රිතව ජීවත් වන මලෛයහම් ජනතාවගේත්, සියලු පුරවැසියන්ගේත් හද කම්පනය පිළිබඳව සන්නිවේදනයක් ඉතා හොඳට තිබෙන මන්ත්‍රීවරුන් 159දෙනෙක් තමයි ආණ්ඩුව පැත්තෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. ඒ අනුව අපි ඒ අවශ්‍යතා සම්පූර්ණ කරනවා කියන පොරොන්දුව ලබා දෙමින්, ඒ සඳහා අපට අවශ්‍ය සහයෝගය දෙන්න කියා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

අපට අවශ්‍යයි හිනා වෙලා ඉන්න, සංවේදී සහ සහකම්පනය තිබෙන මිනිසුන් බහුතරයක් සිටින රටක් බවට මේ රට පත් කරන්න, ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න. ඒ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඔබතුමන්ලාගෙන් සහයෝගය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව නැවතත් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.20]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට අදහසක් එකතු කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. අද ගරු ඇමතිතුමා විවාදයට ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත වැවිලි කර්මාන්තයට අදාළ නොවුණත්, අද තේ අපේ අපනයන ක්ෂේත්‍රයේ ඉතාම වැදගත් භෝගයක් බවට පත් වෙලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේ අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. පසුගිය අවුරුද්ද එක්ක සංසන්දනය කරලා බලනකොට පසුගිය කාල සීමාවේ තේ අපනයනය පැත්තෙන් යම්කිසි පසුබෑමකට ලක් වෙලා තිබෙන බව අපි දකිනවා. අපට මතකයි, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා විවිධ අවස්ථාවල ප්‍රකාශ කළා, අපේ ඉලක්කය වෙලා තිබෙන්නේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 400ක් දක්වා වැඩි කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමයි කියලා. නමුත් කියන්න කනගාටුයි, මේ වසරේ පුරෝකථනය කරලා තිබෙන්නේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 256ක් වාගේ ප්‍රමාණයක්. එහෙම බැලුවාම, අද වන විට තේ නිෂ්පාදනයේ විශාල ප්‍රමාණයක අඩුවක් දකින්න ලැබෙනවා. ඒ අනුව ගරු අමාත්‍යතුමාත්, ආණ්ඩුවත් තේ කර්මාන්තය සංවර්ධනය කරන්න, වැඩිදියුණු කරන්න අරගෙන තිබෙන පියවරවලින් යම්කිසි සාර්ථක තත්ත්වයක් බලාපොරොත්තු වන්න පුළුවන් වෙයිද කියන එක තමයි අපට තිබෙන ලොකුම ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට මතකයි, මීට මාස ගාණකට පෙර අලුතින් තේ ගම්මාන 400ක් ඇති කරනවා කියලා ලොකු වැඩ කොටසක් ආරම්භ කළ බව. ඒ වාගේම ඒ පිළිබඳව විශාල ප්‍රචාරයක් ලබා දෙන්නත් ගරු ඇමතිතුමා කටයුතු කරලා තිබුණා. තේ ප්‍රවර්ධනය සඳහා ඔබතුමන්ලා තේ අපනයන ගම්මාන රාශියක් හැදුවා නම්, ඒ සම්බන්ධ වැඩ කටයුතු පටන් ගත්තා නම් ඒකේ ප්‍රගතිය මොකක්ද කියලාත් අපි දැනගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැනදී ඇත්තටම අලුතෙන් තේ ගම්මාන ඇති කරන්න අවශ්‍යතාවක් නැහැ. ජනතාව විසින්ම, කුඩා තේ වතු හිමියෝ විසින්ම ඒ ගම්මාන ඇති කරගෙන තිබෙනවා. දැන් අවශ්‍ය කර තිබෙන්නේ ඒ අයට සාධාරණ මිලක් ලබා දෙන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනකොට ඩොලරයේ වටිනාකම ඉහළ ගිහින් තිබුණා වුණත් කුඩා තේ වතු හිමියන්ට නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගන්න පුළුවන්කමක් ලැබී නැහැ. ඒ සම්බන්ධව නොයෙක් ආකාරයේ ගැටලු සහගත තත්ත්වයන් තිබෙනවා.

තේ කර්මාන්තයට ඉතාම වැදගත් සාධකය තමයි පොහොර කියන්නේ. පොහොර ටික ලබා ගැනීමේදීත් තේ ගොවීන් නොයෙක් ආකාරයේ දුෂ්කරතාවන්ට මුහුණ පා තිබෙනවා. එක පැත්තකින්, තේ දළුවලට ලබා දෙන මිල පහළ ගිහින් තිබෙනවා. ඒ වෙනුවෙන් ගොවීන්ට සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම පොහොර ටික ගන්න ගියාම ඒවායේ මිලත් අද වනවිට ඉහළ ගිහින් තිබෙනවා. ඒ අනුව පොහොර මිටියක් මිලදී ගන්න අද රුපියල් 15,000ක විතර මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ආණ්ඩුව හුඟක් අවස්ථාවලදී පොහොර සඳහා සහනාධාරයක් ලබා දීලා තිබෙන බවත් බව අප දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොහොර සඳහා සහනාධාරයක් ලබා දුන්නාය කිව්වාට ඒක දීලා තිබෙන්නේ එක වාරයකට පමණයි. අපි දන්නවා, සාමාන්‍යයෙන් තේ වගාවක් හොඳින් නඩත්තු කරන්න ඕනෑ නම් අවුම ගණනේ වසරකට තුන්-හතරවතාවක්වත් පොහොර යොදන්න අවශ්‍ය බව. නමුත් රජය විසින් සහනාධාරයක් ලබා දීලා තිබෙන්නේ එක වාරයකට පමණයි. එසේ එක වාරයකට විතරක් සහනාධාරයක් ලබා දීලා බලාපොරොත්තු වන ඉලක්කය ළඟා කරගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම ගරු අමාත්‍යවරුන්ගෙන් සහ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධව සොයා බලන්න කියලා. තේ කර්මාන්තය වැඩිදියුණු කර ඔබතුමන්ලා කිව්ව ඉලක්කය සපුරා ගන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට අවශ්‍යතාවක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම තේ ගොවීන්ට පොහොර ටික සාධාරණ මිලකට ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

ඔබතුමන්ලා හැම අවස්ථාවකදීම කියනවා, අපේ භාණ්ඩාගාරයේ ඕනෑ තරම් මුදල් තිබෙනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිහින් තිබෙන්නේ කියලා. අපි එක දෙයක් ආණ්ඩුවට කියන්න කැමැතියි. ඔබතුමන්ලා සහනාධාර දෙන්න ඕනෑ නැහැ. අවුම තරමින් පොහොරවලට තිබෙන VAT එක අඩු කර දෙන්න. VAT එක අඩු කළොත් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සිටින තේ ගොවීන්ට විතරක් නොවෙයි, රබර් සහ සුළු අපනයන භෝග වගාකරුවන්ටත්, වී වගාකරුවන්ටත් ලොකු පහසුවක් සැලසේවි. ඒ වාගේම කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය නඟාසිටුවීමටත් එය විශාල පිටුවහලක් වෙනවාය කියන එක මම අමුතුවෙන් කියන්න අවශ්‍යතා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැනට හඳුන්වා දී තිබෙන QR කේත ක්‍රමය සම්බන්ධවත් ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා. මම දන්නා තරමින් විශාල පිරිසක් බලාපොරොත්තු වන්නේ මෙම මුදල තමන්ගේ ගිණුමට බැර කරනවාට වඩා වවුචරයක් මඟින් ලබා දීමක් හෝ එහෙම නැත්නම් කලින් දුන්නා වාගේ තේ කර්මාන්තශාලා හරහා ලබා දීමක්. ඒ නිසා අවුම තරමින් මේ මුදල වවුචරයක් මඟින් ලබා දීමට හෝ කටයුතු කරනවා නම් එය ඉතාම වැදගත් වෙනවා. මෙතැනදී වෙලා තිබෙන්නේ මේකයි. මේ මුදල ගිණුමට බැර කළාම සමහර වෙලාවට තේ පොහොර ලබා ගැනීම සඳහා එය යොදවන්නේ නැහැ. සමහර වෙලාවට ඒගොල්ලන් වෙනත් කාර්යයන් සඳහා, ඒ කියන්නේ පෞද්ගලික වියදමට එම මුදල උපයෝගී කරගන්නා අවස්ථා අපි දැක තිබෙනවා. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ - මේ මන්ත්‍රීවරුන් පුළුවන් නම් ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න - මේ QR කේතය අයින් කරලා, අවුම තරමින් එතුමන්ලාට වවුචරයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් හෝ ක්‍රියාත්මක කරන්න කියායි. එහෙම කළොත් ඒගොල්ලන් අනිවාර්යයෙන්ම පොහොර සහනාධාර මුදලින් පොහොර ටික අරගෙන තේ කර්මාන්තය නඟාසිටුවන්න කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කිලෝග්‍රෑම් මිලියන 400ක් දක්වා තේ නිෂ්පාදනය වැඩි කරගන්න ඕනෑ නම් තේ වගාව වර්ධනය වෙන්න ඕනෑ නේ. නමුත් දැන් කුඩා තේ වතු හිමියන් නැවත තේ වගාවට යොමු වෙන්නේ නැහැ. මොකද, එය වියදම් අධික දෙයක් වෙලා තිබෙනවා. ඒ නිසා ඒකටත් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම වැවිලි සමාගම්වලට රජයෙන්

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

විශාල වශයෙන් උදවු උපකාර ලබා දීලා තිබෙනවා. බදු ක්‍රමයට ඉඩම් ටික ඔක්කෝම දීලා තිබෙනවා. සියලු සම්පත් ලබා දීලා තිබෙනවා. ඔබතුමන්ලා ආණ්ඩුව ගණනේ දෛනික දිරි දීමනාවක් ලෙස රුපියල් 200ක් වතු කම්කරුවන්ගේ වැටුපට ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. නමුත් මම හිතන විධියට තේ සමාගම්වලින් සියයට එකක්වත් නැවත වගා කිරීමක් කරන්නේ නැහැ. තේ සමාගම් ක්ෂේත්‍රයෙන් කිසිම දෙයක් කරන්නේ නැහැ. දැනට තිබෙන දේවල් විතරක් උපයෝගී කරගෙන ඒකෙන් ලැබෙන දෙයකින් තමයි ඔවුන් යැපෙන්න උත්සාහ කරන්නේ. ඒ නිසා මේ කාරණා ගැනත් අවධානය යොමු කරන්න අවශ්‍ය වෙනවා, කුඩා තේ වතු කර්මාන්තය නඟාසිටුවන්න අවශ්‍ය නම්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.26]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඓතිහාසික දිනයක්. මොකද, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා අද දින පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. අපේ රටේ කෘෂිකර්මාන්ත නිෂ්පාදන ලෝකයට ගෙන යැමට, ඒ කටයුතු නියාමනය කිරීම සඳහා අවුරුදු 30කට පසුව අද මේ පනත සංශෝධනය වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබ අප කවුරුත් දන්නවා, අපේ රටේ මේවා නියාමනය කරන්න බලතල තිබුණත් ඊට සරිලන විධියට මේ පනත සංශෝධනය වෙලා තිබුණේ නැති බව සහ මේ බලතල පනතට පැවරී තිබුණේ නැති බව. අද සිද්ධ වෙන්නේ ඒ කාරණය. අද විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු "යන්නේ කොහේද, මල්ලේ පොල්" න්‍යායෙන් අපනයන කෘෂිකර්මාන්තය ගැන කථා කරලා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ වෙනත් මාතෘකා ගැන තමයි වැඩිපුර කථා කරන්නේ. හැබැයි, වැවිලි භෝග ගැනත් කථා කළා. වැවිලි භෝග කියන තැන හරි නතර වුණු එක ගැන අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එහෙම නැති වුණා නම් මේ විවාදයත් වෙනත් දිශාවකට යනවා.

අපි කවුරුත් දන්නවා, ලෝකයේ හොඳම කුළු බඩු තිබෙන්නේ අපේ රටේ බව. ලෝකයේ රටවල් ගත්තොත්, කුරුඳු වර්ග දෙකයි තිබෙන්නේ. ඒ තමයි, සත්‍ය කුරුඳු සහ කැෂියා කුරුඳු. සත්‍ය කුරුඳු තිබෙන්නේ ලංකාවේ. ලෝකයේ හොඳම ගම්මිරිස් තිබෙන්නේ ලංකාවේ. ඒ වාගේම ලෝකයේ හොඳම කෝපි තිබෙන්නේත් ලංකාවේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොකෝවා, කරාබු නැටි, කරදමුංගු වාගේ සුළු අපනයන භෝග ගත්තොත්, ඒවායෙන් ලෝකයේ හොඳම තැන ලැබී තිබෙන්නේත් අපට. වියට්නාමයේ ගම්මිරිස් ගත්තොත්, ගම්මිරිස් ඇට 5ක් විතර ඕනෑ වනවා, අවශ්‍ය සැර ලබා ගන්න. නමුත්, අපේ රටේ එක ගම්මිරිස් ඇටයක් හැපුවාම එයින් නියම රස සහ නියම සැර ලැබෙනවා. හැබැයි, විපක්ෂයේ මහත්තුරු මොනවා කථා කළත්, රටක් විධියට ඒ කාලයේ මේවා ඉස්සරහට ගියේ නැහැ, මේවා සංවර්ධනය වුණේ නැහැ කියලා අපි දන්නවා. එහි ප්‍රතිඵලයක් විධියට අද සුළු අපනයන භෝග විතරක් නොවෙයි, ගරු මන්ත්‍රීවරයෙක් කියපු විධියට තේ, රබර්, පොල්, කුරුඳු වාගේ වැවිලි භෝග නිෂ්පාදනත් ගොඩක් ආපස්සට ගිහිල්ලා තිබෙනවා. නීතිරීති, චක්‍රලේඛ, අණපනත් සියල්ල සම්මත කරලා, ඒ විධියට ආපස්සට ගිය වැවිලි ක්ෂේත්‍රයත්, සුළු අපනයන භෝගත් මහ පොළොවේ වගාවත් එක්කම ඉස්සරහට කරගෙන යන්න - ලෝකයට අරගෙන යන්න - තමයි වර්තමාන ආණ්ඩුවේ අපි සූදානම් වෙලා ඉන්නේ.

අපි කවුරුත් දන්නවා, අපේ සියලු වැවිලි භෝග ගත්තත්, සුළු අපනයන භෝග ගත්තත්, ලෝකයත් එක්ක අපි ඉස්සරහට ගියේ නැති බව. අපි ආපස්සටයි ගියේ. වගාව විධියටත් අපි ආපස්සට ගියේ, තාක්ෂණය විධියටත් අපි ආපස්සට ගියේ, නීතිරීති සම්මත කිරීම පැත්තෙනුත් අපි ආපස්සට ගියේ. එම නිසා වර්තමාන ආණ්ඩුවට පැවරුණු වගකීම තමයි, වසර 30කට පස්සේ අද මේ ඉෂ්ට කරන්නේ. ගරු ලාල් කාන්ත ඇමතිතුමා ප්‍රධානව මෙයට දායක වුණු සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, මේ කටයුතු ඉස්සරහට අරගෙන යන්න දායක වීම පිළිබඳව ඒ නිලධාරි මහත්ම මහත්මීන්ට සහ මේ සඳහා දැනුම ලබා දුන් සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා.

අපි කවුරුත් දන්නවා, මේ අණපනත්, නීතිරීති, චක්‍රලේඛ සංශෝධනය කරන්න, එහෙම නැත්නම් බලාත්මක කරන්න මීට කලින් වුවමනාවක් තිබුණේත් නැති බව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් ඉතිහාසයේදී මේවායේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වුණේ නැහැ කියන එක අපි අහලා තිබෙනවා. ඇයි, ඒ? දැන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, තේ ප්‍රතිඅපනයනය කරන්නේ කවුද කියන එක එතුමන්ලා දන්නවා කියලා. නීතිරීති, අණපනත් සම්මත කරලා තිබුණා නම් ඒවා කරන්න බැරි වෙනවා.

අපට මතකයි, ගම්මිරිස් ගොවියෝ මහ පාරට වැටුණා. කුරුඳු ටික තළා ගත්තාට පස්සේ අස්වැන්න අලෙවි කරගන්න බැරිව ගොවීන් පෝලිම් ගැහිලා හිටියා. ඒ මොකද කියලා එතුමන්ලාට අමතක වෙලා තිබෙනවා. අපි අහලා තිබෙනවා, ගම්මිරිස් ප්‍රතිඅපනයනය කළේ කවුද කියලා. ඔය විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට ඒක අමතක වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් කථා කරන විට හිටපු ඇමතිවරුන්ගේ නම් කියැවෙනවා. දයා ගමගේ හිටපු ඇමතිවරයාගේ නමත් කියැවෙනවා. ඒගොල්ලන්ට ඒවා අමතක වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ නීතිරීති, අණපනත් සම්මත නොකළේ, මේ සංශෝධන නොකළේ ඇයි? මේවා සංශෝධනය කළා නම් මොකක්ද වෙන්නේ? මේවා සංශෝධනය කළා නම් වෙන්නේ ඒගොල්ලන්ට ඒ අයගේ ජාවාරම කරගෙන යන්න බැරි වන එකයි. ඒ ජාවාරම් කරගෙන යන්න බැරි නිසා අද ඒ අයට ගොඩක් රිදිලා තිබෙනවා. අපි කෘෂි කර්මාන්තය ඇතුළේ මේ ප්‍රතිසංස්කරණ ගෙනෙනකොටත් ඒගොල්ලන්ට මතක් වෙන්නේ වෙනත් දේවල්. ඒකයි "යන්නේ කොහේද, මල්ලේ පොල්" වාගේ වෙන වෙන දේවල් කථා කරන්නේ. අනික් ඒවාත් එහෙමයි.

දැන් නීතිය ඇතුළේ ප්‍රතිසංස්කරණ කරනවාටත් ඒගොල්ලන් විරුද්ධයි. බොහෝ මන්ත්‍රීවරු කථා කළේ සුළු අපනයන භෝග ගැන නොවෙයි. තව ටිකක් ඉස්සරහට යන්න නම් මේකේ තිබෙන සාධනීය දේ, මේකේ තිබෙන අඩුපාඩු අපට ඉදිරිපත් කරන්න ඕනෑ. හැබැයි, ඒගොල්ලන් මොකක් ගැනද කථා කළේ? විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන තමයි විපක්ෂ නායකතුමා කථා කළේ. ඒගොල්ලන් නීතිය ඇතුළේ ප්‍රතිසංස්කරණ කරනවාට විරුද්ධයි. ඒ මොකද? ඒගොල්ලන් තර්කය හදන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වැටෙනවා, මහා විනාශයක්

වෙනවා කියායි. මේක ඇතුළේ මහා විලාපයක් තිබෙනවා. හොරු, තක්කඩි, බෙබද්දෝ, කුඩුකාරයෝ කැමති නැහැ, හොරු අල්ලනවාට. නීතිය ඇතුළේ ප්‍රතිසංස්කරණ වෙනවාට ඒවාට උදවු කරපු කට්ටිය කැමති නැහැ.

දේශපාලනය ඇතුළේ ප්‍රතිසංස්කරණ වෙනවාට ඒ අය කැමති නැහැ. ඇයි? ඒගොල්ලන්ගේ වැටුප අඩු වුණා, විශ්‍රාම වැටුප නැති වුණා, පඩි දෙකක් ගත්ත ඒවා නැති වුණා, බංගලා නැති වුණා. ඒ නිසා ඒගොල්ලෝ දේශපාලන ප්‍රතිසංස්කරණවලට කැමති නැහැ. ඒ නිසා ඒගොල්ලෝ මර ළතෝනි දෙනවා. දැන් ගොඩක් ඒවා කියන්නේ විෂයය සම්බන්ධව නොවෙයි. දැන් මහා මර ළතෝනියක් තිබෙනවා, දේශපාලනය ඇතුළේ ප්‍රතිසංස්කරණ වෙනවාට, නීතිය ඇතුළේ ප්‍රතිසංස්කරණ වෙනවාට, අධ්‍යාපනය ඇතුළේ ප්‍රතිසංස්කරණ වෙනවාට එරෙහිව. මේ ප්‍රතිසංස්කරණවලට විරුද්ධව දැවැන්ත මර ළතෝනියක් තිබෙනවා, මේක ඇතුළේ. මොකද, බංගලා දෙකක හිටපු කට්ටිය සමහර වෙලාවට හිර ගෙදර ඉඳලා ඇවිල්ලා මර ළතෝනි දෙනවා, මේක ඇතුළේ. ඇයි? ඒ ප්‍රතිසංස්කරණ සිද්ධ වෙනවාට ඒ අය කැමැති නැහැ.

මේ අපනයන කෘෂි කර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය වෙන එක ඉතාම හොඳයි. ඒ අණපනත් සම්මත නොකරපු නිසා අපේ රටේ තිබුණු ලෝකයේ හොඳම ගම්මිරිස් ටික ඇතුළු අපිට brand කරන්න තිබිච්ච සියල්ල ආපස්සට වැටුණා. ගොවියා මහ පාරේ උද්ඝෝෂණ කරන්න ගත්තා. දැන් වී ගැන කථා කළා. අපි දන්නවා, දැන් හාල් අතිරික්තයක් තිබෙන බව. ඒවාට තව තව ක්‍රම හදන්න ඕනෑ. කලින් තිබුණේ මොකක්ද? කලින් පොහොර ටික ලැබුණේ නැහැ. දැන් තේ පොහොර ගැන කථා කළා. පොහොර මිටිය රුපියල් 40,000ට, රුපියල් 50,000ට තිබුණේ. අද මොකක්ද තත්ත්වය? අද ඒක වෙනස් කරලා තිබෙනවා, ලෝක අර්බුදයකුත් තිබියදී. අද ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල වැඩි වෙලා තිබෙනවා. හැබැයි, අද අපි පොහොර මිල අඩු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මේගොල්ලන්ගේ මර ළතෝනිය මොකක්ද කියන එක දැන් බොහොම පැහැදිලියි. මොකද, නීතිය ඇතුළේ, අධ්‍යාපනය ඇතුළේ, කෘෂි කර්මාන්තය ඇතුළේ ප්‍රතිසංස්කරණ එනවා. ඒ ප්‍රතිසංස්කරණ එනකොට වදින්නේ කාටද? වදින්නේ ජාවාරම්කාරයින්ට. නීතිය ඇතුළේ ප්‍රතිසංස්කරණ එනකොට කුඩුත් එක්ක ගැටගැහිච්ච දේශපාලන ජාවාරම්කාරයින්ට වදිනවා. ඒ වදිනකොට මේක ඇතුළේ මර ළතෝනියක් දෙනවා. මේක හොඳ නැහැ. විපක්ෂ නායකතුමා කථා කළේම මේවා ගැන. ඇයි? ඒ ප්‍රතිසංස්කරණ ඇතුළේ වදින්නේ කාටද? වදින්නේ ඒගොල්ලන්ට. නීතිය ක්‍රියාත්මක කරනකොට පාස්කු ප්‍රහාරය සිදු කරපු අයට දඬුවම් ලැබෙනවා. එසේ දඬුවම් ලැබෙනකොට ඒගොල්ලන් එක්ක ගැටගැහිච්ච කට්ටියටත් දඬුවම් හම්බ වෙනවා. එසේ දඬුවම් ලැබෙනකොට ඒගොල්ලන්ගේ නියෝජිතයෝ ඇවිල්ලා කථා කරන්න ඕනෑ මොකක්ද? ඒගොල්ලන්ගේ නියෝජිතයෝ ඇවිල්ලා කථා කරන්න ඕනෑ, ඒක බේරා ගන්න තමයි. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධියි. බංගලා ටික නැති වෙනකොට, වාහන පර්මිට් එක නැති වෙනකොට, විශ්‍රාම වැටුප නැති වෙනකොට, ඒවායේ ප්‍රතිසංස්කරණ එනකොට විපක්ෂයේ නියෝජිතයෝ කථා කරන්න ඕනෑ ඒක තමයි. හැබැයි, දැන් අපි කථා කරන්නේ මොකක්ද? අපි මේ ප්‍රතිසංස්කරණ ගේන්නේ සුළු අපනයන භෝග නියාමනය කරලා ගම්මිරිස් ඇතුළු ඒ දේවල් සියල්ල පිටරටින් ගෙනෙන එක නතර කරලා, ඒගොල්ලන්ගේ භාණ්ඩාගාරවලට මුදල් ගිය එක නැති කරලා ගොවියාගේ භාණ්ඩාගාරය, මහ පොළොවේ ජීවත් වෙන මිනිස්සුන්ගේ භාණ්ඩාගාරය පිරෙන ප්‍රතිපත්තියක්, ක්‍රමයක් හදන්නයි. අපි ඒවාට ප්‍රතිසංස්කරණ ගේනවා. ඒ සම්බන්ධයෙන් බය වුණාට අපිට කරන්න දෙයක් නැහැ. අපිට දීපු ජන වරම ඒකයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විෂය භාර ඇමතිතුමා ප්‍රධාන සමස්ත කාර්ය මණ්ඩලයට අපි ස්තුතිවන්ත වෙනවා, මේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධයෙන්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.35]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පැවැත්වෙන්නේ අපනයන කෘෂි කර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විවාදය වුණත්, ඒ ගැන කථා කිරීමට පෙර මම කාරණයක් කියන්න ඕනෑ.

ඊයේ අපේ විදේශ කටයුතු ඇමතිතුමා සවුදි අරාබියේ මරණ දණ්ඩනයට ලක් වෙලා ඉන්න ශ්‍රී ලාංකික තරුණයෙක් වන සිවරාසා අනෝජන් සම්බන්ධව එතුමා ගත්ත ක්‍රියාමාර්ග ගැන පැහැදිලි කිරීමක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම මේ සිවරාසා අනෝජන් කියන ශ්‍රී ලාංකික තරුණයා කරපු වරද සම්බන්ධව ඔහුව අත්අඩංගුවට ගන්නේ පසුගිය ජූලි මාසයේ 02වැනි දා. ඔහුට එරෙහිව මුලින්ම නඩු පවරන්නේ සවුදි අරාබියේ තිබෙන cybercrimes නීතිය යටතේයි. මේ නඩුව ඉතා ඉක්මනින් අවසන් වෙනවා. ඒ කියන්නේ, පසුගිය ජූලි 02වැනි දා ඔහුව අත්අඩංගුවට ගන්නවා; ජූලි 15වැනි දා ඔහුට දඬුවම් ලබා දෙනවා. ඒ කියන්නේ, සති දෙකක වාගේ කාලයකින් මේ නඩුව අවසන් කරනවා.

මේ නඩුව සති දෙකක කාලයකින් අවසන් කරන්න හේතු වෙච්ච ප්‍රධානම දේ තමයි, ඔහු වරද පිළිගැනීම. ඒ කියන්නේ, නීතියේ තිබෙන මූලධර්මයක් වන plea bargaining කියන මූලධර්මය අනුව කෙටි ක්‍රමයකින් නඩුව අවසන් කරන්න නම් වරද පිළිගන්න ඕනෑ. ඒ අනුව ඔහු අඩු වරදට වරද පිළිගැනීම මත මේ නඩුව අවසන් වෙනවා, ජූලි මාසයේ 15වැනි දා. ඔහුට දඬුවම් විධියට අවුරුදු 5ක සිර දඬුවම් සහ සවුදි රියාල් ලක්ෂ 30ක දඩයක් පනවනවා. ඒ කියන්නේ, ලංකාවේ මුදලින් රුපියල් කෝටි 27ක වාගේ මුදල් ප්‍රමාණයක දඩයක් ඔහුට පනවා තිබෙනවා. ඊට පස්සේ තමයි ඊළඟ සිදුවීම වෙන්නේ. එහිදී මේ නඩුව appeal කරන්න යනවා. මම දන්නේ නැහැ, ඒ සම්බන්ධයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හරි, විදේශ කටයුතු අමාත්‍යාංශයේ හරි නිලධාරින්ගේ නීති උපදෙස් හරියට ලැබුණාද, වරද පිළිගැනීම නිසාම ඒ තරුණයා දඬුවමකට ලක් වෙලා සිටියදී ඇයි නැවත අභියාචනයක් ඉදිරිපත් කළේ කියලා. මොකද, එකඟතාවකින් තමයි ඔහු මේ වරද පිළිඅරගෙන තිබෙන්නේ. එකඟතාවකින් වරද පිළිගත්තාට පස්සේ ඔහුට දඬුවමක් ලැබුණා. නමුත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉන්න නීති උපදේශකයන් සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉන්න නිලධාරින් වැරදි උපදෙස් දීලා - ඒක කියන්න ඕනෑ - මේ නඩුව appeal කරන්න ගියා. Appeal කළාම තමයි සවුදි අරාබියේ තිබෙන නීතිපති දෙපාර්තමේන්තුව ඒකට counter-appeal කළේ. Counter-appeal කළාම තමයි ඒගොල්ලන්ට සිදු වුණේ, සවුදි නීතිය අනුව ඒ තරුණයාට මරණ දඬුවම නියම කරන්න. Appeal කරන එක නොවෙයි කරන්න තිබුණේ. ඔහුට දඬුවමක් ලැබුණාට පස්සේ ඒ appeal එක දාන්න තිබුණා, සවුදි රජුට; බින් සල්මාන්ට. සවුදි රජුටයි appeal කරන්න තිබුණේ, "මොහුට අවුරුදු පහක සිර දඬුවමක් දීලා තිබෙනවා. කෝටි 27ක දඩයක් පනවා තිබෙනවා. තරුණයා නොදැනුවත්වයි මේ වැඩේ කර තිබෙන්නේ. ඒ නිසා මොහු නිදහස් කරන්න" කියලා. එහෙම කරන්නේ නැතුව මේ වරද පිළිගත් එකකට ආපහු ගිහිල්ලා appeal කළේ කාගේ උපදෙස් මතද කියලා මම දන්නේ නැහැ. ඒක තමයි කරපු වරද.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ඒක විතරක් නොවෙයි නේ. ඒ දෙමව්පියන්ව ගෙන්වලා රුපියල් ලක්ෂ 18ක් අරගෙන. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සල්ලි නැද්ද? ඒ තරුණයා insure කරලා නේ ගියේ. ඒ මුදල් වියදම් කරන්න තිබුණා නේ. දැන් කියනවා, මුදල නැවත ගෙවනවා කියලා. ඒ මුදල නැවත ගෙවීම නොවෙයි, තිබෙන ප්‍රශ්නය. ප්‍රශ්නය වෙන්නේ ඒ මුදල් අරගෙනත් වැඩක් වුණේ නැති එකයි. ඒ තරුණයාගේ මුදලුත් අරගෙන, අන්තිමට මරණ දඬුවම නියම වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වාගේ සිදුවීමක් සම්බන්ධව අපට අත්දැකීමක් තිබෙනවා. සවුදි අරාබියේදී අනවශ්‍ය දෙයක් කරන්න ගිහිල්ලා බස්නාහිර පළාතේ කාන්තාවන් තුන්දෙනෙකුට මරණ දණ්ඩනය නියම කර තීන්දුව දුන්නා. එවකට තිබුණේ යහපාලන ආණ්ඩුව. එදා තලතා අතුකෝරල මැතිනිය තමයි විදේශ රැකියා ඇමතිතුමිය හැටියට හිටියේ. මංගල සමරවීර මැතිතුමා හිටියා විදේශ ඇමතිවරයා හැටියට. ඒගොල්ලන් මැදිහත් වෙලා නීති උපදෙස් අරගෙන කටයුතු කළා. සවුදි අරාබියේ ඒ අදාළ අයගෙන් නීති උපදෙස් ලබාගෙන, මේ රටේ ඉන්න නීති කණ්ඩායමක් හදාගෙන, ඉතා ඉක්මනින් මැදිහත් වීම තුළ ඒ කාන්තාවන් තුන්දෙනාගේම මරණ දඬුවම නැති කරගන්න ඒගොල්ලන්ට පුළුවන්කම ලැබුණා. ඒ කාන්තාවන් ලංකාවට ආවේ ඒ සිරදඬුවම් විඳලා. නමුත් මරණ දඬුවම නැති කර ගන්න පුළුවන් වුණා. එහෙම තමයි එදා ඒ උපදෙස් අරගෙන ඒ අත්දැකීම් එක්ක වැඩ කළේ. ඉතින් මට තේරෙන්නේ නැහැ, මේ කාරණයේදී ඇයි මේ වාගේ දෙයක් කළේ කියලා. එදා ඒ විධියට කටයුතු කරගන්න හැකියාව ලැබුණා.

ඇයි මේකට appeal එකක් කළේ? ඔහු පහළ උසාවියකින් වරද පිළිගත්ත කෙනෙක්. ඒ appeal එක ගියාම තමයි සවුදි අරාබියේ නීතිපති දෙපාර්තමේන්තුව ඇවිල්ලා ඒ appeal එකට counter-appeal කරන්නේ. මේක පහළ උසාවියේදී plea bargaining මූලධර්මය යටතේ විසඳා ගත් නඩුවක්. මේකෙදි, විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ වරදක් වෙලා තිබෙනවා. ඒ නිසා මම විදේශ කටයුතු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ මරණීය දණ්ඩනය නියම කළ නඩු තීන්දුව සභාගත කරන්න කියලා. එතකොට අපට බලාගන්න පුළුවන්, කවුද ඉස්සෙල්ලාම මේක appeal කළේ කියලා. ඒ appeal එකට තමයි සවුදි නීතිපති දෙපාර්තමේන්තුවෙන් counter-appeal එක ආවේ. ඒකයි මම මේ කියන්නේ. මේක appeal නොකර සල්මාන් රජු ළඟට යන්න තිබුණා. ඒ ගියේ නැත්තේ නොදැනුවත්කම හින්දා. ඒක තමයි මම කිව්වේ, මෙතැනදි ලැබී තිබෙන්නේ වැරදි නීති උපදෙස් කියලා.

ඊයේ විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, අපේ Deputy Speakerගේ මූලිකත්වයෙන් යුත් කණ්ඩායමක් එහාට යවනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වැඩේට මැදිහත් වෙන්න ඕනෑ, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින්. Deputy Speakerගේ මූලිකත්වයෙන් කණ්ඩායමක් යැවීම විතරක් ප්‍රමාණවත් මදි. Deputy Speaker මුස්ලිම් හින්දා එතුමා ඒ යන කණ්ඩායමේ නායකත්වය අරගෙන ගියා කියලා සවුදි රජය එතුමා මුස්ලිම් කියලා සලකා කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා මම ආණ්ඩුවට මේ යෝජනාව කරනවා. Deputy Speakerව කමිටුවකට දාගන්න. ඒ වාගේම විපක්ෂය පැත්තේ ඉන්නවා, සවුදි ආණ්ඩුවත් එක්ක ගනුදෙනු කරලා අත්දැකීම් තිබෙන හිටපු ඇමතිවරු. ඒගොල්ලනුත් ඒ කමිටුවට දාගන්න. අගමැතිතුමියගේ හරි, විදේශ කටයුතු ඇමතිතුමාගේ හරි නායකත්වයෙන් යන්න. මේකට එවැනි නායකත්වයක් දෙන්න. අගමැතිතුමියට ඒකේ leadership එක ගන්න කියන්න. ඒ කමිටුවට Deputy Speaker දාගන්න, ඒකට කමක් නැහැ. නමුත් අර විධියට යන්න. ඒ වාගේම සවුදි අරාබියත් එක්ක සම්බන්ධකම් තිබෙන මුස්ලිම් හිටපු ඇමතිවරු මෙතැන ඉන්නවා. ඒ අය කාලයක් තිස්සේ වැඩකටයුතු කරලා අත්දැකීම් තිබෙන අය. ඒ අයවත් අරගෙන යන්න. එහෙම නැතිව මේක Deputy Speakerගේ මට්ටමින් ගිහිල්ලා විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ඒක තේරුම් ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඊට වඩා බරපතළ විධියට මේ කාරණය ගැන කල්පනා කරන්න. ඒ හින්දා තමයි අප කියන්නේ මේ සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මැදිහත් වෙන්න කියලා. ඒ කියන්නේ, ජනාධිපතිතුමාගේ මට්ටමින් දූත පිරිසක් යවන්න පුළුවන් නම් වඩාත්ම හොඳයි. ජනාධිපතිතුමාට තිබෙන කාර්යබහුලත්වයත් එක්ක එතුමාට යන්න බැරි නම් අඩුම ගාණේ අගමැතිතුමිය, එහෙම නැත්නම් විදේශ කටයුතු ඇමතිතුමා ඒ තරුණයාගේ ජීවිතය බේරා ගැනීම සඳහා එම දූත පිරිසේ නායකත්වය ගන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.42]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අපනයන කෘෂිකර්ම භෝග හා සම්බන්ධ මේ පනත ගෙනැවිත් තිබෙන්නේ 1992දීයි. මේ පනත දිහා බැලුවාම අපට පෙනෙනවා, පසුගිය කාලය පුරාම කෘෂිකර්ම ක්ෂේත්‍රයට අත් වෙලා තිබෙන ඛේදවාචකය. ඒ කියන්නේ, කෘෂිකර්ම ක්ෂේත්‍රය තරම් දේශපාලනීකරණය වෙච්ච, දේශපාලන මෙවලමක් විධියට භාවිත කරපු වෙනත් ක්ෂේත්‍රයක් නැහැ. පසු ගිය කාලයේ මේ ක්ෂේත්‍රය පුංචි පුංචි කැලිවලට කැඩුවා, භෝග වශයෙන්, පොල් වෙනම, කුරුඳු වෙනම, අනෙකුත් භෝග වෙනම. ඒ වාගේම, වෙවැල් ආදි භෝගවලටත් වෙනම අමාත්‍යාංශ හදලා තමන්ගේ හිතවතුන් ඒවායේ තනතුරුවලට පත් කරන්න කෘෂිකර්ම ක්ෂේත්‍රය කැලි කැලිවලට කඩා දැමීමට පසුගිය කාලයේ කටයුතු කර තිබුණා. ඒ ආකාරයට කෘෂිකර්ම ක්ෂේත්‍රය කැඩුවාට, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව තිබෙන මේ පනත් සම්බන්ධයෙන් කිසිම කියැවීමක් තිබුණේ නැහැ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, මේ අපනයන කෘෂිකර්ම භෝග සම්බන්ධයෙන් පනතේ විස්තර කරලා තිබෙන්නේ "වාර්ෂික භෝගයක්" කියලායි. ඇත්ත වශයෙන්ම

අපනයන කෘෂිකර්ම භෝග බොහොමයක් තිබෙන්නේ බහු වාර්ෂික භෝග හැටියටයි. Perennial crops කියන category එකටයි අයිති වෙන්නේ, ගම්මිරිස් ආදි බහු වාර්ෂික භෝග. නමුත් මෙහි සඳහන්ව තිබෙන්නේ වාර්ෂික භෝග කියලායි. ඒක වෙනස් කරලාත් නැහැ, පසුගිය කාලයේ. අනෙක් පැත්තෙන් ගත්තොත්, අපනයන කෘෂිකාර්මික භෝග කියන ඒවා වර්ග කරලා තිබෙනවා. එය නිර්වචනය කර තිබෙන ආකාරය අනුව, මුළු වාර්ෂික නිෂ්පාදනයෙන් සියයට 50කට වැඩියෙන් අපනයනය කරනවා නම් විතරයි ඒවා අපනයන කෘෂිකර්ම භෝග හැටියට අයිති වෙන්නේ. හැබැයි, අපේ බොහොමයක් භෝගවලින් සියයට 50කට වඩා අඩු ප්‍රමාණයක් තමයි අපනයනය කරන්නේ. ඒ නිසා අපි එක් පැත්තකින් මේ කාරණා ගැනත් හිතන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, මීට පෙර ගරු මන්ත්‍රීවරුන් ද ප්‍රකාශ කරපු විධියට අපේ රටේ නිසි නියාමනයක් නොමැති නිසාත්, මේ නීතියේ තිබෙන දුර්වලකම් නිසාත් ඇති වෙලා තිබෙන ගැටලුවලින් එකක් තමයි, ප්‍රතිඅපනයනය හෙවත් වෙනත් බොහෝ රටවලින් තත්ත්වයෙන් බාල දේවල් ගෙනැල්ලා, අපේ දේවල් එක්ක කලවම් කරලා අපනයනය කිරීම.

අපනයන කෘෂිකර්ම භෝග තමයි ලංකාවේ පසට, ලංකාවේ දේශගුණයට හොඳටම ගැළපෙන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. ඒවාට අඩු යෙදවුම් ප්‍රමාණයක් - අඩු බාහිර යෙදවුම් ප්‍රමාණයක් - තමයි භාවිත කරන්න ඕනෑ. එය, ස්වාභාවික පරිසරය ඒ විධියටම ආරක්ෂා කරගෙන, පස සෝදා යෑම වළක්වන භෝග විශේෂයක්. මේ ආකාරයට භූමිය පැත්තෙන්, පාරිසරික පැත්තෙන් බැලුවොත්, ලංකාවේ භූමියට ඉතාම හොඳින් ගැළපෙන භෝග තමයි සුළු අපනයන භෝග හෙවත් අපනයන කෘෂිකර්ම භෝග. ඒ කියන්නේ, ගම්මිරිස්, කරාබු නැටි වාගේ භෝග වර්ග.

පසුගිය කාලයේ කරලා තිබුණේ මේ කෘෂිකර්ම ක්ෂේත්‍රය කැලිවලට කඩලා, තමතමන්ට අවශ්‍ය විධියට අමාත්‍යාංශ හදාගෙන තනතුරු බෙදා ගත්තු එකයි. එයට මෑතම උදාහරණය තමයි මේවා අතර තිබෙන ප්‍රධානම භෝගය වන කුරුඳු. අපේ අපනයන කෘෂිකර්ම භෝගවලින් සියයට 50කටත් වඩා වැඩි ප්‍රමාණයක අපනයන දායකත්වයක් දක්වන්නේ කුරුඳු. ඒ විශාලම භෝගය වෙනම අරගෙන දෙපාර්තමේන්තුවක් පිහිටෙව්වා. එදා මේ වාගේ විවිධාකාර විකාර රූපී වෙනස්කම් කළා මිසක් ඒවාට අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ ඇති කළේ නැහැ. ඒ නිසා තමයි අද අපට සිදු වෙලා තිබෙන්නේ, නීතිමය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්න. මොකද, මේ ක්ෂේත්‍ර වැඩිදියුණු කරන්න නම්, මේ භෝග අපනයනය වැඩි කරන්න නම්, මේවා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හදන්න ඕනෑ. ලංකාවේ තිබෙන දේශගුණයත් එක්ක මේ භෝග ඉතා හොඳින් ගැළපුණාට, ලෝකයේ අද තිබෙන තත්ත්වයත් එක්ක ඉන්දුනීසියාව, වියට්නාමය ආදි මහා පරිමාණයෙන් මේ භෝග නිෂ්පාදනය කරන රටවල් සමඟ අපට මේ පරිමාවෙන් - volume එකෙන් - තරග කරන්න බැහැ. අපට තරග කරන්න පුළුවන් වෙන්නේ අපේ රටේ තිබෙන මේ භෝගවල ඇති විශේෂත්වය අනුවයි. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඉන්දියාවේ සහ අනෙකුත් රටවල තිබෙන ගම්මිරිස්වල piperine ප්‍රතිශතය සාමාන්‍යයෙන් 6ට වඩා අඩුයි. අපේ රටේ ගම්මිරිස්වල එම ප්‍රතිශතය ඒ වාගේ දෙගුණයක් වනවා. ඒක තමයි ඒ භෝගවල තිබෙන ගුණාත්මකභාවය. කුරුඳු ගැන අපි කලින් කථා කළා. අපේ රටේ සුළු අපනයන භෝග නිෂ්පාදනවල ගුණාත්මකභාවය ලෝකයේ බොහෝ රටවලට වඩා ඉහළ මට්ටමේ තිබෙනවා. මේ සන්නාමය භාවිත කරලා, කුරුඳුවලට නම් දැන් අපි යුරෝපීය වෙළෙඳ පොළේ GI නිර්ණායකය ලබා ගෙන තිබෙනවා. හැබැයි, අනෙක් භෝග සම්බන්ධයෙන් එහෙම නැහැ. ඒ නිර්ණායක ලබා ගන්න නම් එම භෝගවල සකස් කිරීම අපි නියාමනය කරන්න ඕනෑ. උදාහරණයක් වශයෙන් ගම්මිරිස් ගත්තොත්, ගම්මිරිස් අස්වනු නෙළන කාලයට පාරවල් දිගේ අතුරාගෙන තමයි ගම්මිරිස් වේළන්නේ. එතකොට ඒවාට දූවිලි වදිනවා. ඒ වාගේම විෂබීජ හෝ වෙනත් අහිතකර දිලීර වර්ගත් එකතු වෙනවා. ඒ කාරණා නිසා ලෝක වෙළෙඳ පොළේ තිබෙන නිර්ණායකත් එක්ක අපේ නිෂ්පාදන ගළපා ගන්න බැරි වෙනවා. එම නිසා අපනයන කෘෂිකර්ම භෝග නිෂ්පාදන සකස් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු වෙනවා. ඇත්ත වශයෙන්ම අපට සිදු වන්නේ volume එක වැඩි කරනවාට වඩා මේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි කිරීමයි. අපි මේ නිෂ්පාදන දැනටමත් අපනයනය කරලා විදේශ විනිමය උපයා ගන්නවා. සුළු අපනයන භෝග ඔක්කෝම එකට ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක විතර විදේශ විනිමයක් අපි වර්ෂයකට උපයා ගන්නවා. නිෂ්පාදනය කරන ඉඩම් ප්‍රමාණය එහෙමම තියාගෙන - ඉඩම් ප්‍රමාණය වැඩි කරන්නේ නැතුව - ඒක තුන්ගුණයක් කරන්න අපට පුළුවන්, නිෂ්පාදනවලට අගය එකතු කිරීම වැඩි කිරීමෙන් විතරක්. එමඟින් එම ආදායම තුන්ගුණයකින් විතර වැඩි කර ගන්න අපට පුළුවන්. සමහර භෝගවලින් ලැබෙන ආදායම පස්ගුණයක් දක්වා වැඩි කර ගන්න පුළුවන්. ගම්මිරිස්වල piperine නිස්සාරණය කරලා ලෝක වෙළෙඳ පොළට නිමි ද්‍රව්‍ය යවන්න පුළුවන් නම් මේ කිච්චා වාගේ විශාල විදේශ විනිමයක් අත්පත් කර ගන්න අපට පුළුවන්. එහෙම කරන්න නම් අපට සිද්ධ වෙනවා, නිෂ්පාදන සකස් කිරීමේ කර්මාන්ත නියාමනයට ලක් කරන්න. හැබැයි, දැනට තිබෙන පනත යටතේ එහෙම කරන්න අමාරුයි. මොකද, නීතිමය ක්‍රියාමාර්ග ගනිද්දී ඒවා සම්බන්ධයෙන් වන නිර්වචන අපට බෙහෙවින් වැදගත් වනවා. අපනයන කෘෂිකර්ම භෝග කියන එක "වාර්ෂික භෝගයක්" කියලායි පනතේ නිර්වචනය කරලා තිබෙන්නේ. ඒ නිසා උසාවි ගියාට පස්සේ අපට නීතිමය ක්‍රියාමාර්ග බලගන්වන්න බැරි වෙනවා. නියාමනය කිරීමේ අවශ්‍යතාව නිසා තමයි මේ පනතට මේ සංශෝධනය කරන්න අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපි අද දවසේ මේ පනතට මේ කියන සංශෝධනය ගෙන එන්නේ.

මම හිතනවා, මේක පක්ෂ, විපක්ෂ කියලා බෙදෙන්න ඕනෑ කාරණයක් නොවෙයි කියලා. අපේ රටට විදේශ විනිමය උපයා ගන්න වාගේම අද ලෝකයේ තිබෙන, කාබන් ප්‍රතිශතය අඩු කර ගන්නේ කෙසේද කියන පාරිසරික ප්‍රශ්නය විසඳන්නත් තිබෙන හොඳ විකල්ප යෝජනාවක් තමයි සුළු අපනයන භෝග හෙවත් අපනයන කෘෂිකර්ම භෝග වර්ධනය කිරීම. මේ ඔක්කෝම ඒකාබද්ධ කර ගත්තොත්, මේ ක්ෂේත්‍රය ඉතා ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගත හැකි තැනකට ගෙනෙන්න පුළුවන් කියලා මම හිතනවා. ඒකට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හදලා මේ සකස් කිරීමේ කර්මාන්තය වැඩිදියුණු කිරීම දිරි ගැන්වීම හරහා ඉදිරි කාලයේදී මේ ක්ෂේත්‍රයෙන් විශාල විදේශ විනිමයක් උපයන අතරම මේ ක්ෂේත්‍රයේ නියැළෙන ගොවීන්ගේ ජීවන මට්ටම දැන් තිබෙනවා වාගේ කිහිප ගුණයකින් ඉහළ නංවන්නත් පුළුවන් කියන විශ්වාසය ඇතිව තමයි අපි මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි ඒ සඳහා හැමදෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා. ස්තුතියි, හැමදෙනාටම.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.50]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂි අපනයන ක්ෂේත්‍රය ගැන අද බොහෝ සෙයින් කථා කළා. අපේ රටේ අපනයන භෝග වශයෙන් මුලින්ම හැඳින්වුයේ තේ, රබර් සහ පොල්. ඒ වාගේම, කුරුඳු, ගම්මිරිස්, කරුංකා, කරාබු නැටි වාගේ විවිධ භෝග වර්ග රාශියක් අපේ රටේ වවනවා. ඒවා

[ගරු බී. ආරියවංශ මහතා]

අපනයනයෙන් අපට විශාල මුදලක් ලබා ගන්න පුළුවන් ක්‍රමවේද ද තිබෙනවා. ඒ තුළින් ඩොලර් විශාල ප්‍රමාණයක් අපේ රටට ලැබෙනවා. ඉන්දියාව වාගේ රටවලට තමයි ගම්මිරිස් අපනයනය සියයට 90ක් විතර සිදු කරන්නේ. මේ වන කොට රුපියල් 2,100ක් වැනි ඉතා අඩු මුදලකට තමයි ගම්මිරිස් කිලෝවක් අපනයනය කරන්නේ. ඒවා value කරලා, ඒවායෙන් වෙනත් නිෂ්පාදන සිදු කරලා යුරෝපා රටවලට අපනයනය කරන වැඩ පිළිවෙළක් අපේ රටේම සකස් කළොත් ඒ තුළින් ඩොලර් විශාල ප්‍රමාණයක් අපේ රටට ගේන්න පුළුවන්. නමුත් ඒ වාගේ තත්ත්වයක් අද අපේ රටේ නැහැ. අද අපේ අපනයනකරුවෝ සඳහන් කරනවා, අපනයනය කරන්න ලෙහෙසිම රට ඉන්දියාවයි කියලා. සියයට 90ක් පමණ කළු ගම්මිරිස් වියළලා තමයි ඉන්දියාවට අපනයනය කරන්නේ. සියයට 10ක් වාගේ තමයි වෙනත් ක්‍රමවලින් අපනයනය කරන්නේ. විවිධ ආයතන මඟින් කුඩාවට කර්මාන්ත හදාගෙන ගම්මිරිස් පිටි කරලා, එහෙම නැත්නම් කෑලි කරලා, පැකට් කරලා වෙනත් රටවලට යවලා ලොකු මුදලකට අළෙවි කරනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම සකස් කළ යුතුය කියා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වාගේම තමයි කරුංකා. පසුගිය කාලයේදී කරුංකා අපනයනයෙන් විශාල මුදලක් අපට ලැබුණා. නමුත් මේ වන කොට කරුංකා විකුණා ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. කරුංකා කිලෝවක මිල රුපියල් 650ට, 700ට බැහැලා තිබෙනවා. ඒ නිසා කරුංකා විකුණා ගන්න බැහැ. අපනයනකරුවෝ කියන්නේ කරුංකා අපනයනය කරන්න බැහැ කියලායි. මොකද, ඒවා ඉන්දියාවට ගන්නේත් නැහැ; වෙනත් රටවලට ගන්නේත් නැහැ. පුවක්වලින් තමයි කරුංකා නිෂ්පාදනය කරන්නේ. මේ වනකොට පුවක් වෙළෙලා ගොවීන් ළඟ, එහෙම නැත්නම් ව්‍යාපාරිකයන් ළඟ විශාල වශයෙන් stock කරගෙන තිබෙනවා. අපනයනකරුවන් කියන්නේ මේ වනකොට කිසිම රටකට කරුංකා අපනයනය කරන්න බැහැ කියායි. සමහර ව්‍යාපාරිකයන් කරුංකා මිලදී නොගන්නා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ තේ අපනයනය ගත්තොත්, තේවලින් අපට විශාල ආදායමක් ලැබුණා. දැන් පොහොර හොණ්ඩරයක් රුපියල් 15,000ක් විතර වෙනවා. සහනාධාර ලැබුණත් මේ වනකොට විශාල වශයෙන් තේ අස්වැන්න අඩු වෙලා තිබෙනවා. කුඩා තේ වතු හිමියන් වාගේම මහා පරිමාණ වතුවල අයිතිකරුවන් අප සමඟ මේ ගැන කථා කරනවා. පොහොර මිලත්, කම්කරු ප්‍රශ්නත් නිසා විශාල වශයෙන් තේ අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ඒ නිසා අපට ලබා ගන්න තිබෙන විශාල අපනයන ආදායමක් මේ වනකොට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් මත විශේෂයෙන් කුඩා තේ වතු දියුණු කරන වැඩ පිළිවෙළක් හදනවා නම් හොඳයි. ඒ වාගේම, අලුතින් තේ වතු ආරම්භ කරන්නත් කටයුතු කරනවා නම් හොඳයි. මහා පරිමාණ වතු සමාගම්වලට අයිතිව තිබෙන තේ වතු අද කැලෑ බවට පත් වෙලා තිබෙනවා. මේවා අක්කර 2 බැගින් හෝ ගොවීන්ට ලබා දී නැවත තේ වගා කරන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු වශයෙන් මම මේ කාරණයත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල කියන නගරය තුළ පිහිටි රාහුල ප්‍රාථමික විද්‍යාලයේ පළමු වසරට පන්ති 6ක් තිබුණා. මේ අවුරුද්ද වනකොට එය පන්ති 5කට අඩු කර තිබෙනවා. 2027 වසර වනකොට තවත් පන්තියක් අඩු කරන්න හදනවා. පන්ති 6ක් තිබුණු ගොඩකවෙල රාහුල විද්‍යාලයේ එම පන්ති ප්‍රමාණය අඩුවීම නිසා ඒ ප්‍රදේශයේ සිටින දෙමාපියන්ගේ දරුවන්ට එක වසර පාසල් අධ්‍යාපනය ලබා දීමට නොහැකි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ අවට වෙනත් පාසල් නැහැ. කුලරත්න විද්‍යාලය සහ රාහුල විද්‍යාලය තිබුණත් ඒවා හය වසරින් ඉහළ පන්ති තිබෙන පාසල්. මේ කාරණයත් මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ ප්‍රදේශයේ පෞද්ගලික පාසලක් තිබෙනවා. පසුගිය වසරේ රාහුල විද්‍යාලයේ එක වසරේ පන්ති කාමරයක් අඩු කිරීම තුළ එම පෞද්ගලික පාසලේ ළමයි 50ක් විතර එක්වරම වැඩි වුණා. මේ ප්‍රදේශයේ දෙමාපියන්ට තමන්ගේ දරුවන් රජයේ පාසලට ඇතුළත් කරන්න නොහැකි වෙලා තිබෙනවා. ඒ නිසා පෞද්ගලික පාසලට ළමයි ඇතුළත් කරනවා. 2027 වසරේ තවත් පන්ති කාමරයක් අඩු කරන්න දැන් සැලසුම් කරගෙන යනවා. එහෙම වුණොත් ඒ ප්‍රදේශයේ සිටින දෙමාපියන්ට තමන්ගේ දරුවන් පාසලට ඇතුළත් කරගන්න බැරි වෙනවා. ගොඩකවෙල අවට වෙනත් ප්‍රාථමික පාසලක් නැහැ. මේ තත්ත්වය ගැන විශේෂයෙන්ම මම ගරු අගමැතිතුමියටත් ලිඛිතව දැනුම් දුන්නා, එතුමිය අධ්‍යාපන ඇමතිතුමිය නිසා. ඒ වාගේම, මම මේ අවස්ථාවේදී ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, මේ දෙය කරන්න දෙන්න එපා කියලා. ඒ ප්‍රදේශයේ සිටින දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මේ පාසලේ තිබුණු පන්ති කාමර 6 හෝ නැවත ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ අමාත්‍යාංශය විසින් ඉතාම වැදගත් සංශෝධනයක් තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. විශේෂයෙන්ම 1972දී පිහිටුවන ලද මේ දෙපාර්තමේන්තුව, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව විධියට තමයි නම් කර තිබෙන්නේ. පසුකාලීනව -1992 වනකොට- මේක අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විධියට නාමකරණය වී තිබෙනවා. එහිදී විශේෂයෙන්ම තනතුරු නාමවල ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. "අධ්‍යක්ෂ" විධියට තමයි එම පනතේ සඳහන්ව තිබෙන්නේ. "අධ්‍යක්ෂ" කියා තනතුර තිබුණාට එම තනතුරට අදාළ නෛතික බලය හැදිලා නැහැ. ඒ අනුව මේ සංශෝධනයෙන් එම තනතුර "අධ්‍යක්ෂ ජනරාල්" විධියට වෙනස් වෙනවා. ඊට අදාළව අනෙක් තනතුරු ටික නාමකරණය වෙනවා.

මෙහි වැදගත්ම කාරණය වන්නේ, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත ගත්තාම, එම පනතේ භෝග, "නිවේදිත කෘෂිකාර්මික භෝග" විධියට නම් කර තිබීමයි. අන්න එතැන ගැටලුවක් තිබෙනවා. මොකද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට ගැනෙන ගම්මිරිස්, සාදික්කා, කරාබුනැටි, කෝපි, කරදමුංගු, කොකෝවා, බුලත්, පුවක්,

වැනිලා, පැඟිරි, සේර, ගොරකා, කහ, ඉඟුරු යනාදී භෝග වර්ග, "වාර්ෂික භෝග" කියලා තමයි පනතේ සංශෝධනයේ සටහන් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, පනතේ සංශෝධනයේ තිබෙන්නේ, "වාර්ෂික භෝග" කියලා. කහ, ඉඟුරු වාගේ භෝග, වාර්ෂික භෝග ගොඩට වැටෙනවා. හැබැයි, ගම්මිරිස්, කෝපි, කොකෝවා වාගේ භෝග, බහු වාර්ෂික භෝග. අන්න එතැනදී ගැටලුකාරී තත්ත්වයක් මතු වෙනවා.

ඊළඟට, අපේ මහාචාර්යතුමා මතක් කළා වාගේම සියයට 50ට වඩා වැඩියෙන් අපනයනය කරනවා නම් තමයි මේකට ඇතුළත් කරන්න පුළුවන් වෙන්නේ. නමුත් ඇත්තටම ඒ තත්ත්වය දක්වාම මේ ඔක්කෝම යන්නේ නැහැ. ඔන්න ඔය තත්ත්වයන් තුළ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒ සියලු භෝගවලට අදාළව රාජකාරි කටයුතු කරනවා, ගොවීන් එක්ක ගනුදෙනු කරනවා. හැබැයි, ඒ කටයුතු කරන්න ගිය හැටියේ ප්‍රශ්නයක් එනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කිසියම් කටයුත්තකට නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න ගියා කියමු; අධිකරණ කටයුත්තකට ගියා කියමු. එතැනදී පනත විග්‍රහ වනකොට නීතිමය වශයෙන් හිර වෙනවා. ඒ කියන්නේ, මේකට අදාළව අපේ නිලධාරීන්ට අවශ්‍ය බලය, හයිය හැදිලා නැහැ. කොටින්ම ගත්තොත්, අද වනකොට හෙක්ටෙයාර 82,000කට වැඩි ප්‍රමාණයක අපනයන භෝග වගා කරනවා. ඒ ආශ්‍රිතව වගාකරුවන්, අපනයනයට සහ අගය එකතු කිරීමට සම්බන්ධ වන ලක්ෂ 10කට වැඩි පිරිසක් ඉන්නවා. ලොකු වපසරියක් ඇතුළේ මේ කර්මාන්තය ව්‍යාප්ත වෙලා තිබෙනවා. එතැනදී නීතිමය පැත්තෙන් කටයුතු කරන්න ගිය ගමන් ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වෙනවා. කොටින්ම කිව්වොත්, ගොවියෙක් ලියාපදිංචි කරන්න අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බලයක් නැහැ. ඒ වාගේම සෘජුව ගොවීන්ට ආධාර දෙන්න, උදවු කරන්න බැහැ. ඒ සඳහා වෙනත් පාර්ශ්ව සම්බන්ධ කරගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේ ප්‍රායෝගික ගැටලු ප්‍රමාණයක් මේ තුළ නිර්මාණය වෙලා තිබෙනවා. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පෞරුෂයක් සහිතව, ගෞරවයක් සහිතව ඇත්තටම වැඩ කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ආශ්‍රිතව ඉන්න ගොවි ජනතාව සහ අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරින් අතර තිබෙන සහසම්බන්ධතාව ඉතා හොඳින් - මැනවින් - කළමනාකරණය කරගන්නත් මේ නීතිමය තත්ත්වය අද වනකොට ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සියල්ල අද මේ කටයුත්තත් සමඟ බේරා ගන්න පුළුවන්කම ලැබෙනවා. නම් වට්ටෝරුවක් දැන් මෙතැනදී කිව්වා. ඒ භෝග සියල්ලම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට වැටෙනවා. ඒ වාගේම අපි ආහාරයට ගන්නා වී, ධාන්‍ය වර්ග, එළවලු, පලතුරු වාගේම පොල්, තේ වාගේ වැවිලි භෝග හැර අපනයනය කිරීමට සුදුසු වෙනත් භෝග මේ යටතේ නම් කරන්න අමාත්‍යවරයාට පුළුවන්කම ලැබෙනවා.

අද මෙතැනදීත් සඳහන් වුණා, පසුගිය කාලයේදී කනෙන් රිංගලා ගිහිල්ලා, වංගු දමලා, විවිධ අකටයුතුකම් කළාය කියන කාරණයත්. ගම්මිරිස් එහෙම වියට්නාමය වාගේ රටවලින් පසුගිය කාලයේ ගෙනාවා. ඉන්දුනීසියාවේත් ගම්මිරිස් තිබෙනවා. ඇත්තටම අපේ අපනයන භෝගවල වටිනාකම, ප්‍රමිතිය - quality - ඉහළයි. නමුත් පසුගිය කාලයේදී වියට්නාමය වාගේ රටවලින් ගම්මිරිස් වාගේ දේවල් ගෙනැල්ලා, ලංකාවේ නිෂ්පාදන - “Made in Sri Lanka” - විධියට ප්‍රතිඅපනයනය කළා. ඇත්තටම ඒක ප්‍රතිඅපනයනය කිරීමක් නොවෙයි. එතැනදී වංචාවක් වුණේ. ඒ වංචාව සිදු වුණා. සමහර අවස්ථාවලදී ඒවා රටට එන්නේ නැතුව මුහුදේදීම, නැවේදීම ඒ කටයුත්ත වුණා. ඇත්තටම ඒ කාලයේදී වරක් අපි සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විධියට සාකච්ඡාවකට ආවා, අමාත්‍යාංශයට. එතකොට මහින්ද අමරවීර හිටපු ඇමතිවරයා එක්ක තමයි සාකච්ඡාව තිබුණේ. ඒ ඇමතිවරයාම අපි කිව්වාට පස්සේ ඒ කාරණය පිළිගත්තා. මම ඒ කාරණය ඉදිරිපත් කළාට පස්සේ ඒ ඇමතිවරයා පිළිගත්තා, රටට එන්නේ නැතුව මුහුදේදීම, නැවේදීම ඒ ක්‍රියාවලිය සිද්ධ වෙනවාය කියලා. ඒ නිසා එක පැත්තකින් අපට එන්න තිබෙන විදේශ විනිමය නතර වෙනවා. එතැන ලොකු ජාවාරමක් වෙනවා. අපේ ගොවියාට තිබෙන අවස්ථාව නැති වෙනවා. ඒ වාගේම අපට තිබෙන ගෞරව නාමය නැති වෙනවා. අපේ අපනයන භෝග සම්බන්ධයෙන් තිබෙන ප්‍රමිතිය බාල වෙනවා.

ඒ තත්ත්වයත් එක්ක, අපට තිබුණු ඉල්ලුම සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් නිර්මාණය වනවා. ඔය වාගේ ගැටලු ප්‍රමාණයකට පසුගිය කාලවල මුහුණ දෙන්න සිද්ධ වුණේ මෙතෙක් ක්‍රියාත්මක වෙමින් තිබුණු පනතෙන් ඊට අදාළව නෛතික බලයක් නිසියාකාරව ක්‍රියාත්මක කර ගන්න ඉඩකඩක් නොලැබුණු නිසායි. මේ පනත තුළින් අන්න ඒ සියලු ගැටලු නිරාකරණය කර ගන්න පුළුවන් වනවා.

මේ වනකොට අපි වැඩසටහන් ගණනාවකට අතගහලා තිබෙනවා. එකක්, "අපනයන කෘෂි මහිම පොකුරු ගම්මාන" වැඩසටහන. මේ ඔස්සේ ගම්මාන 500ක් නිර්මාණය කිරීමේ කටයුත්ත තමයි අපි ආරම්භ කරලා තිබෙන්නේ. අපේ ලාල් කාන්ත ඇමතිතුමාගේ මූලිකත්වයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් අපි එය පටන් ගත්තා. මීට දවස් දෙකකට කලින් ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමාත් එක්ක අපි ගාල්ල දිස්ත්‍රික්කයේ තවත් අපනයන කෘෂි මහිම පොකුරු ගම්මානයක් පටන් ගත්තා. මේ වැඩසටහන තුළ එම ක්‍රියාවලිය කෙරෙනවා. ගොවි ජනතාව තුළ මේ සම්බන්ධව උනන්දුවක් තිබෙනවා. මේ දෙපාර්තමේන්තුවට ඉතිහාසයේ කවදාවත් නැති විධියට දැන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඊට කලින් වෙන් කරපු මුදල් ප්‍රමාණයට වඩා තුන් ගුණයකට වැඩි මුදල් ප්‍රමාණයක් 2025 අවුරුද්දේදී මේ දෙපාර්තමේන්තුවට වෙන් කළා. මේ අවුරුද්දේත් එහෙමයි. විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. අපි හරියට වැඩ කරගෙන යනවා නම් මීටත් වඩා මුදල් වෙන් කරන්න පුළුවන්.

ඒ අනුව මේ භෝග ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවීන්ට නොමිලේ පැළ ලබා දෙමින්, වෙනත් සහනාධාර ලබා දෙමින්, ඒ පැළවලට ලෙඩ රෝග හැදුණාට පස්සේ ඒවාට විසඳුම් ලබා දෙන්නත් මැදිහත් වෙමින්, ඒ වාගේම අස්වනු නෙළීමට සහ වියළීමට අදාළ යන්ත්‍ර සූත්‍ර නොමිලේත් ලබා දෙමින්, තවත් සමහර ඒවාට සියයට 50ක දායකත්වයක් සහිතව ලබා දෙමින් දෙපාර්තමේන්තුව විධියට ලොකු මැදිහත්වීමක් මේ වනකොට අපි එම ගොවි ජනතාව වෙනුවෙන් කරන්න පටන් අරගෙන තිබෙනවා. අපේ නිලධාරීන් සියලුදෙනා ඒ සඳහා බොහොම වුවමනාවෙන් කටයුතු කරගෙන යනවා. හැබැයි, මෙතැන තිබෙන ගැටලුව තමයි, මේ කටයුතු කරගෙන යනකොට තිබෙන නීතිමය බාධාව. අන්න ඒ නිසා අපි අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, අපේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුළු සියලුදෙනාට ගෞරවයක් සහිතව, පෞරුෂයක් සහිතව හොඳ ශක්තිමත් විධියට මේ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න ඕනෑකම තිබෙනවා. අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව තුළ සම්මත වුණාට පස්සේ ඊට අදාළ පරිසරය අපට හදාගන්න පුළුවන්කම ලැබෙනවා. මේ වනකොටත් අපේ අතිරේක ලේකම් එච්.ජී.කේ.ආර්. තිසේරා මහතා, ඒ වාගේම දේවසුරේන්ද්‍ර මහත්මිය, අපේ නීති නිලධාරිතුමිය වන තේජානි ලසන්ති මහත්මිය, කේ.ජී.එම්.එල්.එම්. රණවීර මහත්මිය, ප්‍රසාද් ඉඩමේකෝරාල මහත්මයා, මහානාම මහත්මයා කියන මේ සියලු නිලධාරීන් අද මෙතැනට සම්බන්ධ වෙලා ඉන්නවා. එහෙම නම්, මෙන්න මේ තත්ත්වයත් එක්ක අපට පුළුවන්කම ලැබෙනවා, තිබුණු අඩුපාඩු අකා මකාගෙන ඉතාම හොඳ නෛතික පරිසරයක් හදාගෙන මේ කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

පසුගිය කාලයට සාපේක්ෂව ගත්තොත්, මේ භෝග අපනයනය කිරීම තුළ අපි ලබපු ඩොලර් ආදායම අඩු වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් කුරුඳු ගත්තොත්, 2015 දී තමයි කුරුඳුවලින් අඩුම ආදායමක් ගත්තේ. හැබැයි, අපි 2026 අවුරුද්දේ මාස හයක් ඇතුළත 2015දී ගත්ත ආදායමට ටිකක් ළඟින් යන ඩොලර් ආදායමක් ලබනවා. 2015න් පස්සේ 2025 වර්ෂයේදී තමයි අපි වැඩිම ඩොලර් ආදායමක් ලබා තිබෙන්නේ. මේ තත්ත්වය තුළ ගම්මිරිස් සහ අනෙකුත් භෝග සෑම එකකින්ම අපි ලබන ඩොලර් ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම වගා වපසරියත් වැඩි වෙලා තිබෙනවා. මීට අදාළව ගොවි ජනතාවගේ උනන්දුවත් වැඩි වෙලා තිබෙනවා; උද්‍යෝගයත් වැඩි වෙලා තිබෙනවා. ඊට සමාන්තරව අපේ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ගේ මට්ටමින් ගත්තාමත් ඊට අදාළව ලොකු උද්‍යෝගයක්, උනන්දුවක් ඇති වෙලා තිබෙනවා. එහෙම නම්, මේ උනන්දුව, උද්‍යෝගය වැඩි වීමේ මැදිහත්වීමට තිබෙන නීතිමය බාධා ඉවත් වෙලා ඊට අවශ්‍ය නෛතික පරිසරය හැදුණාට පස්සේ අපි විශ්වාස කරනවා, ඉදිරි වර්ෂවලදී අපට විශාල ඩොලර් ආදායමක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

ඒ අනුව මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ගෞරවනීය පාර්ලිමේන්තුවේ පූර්ණ සහයෝගය ලැබෙයි කියන විශ්වාසය පළ කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් කථා කළ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීතුමා සඳහන් කළා, කරුංකා සඳහා අපනයන වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මා ඒ කාරණය නිවැරදි කරන්න ඕනෑ. දැනටමත් අපේ රටේ කරුංකා - areca nuts - නිෂ්පාදන ධාරිතාව වසරකට මෙට්‍රික් ටොන් 25,000ක් ලෙස තමයි තිබෙන්නේ. අපි හැම අවුරුද්දේම මෙට්‍රික් ටොන් 18,000කට වැඩි ප්‍රමාණයක් ලංකාවේ Certificate of Origin යටතේ ඉන්දියාව ඇතුළු රටවල් කිහිපයකට අපනයනය කරනවා. මේ අවුරුද්දේ, මේ මාසය වනකොටත් අපේ මෙට්‍රික් ටොන් 14,000ක් සඳහා Certificates of Origin දීලා තිබෙනවා. එම නිසා අපනයනයේදී විකුණා ගන්න බැරි ප්‍රශ්නයක් කරුංකා සඳහා නැහැ. මේ වනකොටත් සමාගම් කිහිපයක් කරුංකා ආනයනය කරලා අගයදාම එකතු කරලා අපනයනය සඳහා අපෙන් අවසර ඉල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය මම නිවැරදි කරන්න ඕනෑ. කරුංකා වෙළෙඳ පොළේ ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. දැනට කරුංකා අපනයනය සඳහා ආනයනය කරන්න අපෙන් ඉල්ලුම් කරලා තිබෙන බවත් මම සඳහන් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.07]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ දවසේ පාර්ලිමේන්තුවේදී දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කියෙව්වා. දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකරුවන් වන ශිරාන් ගුණරත්න, මහින්ද සමයවර්ධන සහ සම්පත් විජේරත්න කියන විනිශ්චයකාරතුමන්ලා විසින් තමයි ලබා දුන්නේ. එම තීන්දුව අනුව, යෝජිත පනතේ 17වන වගන්තියේ තිබුණු, පුරවැසියාට ඇති අධිකරණ බලය, ජනතාවගේ අධිකරණ බලය සීමා කරවන, විධායකයට එම අධිකරණ බලය අත්පත් කර ගැනීම සඳහා වූ ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඒ ප්‍රතිපාදනය රජයට නීතියක් කරන්න ඕනෑ නම්, ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක කැමැත්ත මදි, ජනමත විචාරණයකදී ද එය සම්මත විය යුතු බවට ඉතාම විශ්ලේෂණාත්මකව පැහැදිලි කර තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාවේ දැක්වෙන ජනතාවගේ පරමාධිපත්‍ය බලයත්, 4වන ව්‍යවස්ථාවේ දැක්වෙන ජනතාවගේ අධිකරණ බලයත් එක්ව ගෙන කියවිය යුතු බව සහ එසේ එක්ව ගෙන කියවන විට එම අයිතියට බාධා වන යම් ප්‍රතිපාදනයක් තිබෙනවා නම් අනිවාර්යෙන්ම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක කැමැත්තට අමතරව එය ජනමත විචාරණයකින් ද සම්මත විය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරලා තිබෙනවා. මෙම තීරණය පසුගිය මාස දෙකක් විතර තිස්සේ රජය වෙනුවෙන් ජනතාවගේ අධිකරණ බලය පිළිබඳව නඟන ලද තර්කවලට සපුරා පටහැනියි. ඒ වාගේම නොසැලකිය යුතු බවට ප්‍රකාශ වූ නඩු තීන්දුවක් උපුටා දක්වමින් තමයි එම තීන්දුව ලබා දී තිබෙන්නේ.

මෙහිදී Industrial Disputes (Special Provisions) Bill, අංක 30/2022 තීන්දුවේ දැක්වෙන මූලධර්මය පිළිගෙන තිබෙනවා. එම මූලධර්මය පාර්ලිමේන්තුවේදී ගරු විපක්ෂ නායකතුමාත්, මමත් ගෙන හැර දක්වන විට එය අනුකූල නොවන බව, අදාළ නොවන බව එවැනි අවස්ථාවක ජනමත විචාරණයක් අවශ්‍ය නොවන බවට තර්ක කළ ගරු මන්ත්‍රීවරුන් මෙම පාර්ලිමේන්තුවේ හිටියා. නමුත්, එම තර්කන ක්‍රමයට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉතා නිසැක ලෙසම අභියෝග කර තිබෙනවා, එම තර්කනය ප්‍රතික්ෂේප කර තිබෙනවා. අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විධායකයට එරෙහිව, විධායකයේ මතවාදයට එරෙහිව විධායකයේ සතුටට හේතු නොවන තීන්දු දෙන්නට පුළුවන් විනිශ්චයකාරවරුන් තවමත් ඉන්නවාය කියන කාරණය මෙම නඩු තීන්දුවෙන් සනාථ කර තිබෙනවා. එම නිසා 49/2026 දරන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව හා ඒ සමඟ බැඳුණු අනෙකුත් නඩුවලට අදාළව දී ඇති එම තීන්දුව මඟින් පෙනී යන්නේ, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව විශ්වාස කරන, විධායකයට යටත් නොවන, කොන්ද කෙළින් තියාගන්න පුළුවන් විනිශ්චයකාරවරුන් මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේත් ඉන්නවා, ඒ වාගේම අනෙක් අධිකරණවලත් ඉන්නවාය කියන එකයි. එම නිසා මේ රටේ පුරවැසියන්ට මම දෙන පණිවුඩය තමයි, බලාපොරොත්තු අතහැර ගන්න එපා කියන එක.

මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මූලධර්මය විශ්වාස කර හෙට පාර්ලිමේන්තුව ඉදිරිපිට උද්ඝෝෂණයට සහභාගි වන සමගි ජන බලවේගය සහ පක්ෂයේ මතය විශ්වාස කරන සියලුදෙනාගෙන් මම කරන ඉල්ලීම තමයි, අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය අතහරින්න එපා කියන එක. පුරවැසියාට අන්තිමට යන්න තිබෙන තැන තමයි, අධිකරණය. අපට බලාපොරොත්තු තබා ගන්න පුළුවන් විනිශ්චයකාරවරුන් ඒ අධිකරණයේ ඉන්නවා. අධිකරණයේ ස්වාධීනත්වය රැකීමේ වගකීම තිබෙන, එය අවබෝධ කර ගත් විනිශ්චයකාරවරුන් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට ඊයේ තවත් නඩු තීන්දුවක් දැනගන්න ලැබුණා. ඒ නඩු තීන්දුව තමයි ප්‍රීති පද්මන් සූරසේන, අචල වෙන්ගප්පුලි, අර්ජුන ඔබේසේකර, සම්පත් අබයකෝන් සහ ගිහාන් කුලතුංග විනිශ්චයකාරතුමන්ලා දීපු තීන්දුව. ශ්‍රේෂ්ඨාධිකරණයේ ධුර දරන විනිශ්චයකාරතුමන්ලා අතරින් ජ්‍යෙෂ්ඨත්වයෙන් එතුමන්ලා 1, 6, 8, 11 සහ 13. දෙවැනි ස්ථානයේ ඉන්න යසන්ත කෝදාගොඩ, තුන්වැනි ස්ථානයේ ඉන්න නවාස්, හතරවැනි ස්ථානයේ ඉන්න ශිරාන් ගුණරත්න, හත්වැනි ස්ථානයේ ඉන්න මහින්ද සමයවර්ධන, නවවැනි ස්ථානයේ ඉන්න සෝභිත රාජකරුණා, දහවැනි ස්ථානයේ ඉන්න මේනකා විජේසුන්දර, ඒ වාගේම දොළොස්වන ස්ථානයේ ඉන්න සම්පත් විජේරත්න කියන විනිශ්චයකාරතුමන්ලාව මඟ හැරී තිබෙනවා. මෙම කාරණයට සම්බන්ධ; මීට කලින් දුන් නඩු තීන්දුවට සම්බන්ධ වෙච්ච, තමන්ගේ මතය ප්‍රකාශ කරපු, එක ස්ථාවරයේ හිටපු විශේෂයෙන්ම රටේ ඉන්න ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරු හතරදෙනෙක් වන යසන්ත කෝදාගොඩ, නවාස්, ශිරාන් ගුණරත්න සහ ජනක් ද සිල්වා කියන විනිශ්චයකාරතුමන්ලාව මඟ හැරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා තමයි ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් S.C.S.D No. 28/2026 දරන නඩු තීන්දුව සහ ඒ සමඟ බැඳුණු නඩු තීන්දු ලබා දීමේ ක්‍රියාවලිය තුළ, ඒ සමඟ බැඳුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න පූර්ණ අධිකරණයක් - full court, 13දෙනාම අවශ්‍යයි කියලා අපි කියද්දී, තෝරා ගත් - handpick කරපු - විනිශ්චය මණ්ඩලයක්, පස්දෙනෙක් ඒ විනිශ්චය මණ්ඩලයට පත් කළේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයෙන් ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් ලබා දී තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි.

ඒ අනුව bench fixing පිළිබඳ ඒ මූලධර්මය සනාථ කරන ක්‍රියාවලියක් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ක්‍රියාදාමය තුළ සිද්ධ වුණා. මම දින දෙකම ශ්‍රේෂ්ඨාධිකරණය තුළ ඉඳලා ඒ සම්පූර්ණ ක්‍රියාදාමය නිරීක්ෂණය කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන්, නීතිඥවරයෙක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙකු වශයෙන් බැලුවොත්, ඒක අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නයක්, දේශපාලන ප්‍රශ්නයක් විතරක් නොවෙයි, ඒක මගේ වෘත්තීය ගරුත්වය පිළිබඳ ප්‍රශ්නයක්, ඒක මගේ ආත්ම ගරුත්වය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ හරහා තමයි අපේ ජීවිත ගොඩනැඟී තිබෙන්නේ, අපට වටිනාකම් ලැබී තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට තුන්වරක් තේරී පත් වීමට හැකියාව ලැබුණේ අපි නීති ක්ෂේත්‍රය පිළිබඳ දක්වා තිබෙන කාරණා ගැන අපේ ගම් රටවල මිනිස්සුන්ට තිබෙන ගෞරවය නිසායි. ඒ නිසා මම මේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිරීක්ෂණය කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් මේ රටේ bench fixing සිද්ධ වුණා. Bench fixing සිදු වන බවත්, එය සිද්ධ නොවිය යුතු බවත් බන්දුල කරුණාරත්න විනිශ්චයකාරතුමා හා සම්බන්ධ නඩු තීන්දුවේදී වර්තමාන අගවිනිසුරුතුමාම සඳහන් කරලා තිබෙනවා. Bench fixing කියන්නේ මොකක්ද කියන එකට උදාහරණයක් විධියට ලෝක ඉතිහාසයට එකතු වන නඩු තීන්දුවක් තමයි මෙවර අපට ලැබුණේ, ඊයේ මේ පාර්ලිමේන්තුවේදී කියෙව්වේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ක්‍රියාවලිය තුළ තවත් දෙයක් සිද්ධ වුණා, ලෝකයේ විශිෂ්ට වූ අධිකරණයක සිදු නොවිය යුතු. ඒ වාගේම රජයේ ප්‍රතිපත්තියක් හැටියට අධිකරණය තමන්ගේ පාලනයට ගැනීම සඳහා අවශ්‍ය කරන ඒ ක්‍රියාදාමය අපි හැඳින්වුවා, court lock-in සහ court packing කියලා. මේ නඩු තීන්දුවේ court lock-in ගැන පමණක් සඳහන් කර තිබෙනවා. හැබැයි, court packing ගැන කියලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තමන්ට හිතවාදී, මතවාදී වශයෙන් තමන් සමඟ යන විනිශ්චයකාරවරුන් තවත් වැඩි කාලයක් - දීර්ඝ කාලයක් - අධිකරණයේ විනිශ්චය ආසන තුළ රඳවා ගැනීම තමයි court lock -in කියන්නේ. මේ නඩු තීන්දුවේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ විනිශ්චයකාරතුමන්ලා පස්දෙනා අහනවා, ඇයි මේ court lock-in ගැන කථා කරන්නේ, court packing ගැන කථා කරන්නේ නැත්තේ ඇයි කියලා. මම කනගාටු වෙනවා, court lock-in සහ court packing කියන කාරණා දෙක ගැනම සඳහන් වුණු කාරණා පිළිබඳව නිසි ලෙස විශ්ලේෂණයක් නැති එක ගැන. ඒ නිසා මේ නඩු තීන්දුව ප්‍රතික්ෂේප කළ යුතු නඩු තීන්දුවක්. ඊයේම පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙච්ච මේ නඩු තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය මණ්ඩලය විසින් ලබා දුන් නඩු තීන්දුවක්ද?

පිළිගත් මූලධර්ම අනුව ගත්තාම මේ තීන්දුව එයට පටහැනියි. එක අතකින් මේක තමයි අපට තිබෙන බලාපොරොත්තුව. අධිකරණයේ ස්වාධීනත්වය ගැන විශ්වාස කරන, විධායකයට යට නොවන විනිශ්චයකාරවරු මේ රටේ ඉහළම අධිකරණවල ඉන්නවා කියලා අපට බලාපොරොත්තුවක් තිබෙනවා. අනෙක් අතට, මේ රටේ ඉහළම අධිකරණවල court packing කරන්න, court lock-in කරන්න, ඒ වාගේම bench fixing කරන්න පුළුවන් කියලා අපේ ඇස් පනාපිට ඔප්පු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හෙට දිනට මගේ කථාව ඉතුරු කර ගනිමින් මට තිබෙන සීමිත වෙලාව තුළ මම ඔබතුමියට තව විශේෂ කාරණයක් කියන්න ඕනෑ. මම court packing පිළිබඳව එක්තරා ලිපියක් සකස් කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ නඩු තීන්දු දෙන අවස්ථාව වනවිට මහාධිකරණයේ පුරප්පාඩු 17ක් තිබෙනවා. හැබැයි, අලුතින් 10ක් හඳුන්වා දෙනවා, කිසිම හේතුවක් නැතුව; ඔක්කෝම 27යි. අභියාචනාධිකරණයේ vacancies 4ක් තිබෙනවා; 5ක් අලුතින් හඳුන්වා දෙනවා; ඔක්කෝම 9යි. ශ්‍රේෂ්ඨාධිකරණයේ vacancies 4ක් පවත්වාගෙන එනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ court packing පිළිබඳව කියන්න මට වේලාව මදි නිසා මගේ ලිපිය මම **සභාගත*** කරනවා. මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට දිගු කලක් පවතින ව්‍යුහාත්මක වෙනසක් කරන, අගති ලෙසට බලපාන මේ වෙනස අපි හෙළා දකිනවා, ප්‍රතික්ෂේප කරනවා. පසුගාමී නඩු තීන්දුවක් හැටියට මේ නඩු තීන්දුව අපි ප්‍රතික්ෂේප කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි පාසල් ගිය කාලයේ කථික තරග, විවාද තරග කියලා ජාතියක් තිබුණා. එහිදී මාතෘකාවට අනුව තමයි කථා කරන්න ඕනෑ. හැබැයි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කථික තරගයකට ආවා නම් එතුමාට ලකුණු බින්දුවයි. මොකද, අද දිනට යෙදී තිබෙන මේ මාතෘකාව සම්බන්ධයෙන් කිසිදු සාධාරණයක් එතුමා ඉෂ්ට කළේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ අපට කථා කරන්න කාලයක් වෙන් කරලා තිබෙනවා. පිට ඒවාත් අපි කථා කරන්න ඕනෑ තමයි. හැබැයි, තමන් දන්න දේ විතරක්ම නම් කථා කරන්නේ, එතැන ගැටලුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ තමයි අද මේ මාතෘකාවට අදාළව කථා කරන්න සිද්ධ වෙන්නේ. දැන් වැරදිලාවත් ජාතික ජන බලවේගය නොවේ නම් බලයේ ඉන්නේ පොල්වලට ඇමතියි, කුරුඳුවලට ඇමතියි, වක්කඩ ඇමතියි, මහවැලි ඇමතියි, තේ ඇමතියි වශයෙන් මේ අමාත්‍යාංශය කුඩු පට්ටම් කරලා ඇමතිකම් ගොඩක් බෙදලා ඉවරයි. හැබැයි, අපි ඉතාම විද්‍යාත්මකව, අපේ ලාල් කාන්ත සහෝදරයාගේ මූලිකත්වයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හදලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඕනෑ ඇයි? ඕනෑම රටක් දියුණු වෙනවා නම් ඩොලර් උපයන්න ඕනෑ. අපේ රටට සාපේක්ෂව නම් අපි ඩොලර් උපයන්න ඕනෑ. දැන් අපේ රටේ නම් ඩොලර් උපයන්න ණය ගන්නවා. ඒක තමයි පසුගිය ආණ්ඩු කාලයේ වැඩියෙන්ම කළේ. ඊට පස්සේ විදෙස් ප්‍රේෂණ අපට ලැබුණා. ඊට අමතරව, සංචාරක ව්‍යාපාරයෙන් අපට ආදායම ලැබුණා. ආපසු අපනයනයෙන් අපට ආදායම ලැබුණා. අපනයනය ඇතුළේ කාර්මික අපනයන, නිමි භාණ්ඩ, ඛනිජ වැලි වාගේ ඒවා තිබුණා. හැබැයි, අද අපි කථා කරන්නේ කෘෂි කර්මාන්තයට අදාළව අපනයනයෙන් අපේ රට ගොඩදාන්න හදන්නේ කොහොමද කියන එකයි. ඒකට අපට ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කය මොකක්ද? මේ වර්ග කිලෝමීටර 65,610ක භූමියට වටිනාකමක් එකතු කරන්න ඕනෑ. ඒ වටිනාකම ඇත්තටම අවුරුදු 76ක් එකතු කරලා තිබුණාද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නෙදර්ලන්තය කියලා රටක් තිබෙනවා. ඒ රටේ මුළු භූමි ප්‍රමාණය, වර්ග කිලෝමීටර 41,500යි. අපේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 65,610යි. නෙදර්ලන්තය කෘෂි කර්මාන්තයට යොදවා තිබෙන්නේ වර්ග කිලෝමීටර 17,938යි. අපේ භූමියෙන් වර්ග කිලෝමීටර 32,648ක් අපි කෘෂි කර්මාන්තයට යොදවා තිබෙනවා. ඒ කියන්නේ, එය සමස්ත භූමියෙන් සියයට 52ක්. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ සමස්ත අපනයන ආදායම හැටියට කෘෂි කර්මාන්තයෙන් ලැබෙන්නේ ඩොලර් බිලියන 3යි. හැබැයි, අපේ රටේ භූමියෙන් භාගයක් විතර අඩු, ඒ වාගේම ඊටත් වඩා අඩු වර්ග කිලෝමීටර ප්‍රමාණයක කෘෂි කර්මාන්තය කරන නෙදර්ලන්තය ඩොලර් බිලියන 137.5ක් කෘෂි කර්මාන්තයෙන් උපයනවා. ඒ කියන්නේ, අපට කොහේ හරි වැරදිලා තිබෙනවා. ඒ වැරැද්ද අපි හදා ගන්න ඕනෑ. ඒ නිසා මේ රටේ කෘෂි කර්මාන්තයට අපි නව පණක් දෙන්න ඕනෑ. අලුත් මඟක්, අලුත් තාක්ෂණයක් අපේ කෘෂි කර්මාන්තයට අපි අරගෙන දෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලයට පත් වුණාට පස්සේ අප කෘෂි කර්මාන්තයට විවිධ සැලසුම් හැදුවා. ඒ සැලසුම් අතර අපි තැඹිලි ගම්මාන නිර්මාණය කිරීම, පොල් ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම, ඒ වාගේම ගම්මිරිස්වලට අදාළව විවිධ දේවල් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ ආසනය වන මහියංගනය ගත්තොත්, අපේ ජනගහනයෙන් මම හිතන විදියට සියයට 90ක්ම ඉන්නේ කෘෂි කර්මාන්තයේ නිරත වෙලා. විශේෂයෙන්ම වී නිෂ්පාදනයේ නිරත වෙලා. හැබැයි, අද වනකොට අපේ රටේ ගොවියාට සාධාරණ ජීවිතයක්, සැපවත් ජීවිතයක් ගත කරන්න පුළුවන් තරමට කෘෂි කර්මාන්තය හැදිලා තිබෙනවාද? එහෙම වෙලා නැහැ. ඒ නිසා දැන් අපි ඉලක්ක කරනවා, වී නිෂ්පාදනයට අමතරව වෙනත් නිෂ්පාදන සඳහා අපේ ප්‍රදේශයේ ජනතාව යොමු කරවන්න. දැන් අපේ ප්‍රදේශය තමයි පළාත් කිහිපයකම ගම්මිරිස් එකතු කරන ස්ථානය බවට පත් වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගම්මිරිස් අපනයනය කරලා මහියංගනයෙන් විතරක් ඩොලර් මිලියන 40ක් හොයනවා. එහෙම නම් අපේ ගොවීනුත් ඩොලර් උපයන ගොවීන් බවට පත් කරන්න ඕනෑ. දැන් අක්කර 10ක භූමියක් තෝරා ගෙන එක් ව්‍යාපාරිකයෙකු කුරුඳු පැළ දස ලක්ෂයක් වගා කිරීමේ කටයුත්ත ආරම්භ කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මහියංගනය, වියලුව වාගේ ආසනවල ගොවීනුත් කුරුඳු නිෂ්පාදනය සඳහා යොමු කරන්න.

ඒ විතරක් නොවෙයි, කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවීන්ගේ ඒ භෝගවලට අලුත් අගයන් එකතු කරන්නත් ඕනෑ. අන්න ඒ අලුත් අගයන් එකතු කිරීමේ කටයුත්තත් අපේ ආණ්ඩුවෙන් පටන් අරගෙනයි තිබෙන්නේ. ඒ නිසා මෙතුවක් කාලයක් කෘෂි කර්මාන්තය හොබවපු විපක්ෂයේ ඉන්න මහත්වරු කල්පනා කර බලන්න ඕනෑ, භූමියෙන් සියයට 52ක් කෘෂි කර්මාන්තයට යොදවලා ඩොලර් මිලියන 3යි නම් ලංකාවට ඉපැයුවේ, ඔබතුමන්ලාගේ කෘෂිකර්ම ඇමතිකම්වලට අදාළව තිබිච්ච ඒ වගකීම් ඉෂ්ට සිද්ධ කර තිබෙනවාද කියලා. ඒක සිද්ධ වෙලා නැහැ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දැන් අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ දැවැන්ත පිම්මක් අපි පනින්නයි හදන්නේ. දේශීය මුදලින් - ලංකාවේ රුපියල්වලින් - අපේ රටේ වැව් අමුණු ටික හදන්න අපි මේ වෙනකොට කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ රටේ ගොවීන්ට විද්‍යාත්මක ආකාරයට කෘෂි භෝගවලින් හොඳ අස්වැන්නක් අරගෙන දෙන්නේ කොහොමද, ඒ අස්වැන්නට එහා ගිය හොඳ ආදායමක් අරගෙන දෙන්නේ කොහොමද කියන එකත් අපි කල්පනා කර තිබෙනවා. ඒ වාගේම ගම්මිරිස්, වී ඇතුළු අපේ රටේ කෘෂිකාර්මික භෝග වේළා ගන්න අවශ්‍ය dryer machine ටික ගෙනෙන එක, බිත්තර වී නිෂ්පාදනය කරන්න අවශ්‍ය මැෂින් ටික ගෙනෙන එක, මහා පරිමාණ වී මෝල් රජයේ මැදිහත්වීම සහිතව ඉදිකරන එක සහ අපේ රටේ වී නිෂ්පාදනයටත් අමතර ආදායමක් එකතු කළ හැකි වෙනත් නිෂ්පාදනවලට යන එක ගැනත් අපි කල්පනා කරලායි තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ අපේ රටේ කෘෂි කර්මාන්තයේ විප්ලවීය වෙනසක් කරන්න පුළුවන් කියලා.

දැන් විපක්ෂයට විවිධ කෙඳිරිලි තිබෙනවා. අධිකරණ කටයුතු සම්බන්ධයෙන් කෙඳිරිලි දැන් අපට ඇහෙනවා. හෙට උදේ මොකක්දෝ සද්දයක් දමන්න හදනවාලු නේ. අපි දන්නවා, ඔය සද්ද දැම්මට ඇත්තටම එයාලගේ දැන් සද්දයක් නැහැ කියලා. සද්දයක් නැත්තේ ඇයි? තමන්ට එකතු වෙන්න භූමියක් දැන් නැහැ, එකතු වෙන්න සටන් පාඨයක් නැහැ. ඒ නිසා විවිධ බොරු සටන් පාඨ ගේනවා. අපට නේ, බොරු කියනවා කියලා කියන්නේ. හැබැයි, ඒගොල්ලන් විවිධ බොරු සටන් පාඨ ගේනවා, භූමියට. නමුත්, ජනතාව ඒවා පිළිගන්න සූදානම් නැහැ. ඒ නිසා අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා කියනවා වාගේ විපක්ෂයේ මහත්වරුන්ට අපි කියනවා, ඔබට බලය ගන්න යම්කිසි හීනයක් තිබෙනවා නම් අපට වඩා හොඳ වෙන්න, එහෙම නැත්නම් කවදාවත් බලය ගන්න බැහැ කියලා. මේ රටේ මහජනතාව අලුත් විදියට හිතලා, තිබුණු පැරණි ක්‍රමය එපා කියලා නව ආණ්ඩුවක් අරගෙන ආවා. ඒ පැරණි ක්‍රමය තුළ තවදුරටත් හිඳිමින් නම් බලය බලාපොරොත්තු වෙන්නේ, කිසිදු දවසක ඒ බලය ගන්න බැහැ. ඒකයි අපි ධීවර, කර්මාන්ත, සන්නිවේදන, අධ්‍යාපන ඇතුළු හැම ක්ෂේත්‍රයක් ගැනම වෙනස් විදියට හිතලා වෙනස් ක්‍රියාමාර්ග ගනිමින් රටක් හදන්න මහන්සි වෙන්නේ. ඒ සඳහා අපි 159දෙනෙක් ඉන්නවා. අපි එකමුතුයි; එක ඉලක්කයකටයි යන්නේ; ස්වේච්ඡාවෙන් වැඩ කරන්නේ. එවැනි බලවේගයක් එක්ක ඔහොම සටන් - fight - කරන්න බැහැ, මහත්වරුනි. ඒ නිසා අපි ඔබට කියනවා, මේ බලය ගන්න අවශ්‍ය නම් පෙරදී කිව්වා වාගේ හොඳ, දැවැන්ත, ශක්තිමත් විපක්ෂයක් බවට පත් වෙලා අපට වඩා හොඳ විප්ලවීය වෙනස් අදහස් හා යෝජනා අරගෙන එන්න කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.26]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்டுள்ள நேரம் குறைவாக இருப்பதனால், அரசியல் ரீதியான இரண்டு விடயங்களை மாத்திரம் இந்த இடத்தில் பேச விரும்புகின்றேன்.

முதலில், அனோஜன் சம்பந்தப்பட்ட விவகாரத்தில் என்னுடைய கருத்தை இந்த இடத்தில் வெளிப்படையாகத் தெரிவிக்க விரும்புகின்றேன். அனோஜனின் பெயரைப் பாவித்து அரசியல் குளிர்காய வேண்டுமென்ற எந்தவிதமான அவசியமும் எனக்குக் கிடையாது. ஒரு விஷயத்தை எல்லோரும் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, வெளிநாட்டில் வேலை செய்யக்கூடிய குறித்த நபர், அநாகரிகமான சில வார்த்தைகளைப் பாவித்து, அந்த நாட்டின் கலாசாரம் மற்றும் மதத்தை அவமதித்ததால்தான் அவருக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்கு அந்த நாடு முடிவெடுத்திருக்கிறது. அப்படி இருக்கும்போது, மனிதாபிமான அடிப்படையில் அவருக்குக் கருணை காட்டச் சொல்லி நாம் ஓர் அரசாங்கமாக மட்டுமல்ல, ஒரு நாடு என்ற ரீதியில் கோரிக்கை ஒன்றை முன்வைக்கிறோம். அதற்கு முழுமையான ஒத்துழைப்பை நாங்கள் கொடுப்போம்.

எதிர்க்கட்சியில் இருக்கின்ற சில உறுப்பினர்களாக இருக்கட்டும், தலைமைகளாக இருக்கட்டும்! அவர்கள் புரிந்துகொள்ள வேண்டிய விடயம் என்னவென்றால், இது முழுக்க முழுக்க வெளிவிவகாரத்துடன் சம்பந்தப்பட்ட ஒரு விடயம் என்பதைத்தான். வெளிவிவகாரத்துடன் சம்பந்தப்பட்ட இந்தப் பிரச்சினையில் அரசாங்கத்துக்குத்தான் முன்னுரிமை இருக்கின்றது. அரசாங்கம்தான் இதனைப் பொறுப்பான முறையில் கையாள வேண்டும். அப்படி இருக்கும்போது, நாம் இந்தப் பிரச்சினையை அரசியல் மயமாக்கி, கடைசியில் வெளிநாட்டலுவல்கள் அமைச்சருக்கு ஒரு பிரச்சினையை indirectஆக உருவாக்குவதில் எந்தவித அர்த்தமும் கிடையாது. இந்த விடயத்துக்கு நாங்கள் முழுமையான ஒத்துழைப்பைக் கொடுக்கத் தயாராக இருக்கிறோம். இந்த விடயத்தைக் கட்டாயம் வெளிநாட்டலு வல்களுக்குப் பொறுப்பான அமைச்சுதான் பாரமெடுக்க வேண்டும். எதிர்க்கட்சியினராகிய நாங்கள் இது தொடர்பில் வலியுறுத்தலாமே தவிர, தலையிடக் கூடாது. அப்படி நாங்கள் தலையிட்டால், இது சர்வதேச ரீதியில் பெரிய பிரச்சினையை உருவாக்கும்.

அடுத்து, நான் இந்த இடத்தில் இன்னொரு விஷயத்தை வெளிப்படையாகவே சொல்ல விரும்புகின்றேன். சனாதிபதி அவர்களின் நோக்கம், எண்ணம் என்ன என்பது எனக்கு நன்றாகவே தெரியும். இதை நான் ஆரம்பத்திலிருந்தே தெளிவாகச் சொல்லி வருகின்றேன். மக்களுக்கு நல்லது செய்ய வேண்டும் என்றுதான் அவர் நினைக்கிறார். ஆளும் தரப்பில் 159 உறுப்பினர்கள் இருக்கிறார்கள். குறிப்பாக, அந்தந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள்; அமைச்சர்கள் இருக்கின் றார்கள். அவர்களும் சனாதிபதி அவர்களின் நோக்கத்தைப் பிரதிபலிக்க வேண்டுமே தவிர, அவருடைய பெயருக்குக் களங்கத்தை ஏற்படுத்தக் கூடாது.

இன்று நான் எதிர்க்கட்சிப் பக்கமே இருக்கின்றேன். ஓர் எதிர்க்கட்சி உறுப்பினராக, ஒரு கட்சித் தலைவராக என்னால் மக்களுடைய பிரச்சினையை இங்கு சொல்ல முடியும். நான் 'தித்வா' அனர்த்தம் சம்பந்தமான பிரச்சினை பற்றி பேசியிருந்தேன்; அரசாங்கம் பெருந்தோட்ட நிறுவனங் களுடனான leaseஐ extend பண்ணுகின்ற விடயம் சம்பந்தமாகப் பேசியிருந்தேன்; தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு சம்பந்தமாகவுள்ள சிக்கல்கள் பற்றி சொல்லி யிருந்தேன். சம்பள உயர்வு கொடுக்கும்போது பறிக்க வேண்டிய தேயிலையின் அளவும் கூடுகின்றது. அதைத் தவிர்த்துக்கொள்ள வேண்டுமென நாங்கள் சொன்னோம். பறிக்கவேண்டிய தேயிலையின் அளவு இன்று

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

கூடியிருக்கின்றது. அதை நிவர்த்தி செய்வதற்கு வர்த்தமானி அறிவித்தலொன்றை வெளியிடுமாறு சொல்லியிருந்தேன். அதையும் நீங்கள் கேட்கவில்லை. நான் ஒவ்வொரு தடவையும் பிரச்சினைகளைச் சொல்லும்போது, நாகரிகமான முறையில் ஓர் எதிர்க்கட்சி உறுப்பினர் என்ற வகையில்தான் உங்கள் முன் வைத்தேன். இரண்டு வருடங்களில் வேலையின் அளவு குறைந்திருக்கின்றதென்று நான் கடந்த தடவை பேசும்போது கூட வெளிப்படையாகவே சொன்னேன். அதற்குக் காரணம், மலையகம் இலங்கையில் உள்ள மற்றைய பகுதிகள் மாதிரிக் கிடையாது. அங்கு RPCsஆல் ஆயிரத்தெட்டுச் சிக்கல்கள் இருக்கின்றன.

நான் என்னுடைய அனுபவத்தைப் பகிர்ந்துகொள்ளும் போது உங்கள் தரப்பிலுள்ள ஓர் உறுப்பினர் எழுந்து, "நீங்கள் 76 வருஷமாக என்ன செய்திருக்கிறீர்கள்?" என்று கேட்கிறார். நாங்கள் 76 வருஷமாக என்ன செய்திருக்கிறோம் என்பதைச் சொல்ல ஆரம்பித்தால் நேரம் போதாமல் போய்விடும். ஆனால், சிறியதொரு விடயத்தை மட்டும் சொல்கிறேன். குறித்த உறுப்பினருடைய தொகுதியில் குறிப்பாக அவர் பிறந்த இடத்தில் மறைந்த தலைவர் சௌமியமூர்த்தி தொண்டமான் அவர்கள் அந்தக் காலத்தில் இரண்டு மாடிக் கட்டிடம்கொண்ட ஒரு பாடசாலையைக் கட்டிக்கொடுத்து இருக்கிறார். அதற்குப் பிறகு, மறைந்த தலைவர் ஆறுமுகன் தொண்டமான் ஐயாவாக இருக்கட்டும், ஊவா மாகாண அமைச்சராக இருந்த செந்தில் தொண்டமானாக இருக்கட்டும், அந்தப் பாடசாலைக்கு இன்னும் இரண்டு மாடிக் கட்டிடத்தை அமைத்துக் கொடுத்து இருக்கிறார்கள்; வீதி வசதிகளை வழங்கி இருக்கிறார்கள்; மின்சார வசதிகளை வழங்கி இருக்கிறார்கள். இவற்றை யெல்லாம் Gampaha Estate, உடப்புசலாவை ஆகிய பகுதியில் வழங்கி இருக்கிறார்கள். குறித்த உறுப்பினருடைய ஊரை விடுங்கள்! அவருடைய குடும்பத்துக்கும் செய்திருக்கிறோம்.

"இலங்கை தொழிலாளர் காங்கிரஸ் 76 வருஷமாக என்ன செய்திருக்கிறது?" என்று என்னிடம் கேட்ட உறுப்பினரின் தந்தை, 1983இலிருந்து 1987 வரைக்கும் இந்த காங்கிரஸின் மூத்த மாவட்டத் தலைவர். அவருடைய அண்ணன் காங்கிரஸின் தோட்டக் 'கமிட்டி' தலைவர். அவருடைய சகோதரி, மறைந்த தலைவர் சௌமியமூர்த்தி தொண்டமான் ஐயாவும் மறைந்த தலைவர் சிவலிங்கம் ஐயாவும் வழங்கிய அரசாங்க உத்தியோகத்தர் பதவியைத்தான் வகித்தார். அப்படி இருக்கும்போது, 76 வருஷமாக என்ன பண்ணியிருக்கிறீர்கள்? என்று கேள்வி கேட்கிறார். எனக்கு அவருடைய குடும்பத்தை இழுத்துப் பேச இஷ்டம் இல்லை. ஆனால், யதார்த்தம் இதுதான். அப்படி இருக்கும்போது, திரும்பத் திரும்ப நீங்கள் என்ன பண்ணியிருக்கிறீர்கள் என்று கேட்பதில் எந்த அர்த்தமும் இல்லை.

நான் இந்த இடத்தில் இன்னொரு விஷயத்தையும் சொல்ல விரும்புகின்றேன். உங்களுடைய கட்சி அந்தக் காலத்தில் உருவாக்கிய கலவரத்தினால், St. Margaret army campக்கு உங்களை அழைத்துச் சென்றார்கள். மறைந்த தலைவர் சௌமியமூர்த்தி தொண்டமான் ஐயா சிபாரிசு பண்ணியதால் தான் அவர்களை வெளியே கொண்டுவர முடிந்தது. இது ஓர் உதாரணம் மட்டும்தான். இந்த மாதிரி பல்லாயிரக்கணக்கான மக்களுக்கு உதவியிருக்கிறோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
தயவுசெய்து, ஒரு விஷயத்தை ஞாபகத்தில் வைத்துக் கொள்ளுங்கள்! ஒரு விரலை நீங்கள் என்மீது நீட்டினால், ஏனைய நான்கு விரல்களும் உங்கள் மீதுதான் பாயும். நான் சேர்ந்து வேலைசெய்ய வேண்டும் என்றுதான் நினைக்கின்றேன். திரும்பத் திரும்ப என்னுடைய வாயைக் கிளறினால் அனைத்து உண்மைகளும் கொஞ்சம் கொஞ்சமாக வெளிவரும். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.31]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ අවස්ථාවේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දීලා තිබෙන තීරණය ගැන වැරදි අදහසක් ජනගත කිරීමට විපක්ෂයේ මන්ත්‍රීවරුන් උත්සාහ කරන බවක් පෙනෙනවා. ඒ නිසා එය නිවැරදි කරන්නට ඕනෑ.

පළමුවැනි කාරණය මේකයි. යම් පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් තීරණය කිරීමට අත්‍යවශ්‍යයෙන් සහ වෙන් කළ නොහැකි ලෙස ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් බලය පවරා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට විතරයි. ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට විතරයි යම් පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් තීරණ ගැනීමක් කළ හැක්කේ. අධිකරණයේ ක්‍රියාවක් සම්බන්ධයෙන් මොකක් හරි ශාස්ත්‍රීය - academic - අදහසක් ප්‍රකාශ කිරීම වෙනම දෙයක්. නමුත් දේශපාලන අරමුණු සඳහා අධිකරණයේ ක්‍රියා කිසිදු හේතුවක් නැතිව මේ ආකාරයෙන් පාර්ලිමේන්තුව තුළ විවේචනයට ලක් වීම අධිකරණයේ ස්ථාවරය, අධිකරණයේ ගම්භීරතාව සහ ලංකාවේ ව්‍යවස්ථාව තුළ එයට ලබා දීලා තිබෙන ස්ථානය හෑල්ලුවට ලක් කිරීමක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා මේ කාරණා ජනතාව ඉදිරියේ නිවැරදි කළ යුතුයි කියලායි මා හිතන්නේ. ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ වගකීමයි.

ශ්‍රේෂ්ඨාධිකරණයට තමයි පූර්ණ වගකීම තිබෙන්නේ; පූර්ණ අයිතිය තිබෙන්නේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් අවසාන තීරණය ලබා දීම සඳහා. ලංකාවේ වෙන කිසිම ආයතනයකට ඒ අයිතිය නැහැ. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ලබා දීලා තිබෙන තීරණය විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන් අඩු ගණනේ කියවා තිබෙනවාද කියන ගැටලුව මතු වෙනවා, මෙතුමන්ලා කියන සමහර කාරණා ගෙන බැලුවාම. අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් නඟන සෑම කාරණයකටම මේ තීරණය හරහා ඉතා විස්තරාත්මකව පිළිතුරු ලබා දීලා තිබෙනවා. මෙහි තිබෙන කාරණා මොනවාද යනාදි වශයෙන් ඒ හැම එකක්ම සලකා බලා තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් කිව්වා, court capture සහ court packing කියන එක මෙහි හරියට consider කරලා නැහැ කියලා. මේ අධිකරණ තීරණයේ 86වන පිටුව බැලුවොත් ඒ බව ඉතාම පැහැදිලිව පෙනී යනවා. "The argument that the Bills as a whole are a project aimed at 'Court Capture' " යටතේ ඒ සම්බන්ධයෙන් අධිකරණය වෙනම අදහසක් පළ කර තිබෙනවා. ඒ වාගේම එවැනි court capture එකක් හෝ court packing එකක්, එහෙම නැත්නම් රජයට කැමැති විනිසුරුවරුන් අධිකරණයට පත් කර ගැනීමේ හැකියාවක් මේ සංශෝධනය හරහා ලැබෙන්නේ නැහැ කියන එක බොහොම නිශ්චිතව මේ තීරණයේ ප්‍රකාශ කරලා තිබෙනවා. එහෙම තිබියදීත් විපක්ෂය ඒක ගැන වැරදි අදහසක් ජනගත කරනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ Article 3 and Article 4 එකට කියවීම හරහා අධිකරණයේ ස්වාධීනත්වයට යම් බලපෑමක් සිද්ධ වෙනවා නම් එහිදී ජනමත විචාරණයකට යන්න ඕනෑ කියන කාරණය Anti-Corruption Bill එක සම්බන්ධව දීලා තිබෙන තීරණයේ තිබෙනවා, මේ තීරණයේ එහෙම දෙයක් නැහැ වාගේ අදහසක් ජනගත කරන්න විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමා උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ තීරණයේ 73වන පිටුවේ බොහොම පැහැදිලිව ඔය refer කරපු නඩු තීන්දුවටම refer කරනවා. Industrial Disputes (Special Provisions) Bill එක සම්බන්ධව Article 3 and Article 4 එකට කියවා බැලුවොත්, අධිකරණයේ ස්වාධීනත්වයට යම් හානියක් සිදු වෙනවා නම්, අනිවාර්යයෙන් ජනමත විචාරණයකට යන්න ඕනෑ කියන ස්ථාවරයට ශ්‍රේෂ්ඨාධිකරණය මේ ලබා දීලා තිබෙන තීන්දුව හරහා එකඟ වෙනවා.

නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මේ දේශපාලන සටන් පාඨයට එකඟ නොවන තැන විපක්ෂයේ මන්ත්‍රීවරු විවේචන ඉදිරිපත් කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වෙලා තිබෙන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අධිකරණයේ ස්වාධීනත්වයට කිසිදු බලපෑමක් සිද්ධ වෙන්නේ නැහැ කියන එකයි. අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් සිද්ධ වෙනවා නම්, ජනමත විචාරණයකට යන්න ඕනෑ කියලා Anti-Corruption Bill එක ගැන සඳහන් තීරණයේ තිබෙන කාරණයට මේ Bill එක තුළත් එකඟතාව තිබෙනවා. විපක්ෂයේ අය මේ කියන ආකාරයට ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ සම්බන්ධයෙන් ජනතාවට වැරදි අදහස් ජනගත කිරීමට පාර්ලිමේන්තුව භාවිත කරන්න දෙන්න එපා කියන ඉල්ලීම කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ සම්බන්ධව වෙනම කථා කරන්න අවශ්‍යයි. නමුත් මේ වෙලාවේ මෙය quote කරන්න ඕනෑ. ඇත්තටම මෙහෙම අසරණ කරන්න අවශ්‍ය නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ට මාධ්‍ය හරහා ඇවිත් තමන් දීපු තීන්දු ජනතාවට ආයෙ ආයේ පැහැදිලි කරන්න බැහැ. ඒ නිසා ඒ ගැන අවබෝධයෙන් කටයුතු කරන්න මේ නීතිඥවරුන්ට, මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙන්න ඕනෑ.

අවසාන වශයෙන් මම මේ කාරණය ප්‍රකාශ කරනවා. The Determination on the Bills titled "Twenty Second Amendment to the Constitution" and "Judicature (Amendment) Bill" states in page 91, I quote:

> "There is a particular threat to judicial independence which should concern us: that is, the growing tendency for politicians and the press to attack in intemperate and even vituperative terms judges who have given decisions with which they disagree. Newspapers all too often respond to an unpopular decision with personal attacks on the judges concerned. Judges must accept strong criticism, even unfounded criticism. Lord Atkin's statement that justice is not a cloistered virtue has become a legal cliché. As Lord Judge, the Lord Chief Justice of England and Wales, has recently said, one of the attributes we expect of an independent judge is the moral courage to make decisions which will be unpopular with politicians or the media or the public."

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දේශපාලනඥයන් අකමැති තීන්දුවක් ලබා දුන්නාම ඒ තීන්දුව මේ ආකාරයෙන් විවේචනයට ලක් කිරීම Independence of the Judiciary කියන principle එකට විරුද්ධයි කියන අදහස අපේ ශ්‍රේෂ්ඨාධිකරණය දවස් දෙකකට ඉස්සෙල්ලා කිව්වාට පස්සේත්, ඒ හා සම්බන්ධ වෙනත් jurisdictionsවල judgesලාගේ අදහස් quote කරමින් ඒක කිව්වාට පස්සේත් අපේ රටේ නීතිඥවරුන් යැයි කියා ගන්නා පිරිස් සහ අපේ රටේ ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙහෙමයි හැසිරෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන කාරණය කියන්න මට තත්පර 30ක් ලබා දෙන්න. Bench එක form කිරීමේ අයිතිය සම්බන්ධයෙන් ඉතා දීර්ඝ වශයෙන් මේ තීරණයේ සාකච්ඡා කර තිබෙනවා. මොකද, ඒකට objection එකක් ආපු නිසා. ඒ Bench එක form කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් තිබෙන්නේ අග්‍ර විනිශ්චයකාරතුමාටයි, එය ප්‍රශ්න කළ නොහැකියි කියන එක, ඒක Supreme Court එකේ අනෙක් විනිසුරුවරුන්ටත් ප්‍රශ්න කරන්න බැහැ කියන ස්ථාවරය මෙහි බොහොම පැහැදිලිව ගෙන තිබෙනවා. ඒ වාගේම පැහැදිලි කරනවා, Ant-Corruption Act එක වාගේ තවත් පනත් සම්බන්ධවත් benches විසින් මේ වාගේ තීරණ ගනිමින් තිබෙනවා, ඒ නිසා හැම judgeටම එහි ඉඳගන්න බැරි හේතුව බොහොම පැහැදිලිව කියා තිබෙනවා. එහෙම තිබියදීත් විපක්ෂය අධිකරණය සම්බන්ධයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් තමන්ගේ දේශපාලන ව්‍යාපාර පවත්වා ගැනීම සඳහා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කියනවා. එය ඉතාම කනගාටුදායකයි. ඒක නවත්වන්න කියන එක, එය වළක්වන්න කියන එක මම බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද දවසේ අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ වෙලාවේ, ඒ සංශෝධනවලට අපේ එකඟත්වය, අපේ කැමැත්ත එකතු කරන්න අපි කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහිදී අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව අලුතින් පිහිටුවූවාට පසුව එම දෙපාර්තමේන්තුවට අයත් කාර්ය මණ්ඩලවල තිබෙන අඩු පාඩුකම්, ඒ කාර්ය මණ්ඩලවල වැඩ ව්‍යූහයට අදාළව තිබෙන අඩු පාඩුකම්, එම ආයතනවල තිබෙන අඩු පාඩුකම් සපුරාලන්න කියලා; ඒ වාගේම විශේෂයෙන්ම කුරුඳු කර්මාන්තයේ යෙදෙන අපේ කර්මාන්තකරුවන්ට යම් සහයෝගයක් ලබා දෙන්න කියලා. එසේ කිරීම වටිනවා. ඒ පිළිබඳවත් සිහිපත් කරමින්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිබඳව කථා කරන මේ වෙලාවේ අපේ රටේ කුඩා තේ වතු හිමියන් මේ වන විට මුහුණ දී තිබෙන

[ගරු චානක මාදුගොඩ මහතා]

ගැටලු විසඳන්න කියන ඉල්ලීමත්, ඔවුන්ගේ ආදායම වැඩි කර ගැනීම සඳහා යම්කිසි ආධාර ක්‍රම වෙනුවෙනුත් ඔබේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම වාගේම, පොල් වගාව ඇතුළු අනෙකුත් භෝග පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් මම මේ මොහොතේ සිදු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට පෙර කථා කරපු ආණ්ඩුවේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, වැව් පිළිබඳව. වැව් හදන්න බලාපොරොත්තු වෙනවා කියලා කිව්වා. ඒක හොඳයි. ජනාධිපතිතුමාත් වේදිකාවේදී කිව්වා අපට මතකයි, වැව් 400ක් හදනවා කියලා. ඒකත් හොඳයි. හැබැයි, ගැටලුව මේකයි. ඔබේ ආණ්ඩුවේ කැබිනට් ප්‍රකාශකතුමා; අපේ නලින්ද ජයතිස්ස මැතිතුමා කැබිනට් ප්‍රකාශකවරයා විධියට තම නිවේදනයේ කියනවා, ආණ්ඩුව තවම එහෙම තීන්දුවක් අරගෙන නැහැ කියලා. ඒ නිසා ජනාධිපතිතුමා ගමට ගිහින් බොරු කියනවා වාගේම, මේ ගරු මන්ත්‍රීතුමන්ලාත් අද පාර්ලිමේන්තුවේදී බොරු කියනවාද කියන ප්‍රශ්නය අපි අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අප මේ කරුණු පිළිබඳව කථා කරන කොට මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි ඊයේ දවසේත් මේ පිළිබඳව කථා කළා. පක්ෂ-පාට, ජාති-ආගම් භේදවලින් ඔබ්බට ගිය අතිශය සංවේදී මානුෂික අර්බුදයක් වෙනුවෙන් සමස්ත ජාතියේම හඬ අපි ඉදිරිපත් කරන්න ඕනෑ.

සෞදි අරාබියේ මරණ දඬුවම නියම වී සිටින අපේම රටේ තරුණයෙකු වන අනෝජන්ගේ ජීවිතය බේරා ගැනීම වෙනුවෙන් වහාම මැදිහත් විය යුතුයි කියන කාරණය අපි සඳහන් කරන්න ඕනෑ. අද ඔහු මුහුණ දී සිටින්නේ අවසානාවන්ත තත්ත්වයකටයි. ඉන් ඔහු මුදා ගැනීම සඳහා රටක් විධියට අපි එකට එකතු විය යුතුයි කියන කාරණයත් මම සඳහන් කරනවා. නමුත්, කනගාටුවට කරුණ නම්, රජය තවමත් සක්‍රියව මේ සම්බන්ධයෙන් මැදිහත් නොවීමයි. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඒ සඳහා සක්‍රියව මැදිහත් වෙන්න කියලා. ඒ පිළිබඳව සක්‍රියව මැදිහත් නොවෙනවා වාගේම මෙවන් ජාතික මානුෂික අර්බුද හමුවේ සමාජයට ජාතිවාදී විස පෙවීම් සිදු වන විට රජය ඒවා නොදැක්කා වාගේ සිටීම ඊට වඩා කනගාටුවට කරුණක්.

අද ජනාධිපතිතුමා ආණ්ඩුවේ ප්‍රගතිය කියන්න රට වටේ යනවා. රට වටේ යන ගමන් එතුමා වේදිකාවේදී කිව්වා ඇස් බැඳගෙන ඉන්නවා කියලා. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ ඇස් බැඳගෙන ඉන්නා රෙදි පටිය ලිහලා ජාතිවාදය ඉදිරියට ගෙන යමින් කටයුතු කරන මහා ව්‍යසනකාරී තත්ත්වයන් පිළිබඳව, සිවරාසා අනෝජන් වැනි අහිංසක තරුණයන් ගැන සහ මේ රටට ලබා දීපු පොරොන්දු ගැන තමන්ගේ ඇස් දෙක ඇරලා බලන්න, අවධානය යොමු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මම මේ සභාවේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව මේ මොහොත වන විට පවතින ගැටලුවක් ගැන. නීතියේ ආධිපත්‍යය වාගේම මේ රට දැය බේරා ගැනීමට කටයුතු කළ වීරයන්ගේ ගෞරවය සම්බන්ධයෙනුත් ගැටලුවක් මතු වෙලා තිබෙනවා කියන එක මේ සභාව වාගේම මේ රටම දන්නා කරුණක්. ඒක අතිශය සංවේදී බරපතළ කරුණක්. ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකයේ අනෙකුත් රටවල එල්ටීටීඊ සංවිධානය තහනම් ත්‍රස්ත ව්‍යාපාරයක් කියන එක අමතක කරමින් අපට කථා කරන්න බැහැ; ඒක ත්‍රස්ත ව්‍යාපාරයක්. අපේ රටේ නීතිවලත් තිබෙනවා, මේ රටමත් දන්නවා එල්ටීටීඊ සංවිධානයේ කොඩි, ලාංඡන ප්‍රදර්ශනය කිරීම, ජාතිවාදීන් වීරත්වයට නංවමින් ප්‍රචාරය කිරීම සහ එල්ටීටීඊ සංවිධානයේ පිරිස පිළිබඳව කථා කිරීම වාගේ දේවල් තහනම් කියන එක. ඔබතුමියම මූලාසනයේ ඉන්නකොට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් බාල්රාජ් වීරයෙක් කියලා කිව්වා. හැබැයි, ඔබතුමියට තවම බැරි වුණා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න. බාල්රාජ් ජාතික වීරයෙක් කියලා උතුරෙන් ආපු මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවේදී කියනකොට පාර්ලිමේන්තුව හැටියට අපට ඊට විරුද්ධ වෙන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් අද ඊටත් වඩා කනගාටුවට කරුණක් තිබෙනවා. අද මේ රට තුළ එල්ටීටීඊ සංවිධානයේ විවිධ පුද්ගලයන්ගේ පිළිරූ හදමින් කටයුතු කරනවා. අපි දැක්කා යාපනයේ නල්ලූර් කෝවිල ළඟ තිලීපන් කියන එල්ටීටීඊ ත්‍රස්තවාදියාගේ ලෝකඩ පිළිමයක් හදලා කොඩි දාලා ශබ්ද විකාශන යන්ත්‍රවලින් ගීත ප්‍රචාරය කරලා ඒ තිලීපන් කියන ත්‍රස්තවාදියාව ප්‍රසිද්ධියේ සැමරුව ආකාරය. හැබැයි, කාටවත් ඊට විරුද්ධව කටයුතු කරන්න බැරි වුණා. රට දෙකඩ කරලා වෙනම ඊළාම් රාජ්‍යයක් ඉල්ලලා යුද්ධ කළ ත්‍රස්තවාදියෙක් ඒ විධියට නගරය මධ්‍යයේ ප්‍රසිද්ධියේ සමරනකොට අපි අහනවා, මේ ආණ්ඩුව ඇස් දෙක පියාගෙනද හිටියේ කියලා, ජනාධිපතිතුමා ඇස් දෙක පියාගෙන හිටියා වාගේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊටත් වඩා කනගාටුවට කරුණ තමයි ඒ සැමරුම වෙනුවෙන් පාසල් සිසුන් සම්බන්ධ කර ගැනීම. නිල ඇඳුමෙන් සැරසුණු දරුවන්, රජයේ වැටුප් ලබන ගුරුවරුන්, ගුරුවරියන් ඒ ඊළාම් ජාතිවාදී විෂ පෙවීම් සැමරීම සඳහා සම්බන්ධ වුණා. හැබැයි, අපේ රටේ අධ්‍යාපන පද්ධතියේ නීති රීති අනුව පාසල් වේලාව තුළ දරුවන් බාහිර වැඩසටහන්වලට යොමු කරන්න නම් විදුහල්පතිවරයාගේත්, බලධාරීන්ගේත් පූර්ණ අනුමැතිය තිබෙන්න ඕනෑ. එහෙම නම් ඒ දරුවන්ගේ හිත්වලට ජාතිවාදී විෂ ඇතුළු කරන ඒ අපුල සහගත ක්‍රියාව සිදු වුණේ අධ්‍යාපන බලධාරීන්ගේ දැනුවත්වීමකින්ද කියලා මම මේ සභාවෙන් අහන්න කැමැතියි. ඒ විධියට ජාතික ආරක්ෂාව සහ නීතිය හෑල්ලුවට ලක් කරමින් පාසල් දරුවන් එවැනි නීති විරෝධී සැමරුම් සඳහා යොමු කළ විදුහල්පතිවරුන්ට සහ අධ්‍යාපන නිලධාරීන්ට එරෙහිව ගරු අධ්‍යාපන ඇමතිතුමිය ගන්නා නීත්‍යානුකූල පියවර, ඔවුන්ට දෙන දඬුවම් මොනවාද කියලා අපි එතුමියගෙන් දැනගන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අත්තනෝමතික ක්‍රියා කලාපයක් පිළිබඳවත් මම කථා කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට තව විනාඩියක් දෙන්න.

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අත්තනෝමතික දේශපාලන මැදිහත්වීම සහ බලපෑම හේතුවෙන් දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරයේ ස්වාධීනත්වය අද අවදානමකට ලක් වෙලා ඇති බව මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි. ජනාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස පළාතේ ආණ්ඩුකාරතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතියේ ආධිපත්‍යය සුරැකීමට බැඳී

සිටිනවා. අද වනවිට පක්ෂයේ දේශපාලන වුවමනා ඉටු කරන ප්‍රධාන ඒජන්තයා බවට එතුමා පත් වෙලා. සමුපකාර සමිති පනත මඟින් සුරක්ෂිත කර තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයට අභියෝග කරමින් ආණ්ඩුකාරවරයා තමන්ගේ දේශපාලන අනුගාමිකයන්ට සහ හිතවතුන්ට සමුපකාර සමිතිවල සභාපතිකම්, අධ්‍යක්ෂ බලතල ලබා දෙන්න කටයුතු කරනවා, බලපෑම් කරනවා. අපි අභියෝග කරනවා, ඒ තීන්දු කරන - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් තමයි වැඩිපුරම කථා කරන්නේ. අපිට මතකයි, අපි පුංචි කාලයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තමයි මෙම දෙපාර්තමේන්තුව තිබුණේ. ඒ කාලයේ ගම්වල කිව්වේ සුළු අපනයන මහත්තයා එනවා කියායි. ඒ කියන්නේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව විධියට තමයි එදා මෙම දෙපාර්තමේන්තුව හැඳින්වූයේ. පසුව 1975 වසරේදී මෙය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගත්තා. නැවත 1992 වසරේදී මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විධියට ස්ථාපිත කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1992 වසරේ සම්මත කළ අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත අවුරුදු 30කට පසුව අද තමයි සංශෝධනයට ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ රටේ විශාල ක්ෂේත්‍රයක් නියෝජනය කරන ගොවි ජනතාවගේ කාරණයක් ගැන අවුරුදු 30කට පසුව කථා කරන්න යන මේ වෙලාවේ අපි හිතුවා විපක්ෂයෙන් මේ සම්බන්ධව සංශෝධන ඉදිරිපත් කරමින්, විවිධ සාකච්ඡා සිදු කරමින් හොඳ ගැඹුරු සංවාදයක් ඇති කරයි කියලා. හැබැයි, ඉතින් අදත් සුපුරුදු විධියටම කට පාඩම් කරගෙන ආපු වචන ටිකක් තමයි මෙතැනදී කිව්වේ. ඇත්තටම මම මේ අවස්ථාවේදී ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. මේ සභාවේ නීතිය දන්නා එකම කෙනා වාගේ, මේ ලංකාවේ නීතිය ගැන දන්නා ලොකුම කෙනා වාගේ උදේ ඉඳලා රෑ වෙනකම් මෙතැන කෙනෙක් පාරම් බානවා. එතුමා කරපු කථාව සම්පූර්ණයෙන්ම අද නිෂේධනය කෙරුණා, අපේ මන්ත්‍රීතුමියගේ කථාවෙන්. ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කරමින්, ඒවා අවතක්සේරු කරමින් කරපු කථාව සම්බන්ධ ඇත්ත තත්ත්වය අද ඇත්තටම ඒ මන්ත්‍රීතුමියගේ කථාව නිසා මේ සභාවට එළිදක්වන්න පුළුවන්කම ලැබුණා.

මම බලාගෙන හිටියා, විපක්ෂයේ එක මන්ත්‍රීවරයකුවත් අද සාකච්ඡා කරන මාතෘකාවට අදාළව කථා කළේ නැහැ. මීට මොහොතකට කලින් කථා කළ මන්ත්‍රීවරයා කිව්වා, දකුණු පළාතේ ආණ්ඩුකාරතුමා සමුපකාර ව්‍යාපාරයට මැදිහත් වෙනවා කියලා. මේකට උත්තර නොදී බැහැ. අද දින අපි සාකච්ඡා කරන මාතෘකාවෙන් වෙනස් වුණත්, ඒ ගැනත් කථා කරන්න ඕනෑ. මොකද, ආණ්ඩුකාරතුමාට මෙතැනට ඇවිල්ලා ඒ ගැන කථා කරන්න බැහැනේ. ඒ නිසා ඒ ගැන සඳහන් කරන්න ඕනෑ. ආණ්ඩුකාරතුමා මැදිහත් වෙන තැනට එම කටයුත්ත පත් කර තිබෙන්නේ ඇයි? දකුණු පළාතේ සමුපකාරය ගත්තාම, ඔය කථා කරපු පරණ ආණ්ඩුවල හිටපු මන්ත්‍රීවරුන් තමයි එහි සාමාජිකයන්ගේ සියලු වරප්‍රසාද උල්ලංඝනය කරමින්, මහ සභාවල අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ඒගොල්ලන්ගේ බිස්නස්කාර ඒජන්තයන්ට ඒවා ලබා දුන්නේ. ඕනෑ නම් අපි කියන්නම්, හබරාදූව සමුපකාර සමිතියේ කෝටි 48ක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරුන් ගසා කෑවේ කොහොමද කියලා. ඊට පසුව මාතර සමුපකාර සමිතිවල කටයුතු වෙන්නේ කොහොමද කියලාත් ඕනෑ නම් කියන්නම්. ගාල්ලේ හැම සමුපකාර සමිතියකම මේගොල්ලන්ගේ නියෝජිතයන් තමයි වැඩ කරන්නේ. මිනිස්සුන්ගේ; සාමාජිකයන්ගේ බලය උල්ලංඝනය කර තිබෙන්නේ. ඒ නිසා තමයි අද ඒ වගකීම ඉෂ්ට කරන්න ආණ්ඩුකාරවරයා ඇවිල්ලා තිබෙන්නේ. ඒ සාමාජිකයන්ගේ අයිතිය, පාරිභෝගිකයන්ගේ අයිතිය රකින්න අද එහෙම වැඩ කරනකොට රිදෙනවා තමයි. ඒගොල්ලන්ට රිදෙනවා තමයි බලය නැති වෙනකොට. ඒ නිසා ඒ ආණ්ඩුකාරතුමා දිගින් දිගටම එම ක්‍රියාවලිය අනිවාර්යයෙන්ම කරන්න ඕනෑය කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මෙතැනදී සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මට අද දින විවාද කරන මාතෘකාව ගැන කථා කරන්න වෙලාව නැති වෙනවා, මේවා ගැන කථා කරන්න ගියාම. නමුත් එකක් කියන්න ඕනෑ. ගාල්ලේ මන්ත්‍රීවරයා මෙතැනට ඇවිල්ලා කථා කළේ එල්ටීටීඊ එක සම්බන්ධව මතු වන කාරණා ගැනයි, කොටි ගැනයි. හැබැයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වේදිකාවේ නග්ගා ගෙන ඉඳලා තමන්ගේ රෙදි ගලවා ගෙන, ඊට පසුව මෙතැනට ඇවිල්ලා තවදුරටත් කොටි සංවිධානය ගැන කථා කරනවා. එතුමන්ලාගේ පක්ෂයට තවදුරටත් කොටි සංවිධානය ගැන කථා කරන්න අයිතියකුත් නැහැ, ජාතිවාදය ගැන කථා කරන්න දේකුත් නැහැ. *[බාධා කිරීම්]* ගාල්ලේ මන්ත්‍රීතුමාගේ නම කියන්න ලජ්ජයි. මට ලජ්ජයි කියන්න. *[බාධා කිරීම්]* ඒ තරම් ලජ්ජයි. බුදු සරණයි! බුදු සරණයි! කියමින් ගියාට කොටි සංවිධානයේ නායකයන් ළඟ තබා ගෙන කරපු වැඩේ ගැන ලජ්ජයි. *[බාධා කිරීම්]* රෙදි ගැලවෙන කථා කියන්නේ. *[බාධා කිරීම්]*

මම අද දින මාතෘකාවට යොමු වෙන්නම්. ඔබතුමන්ලා නිකම්- *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනිවර කියවීමේ විවාදයයි අද අපි පවත්වන්නේ. විශේෂයෙන්ම අපේ රටේ වගා කරන භෝග වර්ග 14ක් ගැන තමයි මේ තුළ අපි කථා කරන්නේ. විශේෂයෙන්ම ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරදමුංගු, ගොරකා වැනි බහු වාර්ෂික භෝග ගැනත්, වාර්ෂික භෝග හැටියට සලකන ඉඟුරු සහ කහ ගැනත්, පානීය භෝග හැටියට සලකන කෝපි, කොකෝවා, වැනිලා ගැනත්, උත්තේජන භෝග ලෙස සැලකෙන බුලත්, පුවක් ගැනත් සහ තෙල් සාදන භෝග හැටියට සලකන සිට්‍රොනෙල්ලා සහ ලෙමන්ග්‍රාස් කියන භෝග ගැනත් තමයි අපි කථා කරන්නේ. අද අපේ සාකච්ඡාවේ තිබෙන්නේ මේ කාරණායි. විශේෂයෙන්ම අපිට ඒ ගැන කථා කරන්න දේවල් තිබෙනවා. මොකද, අපි මේ සම්බන්ධව අලුත් වැඩ පිළිවෙළකට යනවා. අපේ ඒ වැඩ පිළිවෙළ තුළ මූලික සිද්ධාන්ත ටිකක් තිබෙනවා. ඒ තමයි ජනතාව ඒක රාශී කරන එක; නිෂ්පාදකයා ඒක රාශී කරන එක; මේ අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන ගොවියා ඒක රාශී කරන එක; ඒක සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ කරන එක; ඒකට නවීන තාක්ෂණය ගෙනෙන එක; අපනයන කිරීමට සූදානම් කරන එක. මෙන්න මේ වාගේ කරුණු ගණනාවක් එක්ක තමයි පොකුරු ගම්මාන 500ක් අපි ගොඩනඟන්නේ. අපි "අපනයන කෘෂි මහිම

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

පොකුරු ගම්මාන" 500ක් ගොඩනඟන්නේ නිකම්ම නොවෙයි, මෙන්න මේ අරමුණින්. එහිදී අපි බලාපොරොත්තු වනවා, මෙතෙක් කල් අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන වගාකරුවා අගය එකතු කිරීම හරහා දේශීය, විදේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් මෙහෙයුමක් විධියට ක්‍රියාත්මක කරවන්න. 2030 වර්ෂය වනකොට තමයි මේ ගම්මාන 500 ගොඩනඟා අවසන් වන්නේ. මේ ගම්මාන 500 තුළින් මුළු සමාජයම යම් දැනුවත්භාවයකට ගෙනෙනවා.

මේක, සියලු ආකල්ප ගොඩනඟමින් වගාව ගුණාත්මක කරමින් යන ගමනක්. එම නිසා අපි මෙම ගම්මාන හරහා බලාපොරොත්තු වනවා, මෙච්චර කාලයක් අමුද්‍රව්‍ය පමණක් නිෂ්පාදනය කරපු, උදාහරණයක් විධියට ගම්මිරිස් නම් ගම්මිරිස් පමණක් නිෂ්පාදනය කරපු -එවැනි භෝග හෝ අමුද්‍රව්‍ය පමණක් නිෂ්පාදනය කරපු- කෙනා අවසානයේ වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් අගය එකතු කළ නිෂ්පාදනය කරන තැනට ගෙන යන්න. ඒ තැන දක්වා මේ ගොවියා ගෙන යෑම තමයි අපේ මේ සූදානම.

අපි මේ රටට එන සංචාරකයෝ ආකර්ෂණය කර ගන්න ඕනෑ. අපි දන්නවා, මේ රටට එන සංචාරකයින්ගේ ප්‍රමාණය වේගයෙන් වර්ධනය වන බව. ඒ සංචාරකයෝ ආකර්ෂණය කර ගන්නත් මේ ගම්මාන සූදානම්. ඒ සඳහා අපි මුලින්ම කරන්නේ ඉතා ගුණාත්මක, හොඳ පැළයක් දෙන තැනට තවානක් හදන එකයි. ඒකීය ක්ෂේත්‍ර ඵලයකදී වැඩි ඵලදායීතාවක් ගන්න පුළුවන් වගාවක් ඇති කරන්න ඕනෑ. මේවා විද්‍යාත්මකවයි කරන්න වන්නේ. නමුත්, මෙච්චර කාලයක් මේවා කළේ අවිද්‍යාත්මකවයි. එක් එක් මන්ත්‍රීවරයා ඇවිල්ලා පැළය, පැළය බෙදාගෙන ගියා, ඊළඟට කුකුළු පැටියෙක් බෙදාගෙන ගියා. ඔය විධියට තිබුණු ඉතිහාසයක් තමයි අපේ රටේ තිබෙන්නේ.

එහෙම නොවෙයි, අපේ වගාව විද්‍යාත්මක වගාවක් දක්වා ගෙන යන්න අපි ඒ ගම් ඇතුළේ සැලසුම් සකස් කරලා තිබෙනවා. ඊට පස්සේ ඒකෙන් ලැබෙන අස්වැන්න සඳහා පසු අස්වනු තාක්ෂණය ඉතාම හොඳින් යොදාගෙන, ඒ වාගේම හොඳම උපකරණ යොදාගෙන, වගා කරන්නේ ගම්මිරිස් නම් ගම්මිරිස් ඇට ගලවන මැෂින් දීලා, ඒවා වියළන යන්ත්‍ර දීලා, විද්‍යාත්මක ආකාරයට සහ දැනුවත්භාවයකින් එම කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා.

ඊට පස්සේ ඒවාට අගය එකතු කරන ක්‍රියාවලිය කළ යුතුයි. අගය එකතු කරනවා කියන්නේ ඉතාම සියුම් වැඩක්. මොකද, ඒ මඟින් ලෝකයේ හොඳම කුළු බඩු වන අපේ කුළු බඩුවල තිබෙන ගුණාත්මකභාවය විනාශ නොවී, ඒ නමට හානියක් නොවී, ඒවා පාරිභෝගිකයින් දක්වා දිගටම අරගෙන යන හොඳ භාණ්ඩයක් බවට පත් කරන්න නම්, අනිවාර්යයෙන්ම අගය එකතු කිරීමේ ක්‍රියාවලිය විද්‍යාත්මකව කරන්න ඕනෑ. ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය - IDB එක, අපනයන සංවර්ධන මණ්ඩලය, විදාතා සම්පත් මධ්‍යස්ථාන වාගේ ආයතන බද්ධ කරලා හොඳම සහ විද්‍යාත්මක ආකාරයට අගය එකතු කිරීමේ ක්‍රියාවලිය කරන්න ඕනෑ.ඊට පස්සේ තිබෙන්නේ වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් ගමනක්. හොඳම ඇසුරුමක් - හොඳම packing එකක් - දාලා මේක හොඳම ආකාරයට රකින විධියට තත්ත්ව සහතික සහිත හොඳම නිෂ්පාදකයින් ටිකක් හදලා නිෂ්පාදන වෙළෙඳ පොළට නිකුත් කරන එක තමයි මෙහි අරමුණ වන්නේ.

අපි දන්නවා, මේක ගමේ අයට තනිවම කරගන්න බැහැ, ගමේ අයට මේ සාමූහිකත්වය හදාගන්න බැහැ කියලා. ඒ නිසා තමයි රජයක් විධියට අපි මේ සඳහා නොයෙක් ක්‍රියාමාර්ග ගෙන යන්නේ. මේ වනකොට හෙක්ටෙයාර 89,632ක් වන, මෙට්‍රික් ටොන් 130,142ක් අපනයන කරන මේ ක්ෂේත්‍රය තව දෙතුන් ගුණයකින් ගුණාත්මක වර්ධනයක් කරලා අපේ රට ලෝකය ඉස්සරහ කුළු බඩු සම්බන්ධයෙන් මෙතෙක් කල් දිනාගෙන තිබුණු කීර්තිය තවදුරටත් වර්ධනය කරමින් ලෝකයේ ඉහළම රටක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වනවා. අපට ඒ හැකියාව ලැබෙයි කියලා විශ්වාසය තබමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු නීතිඥ සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[2.55 p.m.]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, today I rise in this august House with great pleasure and pride to extend my warmest congratulations and best wishes to the Kingdom of Saudi Arabia and its people on the occasion of the 96th Saudi National Day. On behalf of the people of Sri

Lanka, I convey our sincere greetings to His Majesty King Salman bin Abdulaziz Al Saud, the Custodian of the Two Holy Mosques and to His Royal Highness Prince Mohammed bin Salman bin Abdulaziz Al Saud, Crown Prince and Prime Minister of the Kingdom of Saudi Arabia.

Sri Lanka and Saudi Arabia share a long and valued relationship built on friendship, mutual respect, cooperation and strong people-to-people ties. Saudi Arabia has been a true development partner of Sri Lanka. Through the Saudi Fund for Development, the Kingdom has supported our country in many important areas, including roads, bridges, healthcare facilities, education, water supply and higher education. From major infrastructure projects to support hospitals, universities and medical education, contribution of Saudi Arabia can be seen in many parts of our country.

Madam, I want to emphasize one important point today. That is, these projects are more than concrete, steel and infrastructure; they are symbols of friendship. A road connects our communities; a bridge connects our people; a hospital gives hope to our citizens and a university gives opportunity to our younger generation. Therefore, every road, every bridge, every hospital and every educational institution supported through the friendship of Saudi Arabia represents something much greater. It represents the strong bond between the people of Saudi Arabia and the people of Sri Lanka.

Madam, at a time when Sri Lanka is working to strengthen her economy and create new opportunities for our people, we highly value the continued friendship and cooperation of the Kingdom of Saudi Arabia. I believe there is tremendous potential to further strengthen our partnership in education, healthcare, investment, tourism, renewable energy, technology, agriculture and human resource development. We sincerely appreciate the generosity, friendship and development partnership extended by the Government and the people of Saudi Arabia over many decades.

On this important occasion, I wish the Kingdom of Saudi Arabia continued peace, stability, prosperity and success. May Allah Almighty bless His Majesty King Salman bin Abdulaziz Al Saud, the Custodian of the Two Holy Mosques and His Royal Highness Crown Prince Mohammed bin Salman bin Abdulaziz Al Saud and the people of the Kingdom of Saudi Arabia! May the friendship between Sri Lanka and Saudi Arabia continue to grow stronger and may it benefit the generations to come!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த சில நாட்களாக நமது நாட்டில் மிக முக்கிய பேசுபொருளாக இருக்கின்ற விடயம்தான், சவூதி அரேபியாவில் மரண தண்டனை விதிக்கப்பட்டு இருக்கின்ற அனோஜன் அவர்களுடைய விடுதலை தொடர்பான விடயம். ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸினராகிய நாங்கள் இந்த விடயம் தொடர்பில் 2-3 தடவை கலந்துரையாடி இருக்கின்றோம். இந்தப் பிரச்சினையை எவ்வாறு கையாள வேண்டும், இது தொடர்பில் உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்பதில் நாங்கள் மிகவும் கவனம் செலுத்தி வருகின்றோம். அவர் மன்னிக்கப்பட்டு, எவ்விதப் பிரச்சினைகளும் இல்லாமல் நாட்டுக்கு வந்து, மீண்டும் தனது குடும்பத்தோடு சேர வேண்டுமென நாங்கள் பிரார்த்திக்கின்றோம். அவரை விடுவிப்பதற்குத் தேவையான முழு ஒத்துழைப்பையும் ஒத்தாசையையும் நாங்கள் அரசாங்கத்துக்கு வழங்க இருக்கின்றோம். குறிப்பாக, மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் இது தொடர்பில் விசேட கூட்டங்கள் நடத்தப்பட்டு, அவரது விடுதலைக்காக அரசாங்கம் தீவிர முயற்சியில் ஈடுபட்டு வருகின்றது. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும், வெளிநாட்டலுவல்கள் அமைச்சர் அவர்களுக்கும், சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர் கௌரவ முனீர் முலாபர் அவர்களுக்கும், கௌரவ பிரதிச் சபாநாயகர் ரிஸ்வி சாலி அவர்களுக்கும் எங்களுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம்.

அரசாங்கம் எடுக்கின்ற முயற்சி வெற்றியளிக்க வேண்டுமாக இருந்தால், அதற்காகச் சில நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். கௌரவ பிரதிச் சபாநாயகர் தலைமையில் தூதுக் குழுவொன்று சவூதி அரேபியாவுக்குச் சென்று, இது தொடர்பான நடவடிக்கைகளை எடுக்க விருப்பதாக நான் செய்திகளில் பார்த்தேன். இது தொடர்பில் இங்கு எனக்கு முன்னர் பேசிய பலரும் குறிப்பிட்டார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்கள் மிகவும் நேர்மையான, உயர்வான ஒரு மனிதர். எனினும், வெளிநாட்டலுவல்கள் அமைச்சர் தலைமையில் உயர் மட்டக் குழுவொன்று சென்று, சவூதி அரேபியாவின் வெளிநாட்டலுவல்கள் அமைச்சரை உடனடியாகச் சந்திப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

அனோஜனுக்கு மன்னிப்பு வழங்க வேண்டுமென எங்களுடைய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் கோரிக்கை விடுத்து கையொப்பமிட்ட கடிதத்தை, எமது நாட்டின் வெளிநாட்டலுவல்கள் அமைச்சர் சவூதி அரேபியாவுக்குச் சென்று, அந்நாட்டின் வெளிநாட்டலுவல்கள் அமைச்சரிடத்தில் ஒப்படைக்கின்றபொழுதுதான், அது உரிய முறைப்படி உரிய நேரத்தில் மன்னரைச் சென்றடையும். சவூதி அரேபிய நாட்டின் மன்னர் மன்னிப்பு வழங்கினால் மட்டும்தான் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியும். வேறு சட்டரீதியான நடவடிக்கைகளை எடுக்கலாம். ஆனாலும், அனோஜனை விடுதலை செய்வதற்கான மிகச் சிறந்த வழி மேற்சொன்ன வழியாகும். எனவே, அரசாங்கம் உடனடியாக இதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அந்நாட்டு வெளிநாட்டலுவல்கள் அமைச்சரையும் இந்த விடயத்தோடு தொடர்புடைய ஏனைய உயர்மட்டத் தலைவர்களையும் சந்தித்துக் கலந்துரையாடுகின்றபோது, இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியும். இதற்குத் தேவையான முழு ஒத்துழைப்பையும் ஒத்தாசைகளையும் வழங்குவதற்கு நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம். அனோஜன் விடுதலை பெறுவதற்கான நடவடிக்கைகளை நீங்கள் துரிதப்படுத்த வேண்டும். தாமதமாகின்ற ஒவ்வொரு நாளும் ஒவ்வொரு நிமிடமும் அவருடைய உயிருக்கு ஆபத்தாக அமையும். எனவே, இந்த விடயம் தொடர்பில் அரசாங்கம் அதிக கவனமெடுத்து, உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(*மாண்புமிகு உபுல் கித்சிறி*)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් අද දින ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි අද දවසේ විවාද කරනු ලබන්නේ.

අපනයන කෘෂි කර්මාන්තය ගත්තාම, විශේෂයෙන්ම අපේ රටේ ජෛව විවිධත්වයත් එක්ක බැඳුණු ඒ භෝග රටාවන් අපිට තිබෙන සම්පතක් බව අපි දන්නවා. විශේෂයෙන් මා ජීවත් වන රත්නපුර දිස්ත්‍රික්කය සුළු අපනයන භෝගවලින් වැඩිම ප්‍රමාණයක් - හැම භෝගයක්ම වාගේ - වැවෙන දිස්ත්‍රික්කයක්. විශේෂයෙන්ම ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, සාදික්කා වාගේ දේවල් රත්නපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත වෙලා තිබෙන බව අපිට විශේෂයෙන්ම සඳහන් කරන්න පුළුවන්. අපි දන්නවා, ගම්මිරිස්වලට ඉතිහාසයේ ලැබුණු ඉහළම මිල මේ අවුරුද්දේ මේ වනකොට ලැබිලා තිබෙන බව. වියළි ගම්මිරිස් කිලෝවකට රුපියල් 2,080ක වාගේ මිලක් අපිට ලැබිලා තිබෙනවා. අමු ගම්මිරිස් කිලෝවකට රුපියල් 780ක වාගේ මිලක් පසුගිය දවස්වල ලැබුණා. ඒ වාගේම කුරුඳු ගත්තොත්, එහි විවිධ වර්ගීකරණයන් යටතේ කිලෝවකට රුපියල් 3,500 ඉඳලා රුපියල් 7,500 දක්වා වූ විශාල මිලක් අපිට ලැබෙනවා. විශේෂයෙන්ම පැඟිරි වගාව ගත්තොත්, පැඟිරි තෙල්වලට ඉතාම අඩු මිලක් තමයි පසුගිය කාලයේ තිබුණේ. මේ වනකොට පැඟිරි තෙල් ලීටරයක තොග මිලත් රුපියල් 10,000-12,000 දක්වා ඉහළ අගයකට ගොස් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම සුළු අපනයන භෝග සම්බන්ධයෙන් අපිට මේ වනවිට සතුටු වෙන්න පුළුවන්.

2018, 2019 වාගේ අවුරුදුවල රුපියල් 1,300ට, රුපියල් 1,500ට වාගේ තිබුණු ගම්මිරිස් කිලෝවක මිල රුපියල් 400, රුපියල් 500 දක්වා ඉතා පහළ අගයකට අඩු වුණා කියන එකත් විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ. ඒකට විශේෂම හේතුව තමයි, ගම්මිරිස් ප්‍රතිඅපනයනය කිරීම. ඒ කාලය තුළ එදා තිබුණු ආණ්ඩුවට හිතවත් වෙළෙඳ මාෆියා විසින් අපේ රටට ගම්මිරිස් ගෙනැල්ලා, ලෝකයේ තිබෙන ඉහළම ගම්මිරිස් වුණු අපේ ගම්මිරිස්වලට ඒවා කලවම් කරලා විකුණපු නිසා අපේ රටේ ගම්මිරිස්වලට ඉතාම පහළ අගයක් ලැබුණු බව අපි දන්නවා. මේ වෙලාවේදී අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත වෙනස් කිරීම මඟින් මේ තිබෙන තත්ත්වයන් මඟ හරවා මේ භෝග සඳහා ස්ථාවර මිලක් අපිට ලබා ගන්න පුළුවන් වනවා.

සුළු අපනයන භෝග ගත්තොත්, කෙටිකාලීන භෝග හැටියට නොවෙයි, දීර්ඝ කාලීන භෝග හැටියට තමයි ගොඩක් ඒවා තිබෙන්නේ කියන එක අපි දන්නවා. ඒ නිසා අපිට මේකේ වාසියක් තිබෙනවා. දේශගුණික සහ කාලගුණික තත්ත්වයන් එක්ක මේ භෝග දීර්ඝ කාලයක් පැවතීම නිසාම අපිට නිසි ඵලදාවක් නිසියාකාරව ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම, සුළු අපනයන භෝග තිබෙන්නේ කුඩා කොටසක් වුණාට අපිට ඒවායෙන් ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීමත් අපට මේකේ තිබෙන ප්‍රධාන වාසියක්. ඒ වාගේම, මේ සුළු අපනයන භෝග සමහර විට ආදායම් උත්පාදන පවුල්වල අතිරේක ආදායමක් හැටියටත්, විශේෂයෙන්ම පවුලකට ආදායම ලබා ගැනීමේදී එය විශේෂ කාරණාවක් හැටියටත් සඳහන් කරන්න පුළුවන්. ආණ්ඩුව හැටියටත්, කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියටත් විශේෂයෙන්ම සුළු අපනයන භෝග සම්බන්ධයෙන් අපිට ඉදිරියේදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් කටයුතු කරන්න වෙනවා.

මෙහිදී අපනයන ආදායම් ඉහළ නැංවීම තමයි අපේ ප්‍රධාන අරමුණ වන්නේ. සුළු අපනයන භෝගවලින් ලැබෙන ආදායම ඩොලර් මිලියන 480කට හෝ ඊට වැඩි අගයක් දක්වා ගෙනයන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. මේ කර්මාන්තය ගුණාත්මකභාවයෙන් ඉහළ නැංවීම සඳහා විවිධ දේවල් අපට කරන්න සිද්ධ වෙනවා. අපේ භෝග වගා වපසරිය සහ ඒවායේ ඵලදායීතාව වර්ධනය කිරීමේදී විශේෂයෙන්ම නව වගාවන් ආරම්භ කිරීම සහ පැරණි වගාවන් යාවත්කාලීන කිරීමත් අපිට පැවරී තිබෙන විශේෂ කාර්යයක්.

විශේෂයෙන්ම අපේ කථිකයන් බොහෝදෙනෙකු කථා කළා, කුළු බඩු අපනයන ගම්මාන ඇති කිරීම සම්බන්ධයෙන්. එයත් අපේ ප්‍රධාන ඉලක්කයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, අගය එකතු කළ දාමය මත නිෂ්පාදනය වැඩි කරලා, ඒ තුළින් ආදායම උත්පාදනය කිරීමත් අපේ ප්‍රධාන කාර්යයක්. විශේෂයෙන් ජාත්‍යන්තර වශයෙන් ගත්තාම අපට අවධානය යොමු කරන්න තිබෙන ප්‍රධාන දේ තමයි, ගුණාත්මකභාවය සහ ජාත්‍යන්තර ප්‍රමිතිය. අපේ ආණ්ඩුවේ ප්‍රධානම ඉලක්කයක් සහ අවධානය යොමු වෙච්ච එක අංශයක් තමයි ගුණාත්මකභාවය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් කියන්නේ. ඒ හරහා අපට පුළුවන් නිෂ්පාදනවලට වැඩි අගයක්, වැඩි මිලක් ලබා ගන්න. ඒ වාගේම, සුළු අපනයන භෝගවලින් ලැබෙන ආදායම ඉහළ නැංවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ වනවිට ආණ්ඩුව විධියට එවැනි කාරණා බොහොමයක් ගැන අපි අවධානය යොමු කරලා තිබෙනවා.

අද උදෑසන විපක්ෂ නායකතුමා කථා කරද්දී වී මිල පිළිබඳව කිව්වා. රුපියල් 150ක මිලක් ඉල්ලපු අපි අද ගොවියාට රුපියල් 150ක සාධාරණ මිලක් ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ කියලා කිව්වා. එතුමාට අමතක වෙලා තිබෙනවා, 2021 අවුරුද්දේ ලංකාවේ පොහොර ඇටයක් හොයා ගන්න නැතිවයි තිබුණේ කියලා. එදා රුපියල් 1,300, 1,800 ගණන්වලට තිබුණු යූරියා කොට්ටය රුපියල් 40,000ට, 50,000ටවත් හොයා ගන්න බැරි වුණා. රුපියල් 1,500, 1,200 වාගේ මිලකට තිබුණු MOP, TSP පොහොර රුපියල් 30,000ට, 40,000ට, 50,000ටවත් හොයා ගන්න තිබුණේ නැහැ. ඒ වාගේම තමයි කෘෂි ක්ෂේත්‍රයේ කටයුතු කරන්න තෙල් ටිකක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිෂ්පාදනය ඉතා පහළ අගයකට ගිහිල්ලා තිබුණේ. ඒක තමයි විපක්ෂ නායකතුමාට කියන්න ඕනෑ කාරණාව. එදා අපි ගොවියා වෙනුවෙන් අරගළ කළේ ඒ ආකාරයට කෘෂි කර්මාන්තය බිඳ වැටුණු යුගයක් ඇතුළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගොවීන්ට තවත් ගැටලු තිබෙනවා නම්, ඉදිරියේදී ඒවාත් නිරාකරණය කරලා ඔවුන්ට අවශ්‍ය කරන ඒ සහාය ලබා දෙන්න අපි ආණ්ඩුවක් හැටියට කටයුතු කරනවා.

විපක්ෂයේ ඉන්න මාදුගොඩ මන්ත්‍රීතුමා, "ආපහු කොටි නැඟිටිනවා, කොටි එනවා" වාගේ දේවල් ටිකක් තමයි දැන් මෙතැන ප්‍රකාශ කළේ. ඒක එතුමන්ලාගේ පුරුද්ද. ඕක තමයි හැම දාම කිව්වේ. එතුමන්ලා පසුගිය 12වැනි දා අනුරාධපුරයේ රැස්වීමක් පැවැත්වූවා. විවිධ මාධ්‍යවල විවිධ විධියට ඒ පිළිබඳව පළ වෙනවා අපි දැක්කා. මම දැකපු හොඳම කොටස ගියේ, අන්තර්ජාලය හරහා සමාජ මාධ්‍යවල, FBවල. එහිදී සමාජ මාධ්‍ය ක්‍රියාකාරින් විසින් මා හිතන විධියට හොඳ කවියක් තුළින් ඒක අර්ථකථනය කළා, "එළාර - දුටුගැමුණු යුද්ධය තේමා වූ නාට්‍යයක් හැදුවාලු, ඉස්සර කාලේ" කියලා. ඒ රැස්වීම ගත්තොත්, ආතල් ගොඩායි. එක එක ජාතියේ ඒවා තිබුණා. එළාරත් හිටියා. දුටුගැමුණුත් හිටියා. "මම කොටියා" කියනවා. සිංහයාත් ඉන්නවා කියනවා. එහෙම වටපිටාවක් තමයි එදා නිර්මාණය වෙලා තිබුණේ. ඩයස්පෝරාව ගැන කථා කළා. ඩයස්පෝරාව මේ ආණ්ඩුවට සල්ලි දුන්නාලු. දැන් දෙන්නේ නැහැලු. මේ ආණ්ඩුව

කියන දේ කරන්නේ නැහැලු. එහෙම තමයි. අපි ඒකට සන්තෝෂයි. එතුමන්ලාම කියනවා නම්, ඒ විධියයි කියලා, එහෙම තමයි. ඒ සල්ලි ටික එතුමන්ලාට දෙන්නලු. එතුමන්ලා වරින් වර මේ වාගේ කාරණා තමයි මතු කරන්නේ.

හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කිව්වා, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් දුන් තීන්දුව ගැන එතුමාට සෑහීමකට පත් වෙන්න බැහැ කියලා. කතෝලික සභාව ඒකට සෑහීමකට පත් වෙලා නැහැලු.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
එතුමාට අමතක වෙලා, එතුමන්ලාගේ පාලන කාලයේ තමයි ඒ ප්‍රහාරය සිදු වුණේ කියලා. එතුමන්ලාගේ ජනාධිපතිවරයා අවුරුදු 2ක් හිටියා. ඒ කාලයේ අහන්න බැරි වුණු නඩු ටික තමයි දැන් අහන්නේ. ඒ නිසා ඒවාට අදාළ කරන සාධාරණ විසඳුම් අපි අනිවාර්යයෙන්ම ලබා දෙනවා කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපනයන කෘෂිකර්මය පිළිබඳවත්, ඇති වෙලා තිබෙන තෙල් අර්බුදයට සහන ලබා දීම පිළිබඳවත් සාකච්ඡා වෙන වේලාවේ මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් රටේ නිෂ්පාදනය සම්බන්ධව ගත්තාම, අපනයන කෘෂිකර්මය පිළිබඳව විශාල අවබෝධයක්, නැඹුරුවක් අපි ඇති කරගත යුතුයි කියා මා හිතනවා. මම දැන් මේ සභාවට එනකොට අහගෙන ආවා, නෙදර්ලන්තයේ තිබෙන තත්ත්වය සහ ලංකාවේ තත්ත්වය පිළිබඳව අපේ මන්ත්‍රීවරයෙකු කථා කරනවා. අපි study කරලා බැලුවොත් තේරෙනවා, නෙදර්ලන්තය සිටින ස්ථානය සහ ඔවුන්ගෙන් යුරෝපීය රටවලට යන නිෂ්පාදන කොහොමද සම්බන්ධ වෙන්නේ, ලංකාව කොහේද ඉන්නේ කියලා. ඒ වාගේම ලංකාවට අල්ලපු රට වන ඉන්දියාව සහ අනෙකුත් රටවල් එක්ක බැලුවාම අපට කොහාටද අපනයනය කරන්න පුළුවන් කියන කාරණය ගත්තොත් ඒක හොඳින් අවබෝධ කරගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. කෘෂිකර්ම ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම ඒ ගැන වැඩිය කථා බහ කරන්න යන්නේ නැහැ.

ඊට අමතරව මම ඔබතුමාට මෙන්න මේ කාරණය මතක් කරන්න කැමතියි. විශේෂයෙන්ම වැව් ප්‍රතිසංස්කරණය සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, මේ දෙසැම්බර් මාසය වෙනකොට අපේ රටේ වැව් 450ක් ප්‍රතිසංස්කරණය කරනවා කියලා. දැන් නම් වැස්සත් එක්ක අපේ ප්‍රදේශවල වැව් ප්‍රතිසංස්කරණය කරන්න අමාරුයි. විශේෂයෙන් මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වැව්වල දැන් තිබෙන තත්ත්වය බලන්න. වැව්වල තිබෙන පාසි ඉවත් කරන්න විතරයි දැන් මේ මුදල් පාවිච්චි කරන්නේ. මම ගිහිල්ලා බැලුවා, වැව් කිහිපයක්. සමහර වැව් වෙනුවෙන් රුපියල් ලක්ෂ 18ක් වෙන් කර තිබෙනවා. ඔබතුමාත් දන්නවා, අපි TO කෙනෙක් එක්ක ගිහිල්ලා යම්කිසි විධියකට ඒ වැවේ යම් කොටසක්, අඩි භාගයක්, නැත්නම් අඩියක් හෝ මුළු වැවේම, නැත්නම් වැවේ පිරිලා තිබෙන කොටස තමයි අපි සාමාන්‍යයෙන් ඉස්සර සංවර්ධනය කළේ කියන එක. ගරු ඇමතිතුමනි, දැන් කරන්නේ වෙන එකක් නොවෙයි, කෙළින්ම පාසි සූරන ක්‍රියාදාමය යන්නේ. ඇත්තටම මේකෙන් සිද්ධ වන සහනයක් නැහැ. මොකද හේතුව, අනෙක් කටයුතු කරන්න ඉඩ දීලා නැහැ. අපි දන්නවා වැව පතුළේ තිබෙන්නේ කිරිමැටි බව. එයට උඩින් තිබෙන කොටස යම්කිසි විධියකට අපි ක්‍රමානුකූලව ඉවත් කරපුවාම ඒ ටිකේ වතුර රැඳෙනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
රොන්මඩ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, රොන්මඩ ටික තමයි ඉවත් කරන්නේ. නමුත්, රොන්මඩවලටත් යටින් තිබෙන්නේ සම්පූර්ණයෙන්ම කිරිමැටි. ඒ කිරිමැටි නිසා තමයි වතුර ටික රැඳිලා තිබෙන්නේ වැව්වල. එම නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා. විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය ගැන සොයා බලන්න. මොකද, අපේ ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්න නිසා. මේ සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. කෘෂිකර්ම ඇමතිතුමා විධියට මේ ගැන විශේෂයෙන්ම සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඊට අමතරව මා තවත් කාරණාවක් මතු කරන්න කැමැතියි. මෙය ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සංගමයේ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන කාරණයක්. ඉතිහාසයේත් මේ රණ්ඩුව ගියා. පද රචකයන්, සංගීත තනු නිර්මාපකයන්, ගීත ගායනා කරන අය - මමත් ගීත ගායනා කරන කෙනෙක් - හැටියට ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සංගමය මීට කලිනුත් විජයදාස රාජපක්ෂ මැතිතුමා ඇමතිවරයා වශයෙන් ඉන්නකොට, නලින් ප්‍රනාන්දු ඇමතිතුමා ඉන්න කොට ඒ කාලයේත් ගිහිල්ලා මේ සම්බන්ධයෙන් කථා කෙරුවා. ඒ වෙන මොකක්වත් නොවෙයි, මේ අයට යම් ගෙවීමක් කරන්න කියලා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. නමුත්, දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මේ කාරණය වෙළෙඳ අමාත්‍යාංශයට ආවාට පස්සේ ඒකට දැන් අනුමැතිය දීලා තිබෙනවා. දැන් වෙලා තිබෙන දේ තමයි, මේ ඇවිල්ලා තිබෙන ගාස්තු ව්‍යුහය අනුව සාමාන්‍ය උත්සවයක පුද්ගලයන් 100ට අඩු අවස්ථාවකදී සංගීතය සපයනවා නම් බලපත්‍ර ගාස්තු හැටියට රුපියල් 20,000ක් ගෙවන්න ඕනෑ. මේ මුදල සාමාන්‍යයෙන් උත්සවශාලා ඇතුළේ තිබෙන සංගීත සැපයීම් සඳහා පමණයි. පුද්ගලයන් 100ත්, 300ත් අතර ප්‍රමාණයකට සංගීතය සපයනවා නම් බලපත්‍ර ගාස්තු හැටියට රුපියල් 30,000ක් ගෙවන්න ඕනෑ. පුද්ගලයන් 300ට වැඩි උත්සවවලදී සංගීතය සපයනවා නම් රුපියල් 40,000ක බලපත්‍ර ගාස්තුවක් ගෙවන්න ඕනෑ. සජීවී සංගීත උත්සවවලට වෙනම අය කරනවා. පුද්ගලයන් 100ට අඩු උත්සව සඳහා සංගීතය සපයනවා නම් බලපත්‍ර ගාස්තුව රුපියල් 25,000යි.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා ]

පුද්ගලයන් 100ත්, 300ත් අතර නම් බලපත්‍ර ගාස්තුව රුපියල් 35,000යි. පුද්ගලයින් 300ට වැඩි නම් බලපත්‍ර ගාස්තුව රුපියල් 50,000යි. පෞද්ගලිකව සිදු කරන හෝ ආයතන පවත්වන DJ උත්සව සඳහා රුපියල් 25,000 සිට රුපියල් 50,000 දක්වා බලපත්‍ර ගාස්තුවක් අය කරනවා. පෞද්ගලික ආයතනවල උත්සවවලටත් එහෙමයි. මේකෙදි පුද්ගලයන් 300ට වැඩි නම් රුපියල් 125,000ක බලපත්‍ර ගාස්තුවක් ගෙවන්න ඕනෑ.

මේක බුද්ධිමය දේපළ සම්බන්ධ කාරණයක්. නමුත්, මේකෙන් සිද්ධ වෙන එක දෙයක් මම කියන්නම්. ඉදිරියේදී උත්සවශාලා ඇතුළේ අපට සිංහල සින්දු අහන්න හම්බ වෙන්නේත් නැහැ. තව ටිකක් කල් යනකොට හින්දි සින්දු අහන්න හම්බ වෙන්නේත් නැහැ; දෙමළ සින්දු අහන්න හම්බ වෙන්නේත් නැහැ. තමුන්නාන්සේලා මේ පටන් ගත්ත වැඩේ හින්දා දැන් අපට වෙන මොකක් හරි එකක් තමයි අහන්න වෙන්නේ. දැන් මේ නිර්මාණකරුවන්ගේ සංගමය මොකක්ද කරන්නේ? මේකට සාමාජික වෙලා ඉන්න අයගෙන් විතරයි ඒගොල්ලන් සල්ලි එකතු කරන්න ඕනෑ. දැන් මේගොල්ලන් එහෙම නැති උදවියගෙනුත් සල්ලි එකතු කරලා තිබෙනවා. ඒකෙන් අවසානයේදී සිද්ධ වෙන්නේ මොකක්ද? මීට කලින්, සුපිරි වෙළෙඳ සැල් විවෘත කරද්දී ඒ අවට පොඩි සංගීතයක් දැම්මා. දැන් ඒක කරන්න හම්බ වෙන්නේත් නැහැ. සිල්ලර වෙළෙඳ සැල්, බැංකු, මූල්‍ය ආයතන, ප්‍රදර්ශනාගාර, සාප්පු සංකීර්ණ, සිනමා ශාලා වැනි ස්ථානවලට වාර්ෂික බලපත්‍ර ගත යුතු තැනට දැන් තල්ලු වෙලා තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමතියි, කරුණාකරලා මේ සම්බන්ධව සොයා බලන්න කියලා. මම මේ රටේ කිසිම සංගමයකට බැඳිලාත් නැහැ. ඒ සංගම් වෙනුවෙන් මම කථා කරන්නේත් නැහැ. හැබැයි, තිබෙන සාමාන්‍ය තත්ත්වය අනුව මේ රටේ මිනිස්සුන්ට සිංහල සින්දුවක් අහන්නත් තිබෙන අයිතිවාසිකම නැති වන තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ.

ඊළඟට විශේෂයෙන්ම තව කාරණයක් කියන්න කැමතියි. අද වන විට ලංකාවේ අවුරුදු 15-24 අතර තරුණ තරුණියන්ගේ රැකියා විරහිතභාවය සියයට 43ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. මේකට අපේ රටේ ඉන්න රැකියා විරහිත උපාධිධාරිනුත් ඇතුළත් වෙනවා. තමුන්නාන්සේලා කිව්වා, 23,000කට රැකීරක්ෂා දෙනවා කියලා. හැබැයි, ඒ සඳහා examination එක තියලා දැන් මාස ගණනක් වෙනවා. අද වනතුරු ඒ සම්බන්ධයෙන් මුකුත් වෙලා නැහැ. ඒකෙන් ගන්නා 16,000කට වැඩි ප්‍රමාණයක් ගන්නේ සංවර්ධන නිලධාරින් හැටියටයි. එතකොට degrees කරලා ගම්වල ඉන්න, තමුන්නාන්සේලාගේ රැස්වීම්වලට ගිය උපාධිධාරින්ට අත්වන ඉරණම මොකක්ද? ඒ අයත් අද විනාශ වෙලා තිබෙන්නේ. ඒ අයට යන එන මං නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. දැන් තිබෙන තත්ත්වය අනුව අපට තේරෙන දේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැන් පොළේ යන ගමන් රෝහලට යන්නත් බැහැ. ජනාධිපතිතුමා කියනවා, පොළේ යන ගමන් රෝහලට යන්න එපා කියලා. කාර් එකක පිටුපස ආසනයේ තුන්දෙනෙකුට යන්නත් බැහැ. ලයිසන් නැතිව සින්දු කියන්නත් බැහැ. පව නොකියා රට ගෙනියන්නත් බැහැ. ඒක තමයි දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි, මේ ක්‍රියාවලියත් එක්ක, මේ වැඩ පිළිවෙළත් එක්ක ඉදිරියට යන්න යන්න තමුන්නාන්සේලා මේ රටේ ජනතාවගේ වෛරයට පාත්‍ර වෙනවා මිස වෙනත් දෙයක් සිද්ධ වෙන්නේ නැහැයි කියන එක. ඒ කාරණයත් විශේෂයෙන්ම මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.18]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද දිනයේ විශේෂයෙන්ම අපනයන කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා ඒ ගැන මේ විවාදය පුරාවට සාකච්ඡා කරන මේ වෙලාවේ මම මුලින්ම අවධානය යොමු කරන්න කැමැතියි, මේ පනත සංශෝධනය කරන්න අවශ්‍ය ඇයි කියන කාරණය සම්බන්ධව. ඒ ගැන මුලින්ම කථා බහ කර ගත්තොත් හොඳයි කියා මම හිතනවා.

අපනයන කෘෂිකාර්මික භෝග නිෂ්පාදන අපනයනය කිරීමේදී මුහුණ දෙන ගැටලු කිහිපයක්ම තිබෙනවා. වගාකරුවන් සුළු හා මධ්‍ය පරිමාණ අයවලුන් වීමේ හා ඒ හේතුවෙන් ඒකාකාරී නිෂ්පාදනයක් ගුණාත්මකභාවයෙන් යුතුව සකස් කිරීමේ ගැටලුව ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අතරමැදියන් බහුල වීමේ හේතුවෙන් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පවත්වා ගෙන යන්න බැරි වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, නිෂ්පාදනය හැසිරවීමේ දුර්වලතා, ගබඩාකරණයේ දුර්වලතා, ගුණාත්මකභාවයේ ගැටලු නිසා වැඩි මිලක් ලබා ගත හැකි යුරෝපීය වෙළෙඳ පොළට පිවිසීමට ඇති බාධා මෙන්ම වෙළෙඳ පොළවල් අහිමි වීමේ අවදානමක් ද තිබෙනවා. එය සෘජුව විදේශ විනිමය සඳහා බලපාන ප්‍රධාන කාරණාවක් ලෙස හඳුනාගෙන තිබෙනවා.

මේ පනත සංශෝධනය මඟින් මේ ක්ෂේත්‍රයට ප්‍රධාන වශයෙන් සැලසෙන වාසි මොනවාද? එකක් තමයි, විවිධ ආදේශක ද්‍රව්‍ය එකතු කිරීම පාලනය කිරීම. අපේ රටේ කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමේදී බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා, ප්‍රතිඅපනයනය. අපේ රටට කොහෙන් හෝ රටකින් ගෙනැල්ලා අපනයනය කරන කොට අපේ රටේ නිෂ්පාදනවල quality එක බාල වෙනවා. ඒක, ප්‍රධාන ප්‍රශ්නයක් විධියට තිබෙනවා. ඊළඟ එක, නීත්‍යානුකූල නොවන රසායනික ද්‍රව්‍ය භාවිතය නියාමනය. පිරිපහදු කිරීම සහ මතුපිට පෙනුම ලබා ගැනීම සඳහා විවිධ රසායන ද්‍රව්‍ය භාවිත කරනවා. එය නියාමනය කරන්න ඕනෑකම තිබෙනවා. ඊළඟ එක, ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම නියාමනය කිරීම. රබර් වැනි වෙනත් ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය සමඟ එක්ව ගබඩා කිරීම හා ප්‍රවාහනය නියාමනය කිරීම කරන්න ඕනෑ. ඊළඟට, නියමිත ප්‍රමිතියෙන් තොරව අස්වනු නෙළීම නියාමනය කිරීම. ඒ වාගේම, රටේ ආහාර සුරක්ෂිතතාවට බලපෑමක් විය හැකි පරිදි අපනයන කෘෂි භෝග තොග රැස් කිරීම නියාමනය කිරීම. ඊළඟට, ලියාපදිංචි පාර්ශ්වකරුවන් මඟින් සමස්ත ක්ෂේත්‍රයම නියාමනය කිරීම. අප අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත තුළින් ප්‍රධාන කාරණා දෙකක් බලාපොරොත්තු වෙනවා. මෙමඟින් කෘෂි අපනයන ක්ෂේත්‍රය තුළ තිබෙන සමස්ත ක්ෂේත්‍රයම නියාමනය කරනවා. වසර ගණනාවක් තිස්සේ මේ අපනයන ක්ෂේත්‍රය පවත්වාගෙන යනකොට ප්‍රධාන

තනතුරුවල නාමයන් සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ ප්‍රධාන තනතුරුවල නාමයන් වෙනස් කර ගැනීමත් මේ පනත සංශෝධනය කිරීම තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

අපි කවුරුත් දන්නවා, අපේ රටේ භූගෝලීය පිහිටීම අනුව දිස්ත්‍රික්ක 25 තුළ විවිධ භෝග නිෂ්පාදනය කරන බව. අපේ රටේ වියළි කලාපයට යන කොට වී, බඩ ඉරිඟු වාගේ වියළි භූමියට ගැළපෙන විධියේ භෝග නිෂ්පාදනය කරනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක 17ක, දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කරලා තිබෙනවා, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා. ඒ වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විශාල මැදිහත්වීමක් සිදු කරමින් ඉන්නවා. මේ ක්ෂේත්‍රය වර්ධනය කිරීම වෙනුවෙන්, රටට වැඩියෙන් ඩොලර් උපයා ගැනීම වෙනුවෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හදලා තිබෙන සැලසුම මොකක්ද? මීට පෙර මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ ක්ෂේත්‍රයේ ගැටලු තිබෙනවා කියලා. ඔව්, ගැටලු තිබෙනවා. මෙය වසර ගණනාවක් තිස්සේ පවත්වා ගෙන ආපු විධිය අනුව, ක්‍රමය අනුව විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒ ගැටලු ක්‍රමානුකූලව නිරාකරණය කර ගනිමින්, ඒවාට විසඳුම් ලබා දෙමින් අවශ්‍ය මැදිහත්වීම සිදු කරමින් ඉන්නවා.

මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශය විශේෂයෙන්ම බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අපේ රටේ අපනයනයත් එක්ක ගැටගැහිලා තිබෙන භෝග 16ක් මේ හරහා කෙටුම්පත් කරලා ඒ භෝග 16 මඟින් තමන්ගේ ආර්ථිකය ගැට ගහගන්නේ කොහොමද කියලා වාගේම නිෂ්පාදනයට දායක වන ගොවීන්ට අලුත් තාක්ෂණ ලබා දීලා, අවශ්‍ය පහසුකම් ටික ලබා දීලා මේ කර්මාන්තය නඟාසිටුවන්නේ කොහොමද කියලාත් අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රධාන කාරණයක් විධියට අපනයන ගම්මාන නිර්මාණය කිරීම පිළිබඳවත් අපි අවධානය යොමු කර තිබෙනවා. මාතලේ, ගාල්ල, නුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලට යන කොට තනි තනි ගොවියා පර්චස් 10ක්, අක්කර කාලක්, අක්කර භාගයක්, අක්කරයක් වාගේ භූමි ප්‍රමාණයක් තුළ අවිධිමත් ලෙස වගා කටයුතු සිදු කරනවා. ඒ නිසා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන සැලැස්මක් හදලා තිබෙනවා, අපනයන ගම්මාන ලෙස හඳුනා ගන්න පුළුවන් ගම්මාන ටික හඳුනා ගෙන, ඒ ගම්මානවල වගා කරන සෑම ගොවියෙක්ම - අක්කර කාල වෙන්න පුළුවන්; අක්කර භාගය වෙන්න පුළුවන්; අක්කරය වෙන්න පුළුවන් - එක සමිතියක් ඇතුළට ගෙනැල්ලා නිෂ්පාදන ගම්මානයක් විධියට ඒ ගම්මානය දියුණු කරන්න. ඒ ගොවීන්ට තිබෙන ප්‍රශ්න, ගැටලු හඳුනා ගෙන, තාක්ෂණය ලබා දීලා, පහසුකම් ටික ලබා දීලා, වෙළෙඳ පොළ හඳුන්වා දීලා, ඔවුන් අපනයනය වෙනුවෙන් දිරි ගන්වන්නේ කොහොමද, ඒ ගොවියාට වැඩි ලාභයක් ලබා දෙන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ අපි මේ ක්ෂේත්‍රය තුළ සැලසුම් කර තිබෙනවා. වසර ගණනාවකට පස්සේ මේ අවුරුද්දේ වාර්තාගත ආදායමක් උපයන තැනකට අපේ මේ අපනයන කර්මාන්තය ළඟා වෙමින් තිබෙනවා කියා අපි දන්නවා. තේ, පොල්, රබර් ගත්තාම, ඒවා කර්මාන්තයක් විධියට දියුණු වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් ගත්තාම, කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධිත භෝග 16 ඉලක්ක කරගෙන විතරක් නොවෙයි, අපේ රටේ ගොවි ජනතාව එතැනින් එහාත් විශාල වශයෙන් අපනයනය කරන තවත් බොහෝ දේවල් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඔවුන් මාළුමිරිස් අපනයනය කරනවා; එහෙම නැත්නම් එළවලු වර්ග, පලතුරු වර්ග අපනයනය කරමින් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපේ රටේ ගොවි ජනතාව අපනයනය කරන ඒ එළවලු, පලතුරු වාගේම කෘෂි අපනයන භෝග ටික සැලසුම් සහගතව අපනයනය කරලා අපේ රටේ භාණ්ඩාගාරයට විදේශ විනිමය උපයා ගන්නවා වාගේම, රටේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න සැලසුම් සහගතව යන ගමන අපි ඉතාම විධිමත්ව හදලා තිබෙනවා කියන එක මේ මොහොතේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට, තවත් කාරණා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළොත් හොඳයි කියා මම හිතුවා. විශේෂයෙන්ම මීට පෙර විපක්ෂ නායකතුමා කථා කරන කොට කිව්වා, ගොවීන්ගේ ratings සම්බන්ධයෙන්. ගොවීන්ගේ ratings සම්බන්ධයෙන් පසුගිය කාලයේ යම් ප්‍රශ්න ප්‍රමාණයක් නිර්මාණය වුණු බව අපි දැක්කා. හැබැයි, අපේ ගරු ජනාධිපතිතුමාගේ සිට අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා සහ ගරු නියෝජ්‍ය ඇමතිවරුන් සියලුදෙනා මැදිහත් වෙලා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මැදිහත් වෙලා ගොවීන්ගේ ප්‍රධාන ප්‍රශ්න ටික හඳුනා ගෙන, ඒ ප්‍රශ්නවලට උත්තර සපයමින් තිබෙනවා කියන පණිවුඩයත් අපි මේ මොහොතේ ලබා දෙන්න ඕනෑ.

මේ ratings ගැන කියන කොට අපි දැක්කා, පසුගිය ඉතිහාසය තුළ ඒ අය පෙන්නපු ratings මොනවාද කියලා. ඒ අය ශ්‍රී ලංකාව ගැන හොරකම, වංචාව, දූෂණය ඉහ වහා ගිය ratings තබා තිබුණා, ලෝකයා ඉස්සරහා. ඒ ratings වෙනස් කරලා අපි අලුත් ratings තබා තිබෙනවා. ඒ මොකක්ද? අන්න, 2025 වර්ෂය අවසන් වන කොට අදූෂිත රටවල් 14ක් අබිබවා ලංකාව ඉස්සරහට ගෙනෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ ratings අපි තබා තිබෙනවා.

තවත් ප්‍රධාන කාරණයක් සම්බන්ධයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ වන කොට නැවත මතු කරමින් තිබෙනවා, ජාතිවාදී ගැටුම් නිර්මාණය කරන්න ඉඩ කඩ හදන තත්ත්වයක්. අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, නැවත අපේ රටේ ජාතිවාදී, ආගම්වාදී ගැටුම් නිර්මාණය වෙන්න ඉඩ තබන්නේ නැහැ කියලා. විපක්ෂයේ අය තම ආණ්ඩු කාලවල හැමදාමත් ඒවායෙන් ratings තබමින් තමයි කටයුතු කළේ.

2024 වසරේ මේ ජයග්‍රහණය ලබා ගන්න අප පොර බදන කොට මේ අය අප සම්බන්ධයෙන් මේ රටේ ජනතාව ඉදිරියේ විවිධ මඩ, අවලාද ගහපු හැටි අපි දැක්කා. "මේ රටේ සිටින ආගමක්, දහමක් නැති කට්ටිය" කියලා අපට කිව්වා. "පන්සලට දානය දෙන්න වෙන්නේ නැහැ" කියලා කිව්වා. "දළ දා පෙරහැර නවත්වනවා" කියලා කිව්වා. එහෙම ratings තබපු විපක්ෂයට අපි කියනවා, අපේ ආණ්ඩුව වසර දෙකක් සාර්ථකව ඇවිත් තිබෙන බව. අපේ ආණ්ඩුවට වසර දෙකයි, ගමන සුබයි කියන එක අපි පැහැදිලිව ඔවුන්ට ඔප්පු කර තිබෙනවා. ලෝක සාම දර්ශකයේ 100වැනි ස්ථානයේ හිටපු අපේ රට වසර දෙකක් යන කොට 67වන වන තැනට ගෙනැල්ලා තිබෙනවා. මෙන්න, ලංකාව දැන් ලෝකයා ඉස්සරහා ratings තබා තිබෙන ආකාරය. ඒ ආකාරයට ජාත්‍යන්තර වාර්තා ලැබෙන්න පටන්ගෙන තිබෙනවා.

ගෙවුණු අවුරුදු දෙක තුළ රටට සුබයි කියන පණිවුඩය තහවුරු කරන තවත් ජාත්‍යන්තර වාර්තා ඇවිල්ලා තිබෙනවා. ඒ මොනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට ලංකාව නම් කර තිබෙනවා. අන්න, තව rating එකක්. විපක්ෂ නායකතුමාගෙන් අපි අහනවා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලා තබපු ratings ගැන. ඉතිහාසයේ තබපු ratings ගැන ඕනෑ නම් මේ පාර්ලිමේන්තුවේ කරුණු දිග හරින්න පුළුවන්. ඔය විපක්ෂ නායකතුමාගේ පියාණන්ලා, ඔය එක එක කට්ටිය, මේ විපක්ෂයේ කට්ටිය පසුගිය කාලයේ තබපු ratings ගැන ඕනෑ තරම් කියන්න අපට පුළුවන්. අන්න, තව වාර්තා එනවා. අපේ ආණ්ඩුවට වසර දෙකක් ගත වන කොට රටට සුබයි කියන පණිවුඩය දැන් එන්න පටන් ගෙන තිබෙනවා. ලෝකයේ වරායවල් අතරින් කොළඹ වරාය 20වන තැනට පත් වෙමින් තිබෙනවා. මෙන්න, ලංකාව ගැන ඉස්සරහට එන ratings; ජාත්‍යන්තරයෙන් එන වාර්තා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ වසර දෙක තුළ ඉතාම සාර්ථක ගමනක් ඇවිත් තිබෙනවා. ඒ සාර්ථක ගමන හමුවේ විපක්ෂයට අද උත්තර නැති වෙලා තිබෙනවා. අද විපක්ෂයට මොකවත් කථා කරන්න බැරි වෙලා තිබෙනවා. අපි ඉතා විශ්වාසයෙන් යුතුව මේ වසර දෙක ආවා වාගේම, ඉදිරියේදීත් මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳමින්, අපේ රටේ අපනයන කෘෂි කර්මාන්තය ශක්තිමත් කරන්න කටයුතු කරනවා. හැම වෙලාවේම ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරනවා කියලා බොරු ඇද බාන විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැම කෙනාටම අපි මේ වෙලාවේ අභියෝග කරනවා, ගත වුණු වසර දෙක ඇතුළේ විධායක ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක් කරපු එක් සිද්ධියක් හෝ තිබෙනවා නම් කියන්න කියලා. හැබැයි, ජනතාවාදී ක්‍රියාමාර්ග ටික ස්ථාපිත කරලා තිබෙන බව අපි මේ මොහොතේ දැනුම් දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.28]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සඳහා සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ඒක කාලෝචිත දෙයක්. ගරු කෘෂිකර්ම ඇමතිතුමාත්, ගරු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. විශේෂයෙන්ම මෙතැනදී කථා කළේ, අපනයන භෝග සම්බන්ධයෙන්; තේ, රබර්, කුරුඳු, ගම්මිරිස් සම්බන්ධයෙන්; හැම පළාතකම වගා කරන වැවිලි භෝග සම්බන්ධයෙන්.

මම ගරු ඇමතිතුමන්ලා දෙපළගේම අවධානයට මේ කාරණය යොමු කරනවා. වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ, පොල් කර්මාන්තය පැත්තෙන්, විශේෂයෙන්ම අපනයනය පැත්තෙන් ඉහළින්ම තිබෙන ප්‍රදේශයක්. ඒ වාගේම පොල් කොහු කර්මාන්තය කියන්නේ, ඇත්තටම විදේශ විනිමය ගෙනෙන කර්මාන්තයක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය මීට වඩා මැදිහත් වෙලා කටයුතු කරන්න ඕනෑ. මොකද, ඒක රටට විදේශ විනිමය ගෙනෙන, ඩොලර් ගෙනෙන කර්මාන්තයක්. ඒ නිසා ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් මීට වඩා ගැඹුරින් මැදිහත් වෙන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

කෘෂිකාර්මික ප්‍රදේශයක් වන වයඹ පළාතේ කල්පිටිය අර්ධද්වීපය ගැනත් මම කියන්න ඕනෑ. අපි වයඹ පළාත් සභාවේ ඉන්න කොට කල්පිටිය අර්ධද්වීපය කෘෂි ගම්මානයක් කරමු කියලා යෝජනා කළා. හැබැයි, ඒ යෝජනාව එහෙමම නැවතුණා. ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ කාලයේ එම පළාත් සභාවේ හිටියා. දැන් එතුමා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා. ඒ ප්‍රදේශය, විශේෂයෙන්ම ගොවි ජනතාව ඉහළ මට්ටමෙන් ගොවිතැන් කරන ප්‍රදේශයක්. එළවලු, පලතුරු හැම වර්ගයම ඒ ප්‍රදේශයේ වවනවා; පිටරට යවනවා. ඒ තුළින් විදේශ විනිමය ගෙන එන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මම මීට කලිනුත් මේ ගැන කථා කරලා තිබෙනවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමා, ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි ඒ ප්‍රදේශය ගැන දන්නවා. අද ඒ ප්‍රදේශයේ ජනතාව ගොවිතැන් කරනවා. ගොවිතැන් කළාට, අද පොහොර මිටියක ගණන කීයද? කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ, ඒ ප්‍රදේශයේ ජනතාවට. ඔබතුමන්ලා වී ගොවීන්ට සහන දෙනවා; තේ ගොවීන්ට සහන දෙනවා. මම කියන්නේ බොරු නෙවෙයි කියලා ඔබතුමන්ලාත් දන්නවා. ඇත්තටම අපේ ගොවි ජනතාව මිරිස්, ලූනු, සියලු පලතුරු, සියලු එළවලු වවනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය මීට වඩා මැදිහත් වෙලා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම කල්පිටිය අර්ධද්වීපය ඒ ජනතාව වෙනුවෙන් කෘෂි ගම්මානයක් හැටියට දියුණු කරන්න. එතැන දේශපාලනයක් නැහැ. ඒ ඔක්කෝම ගොවියෝ තමයි. ඒ නිසා ඒ ගොවීන්ට සම්බන්ධයෙන් මීට වඩා මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම CEB එකේ විදුලි පාරිභෝගිකයන් සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමන්ලා කිව්වේ, විදුලි බිල අඩු කරනවා කියලා. විදුලි බිල අඩු කරනවාට වැඩි කරනවාට වඩා කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ ගොවි ජනතාව වැඩි වශයෙන් පාවිච්චි කරන්නේ, විදුලි මෝටර්. ඒ අය විදුලි මෝටරය වැඩිපුර පාවිච්චි කරනවා. අනෙක් එක තමයි, තෙල්. ඒවාට ඒ අයට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ සම්බන්ධවත් මැදිහත් වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මම පුත්තලම ආසනයේ, පුත්තලම ප්‍රදේශය නියෝජනය කරන කෙනෙක්. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, Puttalam Hospital එක ගැන. ඇත්තටම ඒක පළාත් සභාව යටතේ තිබිච්ච hospital එකක්. ඒක දැන් මධ්‍යම රජයට අරගෙන තිබෙනවා. ඒක හොඳයි; සතුටුයි. නමුත් අද කෙනෙකු මිය ගියාම මිනිය එහි මෝචරියට දමලා තියන්න බැහැ. අපේ ඉස්ලාම් ආගමේ හැටියට පැය 24ක් ඇතුළත body එක ගන්න ඕනෑ. අයිස් තියලා තමයි මෝචරියේ මිනී තියලා තිබෙන්නේ. එහෙම නැත්නම් මිනිය කුරුණෑගලට ගෙනියන්න ඕනෑ; එහෙමත් නැත්නම් මාරවිලට ගෙන යන්න ඕනෑ. මාරවිලත් මෝචරිය වැඩ කරන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලා කියනවා, ඕනෑ තරම් සල්ලි තිබෙනවා කියලා. එහෙම නම් ඒවාට වියදම් කරන්න. ඒවා ඇත්තටම අත්‍යවශ්‍ය දේවල්. මොකද, හදිසි අනතුරක් වෙලා මිනිහෙක් මැරුණොත්, දවස් ගණනක් තියා ගන්න බැහැ. අයිස් තියන්න ඕනෑ, body එකට.

Body එකට අයිස් තියලා cool කරලා තමයි තියා ගන්න වෙන්නේ. දවස් දෙකකින්, තුනකින් පස්සේ තමයි මෝචරියට ගිහිල්ලා body එක එළියට ගන්න වෙන්නේ. මේ සම්බන්ධව විශේෂයෙන්ම කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අතරතුර පුත්තලම මරණාධාර සමිතියේ අයට ඒක බලාගෙන ඉන්න බැරුව එතුමන්ලා ඉදිරිපත් වෙලා යම් මට්ටමකින් ඒක හදන්න උත්සාහ කරනවා. ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා පුත්තලම මෝචරිය හදලා දෙන්න. එය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்கள், சகோதரன் அனோஜனுடைய குடும்பத்தினரை நேரடியாகச் சந்தித்துக் கதைத்து, அவருக்கு விடுதலையைப் பெற்றுக்கொடுப்பதற்கான முயற்சிகளை முதலில் எடுத்தவர். அதற்காக அவருக்கு நன்றி கூறுகின்றேன். எங்களுடைய கட்சியானது,

பாராளுமன்றத்திலுள்ள முஸ்லிம் பிரதி அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்களுடன் இணைந்து செயற்பட்டு, மாண்புமிகு சனாதிபதி, கௌரவ பிரதம அமைச்சர், வெளிநாட்டலுவல்கள் அமைச்சர் ஆகியோர்மூலம் இந்த விடயத்தை முன்னெடுத்துச் செல்வதாக எங்களுடைய கட்சியின் தலைவர் உறுதியளித்து இருக்கிறார் என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன்.

எங்களுடைய நாட்டில் சுமுகமான நிலை ஏற்படுவதற்கு நாங்கள் எல்லோரும் அரசியலுக்கு அப்பால் இணைந்து செயற்பட வேண்டும். அரசியலானது காலத்துக்குக் காலம் மாற்றமடையும். எனவே, எமது இலங்கை நாட்டில் சமாதானத்தை நிலைநாட்டுவதற்கு எல்லா சமூகத்தினரும் எல்லா சமயத்தவர்களும் எல்லாக் கட்சியினரும் ஒன்றுபட்டுச் செயற்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எனக்கு இந்த நேரத்தை ஒதுக்கித் தந்த கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන්, මම ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙනුත්, ගරු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, කල්පිටිය ප්‍රදේශය ගැන ඔබතුමන්ලා මීට වඩා වැඩියෙන් අවධානය යොමු කරන්න කියලා. මම කියන එක බොරුවක්ද, ඇත්තක්ද කියලා සොයා බලලා මීට වඩා කෘෂිකර්ම අංශය පැත්තෙන් දියුණුවක් ඇති කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිනවා.

සියලුදෙනාටම බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම අද දවසේ විවාදයට භාජන වන්නේ, ගරු බලශක්ති අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද "පරිපූරක මුදල" වාගේම, 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය පනත සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පතයි.

මම මුලින්ම බලශක්ති අමාත්‍යාංශය ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තුව ගැන කියන්නම්. මැද පෙරදිග අර්බුදය වාගේම පසුගිය දිනවල පැවැති වියළි කාලගුණික තත්ත්වය නිසා විදුලිබල අවශ්‍යතාව සපුරා ලීම සඳහා තාප බලාගාර වැඩි වශයෙන් යොදා ගන්න අපට සිදු වුණා. විශේෂයෙන් ගත්තොත්, විදුලිබලය උත්පාදනය සඳහා අපට ඉතාම ඉහළ පිරිවැයක් දරන්න සිද්ධ වුණා. මෙන්න මේ ඇති වූ අමතර පිරිවැය විදුලි පාරිභෝගිකයන් වෙත පැවරීම වෙනුවට, එය රජය දරා ගැනීම වෙනුවෙන් රුපියල් බිලියන 17.213ක සහනාධාරයක් පාරිභෝගිකයන් වෙත ලබා දීම සඳහා තමයි අපි අද දවසේ මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ. අප්‍රේල් මාසයේ ඉඳලා සැප්තැම්බර් මාසය දක්වා රුපියල් මිලියන 15,000ක මිල සහනාධාරයක් විදුලි පාරිභෝගිකයන්ට ලබා දීලා තිබෙනවා. ඊට අමතරව සැප්තැම්බර් මාසයේ ඉඳලා දෙසැම්බර් මාසය දක්වා තමයි අපි වෙනම පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මුදල් වෙන් කර ගැනීමක් සිද්ධ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂය විසින් විවිධ අවස්ථාවල අපෙන් ප්‍රශ්න කර සිටිනවා අපි ඉතිරි කළ මුදල්වලට මොනවාද කරන්නේ කියලා. අපි ඉතිරි කරපු මුදල් තමයි ඉතාම හොඳ, විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ අපේ රටේ මහ ජනතාවට සහනාධාර වශයෙන් අත්පත් කර දෙන්න කටයුතු කරමින් ඉන්නේ. මම විශේෂයෙන් ඒ බව කියන්න කැමැතියි.

අපි දන්නවා විදුලිබිල වැඩි වන කොට එය බොහෝ කාරණාවලට බලපානවා කියලා. විදුලි බිල වැඩි වන කොට එය නිෂ්පාදන ආර්ථිකයට බලපානවා, භාණ්ඩ මිල ඉහළ යාමට බලපානවා. පාරිභෝගිකයන් මත ඒ බර තබන්නේ නැතිව අපි ආණ්ඩුව විධියට මේ රුපියල් බිලියන 17ක මුදල වෙන් කරගෙන විශේෂයෙන්ම පාරිභෝගිකයන්ට සහන දෙන්න කටයුතු කරන පළමුවෙනි අවස්ථාව නොවෙයි, මෙය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රට බංකොලොත්භාවයට පත් වෙලා අවුරුද්දක් ඇතුළත තමයි අපට "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දෙන්න සිද්ධ වුණේ. එය ඉතාම ඛේදනීය ව්‍යසනයක්. එම ව්‍යසනය නිසා නැවත රට කඩා වැටෙන්නට තිබුණා. නමුත් අපේ තිබුණු මූල්‍ය විනය, මූල්‍ය කළමනාකරණය නිසා ඒ තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කරන්න අපට හැකියාව ලැබුණා. "දිට්වා" ව්‍යසනයෙන් නැති වූ ජීවිත නැවත දෙන්න බැරි වුණාට හානියට පත් වුණු ජනතාවට කරන්න පුළුවන් උපරිමය කිරීම වෙනුවෙන් ආණ්ඩුව මැදිහත් වීමක් කර තිබෙනවා. ඒ සඳහා අපි රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගත්තා. ඒ වාගේම අපි රුපියල් බිලියන 100 පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කරගෙන අස්වැසුම ප්‍රතිලාභීන් ලබන ප්‍රතිලාභ මුදල වැඩි කරන්න ඉන් රුපියල් බිලියන 25ක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එම පරිපූරකයෙන් ඉන්ධන සහනාධාරය සඳහා අපි රුපියල් බිලියන 60ක් වෙන් කරලා ඉන්ධන මිල වැඩි වීමේ සහනය මහජනතාවට අත්පත් කර දීලා තිබෙනවා. ජනවාරි මාසයේ ඉඳලා සැප්තැම්බර් මාසය දක්වා විදුලි බිල්පත් සම්බන්ධයෙන් ජනතාවට සහන ලබා දීම සඳහා අපි තවත් රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබෙනවා. එසේ රුපියල් බිලියන 100ක මුදලක් අපි රටේ මහජනතාවට ප්‍රතිලාභ විධියට අත්පත් කර දීලා තිබෙනවා. විපක්ෂය මොන තරම් ප්‍රශ්න කළත්, අපි මේ හැම දෙයක්ම කරන්නේ විපක්ෂයට උත්තර දීම සඳහා නොවෙයි, මේ රටේ මහජනතාවගේ ජීවිතවලට මැදිහත් වෙමින්, ඉතාම හොඳ ස්ථාවරභාවයක් රට තුළ ගොඩනැඟීම වෙනුවෙනුයි.

අපි ණය ගෙවීමේ ශක්‍යතාවක් තිබුණු රටක් නොවන බව අපි දන්නවා. හැම අතින්ම කඩා වැටිලා රට බංකොලොත්භාවයට පත් වෙලා තිබුණේ. නමුත්, අපි ගොඩනඟපු මූල්‍ය කළමනාකරණය ඇතුළේ, මූල්‍ය විනය ඇතුළේ මේ වනකොට ශ්‍රී ලංකාවේ දිගු කාලීන විදේශ මුදල් ණය පැහැර හැරීමේ ශ්‍රේණිගත කිරීම අනුව CCC+ මට්ටමේ ඉඳලා B- මට්ටම දක්වා ඉතාම හොඳ ස්ථාවර මට්ටමක අපේ රට තිබෙනවා කියලා Fitch Ratings ආයතනය ප්‍රකාශ කරලා තිබෙනවා. විශේෂයෙන්ම කිව්වොත්, අපි අධිවේගී මාර්ගවලින් දියුණුව තිබුණු රටක් භාර ගත්තේ නැහැ.

ඒ විතරක් නොවෙයි. රැකියා ගැන ප්‍රශ්න කරන්න ඇත්තටම පසුගිය අවුරුදු පහ ඇතුළත ඒගොල්ලන් මොනවාද කළේ කියන එක පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. මේ වනකොට රැකියා ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු අපි සූදානම් කරලා තිබෙනවා. අපි විනිවිදභාවයක් සහ ඉතාම හොඳ ක්‍රමවේදයක් සහිතව බඳවා ගැනීමේ පටිපාටි අනුව තමයි ඒ සියල්ල කරමින් යන්නේ. විශේෂයෙන්ම කිව්වොත්, ඉතාම හොඳ මූල්‍ය විනයක් අපට තිබෙනවා.

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් අපට දැවැන්ත වගකීමක් තිබෙනවා. අද දවසේ කථා බහට ලක් වන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත් ඒ සඳහා අපි පියවර ගෙන තිබෙනවා. අපේ ජාතික ආර්ථිකයේ ස්ථාවරත්වය ගොඩනංවා ගන්න විදේශ විනිමය ඉපයීමේ ප්‍රධානතම මාර්ගය, ප්‍රධානම මූලාශ්‍රය බවට පත් වෙලා තිබෙන්නේ අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයයි. විශේෂයෙන්ම ගත්තොත්, මේ වනකොට අපේ රටේ හෙක්ටෙයාර 82,000ක වාගේ ප්‍රමාණයක සුළු අපනයන භෝග වගා කරමින් ඉන්නවා. සුළු අපනයන භෝගවල වැදගත්කම ගත්තොත්, ඉන් සිදු වන්නේ විදේශ විනිමය ඉපයීම විතරක් නොවෙයි. ග්‍රාමීය ආර්ථිකය නැංවීම වාගේම, වක්‍ර වශයෙන් රැකියා උත්පාදනයටත් එය විශාල දායකත්වයක් සපයනවා. විශේෂයෙන්ම කිව්වොත්, අපනයන කෘෂිකර්ම භෝගයක් සඳහා අදාළ වන භෝග අර්ථ කථනය කිරීමේ අවශ්‍යතාව වාගේම, නිල නාම සංශෝධනයත් අද දවසේ මේ කථා බහ කරන පනත් කෙටුම්පත තුළ සිදු වනවා.

අපේ රටේ 2025 අවුරුද්දේ අපනයන කෘෂි භෝගවල තත්ත්වය ගත්තොත්, අපි හෙක්ටෙයාර 43,523ක ගම්මිරිස් වගා කරලා තිබෙනවා. ගම්මිරිස් නිෂ්පාදනය ගත්තොත්, මෙට්‍රික් ටොන් 27,606ක ප්‍රමාණයක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහි අපනයන පරිමාව, මෙට්‍රික් ටොන් 12,916.8ක වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ. ගම්මිරිස්වලින් ලබාගෙන තිබෙන ආදායම ගත්තොත්, රුපියල් මිලියන 31,004යි. එපමණ මුදලක් අපි සමස්ත ආදායම් වශයෙන් එකතු කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ මෙම වගාව බහුලව සිදු වනවා. ගම්මිරිස් මෙන්ම පුවක් ද අපේ අපනයන කෘෂි භෝග ඇතුළේ ප්‍රධාන තැනක් ගන්නවා. අපි අපනයනය කළ සමස්ත ප්‍රමාණ ගත්තොත් මෙට්‍රික් ටොන් 40,283යි. ඉන් අපි ලබපු අපනයන ආදායම රුපියල් මිලියන 87,121යි. අපි මේකෙදි බලාපොරොත්තු වන්නේ, ඉතාම හොඳ සහ ගුණාත්මක නිෂ්පාදන අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රය තුළින් වර්ධනය කරලා, තාක්ෂණය එකතු කරලා, අගය එකතු කිරීමක් කරලා, ඉතාම හොඳ විනිමය ආදායමක් අත්පත් කරගෙන එහි ප්‍රතිලාභත් මහජනතාවට අත්පත් කර දීමයි. ඒ වෙනුවෙන් තමයි මෙම සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

දෙවසරක කාලයක් ගත වෙලා තිබෙනවා. "වසර දෙකයි රටට සුබයි" වාගේම තව අවුරුදු තුනක් අපට ඉතුරු වෙලා තිබෙනවා. ඒ අවුරුදු තුන ඇතුළේත් ඉතාම හොඳ ජයග්‍රාහී ප්‍රතිලාභ ජනතාවට අත්පත් කර දීම වෙනුවෙන් දැවැන්ත මෙහෙයුමක ආණ්ඩුව නිරත වනවා කියමින්, මා නිහඬ වනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.43]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට නිවැරදි කිරීම් කිහිපයක්ම කරන්න සිද්ධ වනවා. මම මේ කාරණයෙන් පටන් ගන්නම්. අනුර කුමාර දිසානායක අපේක්ෂකතුමා 2024 අගෝස්තු මාසයේදී කිව්වා, ලයිට් බිල සියයට 33කින් අඩු කරනවා කියලා. ඒක තමයි පොරොන්දුව. ඒකෙන් තමයි එතුමා ඡන්දයෙන් පත් වුණේ. මිනිස්සු රැවටුණා. ඊට පස්සේ නොවැම්බර් මාසයේදී කිව්වා, නැහැ, සියයට 33කින් නොවෙයි, සියයට 30කින් අඩු කරනවා, හැබැයි ඒකට එතුමාට අවුරුදු එකහමාරක් ඕනෑය කියලා. අද වන විට අවුරුදු දෙකක් ගිහිල්ලා තිබෙනවා, ගරු ජනාධිපතිතුමා පත් වෙලා. ඒ සම්බන්ධයෙන් මෙතැන කථා කරපු කිසි කෙනෙක් වචනයක්වත් කථා කළේ නැහැ. මම හොයලා බැලුවා, ජනාධිපතිතුමා පත් වනකොට සාමාන්‍ය විදුලි ඒකකයක මිල තිබුණේ රුපියල් 30යි. අද සාමාන්‍ය විදුලි ඒකකයක මිල රුපියල් 35යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ කියන්නේ විදුලි බිල සියයට 33කින් අඩු වනවා වෙනුවට සියයට 17කින් වැඩි වෙලා තිබෙනවා. ඕක තමයි සත්‍යය. ඒක වැරදි නම් කරුණාකරලා කාට හරි මාව නිවැරදි කරන්න පුළුවන්.

එතුමා කිව්වේ ක්‍රම තුනකින් ඉන්ධන මිල අඩු කරනවා කියලායි. පළමුවෙනි ක්‍රමය විධියට, දූෂණය නවත්වනවා කිව්වා. තෙල් ගේනකොට, ගල් අඟුරු ගේනකොට දූෂණ වුණා, ඒ අය කොමිස් ගත්තා, ඒ කොමිස් මුදල් ඒ අයගේ සාක්කුවලට ගියා, ඒවා නැති කළාම තෙල් මිල අඩු වෙනවා, ගල් අඟුරු මිල අඩු වෙනවා කිව්වා. එතකොට දැන් තෙල් මිල අඩු වුණාද? ඒ කොමිස් අයින් කළාද? එහෙම වෙලා නැහැ. මොකද, යථාර්ථය ඒක නොවෙයි. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල එහාට මෙහාට යනකොට අපි කාටත් පිළිගන්න වනවා, තෙල් මිල ඉහළ යනවා කියන කාරණය. ඒක කවුරුවත් හොරකම් කරන දෙයක් නොවෙයි. අනුර කුමාර ජනාධිපතිතුමා ද, ඊට කලින් හිටපු කෙනාද කියන එක ඒකට අදාළ නැහැ.

දෙක, ගල් අඟුරු. ගල් අඟුරු ගැන කථා කළා නේ. ගල් අඟුරුවලට මොකද වුණේ? ඇමතිතුමාටත් ගෙදර යන්න සිද්ධ වෙච්ච බව අපි කවුරුත් දන්නවා. පාඩුව අතිවිශාලයි. ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපි දැනුවත් වෙච්ච දේ තමයි, direct loss එක විතරක්, ඒ කියන්නේ විකල්ප විදුලිය ලබා ගැනීම සඳහා රුපියල් බිලියන 8ක් වියදම් වෙලා තිබෙනවාය කියන එක. ඒ කියන්නේ බාල ගල් අඟුරු නිසා විකල්ප විදුලිය ගන්න එපමණ මුදලක් වැය වී තිබෙනවා. ඊට අමතරව, indirect loss එකක් තිබෙනවා, තව රුපියල් බිලියන 4ක හෝ 6ක. ඒ කියන්නේ රුපියල් බිලියන 12ක, 14ක විතර loss එකක් තිබෙනවා. ඔය තමයි ඇත්ත. එතකොට තෙල් මිල අඩු කළාද? අඩු වුණාද? හොරකම් නැවැත්වූවාද? සියයට 30 ගැන කථා කළාද? නැහැ.

ගරු ජනාධිපතිතුමා කිව්ව තුන්වැනි කාරණාව තමයි, LNG හරහා විදුලිය ජනනය කරනවා කියන එක. ඕනෑම කෙනෙකුට ChatGPT එකට ගිහිල්ලා අහන්න පුළුවන්, ගරු ජනාධිපතිතුමා කොහොමද විදුලි බිල අඩු කරනවා කිව්වේ කියන එක. LNG සම්බන්ධයෙන් අගෝස්තු මාසයේ 24වෙනි දා ගිවිසුමක් අත්සන් කළා, කෙරවලපිටිය සොබාදනවි විදුලි බලාගාරය සම්බන්ධව. ඒක අයිති පෞද්ගලික සමාගමකට. LTL කියන සමාගම ගැන කවුරුත් දන්නවා. මම ඒ ගැන කථා කරන්න අද බලාපොරොත්තු වන්නේ නැහැ. Dual fuel කිව්වා. ඒ කියන්නේ මූලිකව පටන් ගන්නේ LNGවලින්, Liquefied Natural Gasවලින්. අවශ්‍ය අඩුපාඩුව සඳහා පාවිච්චි කරනවා කිව්වා, ඩීසල්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වනකොට LNG unit එකක්වත් පාවිච්චි කරලා නැහැ. සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන්නේ ඩීසල්වලින්.

ඊළඟට, මම දැක්කා, BoI එකේ agreement එක ගිය සතියට කලින් සතියේ අත්සන් කරලා තිබෙනවා, සහස්දනවි කියලා. සොබාදනවි එකට අමතරව මේ අගෝස්තු මාසයේ පටන් ගන්නවා කිව්වා, dual fuel with LNG. නමුත් LNG පැත්ත පළාතේ නැහැ. අපි ඊයේ ඇහුවා, අමාත්‍යාංශ ලේකම්ගෙන්, NSO එකේ සභාපතිගෙන්, Electricity Generation Lanka එකේ

නිලධාරියාගෙන් කීය ගාණේද ඔයගොල්ලන් LNG ඒකකයක් සඳහා LTL එකට ගෙවන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මා දිහා බලන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රුපියල් 85යි. රුපියල් 85යි අවමය ඔයගොල්ලන් ගන්නේ. Cabinet Paper එකේ දැම්මා, රුපියල් 20ට LNG ඒකකයක් ගේනවා කියලා. මම මෙතැනදි ඒක ගැන තර්ක කළා. ඉතින් ඒ නිසා ඕවා ඇත්ත නොවෙයි. මිනිස්සු රවටන්න කියපු බොරු. පුනර්ජනනීය විදුලිය උත්පාදනය කරලාය කිව්වා, තුන්වෙනි ක්‍රමයට විදුලි බිල අඩු කරන්නේ. ගිය සතියේ ලේකම්තුමා මේ සම්බන්ධව නියෝගයක් දීලා තිබෙනවා. අපි rooftop solar panels ගහලා තිබෙනවා. එතකොට ඒවායේ Net Accounting සහ Net Metering ක්‍රම දැන් සම්පූර්ණයෙන්ම නවත්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තමන්ට අවශ්‍ය විදුලිය තමන් ජනනය කරගෙන CEB එකෙන් ඒක අඩු කරගෙන ගෙවන්න තිබ්බ ක්‍රමය තමයි, Net Accounting සහ Net Metering. ඒවා දැන් නැහැ. ඒ වෙනුවට CEB එක, එහෙම නැත්නම් Electricity Distribution Lanka එක කියනවා, ඔබ අපෙන්ම මිලදී ගන්න ඕනෑ, වෙන කාගෙන්වත් ගන්න බැහැ කියලා. ඒ අනුව සැප්තැම්බර් මාසයේ 11වෙනි දායින් පස්සේ "අපෙන්ම ගන්න ඕනෑ"ය කියලා ඔවුන් කියනවා. අපි ගන්නේ කීයටද? අපි රුපියල් 85 ගාණේ ගන්නවා, LTL එකෙන්.

ඊට පස්සේ, අපේ rooftop solar panelsවලින් යම්කිසි ප්‍රමාණයක් අපි උත්පාදනය කරනවා නම් ඒක අඩු මිලට ඒ කට්ටියට විකුණන්න ඕනෑ. හැබැයි, අපි වැඩි මිලට ගන්න ඕනෑ. ඉස්සර එහෙම නොවෙයි. අපි ජනනය කරලා, අවශ්‍ය ප්‍රමාණය අප හදාගෙන ඉතිරි ටික විතරයි ඒ කාලයේ අර කට්ටියගෙන් වැඩි මිලට ගත්තේ. නමුත්, දැන් එහෙම බැහැ. එහෙම නම් මොකක්ද ජනාධිපතිතුමා කිව්වේ, renewable energyවලින් එකතු කරලා මේක අඩු කරනවා කියලා? අඩු වෙන්නේ නැහැ, වැඩි වෙනවා. අවුරුදු එකහමාර ඉවරයි. සියයට 30 අඩු කිරීමත් ඉවරයි. සියයට 17කින් වැඩි වෙච්ච එක තමයි වෙලා තිබෙන්නේ. මම වැරදි නම් කරුණාකර PUCSL එකේ දත්තත් එක්ක මේක ඔප්පු කරන්න.

එහෙම නම්, මොකක්ද අද මේ කියන රුපියල් බිලියන 17ක කථාව? සමහරු කියනවා මම අහගෙන හිටියා, මැද පෙරදිග යුද්ධය නිසා, අනම් මනම් නිසා මේ සහනාධාරය දුන්නා කියලා. මොනවාද මේ කථා කරන්නේ? මේ tariff එක හදන්නේ පසුගිය කාර්තුවට එහා කාර්තුවේ තිබුණු ලාභය සහ පාඩුව සන්සන්දනය කරලා. එතකොට මේ tariff එක හදන්නේ 2026 අවුරුද්දේ පළමුවන කාර්තුවේ ලාභය හෝ පාඩුව සන්සන්දනය කරලා. ඒ කියන්නේ, මේ EDL එක වෙන්න කලින්, සංශෝධනයට කලින් CEB එක කාලයේ තිබුණු legacy loss එක. ඒ legacy loss එක පළමුවන කාර්තුවේ රුපියල් බිලියන 26යි. හැබැයි, සහනාධාරයක් දීලා තිබුණා, units 180ට අඩු කට්ටියට මාර්තු ඉඳලා සැප්තැම්බර් මාසය වෙනකල්. මාස 6කට රුපියල් බිලියන 17ක්. ඒකෙන් රුපියල් බිලියන 8ක් වියදම් වෙලා, රුපියල් බිලියන 9ක් ඉතිරි වෙලා තිබෙනවා. අවශ්‍ය ප්‍රමාණය රුපියල් බිලියන 17යි. ඒකයි මේ කියන්නේ. එහෙම නැතුව යුද්ධය නිසා සහනාධාරයක් දෙනවා නොවෙයි. ඒවා බොරු කථා; එහෙම එකක් නැහැ. එහෙම නොවෙයි නම් මේ සභාවේ ඉන්න කවුරු හරි නැඟිටලා කියන්න, හර්ෂ ද සිල්වා වැරදියි කියලා. අපි ඇත්ත කථා කරමු. කොයි වෙලාවේදීත් දත්ත අනුව කථා කරමු. මිනිස්සුන්ව තවදුරටත් රවටන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපේ පක්ෂයේ මහ ලේකම්තුමා මට විනාඩි 2ක් දුන්නා.

ඇත්ත කථාව තමයි, බාල ගල් අඟුරුවල loss එකක් තිබෙනවාය කියන එක. Direct loss එක රුපියල් බිලියන 8යි. Indirect loss එක රුපියල් බිලියන 4 - 6 අතර. ඒ අනුව රුපියල් බිලියන 12ක, 14ක loss එකක් තිබෙනවා. හැබැයි, මම කාරණයක් කියන්නම්. ආණ්ඩුවට අවශ්‍ය නම් මේ විදුලි බිල සියයට 30කින් අඩු කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ, කොහොමද? 2024දී ගෙනා පනතේ ඒකට අවශ්‍ය ප්‍රතිපාදන තිබෙනවා. ආණ්ඩුව දැන් ලොකුවට කියනවා නේ, "අපි බදු ගැහුවා" කියලා. ඔව්, ඉතා විශාල ආදායමක් ආණ්ඩුව ලබාගෙන තිබෙනවා. ඒක ඇත්ත. සියයට 40-45 අතර ආදායමක් ලබාගෙන තිබෙන්නේ වාහන ආනයනය හරහා. Customs Duty, Excise Duty, VAT ඇතුළු මේ ඔක්කොම ගහලා වාහන ගෙනෙනවා. මේ, වාහන ගෙනැල්ලා ගහපු බදු.

මම නේ එක වතාවක් කිව්වේ, භාණ්ඩාගාරය උතුරන්න සල්ලි තිබෙනවා කියලා. සල්ලි තිබෙනවා. නැත්තේ නැහැ නේ. ඇත්තටම අවුරුදු දෙකකින් පස්සේ ඔය පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ නම් ජනාධිපතිතුමාට පුළුවන්, අවශ්‍ය සහනාධාරය ලබා දෙන්න. දැන් electricity generation cost එක අවුරුද්දකට කීයද? මට හරියටම ඒ ගැන කියන්න බැහැ. සාමාන්‍යයෙන් රුපියල් බිලියන 450ක් විතර වෙනවා. එතකොට තුනෙන් එකක් කියන්නේ, රුපියල් බිලියන 150ක්. කාර්තුවකට ගත්තොත්, රුපියල් බිලියන තිස්හතහමාරක්, හතළිහක්. ඉතින්, ඕකත් ඕනෑ නම් දෙන්න පුළුවන් නේ. කවුද කියන්නේ දෙන්න බැහැ කියලා? දෙන්න බැරි නැහැ, දෙන්න පුළුවන්. නමුත් දෙන්න ඕනෑකමක් නැහැ. ඒ කියන්නේ, IMF එක කියනවා නම් දෙන්න බැහැ කියලා, අපි දෙන්නේ නැතුව ඉන්නම්. එහෙම නම් මේක වැඩක් නැහැ නේ. Macro නොම්මර කියලා, ratings ගැන කියලා, growth ගැන කොච්චර කථා කළත් වැඩක් නැහැ. ඇත්තවශයෙන්ම කල්පනා කරලා බලන්න, මහ පොළොවේ ජීවත් වන මනුස්සයා දිහා. දැන් කෘෂිකර්මය ගැන කථා කරනවා, කුඩා අපනයනය ගැන කථා කරනවා. ඔවුන්ට විදුලි බිල ගෙවා ගන්න බැහැ. ඔවුන්ට විදුලි බුබුළු ටික පත්තු කරගන්න බැහැ. ඔවුන්ගේ කර්මාන්තය කරගෙන යන්න බැහැ. විදුලි බිලේ ගණන වැඩියි. ඒවා අඩු කරන්න පුළුවන්. හැබැයි, ඒවා කරන්නේ නැහැ. ඕක තමයි ඇත්ත.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8 කාලයක් තිබෙනවා.

[අ.භා. 3.52]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් අද දවසේ අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සහ පරිපූරක මුදල - ශීර්ෂය 119 පිළිබඳව විවාදයට ගැනෙනවා.

අපනයන කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් බොහෝදෙනෙක් අද මේ සභාව තුළ අදහස් ප්‍රකාශ කළා. අපේ රටේ අපනයන ක්ෂේත්‍රය තුළ විවිධ කාල වකවානුවලදී ඇතැම් කඩාගෙන වැටීම්

[ගරු අරුණ පනාගොඩ මහතා]

ඇති වෙලා තිබුණා. ඒ තත්ත්වය ඉදිරියට ඇති නොවන විධියට වෙනස් කරන්න අපි රජයක් හැටියට කටයුතු කරමින් ඉන්න වෙලාවක්, මේක. මේ පනත සංශෝධනය කරන්න අපි තීරණය කළේ එහි තිබෙන නෛතික තත්ත්වය වෙනස් කරගන්න වාගේම ඉන්පසුව මේ රට ඇතුළේ අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න ගොවියාගේ ජීවිතය නඟාසිටුවන්න සහ ඒ ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නයි. අද අපට නිවැරදි කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ මීට අවුරුදු ගණනකට කලින් මේ පිළිබඳව හොයා බලා කරන්න තිබුණු දේවල්. අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ ඇතැම් නිලධාරින් කිව්වේ, මීට අවුරුදු 22කට විතර කලින් තමයි මේ වැඩේ කරන්න තිබුණේ, එතකොට තමයි මෙවැනි යෝජනා ඉදිරිපත් වුණේ කියායි. නමුත් අවුරුදු 22ක් යනකම් මේ පනත සංශෝධනයට ලක් කරලා, අදට - වර්තමානයට - ගැළපෙන විධියට අපේ රටේ නිලධාරින්ට මෙම තත්ත්වය හදලා දෙන්න පාලකයන්ට බැරි වුණා. ඒ නිසා තමයි අවුරුදු 22කට විතර පස්සේ මේ පනත සංශෝධනය කරලා, ඊට අදාළ ඉඩ පහසුකම් හදා ගන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කරන්න අපට සිද්ධ වුණේ. එවැනි තත්ත්වයක් තුළ තමයි අපි අද අපනයන ක්ෂේත්‍රය දියුණු කරන්න මහන්සි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පනත් එකින් එක මේ විධියට යාවත්කාලීන කරලා, ඒවා අදට ගැළපෙන විධියට හදලා, මේ රටේ සැබෑ ගොවීන්ට, ව්‍යවසායකයන්ට අවශ්‍ය ඉඩ පහසුව හදලා දීලා, මේ රට පොහොසත් රටක්, වඩා යහපත් රටක් බවට පත් කරන්න කටයුතු කරනකොට විපක්ෂය ඒ තුළ දකින්නේ මොකක්ද? ඒගොල්ලන් හැම වෙලාවේදීම "බැහැ, බැහැ" කියමින්, "නැහැ, නැහැ" කියමින් තමයි ඉන්නේ. අවුරුදු ගණනක් මේ රට පාලනය කරපු විපක්ෂය අද මේ රට යථාවත් කරන්න හදද්දි ඒකට අකුල් හෙළමින් රටේ ජනතාවගේ ධෛර්යය ඇති කරනවාට වඩා ඔවුන්ගේ ධෛර්යය කඩා වට්ටන්න තමයි කටයුතු කරමින් ඉන්නේ. ඒගොල්ලන් හිතනවා, මේ බොරුව කිව්වාම හරි කියලා. අර ගොබෙල්ස් න්‍යාය වාගේ බොරුව 500 වතාවක් කියනකොට, ඒක සමාජගත වෙලා මිනිස්සු ඇත්තක් හැටියට පිළිගෙන ජනතාවාදී ආණ්ඩුවක් පලවා හැරලා ඒගොල්ලන්ට බලය ලබා දෙයි කියලා ඒ අය කල්පනා කරනවා. හැබැයි, එහෙම වෙන්නේ නැහැ. අපි මේ රට යථාවත් කරමින්, පොහොසත් රටක් බවට පත් කරමින්, මංකොල්ලකමින් කඩා වට්ටපු රට ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කරමින් ඉදිරියට යන්න කටයුතු කරද්දි ඒගොල්ලන් "බැහැ, බැහැ" කිව්වාට, "නැහැ, නැහැ" කිව්වාට ඒ සඳහා මේ ආණ්ඩුව මොන තරම් උත්සාහයක් දරනවාද, මොන තරම් මහන්සියක් දරනවාද, මොන තරම් කැපවීමක් කරනවාද කියන එක මේ රටේ ජනතාව දන්නවා. මොකද, මේ ආණ්ඩුවේ හැමදෙනාම ජනතාවත් එක්ක එකට සිටිමින් මේ කටයුතු යථාවත් කරන්න මැදිහත් වන කණ්ඩායමක් බව ඒ අය දන්නවා.

පසුගිය කාලයේ අපි මේ රට භාර ගන්නකොට රටේ සංවර්ධනය සම්පූර්ණයෙන් නැවතිලා තිබුණේ. ගමක පාරක් හැදුණේ නැහැ. රජයේ රස්සාවක් දුන්නේ නැහැ. ගමට අලුතින් ව්‍යාපෘතියක් ආවේ නැහැ. ආර්ථිකය බංකොලොත් වෙලා තිබුණේ. රටේ ජනතාව අද විපක්ෂයට වැටිලා ඉන්න මේ හැමෝටම විරුද්ධව එදා මහ පාරට බැහැලා, ඔවුන් එළවලා මේ රට ජාතික ජන බලවේගයේ අපට භාර දුන්නේ ඒ රට ගොඩනඟන්නයි. ඒ නිසා ජනතාවට ඉවසීමක් තිබෙනවා. ජනතාව ඉවසන්නේ ඇයි? විපක්ෂය එදා මේ රටට අත්පත් කරලා දුන්නු විනාශකාරි ගමන වෙනස් කරලා මේ රට ගොඩනඟන්නයි. අද ඒ අය දන්නවා, මේ රට යම් පිළිවෙළකට ස්ථාවර වෙමින්, ආර්ථිකය ශක්තිමත් වෙමින්, සෑම ක්ෂේත්‍රයකම දියුණුවක් අත්පත් කරගනිමින් ගමනක් යන බව. ඒක පිළිවෙළකට කෙරෙන බව අද වනකොට ජනතාවට සක්සුදක් සේ පැහැදිලි වෙලා තිබෙනවා. එහෙම වෙලාවක තමයි අද මේ කට්ටිය මෙතැනට ඇවිල්ලා සමාජගත කරන්න හදන බොරුව පිළිබඳව නිරන්තරයෙන් මතක් කරමින්, කටයුතු කරමින් ඉන්නේ.

පසුගිය දවස්වල මේ අය කල්පනා කළා, රටේ ජන ජීවිතය කොයි විධියටද අඩාළ වෙන්න ඕනෑ කියලා. "දිට්වා" ව්‍යසනය ඇවිල්ලා මේ රට අඩාළ වෙනවා නම් ඔවුන් තවත් සතුටු වුණා. ඇමෙරිකාවත් එක්ක පැටලිලා තිබෙන ඉරාන යුද්ධය නිසා රට ඇතුළේ අස්ථාවරභාවයක් ඇති වෙනවා නම්, බඩු මිල වැඩි වෙනවා නම් හොඳයි කියලා ඒගොල්ලන් කල්පනා කළා. ඒ හැම දෙයක්ම ඒගොල්ලන් ප්‍රාර්ථනා කළා. නමුත් මොකද වුණේ? හැම ප්‍රාර්ථනාවක්ම සුනුවිසුනු වෙලා ගිහිල්ලා අද රටේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් යහපත් රටක් නිර්මාණය වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ අද විපක්ෂය හිටියා නම් මොකක් වෙයිද? අපි රට භාර ගන්නකොට පෝලිම් යුගයක්, ලයිට් කැපූ යුගයක් තිබුණේ. එහෙම ආපු ගමනක් තමයි අද අපි අවසන් කරලා තිබෙන්නේ.

ඊයේ මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අහනවා මම දැක්කා, විදුලි බිල ගෙවන්න, එහෙම නැත්නම් තෙල් මිල අඩු කරන්න ආණ්ඩුව සහනාධාරයක් දෙනවා කිව්වා, ඒක පැලවත්තෙන්ද ගෙවන්නේ කියලා. සිරිකොතේ හිටපු කට්ටිය මහා භාණ්ඩාගාරය කඩාගෙන ගිය බවත් එතුමාට අමතක වෙලා තිබුණා. එතුමාත් කාලයක් සිරිකොතේ හිටියා. සිරිකොතෙන් දොට්ට වැටිලා, විපක්ෂ නායකත් එක්ක අලුත් කාර්යාලයක් හදාගෙන දැන් එතුමා අපෙන් අහනවා, පැලවත්තෙන්ද ගෙවන්නේ කියලා. ඒ අය තෙල් සහනාධාරය ගෙවන එකට, විදුලි බිලට අදාළ සහනාධාරය ගෙවලා මේ රටේ ජනතාවට සහන සපයන එකට විරුද්ධවයි ඉන්නේ. එතැනයි ඉන්නේ, ඒ අය කැමැති නැහැ, රටේ ජන ජීවිතය යහපත් වෙනවාට. මෙවැනි තත්ත්වයක් තුළ තමයි අද අපිට සිද්ධ වෙලා තිබෙන්නේ, මේ රට වඩාත් ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වෙන විධියට යම් පිළිවෙළකට හරිගස්වාගෙන, ගොඩනඟා ගෙන මේ ගමන යන්න. පසුගිය කාලයක් පුරා රටේ සංවර්ධන වැඩ අතහැරලා තිබුණේ. නමුත්, මෑත කාලයේ, මේ දෙවසරක් තුළ මේ රටේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති අපි පටන් අරගෙන තිබෙනවා. ඒක විපක්ෂයට පෙනෙන්නේ නැහැ. ඒක පෙනෙන්නේ නැහැ. ඒ වෙනුවට ඒගොල්ලෝ කොරහේ කිඹුල්ලු දකින තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මම Facebook එකෙන් දැකපු, පත්තරයක පළ වෙච්ච සටහනක් පිළිබඳව යමක් මතක් කරන්න ඕනෑ, මේ කථාව අතරේ. ඒ මොකක්ද? පසුගිය "දිට්වා" ආපදාවට අදාළව අපි යමක් කළේ නැහැ, ජනතාව තවමත් ගැටලුවල ඉන්නවා කියලා සමහරු කෑගහනවා නේ. ඒ නිසා විපක්ෂයේ අය මේක හොඳින් අහගන්න ඕනෑ. "දිට්වා" ආපදාවට රජයෙන් දුන්නු රුපියල් මිලියන 718න් කිසිම දෙයක් කරලා නැහැ කියලා ප්‍රවෘත්තියක් පළ වෙනවා. කවුද මේ? විපක්ෂයට බලය හිමි පාතහේවාහැට ප්‍රාදේශීය සභාව. මේ, අද පත්තරයක පළ වුණු ප්‍රවෘත්තියක්. අද මේ අය කෑගහන්නේ කොහොමද? තමන්ට බලය හිමි ප්‍රාදේශීය සභාවට ඒ ජනතාවගේ යටිතල පහසුකම් දියුණු කරන්න රජය ලබා දුන්නු රුපියල් මිලියන 718ක් මේ විපක්ෂය ඕනෑකමින්ම අතහැර දාලා තිබෙනවා, ජනතාව අපහසුතාවට පත් කරන්න. ඒ නිසා ඒ පිළිබඳව අද විමර්ශනයක් කරන්න සූදානමක් තිබෙනවා. මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා ඒ පිළිබඳ විමර්ශනයක් කරලා වාර්තාවක් කැඳවන්න සූදානමක් තිබෙනවා. මෙහෙම තමයි විපක්ෂයේ කටයුතු. ජනතාවගේ ජීවිත අඩාළ කරන්න, ජනතාවගේ ජීවිත ගොඩ යන එක වෙනුවට වළට දමන්න කල්පනා කරන විපක්ෂයක් අද අපට හම්බ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ තත්ත්වයන් හරියට රටේ ජනතාවට පැහැදිලි කරලා, මේ රටේ ජනතාවට උරුම වෙලා තිබුණු, ඒ ඉතාම අපහසුකාරී වාතාවරණය, වටපිටාව වෙනස් කරලා, මේ රට

යම් කිසි පිළිවෙළකට ඉදිරියට අරගෙන යන්න කටයුතු කර තිබෙනවා. ආර්ථිකය ස්ථාවර කරමින්, සහන ලබා දෙමින්, ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙමින්, ඒ විතරක් නොවෙයි, මේ ගෙවුණු දෙවසර ඇතුළේ පනත් ගණනාවක් අලුතින් යථාවත් කරලා, මේ රටේ ජනතාවට, සංවර්ධනයට අවශ්‍ය කටයුතු ළඟා කරලා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. අද විවාදයට ගැනෙන පනත් කෙටුම්පත තුළිනුත් ඒ තත්ත්වය තමයි අපි දකින්නේ.

ඉදිරි කාලය ඇතුළේ මේ රට පොහොසත් රටක් බවට පත් කර ගනිද්දී, ජනතාවට වඩා සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් බවට පත් කර ගනිද්දී, අපි හැමෝටම තිබෙන වගකීම අපි පැහැර හරින්නේ නැතුව, ජාතික ජන බලවේගය ආණ්ඩුව අවුරුදු පහකට මේ රටේ ජනතාවගෙන් ගත්ත ජන වරමට තවත් අවුරුදු ගණනාවක් ඉස්සරහට එකතු කරන්න පුළුවන් විධියට දැවැන්ත ජන සහභාගිත්වයක්, දැවැන්ත කැමැත්තක් එකතු කරමින් ඉදිරියට යනවා. ඒක අද විපක්ෂයට දරා ගන්න අමාරුයි. ඒත් කරන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.03]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මා මිත්‍ර ලාල් කාන්ත ඇමතිතුමා මෙතැන ඉන්නවා. කෘෂිකර්මය ගැන කථා කිරීමට නොවෙයි මේ අවස්ථාවේදී ආවේ. ඔබතුමා දැන් ඒ කටයුතු කරගෙන යන නිසා, මම කථා කරන්න යන්නේ බලශක්තිය සම්බන්ධයෙන්. නමුත්, ඊට පෙර මේ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන දේ ගැන වචන ස්වල්පයක් කථා කළ යුතුයි. වියදම අඩු කරන එක තමයි, අපි සියලුදෙනාගේම කැමැත්ත. ඒ සම්බන්ධයෙන් නොයෙක් දේවල් කරලා, ඒකේ ඵලදායීතාව - productivity - වැඩි කිරීම තමයි කරන්න ඕනෑ.

හැබැයි, මේ ආණ්ඩුව මෑතක සිට වියදම් වැඩි කිරීමේ ස්වරූපයක් ඇති කරලා තිබෙනවා. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමන්ලාගේ ආණ්ඩුව සුද්දන්ට හුඟක් සහනාධාර දෙනවා. ලාංකිකයන්ගෙන් බදු අරගෙන සුද්දන්ට බදු සහන දෙන එක තමයි අපට තිබෙන කැක්කුම. මේ අවස්ථාව වෙනකොට මඟුල් උත්සවයක් තිබුණොත් ඒකටත් බදු ගහනවා. ඒකට music band එකක් ගෙනාවත් බදු ගහනවා. බැරි වෙලාවත් වාහනයක පිටුපස සීට් එකේ තුන් හතර දෙනෙක් ගෙනිච්චොත් ඒකත් ප්‍රශ්නයක්; දඩ ගහනවා. ඒ විතරක් නොවෙයි, හැම කිලෝමීටර 5,000කටම යම් බද්දක් ගහන්න යනවා. මේ ඔක්කෝම බොහොම හොඳයි, මේ රටේ පාරවල් පැයට කිලෝමීටර 100ට 200ට යන්න පුළුවන් විධියට හොඳට තිබෙන විට. ඇයි, මෙතරම් මුදලක් ගන්න හදන්නේ ටොන් ගාණක් සල්ලි තිබෙනවා නම්? යම් යම් දේවල හොඳ ප්‍රවණතාවක් ඇති කිරීම කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඉස්සෙල්ලා ජීවත් වෙන්න පුළුවන් රටාවක් හදන්න ඕනෑ. අද මිනිස්සු ජීවත් වෙන්නේ හරි අමාරුවෙන්.

ඒ විතරක් නොවෙයි මම දැන් කිව්වා සුද්දන්ට සහනාධාර දෙනවා කියලා. දැන් බලන්න, ඛනිජ තෙල් ගැන. ඛනිජ තෙල් සංස්ථාව එක්ක තරග කරන්න දැන් පිට රට කොම්පැනි තුන හතරක් ඇවිල්ලා තිබෙනවා. ඒ, LIOC, RM Parks සහ Sinopec. එක කොම්පැනියක් ඇවිල්ලා ඒක ගියා. මම දන්නේ නැහැ, මේකට මොකක්ද හේතුව කියලා. නමුත් මම ඕනෑකමින් ආණ්ඩුවට මේ කාරණය කියනවා. මේ අවස්ථාව වෙනකොට ඔබතුමන්ලා සුද්දන්ට උපරිම මිලක් දාලා නැහැ. සුද්දාට උපරිම මිලක් දාලා නැති වෙලාවක ඇයි එවැනි කොම්පැනිවලට සහනාධාරයක් දෙන්නේ? ඒගොල්ලන්ට ඒ අවස්ථාව ඇති කරලා දුන්නේ 2022 කාලයේ රටේ යම් කඩා වැටීමක් තිබුණු අවස්ථාවේ. ඒ වෙලාවේ ඩොලර් නැති වුණා. ඩොලර් නැති වෙලා ගෑස්, තෙල් හිඟ වුණාම මේ කටයුතු විවෘත කළා. ඒ අවස්ථාවේ ඒගොල්ලන්ට අවශ්‍ය ඩොලර් ප්‍රමාණය ගෙනැල්ලා තෙල් අරගෙන විකුණන්න ඒගොල්ලන්ට ඉඩ දුන්නා. දැන් අපේ market share එක ඛනිජ තෙල් සංස්ථාවෙන් කඩලා සුද්දන්ට market share එකක් ඇති කරන්න අපි සහනාධාර දෙන්න ඕනෑ නැහැ නේ. කිසි ප්‍රශ්නයක් නැහැ, අපේ ජනතාවට දෙන සහනාධාරයක් නම්. ඒ සහනාධාර ඔක්කෝම ඛනිජ තෙල් සංස්ථාවට දෙන්න. ඇයි සහනාධාරයක් සුද්දන්ට දීලා ඛනිජ තෙල් සංස්ථාවේ market share එක කඩාගෙන කටයුතු කරන්නේ? ඒ, එකක්. සුද්දන්ට දෙන ඒවා තමයි මේ කියන්නේ.

දෙවැනි කාරණය තමයි, Uber සහ PickMe සම්බන්ධ ප්‍රශ්නය. PickMe කියන්නේ local company එකක්. ඒක Uber කියන පිට රට කොම්පැනිය එක්ක තරග කරනවා. Uber එකෙන් Value Added Tax එක හැටියට සියයට 18ක් අය කරන්නේ ඒ අයගෙන් එකතු කරන සේවා ගාස්තුවට. නමුත් PickMe එකෙන් බදු අය කරද්දී පාරිභෝගිකයා ගෙවන සම්පූර්ණ මිලට බද්ද ගහනවා. ලංකාවේ සම්පූර්ණ invoice එක ඇති කරලා තිබෙන නිසා ඒ සියයට 18 අය කරන්නේ ඒ පාරිභෝගිකයා ගෙවන සම්පූර්ණ මිලට මිස නිල එකතු කිරීමට නොවෙයි. එතැනත් සුද්දන්ට වාසිය තිබෙනවා, ලාංකීය අයට නැහැ. ඉතින් ඒක වෙනස් කරන්න ඕනෑ. බදු ගහන්න තීන්දු කළාට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් මම ඉතාමත් ඕනෑකමින් කියන්නේ මේවා නිවැරදි කරන්න කියන එකයි. මොකද ලංකාවේ තිබෙන කොම්පැනිවලට හානි වෙන්න දෙන්න එපා.

[ගරු රවි කරුණානායක මහතා]

තුන්වැනි එක මේකයි. මම ඉතාම ඕනෑකමින් මම මේක කියන්නේ. මම මෑතකදී දැක්කා FUTA එකේ අයට ඇති වී තිබෙන ප්‍රශ්නයක්. යම් විධියකින් අපේ දරුවන්ගේ මොළ ටික හදන, අපේ ඉදිරි අනාගත නායකයින් බිහි කරන තැන තමයි විශ්වවිද්‍යාල. ඒ ආචාර්යවරුන්ගේ, වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද ජීවත් වෙන්න ඉතාමත් අමාරුයි. ඒ කියන්නේ අත්තිකාරම් පෞද්ගලික ආදායම් බද්ද - APIT, Advance Personal Income Tax - සියයට 36ක් වාගේ ඉතාම ඉහළ මට්ටමක තිබෙන්නේ. ඒ අය සංසන්දනය කරලා තිබුණා, ඒ අයගේ සම්පූර්ණ ආදායමට අත්තිකාරම් පෞද්ගලික ආදායම් බද්ද - APIT - අය කරනවා කියලා. ඒ වාගේම තමයි දොස්තරවරුත් ඔය ප්‍රශ්නය කිව්වා. අපි මීට පෙර කථා කළ අවස්ථාවේදී ඒක පෞද්ගලිකව ඒ අයට බලපා තිබෙන ආකාරය දැක්කා. ඒ අනුව ඒවා නිවැරදි කළා. නමුත් දැනුත් සම්පූර්ණ ආදායමට, - ඒගොල්ලන්ගේ research allowance එක වෙන්න පුළුවන්, ඒගොල්ලන්ගේ DAT allowance එක වෙන්න පුළුවන්, ඒවාටත් ඇතුළත් වන විධියට - බදු ගහනවා. මෑතකදී මම දැක්කා උසාවියෙන් තීන්දුවක් ලැබිලා තිබුණා විනිශ්චයකාරවරුනුත් බදු ගෙවන්න ඕනෑය කියලා.

ඒ ඔක්කෝමලා සම්පූර්ණ ආදායමට බදු ගෙවනකොට අපේ මන්ත්‍රීවරු බදු ගෙවන්නේ යම් ප්‍රතිශතයකට විතරයි. ඇයි එහෙම කරන්නේ? අද මිනිස්සු බලන්නේ, ප්‍රශ්න කරන්නේ මේ 225දෙනාම පට්ට හොරු කියලා නේ. ඉතින් මේවා නිවැරදි කරන්න. ඇයි, අපට විතරක් ඔය වරප්‍රසාද දෙන්න ඕනෑ වන්නේ? මම ආණ්ඩුවට කියනවා, කරුණාකරලා මේක නිවැරදි කරන්න කියලා. ඕනෑ නම් අනෙක් අයගෙන් පටන් ගන්න ඉස්සෙල්ලා මගෙන් පටන් ගන්න. හැබැයි, මේවා නිවැරදි කළේ නැත්නම් මොකද වෙන්නේ? මේ වැරැද්ද ගැන තොරතුරු මිනිසුන් අතරට ගියොත් මොකද වෙන්නේ? මේ 225දෙනාට හෝ මුළු රටේම ඉන්න 10,000ක් පමණ වන දේශපාලනඥයන්ට ජනතාව කියනවා, "මුන් ටික තමයි රට කන්නේ" කියලා. ඒවා නිවැරදි කරන එකෙන් තමයි ආදායම හොයා ගන්න පුළුවන් වන්නේ. මේකෙන් තුට්ටු දෙකක් හොයා ගන්නේ නැහැ තමයි. නමුත් මිනිසුන්ගේ මතය වන්නේ, මේගොල්ලන්ට විතරක් එහෙම දෙන්නේ ඇයි කියන එකයි. මම මේ අවස්ථාවේ එම කාරණය කිව්වේ ඇයි? ජනතාවට ලැබෙන්නේ නැති දේ අපට ඕනෑ නැහැ කියන පක්ෂයක් නේ ඔබතුමන්ලාට තිබෙන්නේ. ඉතින් මේ අඩුපාඩුව නිවැරදි කර ගනිමු.

අද දවසේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන පරිපූරක මුදලට අදාළ යෝජනාව තුළින් අපි විදුලිබල මණ්ඩලයේ තිබෙන කටයුතු සහ ඉන්ධන සම්බන්ධවත් සාකච්ඡා කරනවා. මම කාරණා කීපයක් සාරාංශයක් වශයෙන් කියන්නම්. ජනතාවට සහනාධාර දීම නරක නැහැ. නමුත් අවශ්‍ය කට්ටියට සහනාධාරයක් දෙනවා මිසක් නිකරුණේ හැමෝටම දෙන එක ගැන නැවත සිතා බලන්න අවශ්‍යයි. මොකද, යම් ප්‍රතිශතයකට සහනාධාර දෙන්න අවශ්‍ය නැහැ. නමුත් සහනාධාර අවශ්‍ය බහුතර ජනතාවට ඒක හරියාකාරව දෙන්න ඕනෑ. දැන් මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය? මේ සහනාධාරය එදාත් දුන්නා, අදත් දෙනවා. එය ඉදිරියටත් දෙන්න. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. සාමාන්‍යයෙන් market-oriented economy එකක වැඩ කරන පක්ෂයක් වශයෙන් එක්සත් ජාතික පක්ෂයත්, අපිත් කියන්නේ ඒක අවශ්‍යයි කියන එකයි. අපි කොහොමද ඒක කරන්නේ?

අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තමන්ගේ 7වැනි වාරිකය සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ කරුණුත් අධ්‍යයනය කරලා තමයි මම මේවා කථා කරන්නේ.

අපේ රටේ විදුලිබලය භාවිත කරන පාරිභෝගිකයන් ලක්ෂ 66ක් පමණ ඉන්නවා. ඒ අය අතරින් 135,000ක් පමණ ඒ තිබෙන සහනාධාරයෙන් සියයට 95ක පමණ බර ඇද ගන්නවා, එක තැනකට. රජය මේ අවස්ථාවේදී රුපියල් බිලියන 17.5ක් -කෝටි 1,750ක්- සහනාධාර වශයෙන් ජනතාවට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. එසේ ජනතාවට සහන ලබා දෙන්නේ ආදායම් උත්පාදනයකින් නොවෙයි, ප්‍රාග්ධන වියදම් කපා හැරීම තුළින්. මොකද, මේ ආණ්ඩුව ඒ මුදල් භාවිත කරලා ප්‍රාග්ධන වියදම් සිදු කරලා නැහැ. ඒ මුදල පාවිච්චි කරනවා, පුනරාවර්තන වියදම්වලට. ඒ පුනරාවර්තන වියදම තමයි අද මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ, රුපියල් බිලියන 17.5ක් නැත්නම් කෝටි 1,750ක් ලෙස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සහනාධාර දෙන්න වෙන්නේ ඇයි? මේ අවස්ථාවේදී මම පෙන්වන්න අවශ්‍යයි විදුලිය ජනනය කිරීමට යන වියදම. මේක ආවාට ගියාට බලලා දෙන එකක් නොවෙයි. විදුලිය ජනනය කරන වියදම තුළ යම් විෂමතාවක් තිබුණොත්, ඒ විෂමතාව නැති කර ගැනීමට හැකි පරිදි ආදායම උත්පාදනය කරන්න බැරි වුණොත් මොකක්ද වෙන්නේ? ඒ නිසා ඒ විෂමතාව කුමක්ද කියා සොයා ගන්නා මාර්ගයක් තමයි තිබිය යුත්තේ.

අද වන විට දවසකට විදුලිය ගිගාවොට් 47ක් විතර නිෂ්පාදනය වෙනවා. අවුරුද්දකට බැලුවොත් එම ප්‍රමාණය ගිගාවොට් 17,500ක්. මේ ගිගාවොට් 17,500 තුළ installed capacity එකක් තිබෙනවා, රට පුරා මෙගාවොට් 5,450ක. මේ මෙගාවොට් 5,450 ලබා ගන්නේ එක්කෝ ජල විදුලියෙන් වෙන්න පුළුවන්, පුනර්ජනනීය බලශක්තියෙන් වෙන්නත් පුළුවන්, එහෙම නැත්නම් ගල් අඟුරුවලින් වෙන්නත් පුළුවන්. මේ මෙගාවොට් 5,450න් දවසකට මෙගාවොට් 2,300 සිට 3,200ක ප්‍රමාණයකට maximum demand එකක් තිබෙනවා. ඒක තමයි උපරිම ගිහින් තිබෙන්නේ. මේ 3,200 ජනනය කරන කොට කොහොමද ඒක ගන්නේ? පැලවත්තේ තිබෙන විදුලිබල මණ්ඩලයට අයත් ඒ system control එකෙන්- *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ පැලවත්ත නොවෙයි. *[බාධා කිරීමක්]* ඔයගොල්ලන්ගේ අසල්වැසියෝ. පැලවත්ත කිව්වාම අද හැම එකම පැලවත්ත වෙලා නේ. පැලවත්තේ තිබෙන විදුලිබල මණ්ඩලයට අයත් ඒ system control එකෙන් ඒගොල්ලන් නොයෙක් ප්‍රභේද මඟින් විදුලිය ලබා ගන්නවා. එකක් තමයි ජල විදුලිය. මේ දවස්වල සියයට 25ක් විතර ගන්නේ ජල විදුලියෙන්. ජල විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 3ක් විතර වැය වෙනවා. *[බාධා කිරීමක්]* ඒකත් පැලවත්ත. ඒක තමයි තිබෙන ප්‍රශ්නය නේද? දැන් හැම එකම පැලවත්ත වීගෙන යනවා. කිරි පිටි වුණත් දැන් පැල්වත්ත කියනවා නේ. ඒක නේ තිබෙන ප්‍රශ්නය.

පුනර්ජනනීය බලශක්තිවලින් විදුලිය සියයට 30ක් විතර නිපදවනවා. ඒ කියන්නේ සූර්ය බලශක්තිය වෙන්න පුළුවන්, නැත්නම් සුළං බලය වෙන්න පුළුවන්, අනෙක් ප්‍රභේද වෙන්නත් පුළුවන්. එම විදුලි ඒකකයක් නිපදවීමට රුපියල් 15-35 අතර මුදලක් වැය වෙනවා. ඊට පසුව ගල් අඟුරු භාවිතයෙන් සියයට 15 -18 ප්‍රමාණයක් නිපදවනවා. මොනවා වුණත් එමඟින් රටට ලොකු ශක්තියක් දීලා තිබෙනවා. ගල් අඟුරු භාවිතයෙන් විදුලිය ඒකකයක් නිපදවීමට රුපියල් 22-24 ප්‍රමාණයක් වැය වෙනවා. ඒ වාගේම, තාප විදුලි බලාගාරවලිනුත් විදුලිය නිපදවනවා. ඒ අනුව furnace oil භාවිතයෙන් සියයට 15ක විතර ප්‍රමාණයක් විදුලිය නිපදවනවා. ඒ සඳහා ඒකකයකට රුපියල් 50-55 අතර ප්‍රමාණයක් වැය වෙනවා. ඊට පසුව ඉතිරි ප්‍රමාණය තෙල් භාවිතයෙන් නිෂ්පාදනය වෙනවා. එම ඒකකයකට රුපියල් 55 සිට 185 වනකල් ගෙවනවා. තාප විදුලි බලාගාර තුළින් සියයට 40ක් පමණ නිෂ්පාදනය වෙනවා. ඉතුරු සියයට 60 පුනර්ජනනීය බලශක්තිය

තුළින් නිපදවනවා. එසේ නිෂ්පාදනය කරන ඒකකයක average මිල රුපියල් 24යි. නමුත්, distribution, transmission සහ ණයවලට ගෙවන ඒවා ඔක්කෝම එකතු වුණාම, එක ඒකකයක් රුපියල් 35යි, 36යි අතර වෙනවා. මෙතැනදී, පුළුවන් තරම් marginal cost එකට, ඒ කියන්නේ ආන්තික පිරිවැයට ගන්න පුළුවන් මිලට වඩා අඩුවෙන් ගන්න පුළුවන් වුණොත් විතරයි යම් විධියකින් විදුලි බිල අඩු කරන්න පුළුවන් වන්නේ. මට මතකයි, එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව පාලනය කළ අවස්ථාවේ ඔය පැත්තේ සිටින මන්ත්‍රීවරු සියලුදෙනාම වාගේ කිව්වා, තමන් බලයට ආවාම විදුලි බිල සියයට 35කින් අඩු කරනවා කියලා. ආණ්ඩුව ඇවිත් දැන් අවුරුදු දෙකක් ගිහිල්ලා තිබෙනවා, ඒක වෙලා තිබෙනවාද? මම දැක්කා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කරනවා. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් මගේ වෙලාව නාස්ති කරන්න ඕනෑ නැහැ.

විදුලිය ඒකකයක මිල රුපියල් 7කින් වැඩි වෙලා තිබෙනවා. ඇත්ත තත්ත්වය තමයි ඒක. ඉතින්, විදුලි ඒකකයක මිල රුපියල් 7කින් වැඩි වුණාම අඩු කරන එක නොවෙයි නේ කරන්න තිබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගහලා තිබෙන ගිවිසුමට අනුව තිබෙන්නේ cost-reflective, ඒ කියන්නේ වියදම අනුව තමන්ගේ මිල වෙනස් කරන්න ඕනෑ කියන එක. අන්න ඒ නිසා තමයි අපි එදා ඉඳලා ප්‍රශ්න කළේ, පුනර්ජනනීය බලශක්තිය හදන්නේ නැත්තේ ඇයි කියලා. එහිදී ස්වභාව ධර්මයෙන් ලැබෙන ශක්තියෙන් අපේ වියදම අඩු කරලා, ව්‍යාපාරිකයා හෝ බිස්නස්කාරයා හෝ නැත්නම් ව්‍යවසායකයා හෝ ඔහුට ලබා ගන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. නමුත්, මේ ආණ්ඩුවට යම් විධියක මතයක් තිබෙනවා, ව්‍යවසායකයා හෝ බිස්නස්කාරයා කිව්වාම, "ඒගොල්ලෝ පට්ට හොරු, ඒ අය වැඩක් නැහැ, ඇයි ඔච්චර ලාභ ලබන්නේ" කියලා. ඩීසල් මාෆියාවෙන් විදුලිය නිෂ්පාදනය කරලා අපට තිබෙන සීමිත විදේශ සම්පත පිට රට යවනවාද, නැත්නම් ස්වභාව ධර්මයෙන් අපට ලබා ගන්න පුළුවන් ශක්තිය ලබා ගෙන දේශීය වශයෙන් ව්‍යවසායකයන් ඇති කර ගෙන ඒක ඉදිරියට අරගෙන යනවාද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව - Public Utilities Commission එක - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට ආපු වෙලාවේ අපි මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළා. අපට පෙනුණා එතැන විෂමතාවක් තිබෙනවා කියලා. හැබැයි මට පෙනෙනවා, NSO එක ඒගොල්ලන්ගේ වැඩ කටයුතු කරගෙන යන බවක්. අපි ඒක අගය කරනවා. මොකද, ඒක ඒගොල්ලන්ගේ දේ. ඔවුන් ඒ වැඩේ කරන්න අවශ්‍යයි. හැබැයි, ඊට පස්සේ සමස්තයක් වශයෙන් එදා තිබුණු CEB එක කොටස් 4කට කැඩීම නිසා ඒගොල්ලෝ බලන්නේ ඒගොල්ලන්ගේ කොටස ගැන විතරයි. එතැන suboptimization එකක් තිබෙනවා. ඉතින් මේ කාරණය අනුව මම ආණ්ඩුවට යෝජනා කරන්නේ, කරුණාකරලා මේ ආන්තික පිරිවැය අඩු කරන්න පුළුවන් විධියට වැඩ කරන්න කියන එකයි. ඒක අත්‍යවශ්‍යයි. එමඟින් දේශීය ව්‍යාපාරිකයෝ ඕනෑ තරම් හැදෙනවා. ඒක කොතරම් හොඳද? ඒ හැදීමෙන් තමයි අපට පුළුවන් වෙන්නේ තෙල් මාෆියාව නවත්වන්න. අපට තිබෙන සීමිත සම්පත පිට රට යවන්නේ නැතුව, අපේම ස්වභාව ධර්මයෙන් බලශක්තිය නිෂ්පාදනය කරලා ඊට පිළිතුරු මෙහෙන්ම හදා ගන්න පුළුවන් නම්, ඇයි අපි මේ ප්‍රශ්නය මෙච්චර දුර දිග අරගෙන යන්නේ?

විදුලි බිල්පත් සහන විධියට රුපියල් මිලියන 17,500කට ආසන්න සහනාධාර දෙන්න සිදු වෙලා තිබෙන්නේ බාල ගල් අඟුරු ගෙනාපු නිසයි. *[බාධා කිරීමක්]* නැහැ නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි ඒක කියන්නේ. අපි කිව්වොත් කියයි, ඔන්න මුන් ටික දේශපාලනය වෙනුවෙන් ප්‍රශ්න කරනවා කියලා. ඒගොල්ලන්ම කියපු එකේ එය අන්තර්ගත වෙලා තිබෙනවා නේ. මහජන උපයෝගිතා කොමිසම - Public Utilities Commission of Sri Lanka - කියලා තිබෙනවා, මිල වැඩි කරන්න හේතුවක් විධියට මේක ගන්න බැහැ කියලා; එය ප්‍රශ්නයක් ලෙස තිබෙනවා කියලා. එම නිසා අපි කියන්නේ, කරුණාකරලා පුනර්ජනනීය බලශක්තිය ප්‍රවලිත කරන්න කියලායි.

අපි එදා කිව්වා, මේ BESS - Battery Energy Storage System - එක ගේන්න කියලා. මොකද, ඒක අවශ්‍යයි. දැන් ඒක ගෙනැල්ලා තිබෙනවා. දැනට කිලෝවොට් 200ක ධාරිතාවක් සහිත පද්ධතියක් හදලා තිබෙනවා. තව කිලෝවොට් 200ක්, 300ක් එකතු කරගෙන යනවා. මේවා පුළුවන් තරම් ඇති කරන්න. මොකද, මේවා හදන්න, හදන්න අපේ සීමිත විදේශ සම්පත වැඩි වෙනවා. එතකොට අපේ තිබෙන ඩොලර් ප්‍රමාණය එළියට යවන්න ඕනෑ නැහැ. සාමාන්‍යයෙන් අපේ රටේ සංචිත වැඩි කරන්න අපනයන වැඩි කරන්න ඕනෑ; එහෙම නැත්නම් ආනයනය අඩු කරන්න ඕනෑ. ඒ දෙකෙන්ම ඩොලර් ටික වැඩි වෙනවා. ඒක වෙන්නේ නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. ඒක වෙන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නයත් දැන් තිබෙනවා.

අපි ඒක කියන ගමන් කියන්න ඕනෑ, මහජන උපයෝගිතා කොමිසම BESS එකට රුපියල් 48ක, රුපියල් 54ක මිලක් දුන්නා කියා ලොකු ආන්දෝලනයක් ඇති වෙලා තිබෙන බව. BESS එකට රුපියල් 18ක් ගෙවන කොට සූර්ය බලයෙන් නිෂ්පාදනය කරන විදුලිය ඒකකයකට රුපියල් 18ක්, නැත්නම් රුපියල් 20ක් ගෙවන කොට, ඒ දෙක එකතු කරලා ලබා දෙන මිලට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන කාරණය තමයි මා කියන්නේ. ඒ නිසා මේක නිවැරදි කරන්නම අවශ්‍යයි. මේ ආණ්ඩුව තෙල්වලින් විදුලිය ඒකකයක් නිපදවන්න ලජ්ජා නැතුව රුපියල් 150ක් වියදම් කරනවා. කිසිම හිරිකිතභාවයක් නැතුව ඒ සඳහා තෙල් වැය කරනවා.

"සහස්දනව්" කියන කොම්පැනිය හොඳ කොම්පැනියක්. නමුත්, ඒගොල්ලෝ ව්‍යාපාර කරනවා. එක් විදුලිය ඒකකයක් සඳහා රුපියල් 85ත්, 90ත් අතර ගණනක් ගෙවන්න ඒ ව්‍යාපාරය අවුරුදු 15කට අත්සන් කරනවා. අද LNGවලින් නිෂ්පාදනය කළත්, එක් ඒකකයක් රුපියල් 75කට වඩා වැඩි වෙනවා. ඒ නිසා අපට අවශ්‍ය වෙන්නේ මේකේ ඉදිරි දැක්මක් සහිත strategic content එකක්; ඒ කියන්නේ, ඉදිරියට යන්න පුළුවන් මාර්ගයක්. එවැන්නක් නොමැති වීම තමයි අපට තිබෙන බය.

2026 දෙසැම්බර් 31වන කල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක ඉවර වුණාට පසුව තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක අද ප්‍රශ්නාර්ථයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. විපක්ෂයෙන් දෙයක් කිව්වාම ආණ්ඩුවට ඒක අරහං. එහෙම නොකර මේ කියන දේවලුත් සැලකිල්ලට ගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තවත් මිනිත්තු 5ක් තිබෙනවා කියලා නේ, ඔබතුමා කිව්වේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2යි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ, මට තවත් විනාඩි දෙකක් දෙන්න. මොකද, හුඟක් කරුණු තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කියන්න.

මේ කියන දේවල් ක්‍රියාත්මක කිරීම තුළ ඔබට පුළුවන් වෙනවා, මෙහි ඉදිරි ගමන ශක්තිමත් කර ගන්න. ඕනෑම අවුරුද්දක රටේ ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා. මම කිව්වා වාගේ යුද්ධ කාලයේ වුණත් රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3 ඉඳන් සියයට 6 දක්වා වැඩි වෙලා තිබෙනවා නේ. මොකද, අපේ රටේ ආර්ථික වර්ධන වේගය ගණනය කරන්නේ වියදම ගණනය කරලා ඒකට අනුවයි. රටේ සියයට 5ක, සියයට 10ක විදුලි ඉල්ලුමක් තිබෙන කොට 2032 වන කොට නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරයේ තිබෙන මැෂින් 3 වෙනස් කරලා ගල් අඟුරුවලින් විදුලිබලය නිපදවීම නතර කරන අවස්ථාවේ අපි විදුලිය ජනනය කරන අලුත් ක්‍රමවේද ඇති කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඒ නිසා පුනර්ජනනීය බලශක්තිය පුළුවන් තරම් ප්‍රචලිත කරන්න කටයුතු කරන්න.

ඒ වාගේම තමයි බාල ගල් අඟුරු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයත්. ඉදිරියේදී විදුලිය නිෂ්පාදනය කිරීම පිළිබඳ නිසි වැඩ පිළිවෙළක් නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. දැන් power wheeling වාගේ දේවල් මෙහේ නිෂ්පාදනය කරලා වෙනත් තැන්වලට විකුණන්න පුළුවන් ක්‍රම ගෙන එන්න අවශ්‍යයි. ඒවා පුළුවන් තරම් ඉක්මනට කරන්න.

මම මේ මොහොතේ කියන්න කැමැතියි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරිපත් කළ කරුණු කිහිපයක්. Today, they had a conference with the media, which was a reflection on the seventh tranche to Sri Lanka. There, they were very diplomatically saying that the Government has to do many things. My Colleagues and I at the Committee on Public Finance have always been fighting for a national economic result rather than a colourized one. There are certain institutions handling these affairs. The Government does its job and the Central Bank has got to do their job. But, we have been reflecting on the Central Bank's approach to achieve its core objectives. One is, reducing unemployment, which has not happened. You must have seen the IMF report stating, taking into consideration the age factor of the youth, that the highest youth unemployment rate in the world is in Sri Lanka, which is at 43 per cent.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me two more minutes.

Therefore, unemployment among them needs to be addressed.

Then, with regard to the control of inflation, out of ten quarters, eight have missed the mark. Also, with regard to stabilization of the business cycle, the businessmen will tell you how stabilized it is. I am happy that my Colleague, the Minister of Labour and Deputy Minister of Finance and Planning, is coming in. I am sure he would like to hear these things because his mouth is gagged when it comes to speaking about certain areas. So, we have to get him to speak his mind so that he would reflect certain ideas. He tells one thing to the media and has to live with the other things that are there.

Then, if we take the fiscal policy of Sri Lanka, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තුවක කාලයක් තමයි ඕනෑ.

Under the fiscal policy, contraction is the approach the Central Bank is taking as an anti-inflationary approach. But, that is not so because it is not a demand-driven inflation that we have in this country, but an imported inflation. So, there is no point in contracting the economy by taking the money supply out, when it is an imported inflation that we have, and there is no remedial action taken on that.

Then, again, if we go back to the fiscal policy on taxation and Government spending, taxation has been maximized and Government's spending has been minimized. So, you have a primary surplus, but there is no growth factor. Why I am saying this is because you have to have a strong economy. With the IMF Agreement coming to an end, how are we going to increase our foreign reserves?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. මීට වැඩිය කාලය දෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව තත්පර කිහිපයයි ගන්නේ.

I am asking about the foreign reserves. We have to reach a target of US Dollars 9.2 billion in foreign reserves, which was corrected to US Dollars 8.8 billion. We have US Dollars 6.9 billion of reserves today. Are you getting US Dollars 400 million? No. Now, I appreciate the Governor of the Central Bank. He may have tripped over his own feet and is now saying that there must be an organic growth in the reserves. So, on that basis, what was basically mentioned by the IMF at the media conference was that the Government must reconsider moving forward and not -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.23]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබීම මට සතුටට කරුණක්. අපනයනය සම්බන්ධව කථා කරද්දි ලෝක වෙළෙඳ පොළට, එහෙම නැත්නම් යම් මට්ටමකට සංවර්ධනය වෙච්ච රටකට අපේ රට වාගේ රටකින් භාණ්ඩයක් අපනයනය කිරීමේදී ඒක යම් දුෂ්කර කටයුත්තක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට බලපාන ප්‍රධාන කාරණයක් තමයි, අපට ඒ භාණ්ඩය සම්බන්ධව තිබෙන ප්‍රමාණාත්මක තත්ත්වය, මේ භාණ්ඩය ජාත්‍යන්තර වෙළෙඳ පොළට අඛණ්ඩව සපයන්න පුළුවන් හැකියාව තිබෙනවාද කියන එක. භාණ්ඩයක් අපනයනය කිරීම සම්බන්ධයෙන් ගත්තාම, අපට පුළුවන් කාලය, අපේ season එක, එහෙම නැත්නම් අපේ භාණ්ඩයේ සුලබතාව, එහෙමත් නැත්නම් භාණ්ඩයේ තිබෙන තොග තත්ත්වය සලකා බලා ඕනෑ ඕනෑ වෙලාවට ඒ භාණ්ඩය අපනයනය කරන්න අපට බැහැ. එම නිසා අපේ ප්‍රමුඛතම කාර්යභාරය බවට පත් වන්න ඕනෑ, අඛණ්ඩව භාණ්ඩ සැපයීමේ හැකියාව වර්ධනය කර ගැනීමයි.

දෙවැනි කාරණය තමයි, ඒ භාණ්ඩයේ ගුණාත්මකභාවය. අපි ජාත්‍යන්තර වෙළෙඳ පොළට යම් භාණ්ඩයක් අපනයනය කරද්දි සමාජ සංවර්ධනය, ආර්ථික සංවර්ධනය අනුව ලෝකයේ විවිධ රටවලට ඒ භාණ්ඩයේ තිබෙන ගුණාත්මකභාවය විවිධ වනවා. එම නිසා භාණ්ඩයකට හොඳ ආර්ථික මිලක් ලබා ගන්න නම් ඒ භාණ්ඩය සම්බන්ධව යම් ආර්ථික ශක්තියක් තිබෙන රටකට තමයි අපට ඒ භාණ්ඩය අපනයනය කරන්න සිද්ධ වන්නේ. ඒ නිසාම අපි සැලකිලිමත් වන්න ඕනෑ, ඒ රටේ ජනතාවට තිබෙන හැකියාව වාගේම ඒ රටේ ජනතාව තුළ ඒ භාණ්ඩ සම්බන්ධව තිබෙන ආකල්පය සහ ඒ භාණ්ඩයේ quality එක සම්බන්ධව. හැබැයි ලෝක වෙළෙඳ පොළ තුළ එහෙම හැසිරෙද්දි මේ භාණ්ඩ අඛණ්ඩව සපයන්න පුළුවන් හැකියාව අපි බොහෝ විට සැලකිල්ලට ගන්නේ නැහැ. මහා පරිමාණයේ ඉඩමක් අත්පත් කරගෙන, මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙක් මැදිහත් වෙලා, මහා පරිමාණයෙන් මේ භාණ්ඩය නිෂ්පාදනය කිරීම තමයි අපට මතක් වන්නේ. මොකද, ඒ භාණ්ඩය අඛණ්ඩව දෙන්න නම් අපට අඛණ්ඩ නිෂ්පාදනයක් තිබෙන්න ඕනෑ, අඛණ්ඩව ගබඩා කරගැනීමේ හැකියාවක් තිබෙන්න ඕනෑ, දැවැන්ත වෙළෙඳ පොළක් සොයා ගැනීමේ හැකියාවක් තිබෙන්න ඕනෑ.

හැබැයි, ලෝකයේ මේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි අපේ රට ගත්තත්, ලෝකයේ රටවල් කිහිපයක ගත්තත්, අද හූ සැලසුම අනුව, විවිධ ප්‍රදේශවල geological identification එක අනුව භාණ්ඩයේ තිබෙන quality එක වෙනස් වනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන භාණ්ඩයක රස, භාණ්ඩයක quality එක නොවෙයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ භාණ්ඩයක තිබෙන තත්ත්වය. මේ විවිධත්වය අපේ රටේ ඉතාම හොඳින් පවතිනවා. ඒ විවිධත්වයේ පැවැත්ම සඳහා අපේ රටේ ව්‍යුහාත්මක පිහිටීමත් බලපානවා. කෙටි දුරක් ඇතුළත ශීඝ්‍රයෙන් උෂ්ණත්ව වෙනස් වීමක් දක්නට ලැබෙන රටක් විධියට අපේ රටේ වැල්ලවායේ තිබෙන උෂ්ණත්වය නොවෙයි, කිලෝමීටර 32ක් ගියාට පස්සේ හපුතලේ තිබෙන්නේ. කෙටි දුරක් ඇතුළත දේශගුණයේ ලොකු වෙනස්කමක් තිබෙන නිසාම වැල්ලවායේ තිබෙන කොමඩු ගෙඩියක රස නොවෙයි හපුතලේ පැත්තේ ඒවායේ තිබෙන්නේ; ඒක වෙනස් වනවා. ඒ වගා කිරීමේදී සාරවත් අස්වැන්නක් ලබා ගැනීමේ හැකියාවත් විවිධ වනවා. එම නිසා එක තැනක තිබෙන මහා පරිමාණයේ දැවැන්ත සමාගමක් මඟින් අපනයන කෘෂි කර්මාන්තය ඉලක්ක කරලා භාණ්ඩයක් නිෂ්පාදනය කරනවාට වැඩිය ලෝකය දැන් සැලකිලිමත් වන්නේ විවිධ දේශගුණික තත්ත්වයන් අනුව, විවිධ ජෛව විවිධත්ව අනුව, විවිධ කාලගුණික තත්ත්වයන් අනුව, විවිධ හැඩයෙන් විවිධ විධියට නිෂ්පාදනය කරන භාණ්ඩ එකතු කරලා යම් රටකට අපනයනය කරනවාද කියන එක පිළිබඳවයි.

මේ ආණ්ඩුව ආපු ගමන්ම geological identification එක අනුව කුරුඳු වගා කරන්න කටයුතු කළා. අපි මීට කලින් ඒ තත්ත්වය අත්පත් කරගෙන තිබුණේ නැහැ. "ශ්‍රී ලංකා කුරුඳු" කියලා, "ශ්‍රී ලංකා ඉඟුරු" කියලා, "ශ්‍රී ලංකා ගම්මිරිස්" කියලා වාගේම, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රදේශය මූලික කරගෙන "ගම්පහ-බියගම ඉඟුරු", "ගම්පහ-බියගම කුරුඳු" කියලා රට පුරා ප්‍රචලිත කරනවා වාගේම ජාත්‍යන්තර වශයෙන් ඒ identification එකෙන්ම මෙම භාණ්ඩ දෙන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, බියගම ගත්තොත්, එහෙම නැත්නම් ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, අපට මහා පරිමාණ භූමි ප්‍රමාණයක් නැහැ, ඒ ආර්ථික ඉලක්කයට යන්න. හැබැයි ඒකට ලෝකයේ ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය තමයි, තැන් තැන්වල සුළු පරිමාණයෙන් එකතු කරන භාණ්ඩ quality එකක් සහිතව එක තැනකට එකතු කරගැනීම. ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක් තිබෙනවා. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13හි විවිධත්වය පාවිච්චි කරලා ඒ භාණ්ඩ එක තැනකට එකතු කරනවා. මේකෙදි ගොවි සමිති ආකෘතියකට වඩා, ලාභ ලබන ව්‍යාපාරයක් විධියට, ගොවි සමාගම් විධියට ඉස්සරහට ගෙන යන්න පුළුවන් නම් හොඳයි. ලේඛනගත නොකළ සමාගම් විධියට ඒවා සමාගම් මැදුරේ ලියාපදිංචි කරන්නත් අවස්ථාව තිබෙනවා. ඒ භාණ්ඩය නිෂ්පාදනය කර ගන්නකොට අපට මෙන්න මේ විධියට එය කරන්න පුළුවන්කම තිබෙනවා නම් ඒ භාණ්ඩ විශේෂ භාණ්ඩ බවට පත් වනවා. විශේෂයෙන්ම ඔවුන් කෘෂිකාර්මික භාණ්ඩයක් ලබා ගන්නේම එහි යම් විශේෂත්වයක් තිබෙනවා නම් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය පුරාම තිබෙන්නේ, රන්ගූන් ඉඟුරු. ඒවා චීනයෙන් තමයි ලෝක වෙළෙඳ පොළට එන්නේ. හැබැයි, අපේ පරණ දේශීය ඉඟුරුවලට වඩා ඒවා හාත්පසින්ම වෙනස්. අපේ දේශීය ඉඟුරුවල තිබෙන ජල ප්‍රමාණය අඩුයි, සැර ප්‍රමාණය වැඩියි. ඒ නිසා පොඩි ප්‍රමාණයකින් වැඩි සැරක්, වැඩි taste එකක් ගන්න පුළුවන්. නමුත් අපි අසමත් වෙලා තිබෙනවා, එහෙම වගා කරන්න පුළුවන් ප්‍රදේශ හඳුනාගෙන ඒ ක්ෂේත්‍රය දියුණු කරන්න.

උදාහරණයක් විධියට අපි බියගම ගනිමු. එහි ග්‍රාම නිලධාරි වසම් 49ක් තිබෙනවා. ඒ වසම් 49ම අඩුම තරමින් පර්චස් හතරේ, හතරේ හරි ඉඟුරු වවන්න සලස්වා ඒ ඉඟුරු ටික එක තැනකට එකතු කරලා, අනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වවන ඉඟුරු ටිකත් එකතු කරලා තනි සමාගමක් විධියට හදාගෙන ඒ සමාගමට ලෝක වෙළෙඳ පොළ විවෘත කරගන්න පුළුවන් නම් හොඳයි. කෘෂිකර්ම නවෝත්පාදන සංවර්ධන වැඩ පිළිවෙළක් යටතේ අපට ඒක හදාගන්න පුළුවන්. මේ වනකොටත් අමාත්‍යාංශය විධියට ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. කෘෂි කර්මාන්තයට අදාළව යාය සමාගම් හදනවා වාගේම කෘෂි කර්මාන්තයට අදාළව දේශීය ඉඟුරු සමාගමක් වසම් මට්ටමින් නිර්මාණය කර ගන්න පුළුවන් නම්, ඒ වසම් එකතු කරලා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගන්න පුළුවන් නම්, එක එක පළාත්වලට වෙනම geological identification එකක්, රසක් සහිතව ලෝක වෙළෙඳ පොළට ඉඟුරු ලබා දෙන්න අපට පුළුවන් වනවා. එවිට රන්ගූන් ඉඟුරුවලට වඩා ඉතාම වෙනස් රසයක්, ගුණයක් සහිත දෙයක් බවට අපේ රටේ ඉඟුරු පත් කර ගන්න පුළුවන්. කහවලටත් මේ විධියමයි. ඒ වාගේම හුළංකීරිය වැනි භෝගයකින් ගන්න පිටි එකකින් තමයි "සස්ටජන්" කියන පිටි වර්ගය හදන්නේත්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
අපට මෙන්න මේ විධියට ඒ විවිධත්වය අනුගමනය කරන්න නම් අමාත්‍යාංශයේ දැන් තිබෙන පරිපාලන ක්‍රමවේදය වෙනස් වන්න ඕනෑ. ඒ පරිපාලන ක්‍රමවේදය අදට ගැළපෙන්නේ නැත්නම් ඒක අණ පනත් මඟින් හෝ වෙනස් කිරීමේ වගකීම ජනතාව අපට පවරා තිබෙනවා. ඒ වාගේම ඒ අදාළ භෝගය මොකක්ද කියලා අපි හඳුනාගන්න ඕනෑ; වැවිලිවලට අදාළ භෝග මොනවාද, කෘෂි භෝගවලට අදාළ මොනවාද කියලා අපි බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය ඉතාම සීමිතයි. තව තත්පර කිහිපයක් විතරක් ඔබතුමාට දෙන්නම්.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විධියට භෝග හඳුනාගෙන කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒ සමාගම්වලින් එන අස්වැන්න එක තැනකට කේන්ද්‍රගත කරගෙන ඒවායේ ගුණාත්මකභාවය සහිතව අපනයනය කරන්න පුළුවන්. අපට කෘෂි භෝග අපනයනය කරන්න සිදු වෙලා තිබෙන්නේ ගුවන් මඟින්. එම නිසා ඒ සඳහා ගුවන් තොටුපොළේ තිබෙන නිරෝධායන පහසුකම් වැඩිදියුණු කරන්න ඕනෑ. අඹ යවනවා නම්, ඒ අඹ සෞඛ්‍යාරක්ෂිතව නිරෝධායනය කරන්න ගුවන් තොටුපොළේදී හැකියාව තිබෙනවා නම්, එතැනදීම ඒ සම්බන්ධ වාර්තාව ගන්න පුළුවන්කම තිබෙනවා නම්, අපට ඒ කටයුතු පහසු වෙනවා. ඒ අනුව වැඩි මිලක් නොගෙවා, එම කටයුතු කිරීමේ පහසුකම් දැනටමත් අපි සූදානම් කර තිබෙනවා.

වසර ගණනාවක් තිස්සේ මේ ක්ෂේත්‍ර ගැන අවබෝධයක් ලබා ගන්න, ඒ සම්බන්ධව මැදිහත්වීමක් කරලා තිබුණේ නැහැ. එම නිසා ලෝක වෙළෙඳ පොළේ පවතින තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට අපේ රටේ අපනයන භෝග ඉහළ මට්ටමට ඔසවන්න මේ පනත බොහෝ සේ ඉවහල් වනවා. ඒ සම්බන්ධයෙන් මැදිහත් වන්න අවස්ථාව ලැබීම පිළිබඳව මගේ සතුට ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.32]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සහ බලශක්තිය සම්බන්ධයෙන් කථා කිරීමට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම කියනවා නම්, කෘෂිකර්ම අපනයන භෝග මහනුවර දිස්ත්‍රික්කය පුරාම වගා කරනවා. විශේෂයෙන්ම ලෝකයේ තිබෙන හොඳම කරාබුනැටි, ගම්මිරිස්, ඉඟුරු වැනි භෝග මහනුවර දිස්ත්‍රික්කයේ බහුලව වගා කරනවා. ඒ වාගේම අපේ ලාල් කාන්ත ඇමතිතුමාගේ මූලිකත්වයෙන් ගම්පොල ආසනයේ "අපනයන කෘෂි මහිම පොකුරු ගම්මාන වැඩසටහන" කරන්න අපට පුළුවන් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කුළු බඩු ව්‍යාපාරිකයෙක්. මම කුළු බඩු කඩ දෙකක්, තුනක් තිබෙන ව්‍යාපාරිකයෙක්. ඒ හින්දා මම කුළු බඩු ගැන ඇත්තටම දන්නවා. ගරු ඇමතිතුමනි, ලංකාවේ කුළු බඩු සම්බන්ධයෙන් ඇත්තටම තිබෙන ලොකුම ගැටලුව තමයි, නියමිත කාලයට කලින්, ඒ කියන්නේ පැහෙන්න කලින් ඒ භෝග කඩලා කඩවලට ගෙනැත් දීම. ඇත්තටම සමහර උදවිය බුබුළු කාලයේදී ගම්මිරිස් කඩනවා. එහෙම කැඩුවාම අමු ගම්මිරිස් කිලෝ 8ක් විතර වුවමනා වනවා, වේළා ගත්ත ගම්මිරිස් කිලෝ එකක් හදන්න. ඒ ගම්මිරිස් හොඳට පැහුණාට පස්සේ නම් අමු ගම්මිරිස් කිලෝ දෙකහමාරකින් විතර වියළි ගම්මිරිස් කිලෝ එකක් හදාගන්න පුළුවන්. ඒ තුළින් අපට විශාල ආර්ථික වාසියක් ලැබෙනවා වාගේම විදේශ රටවලට අපනයනය කරලා ඩොලර් උපයා ගැනීමටත් අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම වියට්නාම රජයෙන් තීරණයක් ගන්නා කාලයේදී තමයි අපි ගම්මිරිස් කඩන්න ඕනෑ. ලංකාවේ එක එක ප්‍රදේශවල, එක එක කාලයට තමයි ඇත්තටම මේ භෝග වගා කරන්නේ. බදුල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, සමහර විට මාස තුනක් වැඩියි, නුවර දිස්ත්‍රික්කය ගත්තොත්, මාස තුනක් පහුවෙනවා. ඒ හින්දා ඉදිරි කාලයේදී මේ සම්බන්ධයෙන් නිවැරදි තීන්දු තීරණ අපි ගත්තොත්, ලංකාවට ලොකු මුදලකුත් ලබා ගත හැකි වනවා වාගේම අපට ආර්ථික වශයෙනුත් - ඩොලර් අතිනුත් - ශක්තිමත් විය හැකියි.

ඉඟුරු සම්බන්ධයෙනුත් අද ගොඩක් මන්ත්‍රීවරුන් කථා කළා. මහනුවර ප්‍රදේශයේ ඉඟුරු තිබෙනවා. ගමේ ඉඟුරු ගලවලා සාමාන්‍යයෙන් අපට මාසයක් වුණත් ඇත්තටම තියාගන්න පුළුවන්. ඒ වුණාට අලවිච ප්‍රදේශයේ වගා කරන ඉඟුරු සතියක්වත් තියාගන්න බැහැ. ඒ ඉඟුරුවල සැරත් අඩුයි. ඒ නිසා ගමේ ඉඟුරු ටික වගා කරන්න ඒ මිනිසුන්ට අවස්ථාව දීලා, කෘෂිකර්ම අමාත්‍යාංශය ඒවාට අවශ්‍ය බීජ ලබා දීලා ඒවාට උනන්දු කරවන්න ඕනෑ. ලංකාවේ හෙක්ටයාර 40,000ක විතර භූමි ප්‍රදේශයක ගම්මිරිස් වගා කරනවා.

ග්‍රාමීය ප්‍රදේශවල සමහර උදවිය අවුරුද්දකට අවශ්‍ය සම්පූර්ණ වියදම උපයා ගන්නේ මේ කෘෂි කර්මාන්තය තුළින්. ඒ නිසා අපි ලංකාවේ කෘෂි කර්මාන්තය අනිවාර්යයෙන්ම නඟාසිටුවන්න ඕනෑ. ලංකාව කියන්නේ කෘෂිකාර්මික රටක්. රජය විධියට අපි දැන් ගොවීන්ට dryers දෙනවා. ඇත්තටම ඒ කාලයේ dryers දෙනකොට හිටපු ඇමතිවරුන් කියනවා, ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගෙන් ලියුමක් ඕනෑය කියලා. දැන් එහෙම එකක් නැහැ. ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ගිහිල්ලා ඒ බලධාරීන්ට කියපු ගමන් රජයෙන් සියයට 50කුත්, ඒ ගන්නා කෙනාගෙන් සියයට 50ක දායකත්වයකුත් තුළින් ඒ dryers ටික ලබා ගන්න පුළුවන්. ඒ තුළින් අපට වැහි කාලයේදී වුණත් ඒ බඩු ටික වේළාගන්න, අවශ්‍ය quality එකට තබාගන්න පුළුවන් වනවා.

මගේ පෞද්ගලික කාරණයකුත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මීට මාස දෙකකට විතර කලින් YouTube එකේ හැමදාම සඳහන් වුණා, මීට අවුරුදු 25කට කලින් අපේ තාත්තාගේ කාලයේ මට හම්බ වෙච්ච කඩයක් පිළිබඳව. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ගම්පොල අපේ ප්‍රාදේශීය ලේකම්තුමියත් ඒ හින්දා මම එළෙව්වා කියලා බොරු ප්‍රචාරයක් අරගෙන යනවා. ඇත්තම කියනවා නම්, මීට අවුරුදු 25කට කලින් ෂරුක් හාජ්ජියාර් කියන කෙනාට තමයි නගර සභාවෙන් CTB එකට අයිති මේ ඉඩම බදු පදනම මත ලබා දී තිබෙන්නේ. ඊට පස්සේ එක්කෙනෙක් මේක කරගෙන ඉන්න කොට තමයි මගේ නමට ඇත්තටම අරගෙන තිබෙන්නේ. ඒ ගැනත් මම කියන්න ඕනෑ.

ඒ වාගේම YouTube එකේ ඒ මනුස්සයාම සඳහන් කරලා තිබුණා, ලොකු මුදලක් "දිට්වා" ව්‍යසනය වෙලාවේදී මට හම්බ වුණා කියලා; චෙක් එකක් ලැබුණා කියලා වාගේ වචනයක් පාවිච්චි කරලා තිබුණා. ඇත්තම කියනවා නම්, මට රුපියල් මිලියන 100ක විතරක් පාඩුවක් වුණා. මට විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, ගම්පොල ප්‍රදේශයේ ඉන්න ගොඩක් ව්‍යාපාරිකයින්ට රුපියල් මිලියන 300ක්, 400ක් වාගේ විශාල අලාභ හානි සිද්ධ වුණු බව. ඒ වුණාට මටත් අනෙක් අයට වාගේම business registration එක තිබ්බ හින්දා තමයි රුපියල් ලක්ෂ දෙකක් ලබා දුන්නේ.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා, කලින් ආණ්ඩු කාලයේ බෙහෙත් ගන්න සිංගප්පූරුවට යන්න රුපියල් ලක්ෂ 300ක්, අරගළය කාලයේ හානිවෙච්ච ගෙවල්වලට රුපියල් ලක්ෂ 700ක්, 600ක්, 500ක් ලබා ගත්තා කියලා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් තිබෙනවා. සාමාන්‍ය මනුස්සයාට ලැබෙන දෙයක් තමයි අපටත් ලැබෙන්නේ. ඒ විධියට තමයි මටත් ලැබුණේ. ඔක්කෝටම දීලා අවසාන කණ්ඩායමට දෙනකොට තමයි මට ඒ මුදල ලබා දුන්නේ.

තව YouTubeකාරයෙක්, අපේ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අට දෙනාටම එක දිගට මඩ ප්‍රහාර එල්ල කරනවා. ඔබතුමන්ලා දන්නවා, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් 15දෙනෙකුට විතර ඊයේ දඬුවම් ලබා දුන්නා කියලා. ඒ ගැන ඇත්තටම සතුටුයි. පාස්කු ප්‍රහාරයේ හිටපු සහරාන් ගෝඨාභයලාත් එක්ක, මහින්දලාත් එක්ක, විමල් වීරවංශත් එක්ක, ගම්මන්පිලත් එක්ක ඉන්න photos අපේ ළඟ තිබෙනවා. අවශ්‍ය නම් අපට ඒවා ලබා දෙන්න පුළුවන්.

දැන් අනෝජන් සම්බන්ධවත් කථා කරනවා. මම පෞද්ගලිකව පිළිගන්නේ නැහැ, කුමන හෝ ආගමක නායකයෙකුට විරුද්ධව කවුරු හරි ඒ වාගේ ප්‍රචාරයක් කරන එක ගැන. නමුත් ඔහු ශ්‍රී ලාංකිකයෙක්. අනෝජන් කියන්නේ, අපේ සහෝදර ජනතාවගේ ඥාතියෙක්. ඒ මනුස්සයාව අපි බේරාගන්න ඕනෑ. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරුන් 21දෙනාම අත්සන් කරලා ඉල්ලීමක් කළා. ගරු ජනාධිපතිතුමා, විදේශ කටයුතු ඇමතිතුමා සෑහෙන මැදිහත්වීමක් කරනවා, ඔහුව නිදහස් කරගන්න. ඇත්තටම නබි නායකතුමා, එතුමාගේ ඔළුවට කුණු මල්ලක් දාපු කෙනාටත් සමාව දීලා තිබෙනවා. ශ්‍රී ලාංකික ජනතාව විධියට මේ පාර්ලිමේන්තුවේ ඉන්න අප සියලුදෙනාම මැදිහත්වෙලා ඔහුගේ ජීවිතය අනිවාර්යයෙන්ම බේරාගන්න කටයුතු කරන්න ඕනෑ.

"දිට්වා" ආපදාවට ලක්වෙච්ච මිනිස්සු අද ගොඩක් අමාරුවෙන් තමයි ජීවත් වන්නේ. ඒ මිනිස්සුන්ට අපි රජයක් හැටියට රුපියල් 25,000ක් දුන්නා, රුපියල් 50,000ක් දුන්නා. "දිට්වා" ආපදාවට ලක් වෙලා, ඒ මුදල් ලැබිච්ච නැති අයට රුපියල් ලක්ෂ දෙකක් දෙන්න ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා. ඒ සුදුසු අයට ඉදිරියේදී ඒ මුදල් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

අපි රජයක් විධියට ඉදිරියේදී මේ රට ගොඩ නඟන්නත්, කෘෂිකර්ම ක්ෂේත්‍රය දියුණු කරන්නත් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.40]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற ஏற்றுமதிக் கமத்தொழில் ஊக்குவிப்பு (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு முக்கியமான சில விடயங்களைக் கூற வேண்டும்.

Hon. Presiding Member, I would like to mention that Maitreyi Ramakrishnan, a beloved daughter from Canada had publicly claimed that she was born in Tamil Eelam. And, her Netflix film has received poor ratings due to some racist comments made on social media. Now, that has become a very popular topic on social media. That small kid's mother and father came from Jaffna and during wartime, had migrated to Canada. She has acted in a film on Netflix and now, she is a very popular character as well as a popular actress in Canada. We, as Sri Lankans and as Eelam people, must be very proud of that achievement. But, unfortunately, I saw that a very few of my Sinhalese racist friends have been commenting and giving bad comments on social media about her film on Netflix, getting her ratings to go down. So, I would like to ask our Sinhalese friends to stop making that kind of racist comments.

If you take the Tamil version of the National Anthem of Sri Lanka, it states, "ஈழ சிரோமணி தாயே!". In the 1700s and the 1800s, Sri Lanka was called "Eelam" in Tamil. Later on, it was called "Ceylon" and then, it had been changed to "Sri Lanka". Even in my first speech in this august Assembly, I mentioned that I am from Tamil Eelam. Then, I was taken to the CID and enquired. I showed them that the word "Eelam" is also in our National Anthem and that, therefore, I said that I am from Tamil Eelam. Then, they stopped conducting the investigation. Recently, making my remarks on the *Pohottuwa* stage, I said, "I will not ask for Tamil Eelam." But, that is something totally different. If you take the Tamil Eelam concept, we were born in Eelam, but unfortunately, we fought for a Tamil Eelam and lost because of the actions of Ranil Wickremesinghe. He agreed a couple of days back that he was the one who divided the LTTE into two.

අපේ ඉලංකුමාරන් යාළුවාට එහෙම ඉංග්‍රීසි තේරෙන්නේ නැහැ. ඒ නිසා headset එක දාගෙන ඉන්නවා. මම අපේ සිංහල ජනතාවගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ශ්‍රී ලාංකිකයෙක්

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

ගිහිල්ලා Netflix එකේ star වනකොට අපි racist විධියට comment කරලා, එයාගේ ratings අඩු කරනවා කියන්නේ, අප කොච්චර වැඩ කරලා,- අපි හැම stage එකකටම නැඟලා කියනවා, අපට දැනට මුකුත් එපා,-*[බාධා කිරීමක්]*

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අත ඔසවනවා. එතුමාට අවස්ථාව දෙන්නකෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் மூன்று மொழியிலும் interpretation இடம்பெறுகின்றது. இந்தப் பாராளுமன்றத்தில் மொழி உரிமை பேணப்படுகின்றது. நீங்கள் ஆங்கிலத்தில் உரையாற்றுவதை headsetமூலம் தமிழ் மொழியில் கேட்க முடியும். எனவே, பாராளுமன்ற அமர்வு இடம்பெறும்போது உரைபெயர்ப்பு இடம்பெறுகின்றது என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ඔබතුමා කථා කරන්න, ගරු අර්චුනා මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Presiding Member. The Hon. Ilankumaran spoke for about one minute. So, let me speak for one more minute. I do not think he can understand. So, he is wearing the headset. Anyway, it is not a problem. Unfortunately, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කියන ඒ අදහස ඇත්ත. ඔබතුමා කාටවත් ප්‍රශ්නයක් නොවන විධියට කථා කරන්න. එතකොට ප්‍රශ්නයක් නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Yes. Sir, you also have taken another 16 seconds. So, I guess I will take another minute extra.

Unfortunately, these people do not understand the languages; they do not understand the concept. They might be wearing headsets because they do not understand what we are saying. Probably, you can understand what I am asking for. We are asking the Sinhala community to stop making those kinds of racist comments, bringing down Netflix ratings. That is what I am asking for. Our poor people from the Northern Province have elected some

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

from the Northern Province, who do not understand anything I say in Sinhala or English. I am so sorry for that.

நான் இந்த விடயத்தைத் தமிழில் சொல்ல ஆசைப்படுகின்றேன். இப்போது இந்தச் செம்மறிகளுக்கு வடிவாக விளங்குமென நினைக்கின்றேன். நான் இந்தப் பாராளுமன்றத்தில் ஆற்றிய முதலாவது உரையில், ' தமிழீழம்' என்றுதான் சொல்லி இருக்கிறேன். எங்களுடைய National Anthemஇல் 'ஈழம்' என்ற சொல் பாவிக்கப்பட்டு இருக்கின்றது. 'ஈழ சிரோமணி தாயே' என்பது 'ஸ்ரீ லங்கா'வைக் குறிக்கின்றது. நீங்கள் CIDக்குச் சென்றாலும் சரி, எங்கு சென்றாலும் சரி, ஓர் ஆணியையும் பிடுங்க இயலாது. ඇණයක්වත් ගලවන්න බැහැ. මම තව එකක් කියන්න කැමැතියි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்போது வடக்கு மாகாணத்தில் திலீபன் அண்ணாவுடைய சிலையை வைத்து அரசியல் நடக்கிறது. அந்த சொப்பன சுந்தரி யாருக்குச் சொந்தம் என்ற பிரச்சினை இருக்கின்றது. இலங்கைத் தமிழரசுக் கட்சி சொல்கின்றது, தாங்கள்தான் விடுதலைப் புலிகளுடைய ஏகப் பிரதிநிதிகள் என்று. சைக்கிள் சின்னத்தைக் கொண்ட கட்சியினர் சொல்கின்றார்கள், தாங்கள்தான் விடுதலைப் புலிகளுடைய ஏகப் பிரதிநிதிகள் என்று. என்றோ ஒரு நாள், ஒருவன் எங்களுக்காக 12 நாட்கள் உண்ணாவிரதமிருந்து உயிர்துறந்து இருக்கிறான். அவருடைய சிலைக்கு இந்தச் செம்மறிகள் போய் பூ மாலை போட்டிருக்கின்றன. இந்த நாலு கால் விலங்குகள்கூட போய் பூ மாலை போட்டிருக்கின்றன. Inquiryஐ start பண்ணுவ தென்றால், இங்கிருந்து start பண்ண வேண்டும். அரசியலுக்காக அநுர குமார திஸாநாயக்கவும், சைக்கிள் சின்னத்தைக் கொண்ட கட்சியினரும், வீட்டுச் சின்னத்தைக் கொண்ட கட்சியினரும் எங்களுடைய மாவீரர் திலீபனைப் பாவித்துக்கொண்டு இருக்கிறார்கள். ஆனால், நான் பாவிப்பதில்லை. ஏனெனில், எனக்கு அந்தத் தேவையில்லை. இன்னொருவரின் வலியையும் சாவையும் வைத்து அரசியல் செய்வதற்கு நான் இங்கு வரவில்லை.

சிங்கள இனத்தையும் தமிழ் இனத்தையும் ஒன்றாக்கிவிட்டுச் சாக வேண்டுமென நினைக்கின்ற எனக்கு எதிராக வழக்குத் தாக்கல் செய்வதாகச் சொன்னார்கள். "කොටියා" කිව්වා කියලා මට නඩුවක් දානවා කිව්වා. "කොටියා" என்று சொன்னதற்கு எனக்கு எதிராக வழக்குத் தாக்கல் செய்வதாகச் சொன்னார்கள். வெட்கப்பட வேண்டும். මම සිංහලෙන් කියන්නම්. තමුන්නාන්සේලා සිංහල නේද කථා කරන්නේ? තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. මම පොහොට්ටුවේ වේදිකාවට නැඟලා "කොටියා" කිව්වාය කියලා, TID එකට කියලා,- මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වඩා ගිහිල්ලා බලන්න, උතුරේ අපේ කට්ටිය කොහොමද වැඩ කරන්නේ කියලා. අපේ කට්ටියට ධෛර්යය තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ගිහිල්ලා මල් මාලා දැම්මා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැම්මා. කෝ දැන්? කෝ, නම කියන්නද? ඔයායි, රජීවන් ජෙයවන්ද්‍රමූර්තියි, ආයෙත් ගිහිල්ලා. මෙතුමා, කවුද? රාමලිංගම් චන්ද්‍රසේකර් ඇවිල්ලා මාල දානවා. ප්‍රභාකරන්ට පිළිමයක් හදනවා කිව්වා. කෝ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පිළිම? සල්ලිත් අරගෙන ලජ්ජා නැතිව,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පිළිම? කෝ, ප්‍රභාකරන්ගේ අම්මාට පැටිය? අනේ! ලජ්ජා වෙන්න ඕනෑ, ඔයාලා වාගේ පුද්ගලයෝ අපේ සල්ලිත් අරගෙන. *[බාධා කිරීම්]* ඕනෑ නම් TID එකට නඩුවක් දාන්න කියන්න, මම ගිහිල්ලා පෙන්වන්නම්. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, සභාවේ කථා කරද්දී ඔබතුමා පාලනය වෙන්න අවශ්‍යයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හරි. මට තව විනාඩි දෙකක් තිබෙනවා. හැබැයි, ඔයාලා ලජ්ජා වෙන්න ඕනෑ._

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ අයියා. *[බාධා කිරීම්]* බලන්නකෝ. ඉතින්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. මම මොනවා කරන්නද? මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කට වහගන්න කියන්න,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම කථා කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව පාලනය කරගන්න, කරුණාකරලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමන් බල්ලෝ නොවෙයි නම් කට වහගෙන ඉන්න එපායැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවසන් කරන්න බැහැ. ඔහොම කරන්න එපා. තවම යන්නේ විනාඩි 7.37යි. විනාඩි එකහමාරක් එයා කථා කරලා තිබෙනවා. මේක ලජ්ජා නැති වැඩක්. හැබැයි, මම කියන්න කැමැතියි, TID නොවෙයි, ඕනෑ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එන්නම් කියන එක. ඔයාලාගේ ටිල්වින් සිල්වා ගිහිල්ලා,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අනේ! මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරන්න එපා ඔහොම. තවම විනාඩි 7.53යි. ඔබතුමා විනාඩියක් දීලා තිබෙනවා, අරයාට කථා කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඕක නොවෙයි වෙලාව. *[බාධා කිරීමක්]* කරුණාකර, ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එතැන විනාඩි එකහමාරක් දීලා. දැන් මගේ mike එකත් නවත්වා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමා තත්පර 30ක් විතර ගන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙහෙමයි. අරයා point of Order එක ගත්තාම, ඒක මගේ time එකෙන්ද අඩු කරන්නේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දන්නේත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. එහෙම කියන්න එපා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. එයා point of Order එක ගත්තේ. තමුන්නාන්සේලා point of Order දන්නෙත් නැහැ, මුකුත් දන්නේත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ සභාව පාලනය කිරීමේ අයිතිය මට තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉතින්, මගේ time එකේ point of Order එක ගත්තාම මම කොහොමද කථා කරන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්. ඒකයි කියන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේ බලන්නකෝ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැක්කාද? අපි කොටි. ඒ නිසා අපි බුරන්න දන්නේ නැහැ. හැබැයි, ඔය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇහෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. ඒක නොවෙයි. ඔබතුමා වරදවා වටහා ගන්න එපා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථාව ඉවර කරනවා. මට තත්පර 20ක් දෙන්න. ඔය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ නිල් පාට නැති වෙලා යන්නේ. හැබැයි, අපි භය වෙන්නේ නැහැ. TID එක නොවෙයි, ඕනෑ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා කට උත්තර දෙන්න ලැහැස්තියි. හැබැයි, මගේ කථාවෙන් විනාඩි 2ක් ඔබතුමා තමයි කථා කළේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

Professor. මම කියන්නද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මගේ time එකෙන් විනාඩි එකහමාරක් දුන්නා, එයාට. ඔබතුමා කථා කළා, විනාඩි 2ක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මූලාසනයට අවමන් කරන්න එපා. ඔබතුමා මේ සභාවේ නීතිරීති අනුගමනය කරන්න අවශ්‍යයි. ඒක නිසායි කියන්නේ. *[බාධා කිරීමක්]* කරුණාකර, නවත්වන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
එතුමා මගේ නම සඳහන් කළා. එම නිසා මම මේ පිළිබඳව යමක් කියන්න ඕනෑ.

அர்ச்சுனா என்கின்ற இந்த நபர், உண்மையிலேயே இந்த நாட்டுக்கும் யாழ்ப்பாணத்துக்கும் நாசம் செய்கின்ற ஒரு நபராவார். நான் சென்று யாருக்கோ மாலை போட்டதாக இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற சிறப்புரிமையைப் பயன்படுத்தி இப்பொழுது அவர் சொன்னார். இதை அவர் வெளியில் சொல்வாராக இருந்தால், என்ன செய்ய வேண்டுமென எனக்குத் தெரியும். *[இடையீடு]* நீங்கள் இதை வெளியில் வந்து சொல்லுங்கள்! வெளியிலே வந்து சொல்வீர்களாக இருந்தால், நீங்கள் எந்த இடத்தில் இருக்க வேண்டும் என்பது எனக்குத் தெரியும்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා සඳහන් කළා, මම කොටි සංවිධානයත් එක්ක එකතුවෙලා, මල් මාලා දමලා,- *[බාධා කිරීමක්]* ඒ නිසා මේ පිළිබඳව- *[බාධා කිරීමක්]* පුළුවන් නම් තමුන්නාන්සේ ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ ප්‍රශ්නයේදී. *[බාධා කිරීමක්]* මේ ප්‍රශ්නයේදී. හරිද? *[බාධා කිරීමක්]* හරි, මම බලාගන්නම් ඊට පස්සේ. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන එක දන්නවා. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා දන්නවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට විනාඩියක් දෙන්නකෝ.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තක්කඩි දේශපාලනය කරන්නේ කියන එක දන්නවා. හරිද? *[බාධා කිරීමක්]* ඒ නිසා ඒක හොඳටම අද දෙමළ ජනතාව දන්නවා. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්නේ මහ- *[බාධා කිරීමක්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, දැන් නවත්වමු.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Point එක- *[බාධා කිරීම්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳවත්, රටේ ආර්ථික තත්ත්වය පිළිබඳවත් අදහස් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ පරිපූරක ඇස්තමේන්තුවෙන්, විශේෂයෙන්ම රුපියල් මිලියන 17,213ක් අපේ විදුලි බලය සම්පාදනය කරන ජාතික පද්ධති මෙහෙයුම්කාර සමාගමට - National System Operator (Pvt.) Limited එකට - ලබා දෙනවා. ඒ ලබාදීමට අවශ්‍ය මුදල් සම්පාදනය කරගැනීම සඳහා තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. මෙහිදී මේ පරිපූරක ඇස්තමේන්තුව නිසා අතිරේක වැය බරක් ඇති වෙන්නේත් නැහැ. ඒ වාගේම අපේ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ණය ගැනීමේ සීමාවට බලපෑමක් වෙන්නේ නැති ආකාරයට, මේ වෙනකොට 2026 වර්ෂයට වෙන්කරලා තිබෙන වැය ශීර්ෂයන්ගේ ඉතිරි විය හැකි යැයි අපි අපේක්ෂා කරන තොරතුරු අරගෙන, ඒවා කළමනාකරණය කරලා තමයි මේ ප්‍රතිපාදනය ලබාදෙන්නේ. විශේෂයෙන්ම මේ ප්‍රතිපාදනය ලබාදෙන්නේ, මෑතකදී මැද පෙරදිග ඇතිවුණු යුද්ධමය තත්ත්වයන් හා එවැනි තත්ත්වයන් නිසා විදුලි මිල වැඩිවීම- මොකද, අපි සාමාන්‍යයෙන් මිල වැඩිවීමේදී පිරිවැය ආවරණය කරගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කරනවා. *[බාධා කිරීමක්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම නිවැරදි කිරීමක් කරන්නේ. ඊයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට පැමිණි අවස්ථාවේදී ඒගොල්ලන් කිව්වේ, ප්‍රාග්ධන වියදම අඩු කරලා තමයි පුනරාවර්තන වියදමට දෙන්නේ කියලා. ඒක නිවැරදි කරන්න. මොකද, මුදල් අමාත්‍යාංශයේ Deputy Secretary to the Treasury තමයි ඒ ගැන අප දැනුවත් කළේ. ඒ කියන්නේ Capital Expenditure එක අඩු කරලා මේකට දමනවාය කියන එක.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මම කිව්වේ, සමස්ත වියදම් ගැන. ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් වශයෙන් කොටස් දෙකකට කැඩෙනවා නේ. ඔබතුමා කියන කාරණය හරි. නමුත් සමස්ත වියදම වැඩිවෙන්නේ නැහැ. සමහර ප්‍රායෝගික තත්ත්වයන් යටතේ, අපේ වියදම්වලට කිසි හානියක් නොවෙන්න -ඒ කියන්නේ, සැලසුම් කරපු ඒවා කප්පාදුවක් නොවෙයි කරන්නේ. *[බාධා කිරීමක්]* ඔව්. ඔබතුමා කියපු කාරණය හරි, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ අනුව තමයි කටයුතු කරන්නේ. සමස්ත වියදම වැඩි වෙන්නේ නැහැ. ඒ නිසා ණය ගැනීම් සිද්ධ කරන්නේ නැහැ.

මෙතැනදී තිබෙන විශේෂත්වය මම සඳහන් කරන්න ඕනෑ. මේ පිරිවැය ආවරණය කරන මේ උපයෝගිතාවන්, විශේෂයෙන්ම විදුලිය, ඒ වාගේම ඉන්ධන වාගේ දේවල් -ජලයත් උපයෝගිතාවක්. නමුත් විශේෂයෙන්ම විදුලිය සහ ඉන්ධන- ලබාදීමේදී අතීතයේදී ඒ ආයතනයට අනවශ්‍ය පීඩනයක් එන විධියට ණය ලබාගැනීම, පාඩු සිද්ධ කිරීම නිසා ඒ ආයතන පවත්වාගෙන යන්න බැරි මට්ටමට ළඟා වෙලා තිබුණා. නමුත් දැන් මේ ස්ථාවරත්වය අත්පත් කරගන්නා ගමනේදී අපි ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා, පිරිවැය ආවරණය කරගන්න. එතකොට පිරිවැය ආවරණය කර ගනිද්දී සාමාන්‍ය තත්ත්වයක් යටතේදී නම් ඒ නිෂ්පාදන පිරිවැය යන්නේ, -ආනයන පිරිවැය, නැව් ගාස්තු, ඉන්ධන බවට පරිවර්තනය, විදුලිය නිෂ්පාදනය- සාමාන්‍ය ජනතාවගෙන් අත්පත් කරගන්න එක ඒ පවතින තත්ත්වයට අනුව හරි. හැබැයි, මේ පැන නැඟී තිබෙන්නේ විශේෂිත තත්ත්වයක්. මැද පෙරදිග යුද තත්ත්වය නිසා ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා; ප්‍රවාහන ගාස්තු ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ සුවිශේෂී තත්ත්වය නිසා සාමාන්‍ය ජනතාවට එන අතිරේක පීඩනය අවම කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඒ මුදල් ලබාදෙන ගමන්ම අදාළ ආයතනයට, ඒ කියන්නේ විදුලිය නිෂ්පාදනය කරන ආයතනයට පාඩු නොවන විධියට ඔවුන්ගේ පාඩුව ආවරණය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම තමයි කරලා තිබෙන්නේ. ඒක තමයි අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී කියන්නේ, මූල්‍ය විනය පවත්වාගෙන යාම කියලා. මොකද, අපේ මූල්‍ය විනය නිසි ආකාරයට පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් විධියට තමයි අපිට 2025 වර්ෂයේදීත්, ඒ වාගේම 2026 වර්ෂයේදී දැන් අත්පත් කර ගනිමින් තිබෙන මෙන්න මේ ආදායම් ඒකාග්‍රතාව රැක ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සැලසුම් කරපු ආදායම නිසි පරිදි එකතු කරමින් ඉන්නවා. ඒ වාගේම ඒ වියදම් කළමනාකරණය නිසි පරිදි සිද්ධ කිරීම නිසා ඒ මූල්‍ය විනය අපි පෙන්නුම් කරලා තිබෙනවා.

ඒ වාගේම විදුලිය නිෂ්පාදනය පිළිබඳ කාරණය ගත්තොත්, සමහර අවස්ථාවලදී චෝදනා ඉදිරිපත් කළා, බාල ගල් අඟුරු ආනයනය කළා කියලා. ඇත්තටම ඒ ගල් අඟුරු ආනයනය කිරීමේදීත් අපි නිසි ක්‍රියා පටිපාටීන් අනුගමනය කළා. ගෙන එන ලද ගල් අඟුරුවල ප්‍රමිතියේ යම් වෙනස් වීම් නිසා අපි නිසි ක්‍රමවේදය අනුගමනය කරලා සැපයුම්කරුගෙන් අදාළ අලාභය අය කර ගෙන තිබෙනවා. ඒ අවසාන සැපයුම්කරු වන Trident Chemphar විසින් ගෙනෙන ලද නැව් 19කින් හා ඊට පසුව ලබා ගත්ත අතිරේක නැව් 4කින් අපි ඩොලර් මිලියන 37.5ක් අය කරගෙන තිබෙනවා. ඒ වාගේම කාර්ය සාධනය හරියට නොකරපු නිසා ඒ සැපයුම්කරුගේ කාර්ය සාධන බැඳුම්කරය අවලංගු කරලා ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 14.7ක් අත්පත් කරගෙන තිබෙනවා. සමස්තයක් විධියට ඩොලර් මිලියන පනස් දෙකයි දශම ගණනක් අය කර ගෙන තිබෙනවා. රුපියල්වලට පරිවර්තනය කළොත්, රුපියල් බිලියන 17කට වැඩි ප්‍රමාණයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. ඒ නිසා ඒ ක්‍රියාකාරකම ඇතුළේ අතිරේක බරක් මහජනතාවට ඇවිල්ලා නැහැ. ඇයි, මම එහෙම කියන්නේ? විදුලිය නිෂ්පාදනය කරන ආයතන ගණන් හදලා කිව්වා, මේ කාරණය නිසා අතිරේකව විදුලිය නිෂ්පාදනය කරන්න රුපියල් බිලියන 7ක් වැය වෙනවා කියලා. මහජන උපයෝගිතා කොමිසම කිව්වා, රුපියල් බිලියන 8.5ක් වැය වෙනවා කියලා. දැන් අපි පෙන්නුම් කරලා තිබෙනවා ඒ ප්‍රමාණයට වඩා ඉතා වැඩි මුදල් ප්‍රමාණයක් අපි ආවරණය කරගෙන තිබෙනවා කියලා. ඒ අනුව කිසිදු අලාභයක් සිද්ධ වෙලා නැහැ.

ඒ වාගේම මේ ආණ්ඩුවට වර්ෂ දෙකක් දැන් සම්පූර්ණ වෙමින් තිබෙනවා. මේ අවුරුදු දෙක ඇතුළේ අපි අත්පත් කර ගත්ත ජයග්‍රහණ, ඒ ආර්ථික ස්ථාවරත්වය ලබා ගැනීම වෙනුවෙන් නොබියව, නිවැරදි තීන්දු දිගින් දිගටම අනුගමනය කළා. ඒ ප්‍රතිපත්තිවල ඒකාග්‍රතාව රකිමින් වැඩකටයුතු කළා. එහි ප්‍රතිඵල දැන් දකින්න තිබෙනවා. නමුත් විශේෂයෙන්ම විපක්ෂය, විවිධ ආයතනවල social mediaවල හැම තිස්සේම කිව්වේ, අපි අසාර්ථකයි, මේක අවිනිශ්චිතයි, බිඳ වැටෙනවා, බදු ආදායම් එකතු කර ගන්නේ නැහැ කියලායි. මේ විධියේ අවිනිශ්චිතතාවන් ඇති වෙන දේවල්ම තමයි ප්‍රකාශ කළේ. අපි ඒවාට පිළිතුරු ලබා දෙමින් අපි නිවැරදි ක්‍රියාමාර්ග ගනිමින් ඉදිරියට ගමන් කළා. එහි ප්‍රතිඵල අපේ මේ දත්තවලින් පමණක්ම නොවෙයි පෙන්නුම් කරන්නේ. අවසානයේදී අපේ කාර්ය සාධනය ඇතුළේ ඒ කොතරම් ප්‍රමාණයකට අපි රජයේ ආදායම් එකතු කරගෙන තිබෙනවාද, ආර්ථික වර්ධනය අත්පත් කරගෙන තිබෙනවාද, උද්ධමනය පාලනය කිරීමේ යන්ත්‍රණය ඇතුළේ වැඩ කටයුතු කර තිබෙනවාද කියන කාරණා හා දත්ත ඉදිරිපත් කරනවා.

ඒත් එක්කම ඉතාමත් වැදගත් තොරතුරක් මම ඉදිරිපත් කරන්න කැමතියි. රටක ඒ ස්ථාවරත්වය අරගෙන ඉදිරියට යනකොට වැදගත් සාධකයක් තමයි තමන්ට තිබෙන විදේශීය ණය ගෙවා ගැනීමේ හැකියාව. ණය ආපසු ගෙවීමේ හැකියාව, ඒ ණය ගෙවීමට තිබෙන අවදානම පිළිබඳ තක්සේරු කරලා ස්වාධීන

ආයතන අප පිළිබඳ ශ්‍රේණිගත කිරීම් කරනවා. ඒ ශ්‍රේණිගත කිරීම් කරන ප්‍රධාන ආයතනයක් තමයි Fitch Ratings කියන ආයතනය. මා සතුටින් දැනුම් දෙන්න කැමතියි, මේ වෙනකොට Fitch Ratings සමාගම විසින් අපිව CCC+ කියන ස්ථානයේ ඉඳලා B- කියන ස්ථානයට උසස් කර තිබෙන බව. CCC+ කියන ස්ථානයත් අපේ ආණ්ඩුකරණය ඇතුළේදීම තමයි අපි අත්පත් කර ගත්තේ. අර්බුදයෙන් රට බිඳ වැටිලා තිබුණාම default risk කියන,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

බුන්වත් තත්ත්වයෙන් තිබූ අපේ රට CCC+ කියන stable තත්ත්වයකට ගෙනෙන්න පුළුවන් වුණා; ආර්ථිකය ස්ථාවරයි කියන තැනට. ඒ ස්ථාවරත්වයෙන් දැන් අපිට පුළුවන් සමපේක්ෂණ - speculative motive - හරහා එතැනට එන ආයෝජන කැන්දන්න. ඒ සඳහා rating එකක් දීලා තිබෙනවා. ඒ වාගේම තමයි B- වර්ගීකරණය අපිට ලබා දෙනකොට ඔවුන් කියන කාරණා අනිවාර්යයෙන්ම අපි අනුගමනය කරපු ක්‍රියාමාර්ග එක්ක සමපාත වෙනවා. අපි නිරන්තරයෙන් කිව්ව කාරණා එක්ක අනුගත වෙනවා. විශේෂයෙන්ම අපි අමතක නොකළ යුතුයි, මේ ජයග්‍රහණ අත්පත් කර ගත්තේ බුන්වත්භාවයට - default risk level එකට - ගිය, පෝලිම් නිර්මාණය වෙච්ච, ඖෂධ හිඟය ඇති වෙච්ච, සංචිත බිංදුවට වැටිලා තිබුණු තත්ත්වයකින් ඉදිරියට ඇවිල්ලා කියන එක. ඒ නිසා Fitch Ratings ආයතනය තමුන්ගේ හැරවුම් ලක්ෂ්‍යය ඇතුළේදී පෙන්නුම් කරනවා, මේ මූල්‍ය විනය අපි අත්පත් කර ගැනීම, ප්‍රාථමික ශේෂය අපි අත්පත් කර ගැනීම, ණය ගෙවීම, සංචිත ගොඩනඟා ගැනීම සැලකිය යුතු මට්ටමක තිබෙනවා කියන කාරණා සැලකිල්ලට භාජන කරමින් තමයි මේ වර්ගීකරණය අපිට ලබා දීලා තිබෙන්නේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වගේම අපට මුහුණ දෙන්න සිදු වන අභියෝග ගණනාවකුත් තිබෙනවා. එකක් තමයි, අප ලබා ගත්තු ණයවල තිබෙන අතිරේක පිරිවැය. ඒ නිසාම අපේ ආණ්ඩුවේ ආදායමින් විශාල මුදල් ප්‍රමාණයක් එම ණය පිරිවැය සඳහා වැය වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි සැලසුම් කරලා තිබෙනවා අප මේ ණය සඳහා වූ පොලිය අඩු කරගෙන, ණය බර අඩු කරගෙන, ණය තිරසාරත්වයට ගෙන එන්නේ කොහොමද කියලා. මේ ratingsවලින් පැහැදිලිව පෙන්වා තිබෙනවා, මේ අවුරුදු දෙක තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට අප ණය පිරිවැය ක්‍රමිකව අඩු කර ගෙන තිබෙන්නේ කොහොමද කියලා.

උදාහරණයක් ගත්තොත්, 2023දී රජයේ සමස්ත ආදායමෙන් සියයට 76කට වඩා වැඩි ප්‍රමාණයක් ණය පොලී සඳහා වැය කර තිබෙනවා. 2025 වර්ෂයේදී අපට එය සියයට 46 දක්වා අඩු කර ගැනීමේ හැකියාව ලැබුණා. මේ පවතින දත්ත අනුව, මේ ඉදිරිපත් කිරීම තුළ පෙන්නුම් කරනවා 2026 වර්ෂයේදී එය සියයට 41 දක්වා අඩු කර ගන්න අපට පුළුවන් බව. ඒ වාගේම ණය සැලසුම්කරණයේදී විදේශ ණය අංශයෙන් ඇති වන පීඩනයත්, පොලියත් අඩු කරමින් දේශීය ණය ප්‍රමාණය වැඩි කර ගැනීමේ දිශාවකට අපි ගමන් කරමින් සිටිනවා. ඒ සඳහා ගරු ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවේ මඟ පෙන්වීම යටතේ මුදල් අමාත්‍යාංශය මඟින් එම වැඩ කටයුතු සිදු වෙමින් තිබෙනවා.

ඊත් එක්කම මම සඳහන් කරන්න කැමැතියි, උද්ධමනය කියන කාරණය ගැන. අපි ආණ්ඩුව ගන්න කලින් සියයට 60-70 මට්ටමට උද්ධමනය ඉහළ ගියාට පසුව අපට සිද්ධ වුණා උද්ධමනය කියන කාරණය පාලනය කරන ලද රාමුවක් යටතේ වැඩ කරන්න. ඒ සඳහා අපි දැනට භාවිත කරනවා flexible inflation targeting framework එකක්. අපි ඒ රාමුව අවුරුදු තුනෙන් තුනට අලුත් කරනවා. මුදල් අමාත්‍යාංශයත්, මහ බැංකුවත් 2023දී අත්සන් කරන ලද එම flexible inflation targeting framework එක මෙම වසරේ ඔක්තෝබර් මාසයේදී අවසන් වෙනවා. මේ තත්ත්වය යටතේ ඉදිරියේදී අප මොන වාගේ inflation target එකකටද යන්න ඕනෑ කියන කාරණාවත් මේ වන කොට සාකච්ඡා වෙමින් පවතිනවා. බොහෝ දුරට පවතින තත්ත්වයන් සැලකිල්ලට භාජනය කරමින් ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් වැඩිවීම, ඒ වාගේම තිබෙන අවිනිශ්චිතතා සහ යුදමය තත්ත්වයන් සැලකිල්ලට භාජනය කරමින් උචිත පරිදි 2026 සිට 2029 දක්වා වූ flexible inflation target එකක් අනුව වැඩ කරමින් උද්ධමනය පාලනය කිරීම සඳහා වූ වැඩ කටයුතු අපි සූදානම් කර තිබෙනවා.

එම ස්ථාවරත්වය අත්පත් කර ගැනීමට විවිධ ආයතන සහ පුද්ගලයන් දායකත්වය සපයපු බව මම සතුටින් සඳහන් කරන්න කැමැතියි. කවුරුත් දන්නවා, අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ එකතුව පොදු වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව. අපේ ආණ්ඩුව, අපේ ඉලක්ක සහ ප්‍රතිපත්ති මත එම කොන්දේසි නිසියාකාරව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් විධියට අපට පුළුවන්කම ලැබුණා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මේ වන කොට ඩොලර් බිලියන 2.4ක මුදලක් ලබා ගන්න. දැන් එම වැඩසටහන අවසාන අදියරේ පවතින්නේ. එහි 7වන සමාලෝචනයට අදාළ මූලික තාක්ෂණික රැස්වීම් පැවැත්වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම මේ වන කොට ලංකාවට ඇවිල්ලා ඉන්නවා. සැප්තැම්බර් 10වන දා ඉඳලා 23වන දා දක්වා -අද වන කල්- ඒ අදාළ මූලික කටයුතු ඉතාම සාර්ථකව කරලා, ඔවුන් අද මාධ්‍ය නිවේදනයක් නිකුත් කරනවා. එම මාධ්‍ය නිවේදනයේ ඉතා පැහැදිලිව සඳහන් කරනවා, අප කොහොමද මේ සාර්ථකත්වය අත්පත් කර ගෙන තිබෙන්නේ කියලා. එහිදී විශේෂයෙන්ම ඔවුන් අවධාරණය කරනවා, අපි බාහිර කම්පනයන්ට මුහුණ දෙමින් ඉතාම සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා කියන කාරණය. ඔවුන් අපට ලබා දීලා තිබුණු ප්‍රාථමික ශේෂයේ ඉලක්ක අපි ළඟා කර ගෙන තිබෙනවා. ඒ වාගේම ආදායම් එකතු කර ගැනීමේ ඉලක්කත් අපි නිසි පරිදි ළඟා කර ගෙන තිබෙනවා. ආදායම් එකතු කර ගැනීම මෙහි ප්‍රධානම කාරණයක්. අපි එම ප්‍රධාන කාරණය ඉලක්ක කර ගෙන දිනපතා අඛණ්ඩව සමාලෝචනය කරමින් වැඩ කටයුතු කළා. අපි උදාහරණයක් ගනිමු. 2026 සැප්තැම්බර් 17වන කොට - සැප්තැම්බර් මාසයේ මැද වන කොට- අප අත් පත් කර ගන්න ඕනෑ ආණ්ඩුවේ ආදායම ලෙස ඉලක්කගත වෙන්නේ සියයට 70ක් විතර ප්‍රමාණයක්. හැබැයි, අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා මේ සැප්තැම්බර් මාසයේ මැද වන කොට සියයට 80 ඉලක්කයක් දක්වා එන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. මෙම පරිපූරක මුදල සඳහා අපි අද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නවා. ගත වූ වසර දෙක ඇතුළත අප දේශීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් අත් පත් කර ගත්තු ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහින් සැබෑ පරිවර්තනය සඳහා

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

සැවොම සම්බන්ධ වුණු ආර්ථික වර්ධනය අත් පත් කර ගැනීමේ දිශාවට යන වැඩසටහන ගැන තමයි ඉදිරියේදී - අය වැයේදී - සාකච්ඡා කරන්නේ. From stabilization to transformation strategy කියන කාරණය අනුව යමින් අපට ආර්ථික ජයග්‍රහණ අත්පත කර ගන්න හැකියාව ලැබෙනවා කියන කාරණයත් සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.06]

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රධාන කාරණා 2ක් සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙන මේ වෙලාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය සම්බන්ධයෙන් කරුණු දක්වන්නට අවසරයි.

රටේ ශ්‍රම බලකායෙන් සියයට 26කට ආසන්න ප්‍රමාණයක් තමයි කෘෂි කර්මාන්තයේ යෙදෙන්නේ. එහෙත් මේ ප්‍රමාණයෙන් ජාතික නිෂ්පාදනයට දායකත්වය සියයට 7.5ක වාගේ සුළු ප්‍රමාණයකයි තිබෙන්නේ. එම නිසා අපි කවුරුත් නැවත අවධානය යොමු කරන්න වෙයි, පෙරළා කල්පනා කරන්න වෙයි, සියයට 26ක් කෘෂි කර්මාන්තයේ යෙදෙන කොට ජාතික නිෂ්පාදනයේ දායකත්වය සියයට 7.5ක් දක්වා අඩු ප්‍රතිශතයකට එන්නේ ඇයි කියන කාරණය ගැන. එහෙම නම් අපි කෘෂි කර්මාන්තය සඳහා මීට වඩා විද්‍යාත්මක ප්‍රවේශයක් අනිවාර්යයෙන්ම ගන්න ඕනෑ. ඒ වාගේම, කෘෂි කර්මාන්තය තුළට නවීකරණ ව්‍යාපෘති ගෙනෙන්නත් ඕනෑ. එහෙම නැතිව ලෝක වෙළෙඳ පොළ තුළ කෘෂි කර්මාන්තයේ, එහෙම නැත්නම් අපනයන කෘෂි කර්මාන්තයේ අපේ පංගුව අත් පත් කර ගැනීම අපට අභියෝගයක් බවට පත් වෙනවා. අන්න ඒ සියලු කාරණා සැලකිල්ලට ගෙන තමයි අද මේ පනත සංශෝධනය සිද්ධ වෙන්නේ. මේ පනත සංශෝධනය කිරීම කොච්චර කාලයක් ප්‍රමාද වුණාද කියන එක පිළිබඳව, එහෙමත් නැත්නම් දෙපාර්තමේන්තුවක් විධියට පසුගිය කාලයේ මොන තරම් අභියෝගවලට මුහුණ දුන්නාද කියන එක පිළිබඳව අද දවස පුරා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී සහෝදර සහෝදරියන් අදහස් ඉදිරිපත් කළා. ඇත්තටම මෙය කාලීන අවශ්‍යතාවක් විධියට ගන්න පුළුවන්. ඒ වාගේම මේ තුළින් සිදු වන්නේ පනත සංශෝධනය කිරීමක් පමණක් නොවෙයි, එහෙමත් නැත්නම් තනතුරු නාම සංශෝධනය කිරීමක් පමණක් නොවෙයි. අනෙකුත් අමාත්‍යාංශ ඒකාබද්ධ කර ගනිමින් යන ජාතික වැඩසටහනේ එක අංගයක් විධියට තමයි අද මේ පනත සංශෝධනය සිද්ධ වෙන්නේ.

අපි කවුරුත් දන්නවා, ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම කියන්නේ මේකට සමගාමීව අපේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන ප්‍රධාන කටයුත්තක් බව. ආර්ථිකයේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට ආවේ නැත්නම්, ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය දියුණු කරන වැඩසටහන් ගෙන ආවේ නැත්නම්, අප ආර්ථිකමය වශයෙන් මොන තරම් වර්ධනයක් අත් පත් කර ගත්තත් වැඩක් නැති වෙනවා. ඒ නිසා තමයි රජය විධියට අප කල්පනා කරලා තිබෙන්නේ විශේෂයෙන් අපනයන ක්ෂේත්‍රයට අදාළව කටයුතු කරද්දී ග්‍රාමීය ජනතාව තුළ මේ ගැන යම් ඇල්මක් ඇති කරලා, ප්‍රබෝධයක් ඇති කරලා, ඔවුන් වැඩි වැඩියෙන් මේ තුළට ආකර්ෂණය කර ගනිමින් කටයුතු කරන්න. ඒ වාගේම අපි මේ වන කොට විශේෂයෙන් "අපනයන කෘෂි මහිම" වැඩසටහන හරහා ග්‍රාම නිලධාරි වසම් කිහිපයක් ඒකාබද්ධ කර ගෙන ප්‍රතිලාභ වැඩි කර ගන්නේ කොහොමද, අස්වැන්න වැඩි කර ගන්නේ කොහොමද, මේ තුළට විද්‍යාත්මක ප්‍රවේශයන් ගෙන එන්නේ කොහොමද කියන ඒවා පිළිබඳව ගොවීන් දැනුවත් කරමින් වැඩසටහන් ගණනාවක් පවත්වා ගෙන යනවා. ඒ විතරක් ද නොවෙයි. අපි මේ වන කොටත් අතිවිශාල මුදල් සම්භාරයක් වැය කරමින් අපේ ග්‍රාමීය ප්‍රදේශවලට අදාළ කාර්මික උපකරණ ලබා දෙමින් තිබෙනවා. ඒවා, පස් භාරන උපකරණ වෙන්න පුළුවන්; වල් කැපීමේ යන්ත්‍ර වෙන්න පුළුවන්; එහෙමත් නැත්නම් කෝපි කොටන යන්ත්‍ර වෙන්නත් පුළුවන්. අපි දන්නවා, ඉස්සර කාලයේ කෝපි කෙටුවේ වංගෙඩියේ දාලායි කියලා. නමුත්, අපි අද ගම්බද ජනතාවට අලුත් තාක්ෂණයත් එක්ක මැෂින් ලබා දෙමින් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මහා වැඩ කටයුත්තක් සිදු කරමින් පවතිනවා. අපට පෙනෙන දේ තමයි රටක් විධියට, ජාතියක් විධියට අප සියලුදෙනා ඒකාබද්ධ කර ගත් වැඩසටහනක එක අංගයක් හැටියට මේ පනත සංශෝධනය සිදු වනවා කියන එක.

විශේෂයෙන් අපට තිබෙන ප්‍රධාන අභියෝගය විධියට අපි තේරුම් ගන්න ඕනෑ සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ යෙදුණු ගොවියා නවීන කෘෂි කර්මාන්තය දක්වා ගෙන ඒම. ඒක ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. විශේෂයෙන් වර්තමාන රජය විධියට අප ඒ වෙනුවෙන් අදාළ ආයතන, දෙපාර්තමේන්තු සියල්ල ඒකාබද්ධ කර ගනිමින්, අවශ්‍ය ඉලක්ක සපුරා ගනිමින් ඉදිරියට ගමන් කරන මොහොතක් තමයි අද මේ ගත කරමින් ඉන්නේ.

ඒ වාගේම අපනයන කෘෂි කර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම තුළ මේ නිලධාරින්ට පෙර තිබුණාට වඩා යම් නීතිමය බලයක්, නියාමනය කිරීමේ හැකියාවක් ලැබෙනවා. අන්න ඒ තුළින් වඩා ගුණාත්මක, තත්ත්වයෙන් වඩාත් ඉහළ නිෂ්පාදනයන් අත්පත් කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම අගය එකතු කිරීමේ ක්‍රියාවලිය හරහා අපනයන තත්ත්වයට සුදුසු ඵලයන් එහෙමත් නැත්නම් නිෂ්පාදන අපට එකතු කර ගන්න පුළුවන්කම තිබෙනවා. එතකොට තමයි අපට අපනයන ආදායම ඉහළ නංවාගන්න පුළුවන්කම ලැබෙන්නේ. එතකොට තමයි අපට ලෝකයේ අනෙකුත් රටවල් එක්ක තරග කරමින් ලෝක වෙළෙඳ පොළ තුළ වැඩි පංගුවක් අත්පත් කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මම හිතනවා, මේ සංශෝධනය පනතට සීමා වීමක් පමණක් නොවෙයි කියලා. මොකද, ජාතික වශයෙන් ඒකාබද්ධ කර ගත්ත මහා වැඩ පිළිවෙළක් තුළ අපට මේ ගමන යන්න පුළුවන්කම තිබෙනවා කියලා මම හිතනවා.

ඒ වාගේම අවසාන මිනිත්තු කිහිපය තුළ මම අවධානය යොමු කරන්න ඕනෑ, අධිකරණය සම්බන්ධ කාරණාවට. ඇත්තටම අධිකරණය සම්බන්ධයෙන් අද දවසේ කරුණු ගණනාවක් ඉදිරිපත් වුණා. ඇත්තටම අධිකරණයට බිය වෙන්න ඕනෑකමක් නැහැ. ඊයේ දවසේ දුන් නඩු තීන්දුවේදී 15දෙනෙක් වරදකරුවන් බවට පත් වෙද්දි, 9දෙනෙක් සාධාරණ සැකයෙන් තොරව චෝදනා ඔප්පු කරන්න බැහැ කියලා නිදොස්කොට නිදහස් වුණු බව අපි කවුරුත් දන්නවා. ඒත් පසුගිය කාල සීමාව තුළ අධිකරණයට ඉදිරිපත් වුණු දේශපාලනඥයන් තුළින් අපට දක්නට තිබුණේ කුමක්ද? එක්කෝ අපි කවදාවත් අහලා නැති රෝග තියෙන තත්ත්වයකට ඔවුන් පත් වෙනවා. එහෙම නැත්නම් කිසි දෙයක් මතක නැහැ කියන තත්ත්වයට පත් වුණා.

ඒ වාගේම ඊයේ - පෙරේදා විශේෂ සිද්ධියක් ඇති වුණා. ඒක අපේ ප්‍රදේශයට අදාළ සිද්ධියක් නිසා ඒ ගැන සඳහනක් කළොත් හොඳයි කියලා මම හිතනවා. මා නියෝජනය කරන හඟුරන්කෙත ප්‍රදේශයේ ජනතාව නම් ඒ ගැන කියන්නේ "හඟුරන්කෙත ඇසළ පෙරහැර පෙන්වන්න ඇප ඉල්ලුවා" කියායි. මොකද, බෙබිලාට පෙරහැර පෙන්වන්න ඕනෑ නිසා කියායි ඒ පැත්තේ ජනතාව කථා කරන්නේ. නමුත් ඇත්ත කථාව ඒක නොවෙයි. ඒ නීතිඥයා කිව්වේ, ඇසළ පෙරහැරේ කොත් පැලඳවීමේ අවස්ථාවකට සම්බන්ධ වෙන්න අදාළ චූදිතයාට ඇප ලබා දෙන්න කිව්වාය කියායි. අපි පුංචි කාලයේ ඉඳලා පෙරහැර බලලා තිබෙනවා. ඒත් පෙරහැරේ චාරිත්‍රයක් නැහැ, කොත් පැලඳවීමේ උත්සවය කියලා. පෙරහැර චාරිත්‍රවල සිද්ධ වෙන්නේ සදාතුක කරඬුව එහෙම නැත්නම් ධාතූන් වහන්සේලා රැගත් කරඬුව හස්තියා මත තැබීමේ චාරිත්‍රයයි. නමුත් ඒකවත් හරියට කියා ගන්න බැරි වෙනවා. ඒ තරමටම අසරණ වෙලා, ඒ වාගේ පිහිටකින් හෝ ඇප ලබා ගන්න උත්සාහ කරන බවක් තමයි පෙනෙන්න තිබෙන්නේ.

ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් පසුගිය දවසක මාධ්‍ය සාකච්ඡාවක් තිබියදී විශාල ගෝරනාඩුවක් කළා, රට ආර්ථික වශයෙන් බිඳ වැටිලා තිබෙනවා, බංකොලොත් වෙලා තිබෙනවා කියලා. ඒ වෙලාවේදී මාධ්‍යවේදියෙක් ඇහුවා, එහෙම නම් දැන් ඔබතුමන්ලා බලය ගන්නවාද කියලා. නැහැ, අපි එයාලා හැදුවාට පස්සේ බලය ගන්නවාය කියලා ඒ මන්ත්‍රීවරයා කිව්වා. ඒ කියන්නේ අනියමින් එතුමා කියනවා, මේ රට හැදෙනවා කියන එක. ඒ මන්ත්‍රීවරයා තුළ ඒ විශ්වාසය තිබෙනවා. හෘදය සාක්ෂිය කියන්නේ ඒක.

ඒ වාගේම පාර්ලිමේන්තුවේදී විවිධ අවස්ථාවල වයිමලා, ශක්‍රයලා ගැන දේවල් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා එවැනි අයගෙන් නිදහස් වෙලා අද කිසිදු සද්දයක් නැතුව ඉන්නවා. අපට ඒ ගැන කියන්න තිබෙන්නේ මේකයි. මෙන්න මේ වැඩ පිළිවෙළ යටතේ වයිමා නොවෙයි, ශක්‍රයා නොවෙයි, කවුරු ආවත් මේ ගමන කිසිවෙකුට නවත්වන්න, අඩාළ කරන්න පුළුවන්කමක් නැහැ කියන කතන්දරය පැහැදිලි කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඉතාම වැදගත්, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට වාගේම අපේ ආර්ථිකයට සෘජුවම දායකත්වය සපයන අපනයන කෘෂි කර්මාන්තයට අදාළ සංශෝධන පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්බන්ධයෙනුත්, විදුලිබල මණ්ඩලයට අදාළ පරිපූරක මුදල අනුමත කර ගැනීම සම්බන්ධයෙනුත් වූ විවාදය අද දවස පුරාවටම පවත්වනු ලබනවා.

අපේ රට ඉතිහාසය පුරාවටම හඳුන්වන්නේ කෘෂි කාර්මික රටක් කියායි. කෘෂි කාර්මික රටක් වෙච්ච අපේ රට යැපුම් කෘෂි කර්මාන්තයේ ඉඳලා ආර්ථිකමය වශයෙන් වාණිජ කෘෂි කර්මාන්තය දක්වා මෙහෙයවා ගැනීමට දශක කිහිපයක් සිටි පාලකයන් උත්සාහ කරනු ලැබුවා. ඒ තුළින් සමහර ජයග්‍රහණ වාගේම සමහර පරාජයන් අපේ රට ලබා ගෙන තිබෙනවා. මුලින්ම අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේ මේ අමාත්‍යාංශ සහ පැවති ආණ්ඩු අපනයන කෘෂි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා, එය ගොඩනැඟීම සඳහා, කිසිවක් නොකළාම නොවෙයි. හැබැයි, රටක් විධියට අපේ රටේ ආර්ථිකය ගමන් කළ යුතු දිශාව හඳුනාගෙන මේ ක්ෂේත්‍රයේ නිරත වන සියයට 27කට ආසන්න වෙච්ච ශ්‍රම බලකාය - ශ්‍රම බලකායෙන් ආසන්න වශයෙන් සියයට 25ක් නියෝජනය කරන කණ්ඩායම - ඉලක්ක කරලා, ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහාත්, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහාත් නිශ්චිත, ඉලක්කගත වැඩ පිළිවෙළක් රට තුළ ක්‍රියාත්මක නොවුණා කියන එක තමයි මේ මොහොත වනකොට අපි හඳුනා ගනිමින් තිබෙන්නේ. ඒ නිසාම තමයි මේ අණපනත් වෙනස් කරමින්, මේ ආයතන ශක්තිමත් කරමින්, මේ ආයතනවල වගකීම් දරන වගකිවයුත්තන්ගේ නිල නාමයන් සහ රාජකාරිමය පෞරුෂය ගොඩනඟමින් ඒවා මේ රටේ ආර්ථිකයට සෘජු දායකත්වයක් සපයන ආයතන බවට පත්කර ගන්න අපි කඩිනමින් මෙවැනි පනත් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා යෝජනා ඉදිරිපත් කරමින්, වෙනස් කරමින් යන්නේ.

අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම තුළ සිදු කරන්නේ තනතුරු නාමය වෙනස් කිරීම එහෙම නැත්නම් මේ ආයතන ශක්තිමත් කිරීම පමණක්ම නොවෙයි. මේ ක්‍රියාමාර්ගත් එක්ක අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ ගත වුණු ඉතිහාසය තුළ ළඟා කරගන්න බැරි වෙච්ච සුවිශේෂී ජයග්‍රහණ ප්‍රමාණයක් ඉලක්ක කරලා, එහි ආරම්භයක් විධියට තමයි මේ සංශෝධන අපි ඉදිරිපත් කරමින් තිබෙන්නේ. 2030 අවුරුද්ද වනවිට අපේ රටේ අපනයන පරිමාව සියයට 30ක් දක්වා වැඩි කරන්න අපි සැලසුම් කර තිබෙනවා. ඒ ඉලක්කයට යද්දි හෙක්ටෙයාර 13,045කින් නව වගා භූමි ප්‍රමාණය වැඩි කරනවා වාගේම, දැනට වගා කර තිබෙන භූමිවල - සම්පූර්ණ වශයෙන් අපනයන කෘෂිකර්මය සඳහා යොදා ගෙන නැති භූමිවල - අඩුපාඩු සම්පූර්ණ කරමින් හෙක්ටෙයාර 21,915ක් සංවර්ධනය කරන්නත් අපි සැලසුම් කර තිබෙනවා. ඒ සියල්ල අවසානයේ 2030දී ඩොලර් මිලියන 450ක් - 455ක් අපනයන කෘෂිකර්මය හරහා අත්පත් කරගන්නත් අපි අපේක්ෂා කරනවා. මේවා සැලසුම් සහගත, විධිමත්, ප්‍රතිපත්තිමය තීන්දු හරහා ළඟා කරගත යුතු ජයග්‍රහණ. ඒ නිසා තමයි දශක කිහිපයකට පෙර අත්හැරුණු මෙවැනි පනත් සංශෝධනය කරමින් මේ වනවිට කඩිනම් ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලෝකයේ නමක් රඳවා ගත්ත අපනයන භෝග ගණනාවක් හිමි රටක්. ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, කරුංකා නැත්නම් පුවක්, බුලත් ආදී අපනයන භෝග ගණනාවක් අතරින් 'ශ්‍රී ලංකා' නාමය අපනයන වෙළෙඳ පොළ තුළ රඳවා ගන්න අපි සමත් වුණත්, මීට වඩා ධාරිතාවකින්, මීට වඩා පුළුල් වෙළෙඳ පොළ අවස්ථා තුළින් අපට ළඟා කර ගත හැකි ජයග්‍රහණ ගොඩක් තිබෙනවා. අන්න ඒ සඳහා අපි ආණ්ඩුවක් විධියට දැන් කටයුතු කරමිනුයි සිටින්නේ. විශේෂයෙන්ම හම්බන්තොට, මොනරාගල, මාතලේ, නුවර ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක සිටින ලෝකයේ හොඳම ගම්මිරිස් නිෂ්පාදනය කරන ගම්මිරිස් ගොවියා ඉහළ ආදායම් ලබන කෘෂිකාර්මිකයෙකු බවට පත් කරගන්න අපේ රට සමත් වෙලා නැහැ. ඔහු සාමාන්‍ය ආදායමක් ලැබුවාට, රටට ඩොලර් ගෙනෙන,

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ඩොලර් ආදායම වැඩි කර ගත්ත ඉතා ශක්තිමත් ගොවියෙක් බවට පත් කරගන්න මේ සමාජය සහ ආර්ථිකය ඇතුළේ අපට ලොකු විභවයක් තිබෙනවා. ඒ සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අපේ අමාත්‍යාංශය කටයුතු කරමින් ඉන්නවා.

අපි අගය එකතු කළ නිෂ්පාදන හරහා පොකුරු ගම්මාන නිර්මාණය කරමින් ඉන්නවා. ගම්මිරිස් අපනයන පොකුරු ගම්මාන ආරම්භ කරන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා. කුරුඳු අපනයන පොකුරු ගම්මාන නිර්මාණය කරන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සම්බන්ධ වුණත්, අපි දැන් තැඹිලි අපනයන ගම්මාන නිර්මාණය කරමින් තිබෙනවා. තේ අපනයන ගම්මාන නිර්මාණය කරමින් තිබෙනවා. මේ ආණ්ඩුව මේ දශකයේ එළඹෙමින් තිබෙන අනාගත වෙළෙඳ පොළ තුළ ලෝකයේ අවශ්‍යතා හොඳින් හඳුනාගෙන වැඩිම ආදායමක් ඉපයීම සඳහා ඉලක්කගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒ නිසා නිෂ්පාදනය වැඩි කරගන්න, ඒ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි කරගන්න, ඒ හරහා ලෝක වෙළෙඳ පොළ තුළ වැඩි පංගුවක් අත්පත් කරගන්න අමාත්‍යාංශයක් විධියට, දෙපාර්තමේන්තුවක් විධියට ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් ටික තමයි අපි මේ සම්පාදනය කරමින් ඉන්නේ.

ඒ නිසා අපි එළියේ ඉන්න ගොවියාට යෝජනාවක් කරන්න සූදානම්. ගම්මිරිස් ගොවියා, කුරුඳු ගොවියා, කරාබුනැටි ගොවියා, පුවක් ගොවියා, බුලත් ගොවියා, එනසාල් ගොවියා ඇතුළු ඕනෑම වගාවක නිරත වන ගොවීන්ට ඉතාම ශක්තිමත් පදනමක් හදලා දෙන්න ආණ්ඩුවක් විධියට අපි සූදානම්. ඒ සඳහා අවශ්‍ය සියලුම සැලසුම් අපි දැන් බිමේ ක්‍රියාත්මක කරමින් තිබෙනවා. දැන් නිලධාරින් ගමට එනවා. නිලධාරින් දැන් වගාව පරීක්ෂා කරනවා. ඒ විධියට අපි ගොවියාත් එක්ක සම්බන්ධීකරණයක් හදලා තිබෙනවා. ඒ හරහා ගොවියාට තමන්ගේ වගා භූමිය තුළ තිබෙන අඩු පාඩු ටික මඟ හරවාගෙන හොඳම අස්වැන්නක් එක්ක, හොඳම ආදායමක් ලැබීමේ අවස්ථාව අපි හදලා තිබෙනවා.

මේක සම්බන්ධ වනවා, අපේ ආණ්ඩුවේ මූලික අරමුණුත් එක්ක. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගමේ දුප්පත්කම තුරන් කරන්න අවශ්‍ය වනවා. ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව හදලා තිබෙන සැලැස්ම ඇතුළේ කෘෂි කර්මාන්තයට පණ දෙන්නේ නැතිව ගමේ දුප්පත්කම තුරන් කරන්න බැහැ කියන එක අපි විශ්වාස කරනවා. ගමේ සාමාන්‍ය පුරවැසියාගේ අතමිට සරු කිරීම හරහා, ගමේ සාමාන්‍ය ගොවි අම්මා, තාත්තාගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හරහා තමයි ග්‍රාමීය දුප්පත්කම තුරන් කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා අපි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුනරුදයක් හදන්න ඕනෑ. ඒ සඳහා ගත යුතු සියලුම ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විධියට ගනිමින් තිබෙනවා. ඒ නිසා අද දවසේ ඉදිරිපත් කරපු මේ පනත් සංශෝධනය ඒ සඳහා ඉතාම වැදගත් වනවා.

හැබැයි, මේකේ ප්‍රතිඵලය ජනතාවට අරගෙන දෙන්න විපක්ෂය සමත් වුණේ නැහැ කියන එක තමයි අද දවසේ මේ පාර්ලිමේන්තුවේ රැඳී ඉඳලා මේ මහත්වරුන්ගේ කථා ඇහුවාට පස්සේ අපට දැණුනේ. විපක්ෂයකට වගකීමක් තිබෙනවා. ඔවුන් ඒ වගකීම සියයට සියයක් ඉටු කළේ නැහැ කියලා තමයි අපි විශ්වාස කරන්නේ. සමහර මන්ත්‍රීවරුන් ඇත්තටම සාධනීය කරුණු ඉදිරිපත් කළා. අද දවසේ අපි සාකච්ඡා කරපු මේ මාතෘකා දෙකට අදාළව ඉතා හොඳ කරුණු ඉදිරිපත් කරමින් මෙය සංවර්ධනය කරන්න, මෙය වඩා හොඳ සංශෝධනයක් බවට පත් කරන්න කරුණු ඉදිරිපත් කරපු මන්ත්‍රීවරුනුත් හිටියා. හැබැයි, බහුතරයක් මේක අත් හැරලා තමන්ගේ පටු න්‍යාය පත්‍රය පිළිබඳව, හෙට දවසේ ඔවුන්ට මුහුණ දෙන්න වෙන ඛේදවාචකය පිළිබඳව හිතමින් තමයි කරුණු ඉදිරිපත් කළේ. කොහොම නමුත් අද දවසේ අපි සම්මත කර ගනු ලබන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පතත්, විදුලිබල මණ්ඩලයේ පරිපූරක ඇස්තමේන්තුවත් කියන කටයුතු දෙක සෘජුවම ජනතාවත් එක්ක බැඳෙන, හෙට දවසේ අපේ ආර්ථිකය ශක්තිමත් කරන තීන්දු-තීරණ වනවා. ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙච්ච සියලුදෙනාට මම ස්තුතිය පුද කරනවා.

වැව් හදන්න, ගමට තාක්ෂණය ගේන්න, නිවාස හදන්න, ආණ්ඩුව විධිමත් දැවැන්ත සැලැස්මක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර අය පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරමින් ඉන්නවා, මෙච්චර වැව් ප්‍රමාණයක් හදන්න පුළුවන්ද කියලා. වැව් හදන්න බැහැ, ඔය විපක්ෂයේ හිටපු මහත්වරුන් අනුගමනය කරපු ක්‍රමවේදයට. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් වාර්මාර්ග දෙපාර්තමේන්තු, මහවැලි අධිකාරිය වාගේම අපි විශේෂයෙන් ක්‍රියාත්මක කරන "වාරි මහිම අපේ උරුමය" කියන ව්‍යාපෘතිය හරහා අපේ රටේ ප්‍රතිසංස්කරණය කළ යුතු වාරි පද්ධති හඳුනාගෙන මේ කෙටි කාලය ඇතුළේ -වැස්සට පෙර, කන්නයේ අස්වැන්න ගත්තාට පසුව ලැබෙන කාලයේ, මේ කන්නයේ අවසානයේ, 2027ට අදාළව ගත්තොත් පෙබරවාරි, මාර්තු මාසවල ඇති වන නියං කාලය- ඉතාම විධිමත්, සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා විපක්ෂය කලබල වෙලා තිබෙනවා. විපක්ෂය කියනවා, අපි මේ කියන්නේ අසත්‍ය කියලා. නැහැ, මේක බිමේ යථාර්ථයක් බවට පත් කරන්න අපට පුළුවන්. අපි ඒ සඳහා සැලසුම් සකස් කරමින් තිබෙනවා. මේ ඇති වෙලා තිබෙන එල් නිනෝ තත්ත්වයත් එක්ක හිඳිලා ගිය වැව් ප්‍රතිසංස්කරණය කරන්න ලෝක බැංකුව අපට දැවැන්ත මුදලක් දීලා තිබෙනවා. ඒ සියල්ලත් පාවිච්චි කරමින්, අපේ රටේ වාරි පද්ධතිය අපි නවීකරණය කරනවා.

අද විපක්ෂය නඟන චෝදනා සියල්ල අසත්‍යයයි කියන එක ජනතාව තේරුම් ගනිමින් තිබෙනවා. ඔවුන්ට වෙන කිසිවක් නැහැ, ඔවුන්ගේ හෙට දවසේ ඉරණම තීන්දු කර ගැනීම සඳහා විතරයි ඔවුන් කටයුතු කරමින් තිබෙන්නේ. ආණ්ඩුව, අද දවසේදී වාගේම පාර්ලිමේන්තුව උපරිම වශයෙන් පාවිච්චි කරනවා, රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට වාගේම රටේ ජනතාවට ජයග්‍රහණ ගේන්න. එහි ඉතාම තීරණාත්මක දවසක් තමයි අද දවස. මොකද, අද අපි මේ පනත් සංශෝධනය සම්මත කරනවා. එම නිසා අද දවස අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ජයග්‍රාහී දවසක්. ඒකේ ප්‍රතිලාභ ගන්න ජනතාවටත් ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරන ගමන්, ආයතනය විධියටත්, නිලධාරින් විධියටත්, දේශපාලන අධිකාරිය විධියටත් ඒ ජයග්‍රහණ ලබා දෙන්න, හැමෝම අත්වැල් බැඳ ගනිමු කියන යෝජනාවත් කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு கே.டீ. லால் காந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. K.D. Lalkantha.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 6 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## පරිපූරක මුදල: විදුලිබල කර්මාන්තය සඳහා සහනාධාරයක් ලබා දීම
### குறைநிரப்புத் தொகை: மின்சாரத் துறைக்கு மானியம் வழங்குதல்
### SUPPLEMENTARY SUM: PROVISION OF SUBSIDY TO ELECTRICITY INDUSTRY

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන දාහත් දහස් දෙසිය දහතුනක් (රු.17,213,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 119 | - | බලශක්ති අමාත්‍යවරයා | |
| වැඩසටහන | 01 | - | මෙහෙයුම් වැඩසටහන<br>පුනරාවර්තන වියදම්<br>මුළු වියදම | <br><br>රු. 17,213,000,000 |
| | | | | රු.17,213,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2 යටතේ පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

## කල්තැබීමේ ප්‍රශ්න
### ஒத்திவைப்பு வினாக்கள்
### ADJOURNMENT QUESTIONS

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ප්‍රශ්නය අසන්නේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් ඇමතිතුමාගෙන්.

ශ්‍රී ලංකාවේ 732,771කට ආසන්න බිහිරි ප්‍රජාවගේ ප්‍රමුඛතම සන්නිවේදන මාධ්‍යය වන්නේ සංඥා භාෂාවයි. ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ, අධ්‍යාපනය ලැබීමේ සහ පොදු රාජ්‍ය සේවාවන් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා සංඥා භාෂාවක් නිල වශයෙන් පිළිගත් භාෂාවක් බවට පත් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කාලීන වගකීමකි.

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

(I) මෙරට බිහිරි ප්‍රජාවගේ මූලික සන්නිවේදන මාධ්‍යය වන ශ්‍රී ලාංකේය සංඥා භාෂාව නිල වශයෙන් පිළිගත් භාෂාවක් බවට පත් කිරීම සඳහා රජය මඟින් පියවර ගන්නේද?

(II) සංඥා භාෂාව සංවර්ධනය කිරීම සහ සම්මතකරණය කිරීම උදෙසා ගෙන ඇති පියවර කවරේද?

(III) රාජ්‍ය ආයතන ආශ්‍රිතව බිහිරි ප්‍රජාවට සේවාවන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි සුදුසුකම්ලත් සංඥා භාෂා පරිවර්තකයන් පුහුණු කිරීමේ සහ අනුයුක්ත කිරීමේ වැඩ පිළිවෙළක් පවතින්නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රශ්න ගරු අමාත්‍යතුමාගෙන් මා විමසන්න හේතුව අද ජාත්‍යන්තර සංඥා භාෂා දිනය නිසායි. ඔබතුමන්ලා දන්නවා, සංඥා භාෂාව කියන්නේ බිහිරි ප්‍රජාව අතර සන්නිවේදනය පවත්වාගෙන යාමේ ක්‍රමවේදය බව. ලක්ෂ 7කට අධික බිහිරි ප්‍රජාවක් ශ්‍රී ලංකාව තුළ ජීවත් වන අතර, ඒ ප්‍රජාවට සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ දැඩි හිඟයක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, මෙම සංඥා භාෂාව නීතිගත කිරීම සඳහා යම් උත්සාහයක් ගනිමින් සංඥා භාෂා පනත් කෙටුම්පතක් සකස් කර ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ තුළ තමයි ලක්ෂ 7කට අධික බිහිරි ප්‍රජාවගේ ප්‍රශ්නය විසඳෙන්නේ. මොකද, බිහිරි බව කියන්නේම සන්නිවේදනමය ආබාධිතතාවක්. බිහිරි බව නිසා ඇති වෙලා තිබෙන සන්නිවේදන බාධාව ඉවත් වුණොත් ඇත්තෙන්ම බිහිරි ප්‍රජාවට කිසිදු ගැටලුවකින් තොරව තම දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීමට, දෛනික සේවාවලට සහ සංවර්ධනයට දායක වීම වාගේ සියලු කටයුතු කර ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ මේක රජයේ වගකීමක් කියලා. සංඥා භාෂාව පිළිබඳව තිබෙන ගැටලු සහ එහි සංවර්ධනයට තිබෙන ගැටලු නිසා ඇත්තෙන්ම බිහිරි ප්‍රජාවගේ අධ්‍යාපන අවශ්‍යතා ඉතා දුර්වල මට්ටමක තිබෙන්නේ. මොකක්ද, ඒකට හේතුව? සංඥා භාෂාව සහ ඒ විෂයානුබද්ධ දැනුම සම්පූර්ණ වුණු ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ ගුරුවරුන්ගේ හිඟය බිහිරි ප්‍රජාවගේ අධ්‍යාපන තත්ත්වය පහත වැටෙන්න හේතු වෙලා තිබෙනවා. Paper qualifications නොමැති වීම නිසා ඇත්තෙන්ම බිහිරි ප්‍රජාවට සිද්ධ වෙලා තිබෙන්නේ ශ්‍රමය වගුරන, කායික ශ්‍රමය පදනම් කර ගත්ත රැකියාවල නියුතු වෙන්නයි. සංඥා භාෂාව ප්‍රචලිත නැති නිසා රැකියාවල නිරත වන අයගෙන් සේවා ලබා ගැනීමේ අපහසුතා පවතිනවා වාගේම ඔවුන් සේවා නියුක්ත කර ගැනීමට සේවා යෝජකයන් පසුබානවා. ඒක ලොකු ගැටලුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන් සංඥා භාෂාව විධිමත් භාෂාවක් විධියට පිළිගෙන නෛතික තත්ත්වයක් නිර්මාණය වීම ප්‍රමාද වීම නිසා ඔවුන්ට තොරතුරු දැනගැනීමේ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. ඇත්තෙන්ම මේ පවතින්නේ තොරතුරු පදනම් කර ගත්ත ආර්ථික ක්‍රමයක්, තොරතුරු මත පදනම් වෙච්ච සමාජ ක්‍රමයක්. මේ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම නිසා ඉතා කනගාටුදායක තත්ත්වයක් තමයි බිහිරි ප්‍රජාවට අත්විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, ජාතික රූපවාහිනිය සහ පෞද්ගලික මාධ්‍ය නාලිකාවක් වන "සිරස" මාධ්‍ය ආයතනය විතරයි රූපවාහිනි ප්‍රවෘත්තිවලට සංඥා භාෂාව ඇතුළත් කර තිබෙන්නේ කියන එක. හැබැයි, බිහිරි ප්‍රජාවගෙන් කියැවෙන දෙයක් තමයි ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී සංඥා භාෂාව ඉදිරිපත් කිරීමට යොදා තිබෙන කොටුව ප්‍රමාණවත් නැහැ කියන එක. එම කොටුව ඊට වඩා ප්‍රමිතිගතව පළල් විය යුතුයි. එහෙම නැත්නම් ඔවුන්ට ඇස් මහන්සි කරමින් ඉතා දුෂ්කර විධියට තමයි ඒ කුඩා කොටුව දෙස බලන්න වෙන්නේ. ඒ නිසා ජාතික රූපවාහිනී නාලිකාවටත්, "සිරස" නාලිකාවටත් අප ස්තුතිවන්ත වන ගමන් ඔවුන්ට යෝජනා කරනවා, එම කොටුව පළල් කරන ලෙසත්. ඒ එක්කම ජනමාධ්‍ය විසින් සමාජ වගකීමක් දරනවා නම් අනෙක් රූපවාහිනී නාලිකාවලටත් අපි යෝජනා කරනවා, සංඥා භාෂාව හරහා ලක්ෂ 7කට අධික බිහිරි ප්‍රජාවට තොරතුරු දැනගැනීමට ඔවුන්ගේ රූපවාහිනී නාලිකා හරහාත් අනිවාර්යයෙන්ම ප්‍රවෘත්ති විකාශන තුළදීවත් සංඥා භාෂා පරිවර්තන සපයන්න කියලා.

සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ විශාල හිඟයක් තිබෙන බව මම කලිනුත් කිව්වා. ඒ හිඟය මකන්න නම් රාජ්‍ය අංශයේ රැකියාවලට සංඥා භාෂා පරිවර්තකවරුන් බඳවා ගැනීම අත්‍යවශ්‍යයි. ඒ බඳවා ගන්නා අය අතර තව ගැටලුවක් තිබෙනවා.

මෙහිදී CODA දරුවන් ගැනත් සඳහන් කළ යුතුයි. CODA දරුවන් කියන්නේ, බිහිරි දෙමව්පියන්ගේ දරුවන්. බිහිරි දෙමව්පියන්ගේ දරුවන්ට සංඥා භාෂාව හැසිරවීම පිළිබඳව ඉතා ඉහළ පරිචයක් තිබෙනවා. ඒ ඉහළ පරිචය රාජ්‍ය සේවයට ලබා ගැනීමට නොහැකි වෙලා තිබෙන්නේ ඔවුන්ගේ අඩු අධ්‍යාපනික සුදුසුකම් නිසායි. ගරු අමාත්‍යතුමනි, එම නිසා මම යෝජනා කරනවා, මේ CODA දරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව වැඩි අවධානයක් යොමු නොකර ඔවුන්ට ඒ සුදුසුකම් සම්පූර්ණ කරගන්න අවස්ථාව සලසා දී, ඒ අතර ඔවුන්ගෙන් ලබා ගත හැකි සංඥා භාෂා පරිචය බිහිරි ප්‍රජාවට ලබා දෙන්න කියලා. ඒ තුළ CODA දරුවන්ට ලොකු අවස්ථාවක් හම්බ වෙනවා. ඒ දරුවන්ට තමන්ගේ දෙමව්පියන් බිහිරි නිසා තම අධ්‍යාපනික අවස්ථා අහිමි වුණත්, බිහිරි ප්‍රජාවට අවශ්‍ය සංඥා භාෂා පරිවර්තකයන්ගේ හිඟය ඔවුන් තුළින් මකා දැමිය හැකියි. ඒ නිසා එම සේවාව ලබා ගන්න කියා මා යෝජනා කරනවා.

අනෙක් පැත්තෙන්, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළදීත් බිහිරි ප්‍රජාව ගැටලුවලට මුහුණ පානවා. එහිදී ඔවුන් මුහුණ දෙන ලොකුම ප්‍රශ්නය තමයි තමන්ගේ රෝගී තත්ත්වය පිළිබඳව, තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව වෛද්‍යවරුන් සමඟ, රෝහල් කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කරන්න බැරිකම. මේ සියලු අංශවලදී බිහිරි ප්‍රජාව මුහුණපාන දැඩිම දුෂ්කරතාව තමයි සංඥා භාෂා පරිවර්තනය හරහා සන්නිවේදනය පුළුල්ව සිද්ධ කරන්න බැරිකම.

ගරු අමාත්‍යතුමනි, ජාත්‍යන්තර සංඥා භාෂා දිනය යෙදෙන අද දවසේ අපි යෝජනා කරනවා, සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ හිඟය මඟ හරිමින්, සුදුසුකම්ලත් සංඥා භාෂා පරිවර්තකවරුන් පුහුණු කරමින් මේ බිහිරි ප්‍රජාවගේ සන්නිවේදන අවශ්‍යතාව ඉෂ්ට කරන්න අපි මැදිහත් වෙමු කියලා. ඒ තුළ තමයි ලක්ෂ 7කට අධික - තමන්ගේ හඬ, තමන්ගේ හැඟීම, තමන්ගේ අදහස එළියට කියා ගන්න බැරි - මේ බිහිරි ප්‍රජාවට හඬක් වෙන්න අපට හැකි වන්නේ. ඒ සඳහා සමාජයට වගකීමක් තිබෙනවා, රජයට වගකීමක් තිබෙනවා. ඒ වාගේම අපේ සමස්ත සමාජයටම වගකීමක් තිබෙනවා, මේ සංඥා භාෂාව පිළිබඳ දැනුවත්භාවය තහවුරු කර ගනිමින් මේ ප්‍රජාවත් සමාජය තුළට අන්තර්කරණීය ප්‍රවේශයක් හරහා ඇතුළත් කර ගැනීමට. ඒ සඳහා අදට යෙදෙන ජාත්‍යන්තර සංඥා භාෂා දිනය යොදා ගනිමු කියන යෝජනාව කරමින් මේ ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තුවෙන් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු ලබා දීම, ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ගරු සුගත් වසන්ත ද සිල්වා මැතිතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, අද දවසේ සභාව කල්තබන අවස්ථාවේ මේ ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධයෙන්. මොකද, අදට තමයි ජාත්‍යන්තර සංඥා භාෂා දිනය යෙදී තිබෙන්නේ. 1951 වර්ෂයේ සැප්තැම්බර් 23වැනි දින ලෝක බිහිරි සම්මේලනය ස්ථාපනය කිරීම අගයනු වස් 2017 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ජාත්‍යන්තර සංඥා භාෂා දිනය ප්‍රකාශයට පත් කරනු ලැබුවා. ඒ අනුව යමින් 2018 වර්ෂයේ සිට සෑම වර්ෂයකම සැප්තැම්බර් මාසයේ 23වැනි දින ජාත්‍යන්තර සංඥා භාෂා දිනය ලෝකවාසී ජනතාව විසින් සමරනු ලබනවා.

ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(I) ඔව්.

සංඥා භාෂාව පිළිගත් භාෂාවක් ලෙස ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මීට පෙර අනුමැතිය ලැබී තිබුණා. ඒ අනුව යමින් වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ 2025 වර්ෂයේ ජුනි මස 2වැනි දින පැවැත්වූ කැබිනට් රැස්වීමේදී ගත් තීරණයක් මත සංඥා භාෂාව පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කරලා නීතිමය ආවරණය ලබා දීම සඳහා සහ නිල වශයෙන් සංඥා භාෂාව පිළිගැනීම සඳහා එය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර තිබෙනවා. එසේ අනුමත කරනු ලැබූ කැබිනට් පත්‍රිකාව අනුව සංඥා භාෂාව පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කරලා නීති කෙටුම්පත් සම්පාදක විසින් එහි අවසන් කෙටුම්පත මේ වන විට සකස් කරමින් ඉන්නවා. ඉතාම කෙටි කාලයක් තුළ නීතිපති නිෂ්කාසනය ලබාගෙන සංඥා භාෂාව පිළිබඳ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

(II) විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ සේවා දෙපාර්තමේන්තුව, සංඥා භාෂාව සංවර්ධනය කිරීම සහ සම්මතකරණය උදෙසා කාර්යයන් රාශියක් ඉටු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම බිහිරි පුද්ගලයින් සඳහා සංඥා භාෂා පරිවර්තන සේවා සැපයීම ප්‍රධාන වශයෙන් කරගෙන යනවා. ඒ වාගේම, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සංඥා භාෂා ඒකකයක් පිහිටුවලා සංඥා භාෂාව ප්‍රවර්ධනය සඳහා වැඩ කටයුතු රාශියක් කරගෙන යනවා. විශේෂයෙන්ම අපි පසුගිය වර්ෂය තුළ සංඥා භාෂා පරිවර්තක සංචිතය 36දෙනෙක් දක්වා පුළුල් කරගෙන තිබෙනවා. ඒ සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ නිර්දේශ මත සමාජ සේවා දෙපාර්තමේන්තුව, සංඥා භාෂා පරිවර්තක සංචිතය කුසලතා මත වර්ගීකරණය කරමින් සංඥා භාෂාවෙන් ගනුදෙනු කරන - සන්නිවේදනය කරන - අයට වඩාත් හොඳ සේවාවක් ලබා දීම සඳහාත් කටයුතු කරමින් ඉන්නවා.

ඊට අමතරව, විශේෂයෙන්ම සංඥා භාෂාව පිළිබඳ ග්‍රන්ථයක් පිළියෙල කරලා, 2024 වර්ෂයේදී සිංහල භාෂාවෙන්, ඒ වාගේම 2025 වර්ෂයේදී ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින් ප්‍රකාශයට පත් කරලා, ඒ අනුව සංඥා භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතුත් කරගෙන යමින් පවතිනවා.

(III) ඔව්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සංඥා භාෂාව රාජ්‍ය ආයතන තුළත්, පෞද්ගලික අංශය තුළත් වැඩි වැඩියෙන් භාවිත කිරීම ප්‍රචලිත කිරීම සඳහා අපි 2025 වර්ෂයේදී රාජ්‍ය සේවයේ නිරත වූ නිලධාරින් සංඥා භාෂාව පිළිබඳව පුහුණු කිරීමේ වැඩමුළු ආරම්භ කළා. ඒ අනුව, ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම රාජ්‍ය නිලධාරින් සංඥා භාෂාව පිළිබඳව පුහුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කරනවා. අපි 2025 වර්ෂයේදී මෙයට අදාළ වැඩසටහන් දෙකක් දිස්ත්‍රික්ක දෙකක පැවැත්වූවා. ඒ වාගේම, 2026 වර්ෂයේ මේ වෙනකොට අපි තවත් වැඩසටහන් 4ක් පවත්වමින් ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම රාජ්‍ය සේවය ලබාදෙන රාජ්‍ය නිලධාරින් සඳහා සංඥා භාෂාව පිළිබඳ පුහුණුවක් ලබා දීමේ වැඩ කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම, ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දීම සඳහා, උදාහරණයක් විධියට බස් රථවල සේවය කරන රියදුරන් හා සහායකයින් සඳහා සංඥා භාෂා පුහුණුව ලබා දීම ආරම්භ කර තිබෙනවා. මේ වන විට අපි 119දෙනෙක් පුහුණු කරලා තිබෙනවා. ඒ වාගේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයෙන්, සංඥා භාෂා භාවිත කරන්නට කැමති පෞද්ගලික අංශයේ අයත් මේ වෙනකොට අපි පුහුණු කරමින් ඉන්නවා. ඒ වාගේම, 2023 වර්ෂයේ සිට සෑම වර්ෂයකම සැප්තැම්බර් 23වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ජාත්‍යන්තර සංඥා භාෂා දිනය සමරමින් සංඥා භාෂාව ප්‍රවර්ධනය කිරීමටත්, ප්‍රචලිත කිරීමටත් වැඩ කටයුතු කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම, ශ්‍රවණ හා කථන ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහාය දීමේ අරමුණින් අපි පසුගිය 2025 වර්ෂයේදී WhatsApp වීඩියෝ ඇමතුම් පහසුකම් සහිත දුරකථන අංකයක් හඳුන්වා දුන්නා. 2025 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා එම WhatsApp අංකය හරහා අපට පැමිණිලි 350ක් පමණ ලැබී තිබෙනවා. අපි විශේෂයෙන්ම ආබාධිත අයට දෙන දීමනාව සම්බන්ධ පැමිණිලි, පවුල් ගැටලු, පොලිස් පැමිණිලි, රැකියා අවස්ථා සම්බන්ධ පැමිණිලි මේ WhatsApp අංකය හරහා සංඥා භාෂාවෙන් ලබාගෙන ඒවාට පිළිතුරු ලබා දීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම තමයි, අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව International Foundation for Electoral Systems කියන සංවිධානයත් සමඟ සහයෝගයෙන් රාජ්‍ය ආයතනවල සේවාවන් සම්බන්ධ තොරතුරු සංඥා භාෂාවෙන් ලබා ගැනීම සඳහා QR කේතයක් හඳුන්වා දීලා ඒ පිළිබඳවත් අපි වැඩ කටයුතු කරගෙන යනවා. මේ ආකාරයෙන්, සංඥා භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහාත්, තවදුරටත් සංවර්ධනය කිරීම සඳහාත් විශේෂයෙන්ම අපේ රජය කටයුතු කරමින් ඉන්න බව ප්‍රකාශ කරමින් මම පිළිතුරු ලබා දීම අවසන් කරනවා.

බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ දෙවැනි ප්‍රශ්නය, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් තමයි මා මෙම ප්‍රශ්නය අහන්නේ

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

01. සමුපකාර සමිතිය වෙතින් අය කරන විවිධ බදු හේතුවෙන් බොහෝ සමුපකාර සමිති ඇවර කරන්නට යන බව දැනගන්නට ඇත. මෙසේ අයකරන බදු වර්ග මොනවාද? අයකරන බදු වර්ග සඳහා යම් සහනයක් ලබාදීම සිදු කරන්නේද?

02. බදු අය කර ගැනීම හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවන්ට පත්ව ඇති සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද?

03. රජයේ ප්‍රතිලාභ ජනතාව වෙත ලබාදීමේදී පසුගිය කාලවකවානුවලදී එකී ප්‍රතිලාභ රජයට අනුබද්ධ සමුපකාර සමිති හරහා නිකුත් කිරීම හේතුවෙන් සමුපකාර සමිතිවල ස්ථාවරත්වයට එම තත්ත්වය වඩාත් බලපෑ බැවින් වත්මන් රජයත් එම ප්‍රතිපත්තියම ක්‍රියාවට නංවන්නේද?

04. වර්තමානයේදී දැඩි අර්බුදයකට මුහුණ දී සිටින සමුපකාරය ආරක්ෂා කිරීම සඳහා රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?

විශේෂයෙන්ම මෙහිදී පොඩි කාරණා කිහිපයක් කියන්න මම කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සමුපකාරවලින් කාරණා කිහිපයක් සිද්ධ වෙනවා. එනම් සේවා සැපයීම, තොග හා සිල්ලර වෙළෙඳාම සහ නිෂ්පාදන සැපයීම කියන ඒවා. මේවායෙන් ලැබෙන සමස්ත ආදායමින් සියයට 2.5ක් සමාජ ආරක්ෂණ බද්දක් වශයෙන් අය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් තේරෙනවා ඇති, ඒක දැන් විශාල අර්බුදයක් වෙලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් සමුපකාර මල්ශාලාවල තිබෙන තත්ත්වය ගත්තොත්, සමහර වෙලාවට අනෙක් මල්ශාලාවලට වඩා අඩු වියදමකින් ඒ කටයුත්ත කරන්න සමුපකාර මල්ශාලාවක් උත්සාහ කරනවා. හැබැයි ඔවුන්ට තරග කරන්න තිබෙන්නේ බොහොම අඩු ප්‍රමාණයක පහසුකම් ටිකක්. නමුත් ඒකෙන් එන ලාභය එන්නේ සමුපකාරයට. හැබැයි, ඒකට විශේෂයෙන් සමාජ ආරක්ෂණ බද්දක් අය කරන්න වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා, මේ ආණ්ඩුව විසින්.

විශේෂයෙන්ම සහල් මේ බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. සමස්ත විකුණුම්වලින් සියයට 2.5ක විකුණුම්වලට මේ සමාජ ආරක්ෂණ බද්ද ගහනවා. මේක නිසා විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, පෞද්ගලික අංශය වෙළෙඳ කටයුතුවලදී පොත්පත් තියාගන්නේ නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, සමුපකාරයක පොත්පත් තියාගෙන, ලැබෙන ගණන් කොච්චරද, කීයටද ගත්තේ, මොකක්ද වුණේ කියලා ඔක්කෝම සටහන් කරන බව. නමුත් මෙතැනදී පෞද්ගලික අංශයට සිද්ධ වෙන දේට වඩා වෙනස් දෙයක් තමයි අපිට සිද්ධ වන්නේ. විශේෂයෙන්ම ලාභය මත නොවෙයි, කෙළින්ම ගනුදෙනු මත, සමස්ත විකුණුම් මත මේ බද්ද අය කරන නිසා සමුපකාර අංශයට විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම Food City ආකාරයෙන් පවත්වාගෙන යන, සියයට 100ක් පෞද්ගලික අංශයේ ආයතනත් එක්ක හැප්පෙන්න දාලා තිබෙන්නේ Co-op City එක. Co-op City එකේත් මේ වාගේම අර්බුදයක් තිබෙන්නේ. ඔබතුමා දන්නවා Food Cityවලට විවිධ තැන්වලින් භාණ්ඩ ගේන බව. උදාහරණයක් ගත්තොත්, සමුපකාර සාමාන්‍ය කුඩා නිෂ්පාදකයෙකුගෙන් පවා භාණ්ඩ මිලදී ගන්නවා, ඒ අයට ලබාදෙන සහනයක් විදියට. දැන් ඔවුන්ට ඒකට VAT එක අය කරගන්න විදියක් නැහැ. මොකද, කුඩා නිෂ්පාදකයෙකුගෙන්, අහිංසක පුද්ගලයෙකුගෙන්, මිරිස් ටිකක් කුඩු කරලා විකුණන පුද්ගලයෙකුගෙන් ඒ වාගේ දෙයක් ගත්තොත්, ඒකත් හරිම අමාරු තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා සමුපකාරයක් ගත්තාම, ප්‍රාදේශික තිබෙන බව. සාමාන්‍යයෙන් ඔබතුමා දන්නවා, ආයතනයක ආදායම රුපියල් ලක්ෂ 30ට අඩු නම් ඒක සමාජ ආරක්ෂණ බද්දට අයිති වෙන්නේ නැහැ කියලා. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? සමස්ත සමුපකාරයම තමයි මේකට අහුවෙන්නේ. සමුපකාරයේ අර තිබෙන ප්‍රාදේශිකවලට බලපාන්නේ නැති විධියට මේක හදලා තිබෙනවා නම් සමහර වෙලාවට ඒවාට මේකෙන් ගැලවෙන්න පුළුවන්. මම ඉල්ලීමක් කරනවා, අපේ ගරු ඇමතිතුමාගෙන්. විශේෂයෙන් මේකෙදි කරන්න ඕනෑ ප්‍රධානම කාර්යය මෙයයි. සමස්ත සමුපකාරයට බදු ගහන්නේ නැතුව අඩුම තරමින් අර ප්‍රාදේශිකවලට ගොඩඑන්න පුළුවන් විධියට ඒවා සමාජ ආරක්ෂණ බද්දෙන් නිදහස් කර ගත්තොත් අපිට මේක දියුණු කරගන්න පුළුවන් තත්ත්වයක් එනවා. එහෙම නැත්නම් වෙන්නේ මේ සමුපකාර සමිති විශාල වශයෙන් කඩා වැටෙන එකයි. මොකද, දැනටමත් සමුපකාර සමිති පවත්වා ගෙන යන්න බැරි තැනකටයි තල්ලු වෙලා තිබෙන්නේ. සමහර සමුපකාර සමිතිවලට තමන් ලබන පිරිවැටුම මත මාසයකට රුපියල් කෝටි එකහමාරක් පමණ ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මෙය විශාල අර්බුදයක් බවට පත් වෙලායි තිබෙන්නේ. මෙයට අමතරව සේවකයන්ගේ මාසික වැටුප් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම, ජලය, විදුලිය, වාහන සහ ගොඩනැගිලි නඩත්තු වියදම්, අර්ථසාධක, නිල ඇඳුම් වාගේම අනෙකුත් අමතර සේවාවන් සඳහා වැය වන පිරිවැය දරා ගන්න බැරුව දැන් විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. මම කලිනුත් කිව්වා වාගේ දෛනික ජීවිකාව පවත්වාගෙන යෑම සඳහා ස්වයං රැකියාවල නියුතු අයගෙන් VAT එකක් අය කරන්න බැහැ. ඒ නිසා ඔවුන්ගෙන් භාණ්ඩ මිල දී ගන්නවා. ඒ අයටත් අනෙකුත් ආයතනවලටත් ප්‍රශ්නයක් නැහැ. නමුත් සමුපකාර සමිතිවලට එය විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මතු කරන අනෙක් කාරණය මෙයයි. විශේෂයෙන්ම සමුපකාර සමිතිවල ලාභ ප්‍රතිශතය සාමාන්‍යයෙන් පවතින්නේ සියයට 7.5ක මට්ටමකයි. සමුපකාර සමිතිවල ගිණුම්කරණ කටයුතු නිවැරැදිව සිදු කරන නිසා, පෞද්ගලික අංශයේ ව්‍යාපාර සමඟ තරග කිරීමේදී එය විශාල අර්බුදයක් වනවා. මොකද, පෞද්ගලික ව්‍යාපාරිකයන් සැබෑ ආදායම පෙන්වන්නේ නැහැ. සමහර වෙලාවට ආදායම සඟවමින් කටයුතු කරනවා. නමුත් සමුපකාර සමිති තම ගිණුම් පොත්පත්වලින් ඒවා නිවැරැදිව පෙන්වන්නම ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ ලොකු leakage එකක් ඇවිල්ලා, විශාල අර්බුදයක් ඇති වෙලා මුළු සමුපකාර සමිතියම සමුපකාර පනතේ 46වන වගන්තිය යටතේ පරීක්ෂණයකට යටත් වන එකයි. ඒක නිසා සමුපකාරයේ කටයුතු පවත්වාගෙන යන්න අමාරුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මතු කරන අනෙක් කාරණය මේකයි. සමුපකාර සමිති බොහෝ වෙලාවට විධිමත් අලෙවිකරුවන්ගෙන් පමණයි භාණ්ඩ මිල දී ගන්නේ. සිල්ලර වෙළෙඳ සැල් ඇතුළු අනෙකුත් වෙළෙඳ සැල්වල වෙන්නේ විධිමත් අයගෙන්ම නොව විවිධ අයගෙන් - ඕනෑම කෙනෙකුගෙන් - මිල දී ගන්නා එකයි. හැබැයි සමුපකාර ආයතන විධිමත් අලෙවිකරුවන්ගෙන්ම මිල දී ගැනීම් කළ යුතු නිසා undercut කරන්න වෙන්නේ නැහැ. එම නිසා මෙතැන විශාල අර්බුදයක් තිබෙනවා. එහෙම නම්, ආණ්ඩුව මේ ගැන විශේෂයෙන් කල්පනා කළ යුතුයි; සමුපකාර ක්ෂේත්‍රය රැක ගන්න කටයුතු කළ යුතුයි. ඔබතුමන්ලා නිරන්තරයෙන්ම ප්‍රකාශ කරන්නේ මෙය ලංකාවේ බිහි වූ පළමුවැනි ජනතා ආණ්ඩුව කියලා නේ. එහෙම නම්, ජනතාවගේ ආණ්ඩුවට කරන්න තිබෙන ප්‍රධාන දේ තමයි, සමුපකාර ක්ෂේත්‍රය රැක ගන්න වැඩ පිළිවෙළක් හදන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා වයඹ පළාතේ මහ ඇමතිවරයාව සිටින විට අපි එම පළාතේ සියලු සමුපකාර සේවකයන්ගේ පඩි වැඩි කළා. මා එම ධුරයට පත් වන කොට සමුපකාර ක්ෂේත්‍රයේ සාමාන්‍ය මැනේජර් කෙනෙකුගේ වැටුප විධියට තිබුණේ, රුපියල් 7,500යි. නමුත් අද වන කොට සාමාන්‍ය මැනේජර් කෙනෙකුට රුපියල් 75,000ක පඩියක් හම්බ වෙනවා. මම වයඹ පළාතේම තිබෙන සමස්ත සමුපකාරවලම සේවකයන්ගේ පඩි වැඩි කළා. ඒ වාගේම ඔවුන්ට වෙනම විශ්‍රාම

වැටුපක් හදලා දුන්නා. මා කියන්නේ, මෙවැනි දේවල් පළාතෙන් පළාතට කරන්නේ නැතිව සමස්තයක් විධියට අරගෙන කරන්න කියලායි. මම මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ, සමුපකාර ක්ෂේත්‍රය විධිමත් කරන කටයුත්තට අත ගහන්න කියලායි.

2023 වසරේදී විතර ඉඳන් ගෙවුණු වසර තුනක කාලය පුරා ඔබතුමන්ලාගේ පාලනය යටතේ තිබූ සමුපකාර ආයතනවල බලය දැන් වෙනත් පක්ෂවලට ගිහින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අයටත් දැන් තේරෙනවා ඇති, මේවා කරගෙන යන්න බැහැ කියලා. එවැනි තැනකට තල්ලු වෙලායි තිබෙන්නේ. එහෙම නම්, කොයි තරම් අමාරුවෙන්ද සමුපකාර සමිති ඇදගෙන යන්නේ කියන කාරණය අවධානයට ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මේකයි. මේක කියන්න මම තවත් එක විනාඩියක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා, එහි සිටින කොමසාරිස්තුමා ඇතුළු ඔක්කෝම එකතු වෙලා සමුපකාර නිලවරණ පැවැත්වීම නතර කර තිබෙනවා. මම දන්නේ නැහැ, පරදින නිසාද ඒක කරන්නේ කියලා. ඒ අය දැන් කරලා තිබෙන්නේ මොකක්ද කියා මම ඔබතුමන්ලාට කියන්නම්. මීට පෙර තිබුණු ක්‍රමයට සාමාන්‍යයෙන් සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් සාමාජික ලේඛනවලට අනුව තමයි ඡන්දය පවත්වන්නේ. නමුත් වයඹ පළාතේ ආණ්ඩුකාරතුමාගේ යෝජනාවකට අනුව, කොමසාරිස්තුමා සෑම සමුපකාර සමිතියකටම ලිපියක් යොමු කරමින් දන්වා තිබෙනවා ඒ ඔක්කෝම ටික නැවත පරීක්ෂා කරන්න කියලා. පඬුවස්නුවර සමුපකාර සමිතිය උදාහරණයක් හැටියට ගත්තොත්, එහි සාමාජිකයෝ 54,000ක් ඉන්නවා. මිය ගිය අය, රට හැර ගිය අය ඇතුළු ඔක්කෝම ගැන සොයලා තමයි සාමාන්‍යයෙන් නම් ඇතුළත් කරන්නේ. දැන් වෙලා තිබෙන දේ මම ඔබතුමාට කියන්නම්. ඒ එක් සාමාජිකයෙකුට ලියුමක් යවන්න රුපියල් 150ක් අවශ්‍ය වෙනවා. ඒ අනුව, පඬුවස්නුවර සමුපකාර සමිතියේ ඒ ලැයිස්තුව clear කරන්න රුපියල් එක්කෝටි පනස් ලක්ෂයකට වැඩි මුදලක් වැය වෙනවා. මේකෙන් මොකක්ද වෙන්නේ? වෙනදා තිබුණේ නැති අලුත් ක්‍රමවේදයක් හදන්න ගිහිල්ලා දැන් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කාරණයත් මතක් කරමින් මම අද ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා, සමුපකාර ක්ෂේත්‍රය ගැන වෙනම හිතන්න කියලා. ඊළඟ අය වැය ලේඛනය මඟින් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සමුපකාර ක්ෂේත්‍රයෙන් ඉවත් කරන්න. මුළු සමුපකාර ව්‍යාපාරයටම මේ බදු පැනවීම කරන්නේ නැතුව එහි ප්‍රාදේශිකවලින් හෝ එම බද්ද ඉවත් කරලා එම වැඩ පිළිවෙළට සහයෝගය දෙන්න කියලායි මා ඉල්ලා සිටින්නේ. එසේ නොකළොත්, අනාගතයේ සමුපකාර ක්ෂේත්‍රය රැක ගන්න බැරි තැනකට තල්ලු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුර ලබා දීම, නියෝජ්‍ය අමාත්‍ය ගරු උපාලි සමරසිංහ මහතා.

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

අද දින ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපේත් අරමුණ තමයි, බිඳ වැටිච්ච සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීම සඳහා වැඩ කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව සොයා බැලීම. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. සමුපකාර ව්‍යාපාරය සඳහා ප්‍රධාන වශයෙන් බලපාන බදු වර්ග 2කි.

i. එකතු කළ අගය මත බද්ද - VAT

ii. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL

- සමුපකාර ව්‍යාපාරය ලාභය මූලික කර නොගත්, සාමාජිකයන්ගේ හා ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික හා සමාජ අවශ්‍යතා ඉටු කිරීම අරමුණු කරගත් ජනතා කේන්ද්‍රීය ව්‍යාපාරයකි.
- මෙලෙස බදු මුදලක් අය කිරීමට යාමෙන් සමස්ත ගනුදෙනු හා දෛනික පැවැත්ම අඩාල වන බවත්, එය සමිතිවල අඛණ්ඩ පැවැත්මට සෘජු තර්ජනයක් බවට පත් වී ඇති බව දන්වා සමුපකාර සමිති විසින් බදු සහනයක් ඉල්ලා ඇති අතර, ඒ පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී. කෙසේ වුවද, එකතු කළ අගය මත බද්ද -VAT- සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL - අදාළ වනුයේ කාර්තුවක පිරිවැටුම රුපියල් මිලියන 1.5ට වැඩි නම් පමණි.

02. තොග සහ සිල්ලර වෙළෙඳාම හා ඉන්ධන අළෙවිය සිදු කරන සියලු විවිධ සේවා සමුපකාර සමිති මේ යටතට අයත් වේ. සමුපකාර විෂය විමධ්‍යගත විෂයක් වන අතර, විවිධ සේවා සමුපකාර සමිති පිළිබඳ සංඛ්‍යාලේඛන පළාත් සමුපකාර දෙපාර්තමේන්තු මඟින් ලබා ගත යුතු වන බැවින් මේ පිළිබඳව නිශ්චිත තොරතුරු අද දින ලබා දීමට අපහසු වන අතර, අදාළ තොරතුරු ලබා ගැනීමෙන් පසුව ලබා දීමට හැකි ය.

03. ඔව්.

"දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේදී මෙන්ම ගංවතුර, නියං වැනි අවස්ථාවලදීත් විවිධ සේවා සමුපකාර සමිති හරහා ජනතාවට ප්‍රතිලාභ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

04. වර්තමානයේ රජය විසින් සමුපකාර ව්‍යාපාරය නැවත ශක්තිමත් කර නවීන හා ව්‍යාපාරික වශයෙන් ස්වයංපෝෂිත සමුපකාර පද්ධතියක් බවට පත් කිරීම සඳහා පියවර කිහිපයක් ගනිමින් සිටී.

2026 වර්ෂයට අදාළ රජයේ ප්‍රකාශිත සැලසුම් අනුව ප්‍රධාන පියවර මෙසේ දැක්විය හැකි ය.

1. සමුපකාර සමිති සඳහා නව සමුපකාර පනතක් සහ රීති මාලාවක් සකස් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී.
2. නිෂ්පාදන සමුපකාර සමිති 1,000ක් වසර 3ක් ඇතුළත ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර, 2026.08.31වන දිනට ලියාපදිංචි සමුපකාර සමිති 103ක් සහ ලියාපදිංචියට යෝජිත සමුපකාර සමිති 84ක් ඇත. 2027 වර්ෂය තුළදී ද මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

[ගරු උපාලි සමරසිංහ මහතා]

3. මේ වන විට නිෂ්පාදන සහ වෙනත් සමුපකාර සමිති සඳහා 2025 සහ 2026 වර්ෂවලදී මිලියන 200ක මුදලක් අය වැය ප්‍රතිපාදන මඟින් වෙන් කර තිබූ අතර ඒ අනුව සමිති සඳහා ට්‍රැක්ටර්, වී වියළන යන්ත්‍ර හා අනෙකුත් උපකරණ ලබා දීමට කටයුතු කර ඇත. 2027 වර්ෂය තුළදී ද රුපියල් මිලියන 100ක මුදලක් මේ සඳහා ලබා දීමට අපේක්ෂා කරයි.

4. 2026 අය වැය ප්‍රතිපාදන යටතේ වී වියළීමේ යන්ත්‍ර ලබා දීම සඳහා මිලියන 500ක මුදලක් වෙන් කර ඇති අතර, ඒ සඳහා සමුපකාර සමිතිවලට වී වියළන යන්ත්‍ර ලබා දීමට කටයුතු කරමින් පවතී.

5. සමුපකාර වෙළෙඳ ජාලය පුළුල් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් Mega Co-op City ජාලයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින Co-op City සහ Mini Co-op City ජාලය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

6. සමුපකාර සමිතිවල කාර්ය සාධනය හා යහ පාලනය වැඩි කිරීම සඳහා වන ජාතික මට්ටමේ කාර්ය සාධන තරගාවලියක් මේ වන විටත් ආරම්භ කර ඇත.

7. සමුපකාර සමිතිවල සාමාජිකයන් ඩිජිටල් ක්‍රමවේදය යටතේ ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම.

8. සමුපකාර අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය සඳහා පොල්ගොල්ල සමුපකාර ආයතනය විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට ඉදිරි සැලසුම් සකස් කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමුපකාර ව්‍යාපාරය පසුගිය දශකයක කාලය තුළදී කුමන තත්ත්වයකට පත් වෙලා තිබුණාද කියලා අපි හැමෝම දන්නවා. ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් එතුමන්ලා බලයේ සිටි කාලයේ එම ව්‍යාපාරය වෙනුවෙන් යම්කිසි සේවයක් කරන්න ඇති. අපි එය අගය කරනවා. නමුත්, වර්තමාන රජයේ අපි මේ සමුපකාර ව්‍යාපාරය නැවත පණ ගන්වා මේ රටේ මහ ජනතාවට වඩාත් හොඳින් සේවය සැපයිය හැකි ආයතනයක් බවට පත් කිරීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.00ට, 2026 සැප්තැම්බර් 24වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.00க்கு, பாராளுமன்றம் 2026 செப்ரெம்பர் 24, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.00 p.m. until 9.30 a.m. on Thursday, 24th September, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2329/2026 - පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා සතියක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பி. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2329/2026 - விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்கள் ஒரு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration, has requested for one week's time to reply to Question No. 01 - 2329/2026 - raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

## පාරම්පරික වෛද්‍යවරුන් සහ ලියාපදිංචි ආයුර්වේද උපාධිධාරී වෛද්‍යවරුන්: විස්තර
## பாரம்பரிய மருத்துவர்கள் மற்றும் பதிவுசெய்யப்பட்ட ஆயுர்வேத பட்டதாரி மருத்துவர்கள்: விபரம்
## TRADITIONAL MEDICAL PRACTITIONERS AND REGISTERED AYURVEDIC GRADUATE MEDICAL PRACTITIONERS: DETAILS

2330/2026

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பி. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට සිටින පාරම්පරික වෛද්‍යවරුන් සහ ලියාපදිංචි ආයුර්වේද උපාධිධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරයෙකු සහ පාරම්පරික වෛද්‍යවරයෙකු පුහුණු කිරීම සඳහා රජය විසින් දරනු ලබන වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වෛද්‍ය කාණ්ඩ දෙක ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රයට දක්වන දායකත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ තීන්දු සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අඩු නියෝජනයක් ලබාදී තිබීමට හේතු කවරේද;

(ii) පවතින නියෝජන ක්‍රමවේදය වෙනස් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையிலுள்ள பாரம்பரிய மருத்து வர்களினதும் பதிவுசெய்யப்பட்ட ஆயுர்வேத பட்டதாரி மருத்துவர்களினதும் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) ஆயுர்வேத பட்டதாரி மருத்துவர் ஒருவரையும் பாரம்பரிய மருத்துவர் ஒருவரையும் பயிற்றுவிப் பதற்காக அரசாங்கத்தினால் செய்யப் படுகின்ற செலவு வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி இருவகையான மருத்துவப் பிரிவுகளும் இலங்கையின் மருத்துவத்துறைக்கு ஆற்றுகின்ற பங்களிப்பு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஆயுர்வேத மருத்துவத்துறையில் தீர்மானங்கள் மற்றும் முடிவெடுக்கும் செயன்முறையில் பாரம் பரிய மருத்துவர்களுக்குக் குறைந்தளவான பிரதிநிதித்துவம் வழங்கப்பட்டு இருப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) தற்போது காணப்படுகின்ற பிரதிநிதித்துவ முறையை மாற்றுவதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) separately, the number of traditional medical practitioners and the registered graduate Ayurvedic medical practitioners in Sri Lanka at present;

(ii) separately, the expenditure borne by the Government to train a graduate Ayurvedic medical practitioner and a traditional medical practitioner; and

(iii) the contribution made by the said two categories of medical practitioners to the medical field of Sri Lanka?

(b) Will he also inform this House -

(i) the reasons for the lower representation afforded to traditional medical practitioners in the decision-making process of the Ayurvedic medical sector; and

(ii) whether steps will be taken to change the existing methodology of representation?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) පාරම්පරික වෛද්‍යවරුන් සංඛ්‍යාව 17,534යි.

ලියාපදිංචි ආයුර්වේද උපාධිධාරි වෛද්‍යවරුන් සංඛ්‍යාව 4,711යි.

(ii) **උපාධිධාරි ආයුර්වේද වෛද්‍යවරුන්**

රජයේ විශ්වවිද්‍යාලවල (උදා: කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය ආදී විශ්වවිද්‍යාලවල) ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් - BAMS - ලබා දීම සඳහා ශිෂ්‍යයකු වෙනුවෙන් රජය විසින් වාර්ෂිකව විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් (මහාචාර්ය වැටුප්, යටිතල පහසුකම්, රෝහල් පුහුණු වියදම් ආදී වශයෙන්) දරනු ලබයි.

2025/2026 වර්ෂයේ බඳවා ගත් උපාධිධාරි වෛද්‍යවරුන් 400 දෙනෙකු සඳහා සීමාවාසික පුහුණුව සඳහා වැය වූ මුදල රුපියල් 848,824.00යි.

**පාරම්පරික වෛද්‍යවරුන්**

පාරම්පරික වෛද්‍යවරුන් බිහිවීම පරම්පරාගතව හෝ ගුරු-ගෝල ක්‍රමයට හෝ පෞද්ගලිකව සිදුවන බැවින්, ඔවුන්ගේ පුහුණුව සඳහා රජය සෘජුව දරනු ලබන මූල්‍ය වියදමක් සාමාන්‍යයෙන් නොමැත. එහෙත් ඔවුන් ලියාපදිංචි කිරීම, ඇගයීම සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද දෙපාර්තමේන්තුව ආදී ආයතන යටතේ යම් පරිපාලනමය වියදම් දැරීම සිදු කරනු ලබයි.

| වර්ෂය | පුහුණුව ලත් වෛද්‍යවරුන් සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| 2023 | 384 | රු. 861,402.07 |
| 2024 | 426 | රු. 1,172,845.00 |
| 2025 | 351 | රු. 2,218,843.84 |
| 2026 | 111 | රු. 366,920.00 |

(iii) **උපාධිධාරි ආයුර්වේද වෛද්‍යවරුන්**

විද්‍යාත්මක හා ශාස්ත්‍රීය පදනමක පිහිටා රජයේ ආයුර්වේද රෝහල්, මධ්‍යස්ථාන සහ පර්යේෂණ ක්ෂේත්‍රය තුළ නවීන වෛද්‍ය ක්‍රමවේද සමඟ ද සම්බන්ධ වෙමින් පුළුල් සෞඛ්‍ය සේවාවක් සපයයි.

**පාරම්පරික වෛද්‍යවරුන්**

ග්‍රාමීය හා බිම් මට්ටමේ ජනතාවට ළඟා විය හැකි සේවාවක් සපයමින්, මෙරටට ආවේණික වූ සර්ප දෂ්ට වෛද්‍ය ක්‍රම, ඇස් වෙදකම, විදුම් පිලිස්සුම් වෙදකම, දැවුම් පිලිස්සුම් වෙදකම, ගෙඩිවණ වෙදකම, කැඩුම් බිඳුම් වෙදකම, ජලභීතිකා වෙදකම, මානසික රෝග, චර්ම රෝග වෙදකම ආදී පාරම්පරික පරම්පරාගත ප්‍රතිකාර සහ පරම්පරාගත විශේෂිත ක්‍රමවේද සුරක්ෂිත කරමින් දේශීය වෛද්‍ය වංශ කථාව හා සෞඛ්‍ය සේවය පෝෂණය කිරීමට දායක වේ.

(ආ) (i) 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අනුව සංශෝධනය වී ඇති 1961 අංක 31 දරන ආයුර්වේද පනත අනුව ආයුර්වේද වෛද්‍ය සභාව නියෝජනය කිරීමේදී පත් කරනු ලබන

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සාමාජිකයින් 27දෙනා අතුරින් නිල බලයෙන් පත්වන සාමාජිකයින් 11දෙනෙකු ආයතනික මට්ටමින් පත්වෙන අතර ගරු අමාත්‍යවරයා විසින් එක් එක් වගන්ති යටතේ 16දෙනෙකු පත් කරනු ලබයි. ආයුර්වේද පනත සහ ආයතනික ව්‍යුහයන් බොහෝ දුරට උපාධිධාරී වෛද්‍යවරුන් කේන්ද්‍ර කරගනිමින් සැකසී තිබීම සහ පාරම්පරික වෛද්‍යවරුන් ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදක කමිටු තුළ සංවිධානාත්මකව හා බලපෑමක් කළ හැකි අයුරින් නියෝජනය වීමට නිල යාන්ත්‍රණයක් ප්‍රමාණවත් නොමැතිවීම මීට හේතු වී ඇත. නමුත් මේ වනවිට ආයුර්වේද පනතේ සංශෝධන සඳහා කටයුතු සකස් කරමින් පවතින අතර එමඟින් පාරම්පරික වෛද්‍යවරුන් සඳහා ප්‍රමාණවත් නියෝජනයක් ලබා දීමට යෝජනා කරනු ලැබේ.

(ii) පාරම්පරික වෛද්‍යවරුන්ගේ සංගම් හරහා ඉදිරිපත් වන ඉල්ලීම් සලකා බැලීම, ආයුර්වේද පනතට අවශ්‍ය සංශෝධන යෝජනා කිරීම සහ ආයුර්වේද වෛද්‍ය සභාවේ හෝ අමාත්‍යාංශ උපදේශක කමිටුවල පාරම්පරික වෛද්‍ය නියෝජනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ඇ) පැන නොනඟී.

(அ) (i) பாரம்பரிய மருத்துவர்களின் எண்ணிக்கை 17,534

பதிவுசெய்த ஆயுர்வேத பட்டதாரி மருத்துவர் களின் எண்ணிக்கை 4,711

(ii) அரச பல்கலைக்கழகங்களில் (உதாரணம்: கொழும்புப் பல்கலைக்கழகத்தின் சுதேச மருத்துவ பீடம், கம்பஹா விக்கிரமாரச்சி ஆயுர்வேத பல்கலைக்கழகம், யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் சித்த மருத்துவ பீடம், கிழக்குப் பல்கலைக்கழகத்தின் சித்த மருத்துவ பீடம் போன்ற பல்கலைக்கழகங்களில்) ஆயுர்வேத மருத்துவ மற்றும் அறுவை சிகிச்சை பட்டத்தை - BAMS - வழங்குவதற்காக மாணவர் ஒருவருக்காக அரசாங்கத்தால் ஆண்டுதோறும் பாரிய நிதி ஒதுக்கீடு (பேராசிரியர் சம்பளம், உட்கட்டமைப்பு வசதிகள், வைத்தியசாலைப் பயிற்சிச் செலவுகள் போன்றவற்றுக்கு) செய்யப் படுகின்றது.

2025/2026 ஆம் ஆண்டில் இணைத்துக் கொள்ளப்பட்ட 400 பட்டதாரி மருத்துவர்களின் இடைநிலைப் பயிற்சிக்காகச் செலவிடப்பட்ட தொகை ரூ. 848,824.00 ஆகும்.

**பாரம்பரிய மருத்துவர்கள்:**

பாரம்பரிய மருத்துவர்கள் உருவாகுதல் பரம்பரை பரம்பரையாகவோ, குரு சீட முறை மூலமாகவோ அல்லது தனிப்பட்ட முறையிலோ இடம் பெறுவ தால் அவர்களது பயிற்சிக்காக அரசாங்கத் தினால் நேரடியாகச் செலவிடப்படும் நிதிச் செலவு எதுவும் பொதுவாகக் காணப் படுவதில்லை. இருப்பினும், அவர்களைப் பதிவு செய்தல், மதிப்பீடு செய்தல் மற்றும் தொழிற்றுறை அபிவிருத்தித் திட்டங்களுக்காக ஆயுர்வேத மருத்துவ பேரவை, ஆயுர்வேத திணைக்களம் போன்ற நிறுவனங்களின்கீழ் சில நிருவாகச் செலவுகள் மேற்கொள்ளப் படுகின்றன.

| ஆண்டு | பயிற்சி பெற்ற மருத்துவர்களின் எண்ணிக்கை | தொகை |
|---|---|---|
| 2023 | 384 | ரூ. 861,402.07 |
| 2024 | 426 | ரூ. 1,172,845.00 |
| 2025 | 351 | ரூ. 2,218,843.84 |
| 2026 | 111 | ரூ. 366,920.00 |

(iii) **பட்டதாரி ஆயுர்வேத மருத்துவர்கள்:**

விஞ்ஞான ரீதியிலும் கல்விசார் அடிப்படை யிலும் அமைந்த அரசாங்க ஆயுர்வேத வைத்திய சாலைகள், நிலையங்கள் மற்றும் ஆராய்ச்சித் துறையில் நவீன மருத்துவ முறைகளுடன் இணைந்து பரந்தளவிலான சுகாதார சேவையை வழங்குகின்றனர்.

**பாரம்பரிய மருத்துவர்கள்:**

கிராமப்புற மற்றும் வறிய (கீழ் மட்ட) மக்களால் எளிதில் அணுகக்கூடிய சேவையை வழங்கி, இந்நாட்டுக்கு உரித்தான பாம்புக்கடி மருத்துவம், கண் மருத்துவம், குத்தல் சுடுதல் மருத்துவம், தீக்காய மருத்துவம், கட்டி புண் மருத்துவம், எலும்பு முறிவு மருத்துவம், வெறிநாய்க்கடி மருத்துவம், மனநோய் மருத்துவம், தோல் நோய் மருத்துவம் போன்ற பாரம்பரிய பரம்பரைச் சிகிச்சைகள் மற்றும் பரம்பரை விசேட மருத்துவ முறைகளைப் பாதுகாத்து, சுதேச மருத்துவ வரலாறு மற்றும் சுகாதார சேவையை வளப்படுத்துவதற்குப் பங்காற்றுகின்றனர்.

(ஆ) (i) 2023ஆம் ஆண்டின் 19ஆம் இலக்க, ஆயுர்வேத (திருத்தம்) சட்டத்தின்மூலம் திருத்தப்பட்டுள்ள 1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேத சட்டத்தின்படி, ஆயுர்வேத மருத்துவ பேரவையில் பிரதிநிதித்துவப்படுத்துவதற்காக நியமிக்கப்படும் 27 உறுப்பினர்களில் பதவிவழி உறுப்பினர்களான 11 பேர் நிறுவன மட்டத்தில் நியமிக்கப்படுவதுடன், கௌரவ அமைச்சரினால் வெவ்வேறு பிரிவுகளின்கீழ் 16 பேர் நியமிக்கப்படுகின்றனர். ஆயுர்வேத சட்டமும் நிறுவனக் கட்டமைப்புகளும் பெரும்பாலும் பட்டதாரி மருத்துவர்களை மையமாகக்கொண்டு அமைக்கப்பட்டு இருக்கின்றமை மற்றும் பாரம்பரிய மருத்துவர்கள் தேசிய மட்டத்தில் கொள்கை வகுக்கும் குழுக்களில் ஒழுங்குமுறை யாகவும் செல்வாக்குச் செலுத்தக்கூடிய வகையிலும் பிரதிநிதித்துவப்படுத்தப்படுவ தற்குப் போதுமான உத்தியோகபூர்வ பொறிமுறை இல்லாமை ஆகியன இதற்குக் காரணங்களாகும். இருப்பினும், தற்போது ஆயுர்வேத சட்டத்தில் திருத்தங்களை மேற் கொள்வதற்கான நடவடிக்கைகள் தயாரிக்கப்

பட்டு வருவதுடன், அதன்மூலம் பாரம்பரிய மருத்துவர்களுக்குப் போதுமான பிரதிநிதித் துவத்தை வழங்குவதற்கும் முன்மொழியப் படுகின்றது.

(ii) பாரம்பரிய மருத்துவர் சங்கங்கள்மூலம் முன்வைக்கப்படும் கோரிக்கைகளைப் பரிசீலித்தல், ஆயுர்வேத சட்டத்துக்குத் தேவை யான திருத்தங்களை முன்மொழிதல் மற்றும் ஆயுர்வேத மருத்துவ பேரவையில் அல்லது அமைச்சு ஆலோசனைக் குழுக்களில் பாரம்பரிய மருத்துவப் பிரதிநிதித்துவத்தை உயர்த்துவதற் கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

(இ) பொருந்தவில்லை.

(a) (i) The number of traditional medical practitioners is 17,534.

The number of registered graduate Ayurvedic medical practitioners is 4,711.

(ii) **Graduate Ayurvedic Medical Practitioners**

The Government incurs a considerable annual financial cost per student to provide the Bachelor of Ayurvedic Medicine and Surgery - BAMS - degree through Government universities, such as the Faculty of Indigenous Medicine of the University of Colombo, Gampaha Wickramarachchi University of Indigenous Medicine, the Unit of Siddha Medicine of the University of Jaffna and the Faculty of Siddha Medicine of the Eastern University, and such expenditure includes the salaries of academic staff, infrastructure facilities and hospital-based clinical training costs as well. The cost incurred for the internship training of 400 medical graduates recruited in the year 2025/2026 was Rs. 848,824.00.

**Traditional Medical Practitioners**

Since traditional medical practitioners acquire their knowledge and skills through hereditary transmission, the “teacher-student system” or private training, the Government generally does not incur any direct financial expenditure on their trainings. However, certain administrative costs are incurred by institutions such as the Ayurvedic Medical Council and the Department of Ayurveda in relation to their registrations, evaluations and professional development programmes.

| Year | No. of trained Medical Practitioners | Cost |
|---|---|---|
| 2023 | 384 | Rs. 861,402.07 |
| 2024 | 426 | Rs. 1,172,845.00 |
| 2025 | 351 | Rs. 2,218,843.84 |
| 2026 | 111 | Rs. 366,920.00 |

(iii) **Graduate Ayurvedic Medical Practitioners**

Provide comprehensive health services based on scientific and academic foundation, integrating modern medical methodologies within government Ayurvedic hospitals, centres and in the field of researches.

**Traditional Medical Practitioners**

By providing accessible services to rural and grassroots level communities, they contribute to the preservation of the indigenous medical heritage and the strengthening of the healthcare system in the country by safeguarding traditional hereditary treatments and specialized practices unique to Sri Lanka, including traditional treatments for snakebites, eye diseases, fractures and dislocations, burns and scalds, tumours and wounds, rabies, mental health conditions and skin diseases.

(b) (i) Under the Ayurveda Act, No. 31 of 1961, as amended by the Ayurveda (Amendment) Act, No. 19 of 2023, 27 members are appointed to represent the Ayurvedic Medical Council, 11 members are appointed ex officio at the institutional level, while 16 members are appointed by the Hon. Minister under the respective provisions of the Act. This situation is attributable to the fact that the Ayurveda Act and the institutional structures have largely been designed with a focus on Graduate Medical Officers and that there is no adequate formal mechanism to ensure the organized and effective representation of traditional medical practitioners in national level policy-making committees. However, steps are currently being taken to make amendments to the Ayurveda Act, through which adequate representation is proposed to be provided for traditional medical practitioners.

(ii) Actions are being taken to consider requests submitted through associations of traditional medical practitioners, propose necessary amendments to the Ayurveda Act and enhance the representation of traditional medical practitioners in the Ayurvedic Medical Council and Ministry-level advisory committees.

(c) Does not arise.

## දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීම: විස්තර
## பாரம்பரிய சுதேச மருத்துவ முறைகள் பற்றிய அறிவைப் பெறுதல்: விபரம்
## ACQUISITION OF KNOWLEDGE OF INDIGENOUS TRADITIONAL MEDICAL SYSTEMS: DETAILS

2331/2026

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම ප්‍රභවය වන රටවල් කවරේද;

(ii) එම වෛද්‍ය ක්‍රම `දේශීය වෛද්‍ය ක්‍රම' ලෙස සලකනු ලබන පදනම කවරේද;

(iii) ශ්‍රී ලංකාවට ආවේණිකවූ දේශීය පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයක් පවතින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දේශීය පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා වන නීති කෙටුම්පත සැකසීමේ ක්‍රියාවලිය තුළ පාරම්පරික වෛද්‍යවරුන්ට ප්‍රමාණවත් අවස්ථාවක් ලබාදී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය සම්බන්ධ දැනුම ආයතනික ක්‍රමවේදයක් ඔස්සේ ලබා දීමේ හැකියාවක් තිබේද;

(iv) එසේ නම්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් එම පාරම්පරික දැනුම සම්පූර්ණයෙන්ම ලබා ගත හැකි වන්නේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා පවතින විකල්පය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆயுர்வேத, சித்த மற்றும் யுனானி மருத்துவ முறைகள் தோற்றம்பெற்ற நாடுகள் யாவை என்பதையும்;

(ii) மேற்படி மருத்துவ முறைகள் 'சுதேச மருத்துவ முறைகள்' எனக் கருதப்படுவதற்கான அடிப்படை யாது என்பதையும்;

(iii) இலங்கைக்கே உரித்தான பாரம்பரிய சுதேச மருத்துவ சாஸ்திர முறையொன்று உள்ளது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பாரம்பரிய சுதேச மருத்துவர்களைப் பதிவுசெய்வதற்கான சட்டவரைவு தயாரிப்புச் செயன்முறையில் பாரம்பரிய மருத்துவர்களுக்குப் போதுமானளவு வாய்ப்பு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இன்றேல், அது ஏன் என்பதையும்;

(iii) பாரம்பரிய சுதேச மருத்துவ முறை தொடர்பான அறிவை நிறுவனமயப்படுத்தப்பட்ட ஒரு பொறிமுறையினூடாகப் பெற்றுக்கொடுப்பதற்கான சாத்தியம் உள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், பல்கலைக்கழகக் கல்வியினூடாக மேற்படி பாரம்பரிய அறிவை முழுமையாகப் பெற்றுக்கொள்ள முடியுமா என்பதையும்;

(v) இன்றேல், அதற்கான மாற்றுவழி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the countries of origin of the Ayurveda, Siddha and Unani systems of medicine;

(ii) the basis on which the aforesaid systems of medicine are considered as "indigenous systems of medicine"; and

(iii) whether he accepts that there is an indigenous traditional medical science unique to Sri Lanka?

(b) Will he also inform this House -

(i) whether adequate opportunity has been given to traditional doctors in the process of drafting the law for the registration of indigenous traditional doctors;

(ii) if not, why;

(iii) whether there is a possibility of imparting knowledge related to indigenous traditional medical systems through an institutional mechanism;

(iv) if so, whether it is possible to fully acquire the aforesaid traditional knowledge through university education; and

(v) if not, the alternative available for the aforesaid purpose?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය

ප්‍රභවය වී ඇත්තේ ඉන්දියාවෙනි. (ප්‍රධාන වශයෙන් ඉන්දියානු උප මහද්වීපය තුළ මුල් බැසගත් වෛද්‍ය ක්‍රමයකි.)

**සිද්ධ වෛද්‍ය ක්‍රමය**

ප්‍රභවය වී ඇත්තේ දකුණු ඉන්දියාවේ (විශේෂයෙන් ද්‍රවිඩ සංස්කෘතිය සහ තමිල්නාඩු ප්‍රදේශය) ආශ්‍රිතවය.

**යුනානි වෛද්‍ය ක්‍රමය**

ප්‍රභවය වී ඇත්තේ ග්‍රීසියෙනි - Greek medicine - පසුව එය අරාබි සහ පර්සියානු සංස්කෘතීන් හරහා වර්ධනය විය.

(ii) මෙම වෛද්‍ය ක්‍රම ශ්‍රී ලංකාව තුළ සියවස් ගණනාවක සිට ජන සමාජයේ සංස්කෘතිය, ඇදහිලි සහ ජීවන රටාව සමඟ බද්ධ වී, මෙරට දේශීය වෛද්‍ය ක්‍රම පද්ධතියේ අනන්‍යතාවක් ගොඩ නඟාගෙන තිබීම මීට පදනම වේ.

එසේම 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ "ආයුර්වේදය" යන්නට "ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්මය ද වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමද" ඇතුළත් වේ. ඒ අනුව ආයුර්වේද පනත යටතේ ද මෙම ක්‍රම දේශීය වෛද්‍ය පද්ධතියේ කොටස් ලෙස පිළිගෙන ඇත.

(iii) ඔව්.

ශ්‍රී ලංකාවට ආවේණික වූ හෙළ වෙදකම හෙවත් දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් පවතී. එය ඉන්දීය ආයුර්වේදයෙන් යම් යම් ආභාස ලැබුවද, මෙරටටම විශේෂිත වූ ඖෂධ සංයෝග, ප්‍රතිකාර ක්‍රම (උදා: සර්ප දෂ්ට වෛද්‍ය ක්‍රම, ඇස් වෙදකම්, විදුම් පිලිස්සුම් වෙදකම, දැවුම් පිලිස්සුම් වෙදකම, ගෙඩිවණ වෙදකම, කැඩුම් බිඳුම් වෙදකම, ජලභීතිකා වෙදකම, මානසික රෝග, චර්ම රෝග වෙදකම ආදී පාරම්පරික පරම්පරාගත ක්‍රම) පවතී.

(ආ) (i) ආයුර්වේද පනත (1961 අංක 31 දරන ආයුර්වේද පනත සහ එහි සංශෝධන) යටතේ පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ක්‍රමවේද සකස් කර ඇත. නීතිපති උපදෙස් පරිදි රෙගුලාසි සකස් කර යොමු කර ඇතත් මෙම නීති සහ රෙගුලාසි සම්පාදනය කිරීමේදී සැබෑ බිම් මට්ටමේ පාරම්පරික වෛද්‍යවරුන්ගේ අදහස් සහ දායකත්වය ප්‍රමාණවත් පරිදි ලබාගෙන නොමැති බවට නිරීක්ෂණය වන බැවින් එය සමාලෝචනය කළ යුතුය.

(ii) නීති සම්පාදන ක්‍රියාවලිය බොහෝ දුරට ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් අතුරින් සිදු කර ඇති බැවින් පාරම්පරික වෛද්‍යවරුන්ගේ නියෝජනය ප්‍රමාණවත් නොමැති වීමත් කෘතහස්ත පාරම්පරික වෛද්‍යවරුන්ගේ අදහස් සලකා බැලීමක් සිදු නොවීම මීට හේතු වී ඇත.

(iii) ඔව්, පවතී. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් දේශීය පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම ආයතනික මට්ටමින් සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩ සටහන් පවත්වනු ලැබේ. එසේම රජයේ විශ්වවිද්‍යාල යටතේ ඇති දේශීය වෛද්‍ය විද්‍යාපීඨ (උදා: කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය) හරහා ද ආයතනික අධ්‍යාපනය ඇතැම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ලබා ගත හැකිය.

(iv) නැත.

විශ්වවිද්‍යාල සහ ආයතනික අධ්‍යාපනය මඟින් මූලිකව උගන්වනු ලබන්නේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවන්හි ශාස්ත්‍රීය පාඨමාලා වේ. ශ්‍රී ලංකාවට ආවේණික පාරම්පරික දේශීය වෙදකමේ පවතින පරම්පරාගත රහස්‍ය අත්දැකීම්, විශේෂිත පාරම්පරික අත් බෙහෙත් සහ ගුරුකුල ආශ්‍රිත ප්‍රායෝගික දැනුම - tacit knowledge - සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාල විෂයමාලා තුළින් පමණක් ලබා ගත නොහැක.

(v) නියම පරම්පරා ආරක්ෂා කර ගනිමින් පාරම්පරික පරම්පරාගත වෛද්‍යවරුන් යටතේ ගුරු-ගෝල ක්‍රමයට ප්‍රායෝගිකව හැදෑරීම සහ ආයුර්වේද පනතේ ප්‍රතිපාදන යටතේ පාරම්පරික වෛද්‍යවරුන් ලෙස සුදුසුකම් සපුරා ඇති පාරම්පරික අපේක්ෂකයින් පනතේ 55(1) වගන්තිය අනුව කාර්යක්ෂම ලෙස ආයුර්වේද වෛද්‍ය කර්මයෙහි යෙදීමට සුදුසු දැනුමක්, පළපුරුද්දක් හා දක්ෂකමක් අදාළ අයදුම්කරුට ඇති බවට සභාව සෑහීමකට පත්වීම නිර්ණය කිරීම සඳහා ලිඛිත හා වාචික පරීක්ෂණ පවත්වා ඉන් සමත් වන අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම විකල්පය වේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i) **ஆயுர்வேத மருத்துவ முறை**

இந்தியாவில் தோற்றம் பெற்றது. (முக்கியமாக இந்திய உப கண்டத்தில் வேரூன்றிய ஒரு மருத்துவ முறையாகும். )

**சித்த மருத்துவ முறை**

தென்னிந்தியாவில் (குறிப்பாக, தமிழ் கலாசாரம் மற்றும் தமிழ்நாடு பிரதேசத்தைச் சார்ந்து) தோற்றம் பெற்றது.

**யுனானி மருத்துவ முறை**

கிரேக்கத்தில் தோற்றம் பெற்றது. Greek medicine. பின்னர் அது அரபு மற்றும் பாரசீகக் கலாசாரங்கள் ஊடாக வளர்ச்சியடைந்தது.

(ii) இம்மருத்துவ முறைகள் இலங்கையில் பல நூற்றாண்டுகளாக மக்கள் சமூகத்தின் கலாசாரம், நம்பிக்கைகள் மற்றும் வாழ்க்கை முறையுடன் பிணைந்து, இந்நாட்டின் சுதேச மருத்துவ முறைமையின் தனித்துவத்தைக் கட்டியெழுப்பியுள்ளமை இதற்கான அடிப்படையாகும்.

அத்துடன், 2023ஆம் ஆண்டின் 19ஆம் இலக்க, ஆயுர்வேத (திருத்தம்) சட்டத்தினால் திருத்தப் பட்ட, 1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேத சட்டத்தில், “ஆயுர்வேதம்” என்பதில் “ஆயுர்வேத, சித்த, யுனானி மற்றும் சுதேச மருத்துவச் சிகிச்சைகளும் அறுவை சிகிச்சை களும் வேறு சில ஆசிய நாடுகளுக்கு உரிய மற்றும் அத்தொடர்புடைய நாடுகளின் அரசாங்

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

கங்களினால் ஏற்றுக்கொள்ளப்பட்ட வேறு சில மருத்துவச் சிகிச்சை முறைகளும்" உள்ளடங்குகின்றன. அதற்கமைய, ஆயுர்வேத சட்டத்தின் கீழும் இம்முறைகள் சுதேச மருத்துவ முறைமையின் அங்கங்களாக ஏற்றுக்கொள்ளப்பட்டுள்ளன.

(iii) ஆம். இலங்கைக்கு உரித்தான "ஹெள மருத்துவம்" - Hela medicine - அல்லது சுதேச பாரம்பரிய மருத்துவ முறைமை ஒன்று உள்ளது. அது இந்திய ஆயுர்வேதத்திலிருந்து சில தாக்கங்களைப் பெற்றிருந்தபோதிலும், இந்நாட்டுக்கே பிரத்தியேகமான ஔடதக் கலவைகள், சிகிச்சை முறைகள் (உதாரணம்: பாம்புக்கடி மருத்துவம், கண் மருத்துவம், குத்தல் சுடுதல் மருத்துவம், தீக்காய மருத்துவம், கட்டி புண் மருத்துவம், எலும்பு முறிவு மருத்துவம், வெறிநாய்க் கடி (விஷர்நாய்) மருத்துவம், மனநோய் மருத்துவம், தோல் நோய் மருத்துவம் போன்ற பாரம்பரிய பரம்பரை முறைகள்) காணப்படுகின்றன.

(ஆ) (i) ஆயுர்வேத சட்டத்தின்கீழ், (1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுர்வேத சட்டம் மற்றும் அதன் திருத்தங்கள்) பாரம்பரிய மருத்துவர்களைப் பதிவு செய்வதற்காக ஆயுர்வேத மருத்துவப் பேரவையால் நடைமுறைகள் தயாரிக்கப்பட்டுள்ளன. சட்டமா அதிபரின் ஆலோசனைக்கு அமைய ஒழுங்குவிதிகள் தயாரிக்கப்பட்டு அனுப்பப்பட்டுள்ள போதிலும், இச்சட்டங்களையும் ஒழுங்குவிதிகளையும் இயற்றும்போது, உண்மையான அடித்தள மட்டத்திலுள்ள பாரம்பரிய மருத்துவர்களின் கருத்துக்களும் பங்களிப்பும் போதுமான அளவில் பெறப்படவில்லை என அவதானிக்கப்படுவதால், அது மீண்டும் மறுபரிசீலனை செய்யப்பட வேண்டும்.

(ii) சட்டம் இயற்றும் செயன்முறையானது பெரும்பாலும் ஆயுர்வேத மருத்துவப் பேரவையின் உறுப்பினர்களுக்கு இடையே மேற்கொள்ளப்பட்டு உள்ளமையால், பாரம்பரிய மருத்துவர்களின் பிரதிநிதித்துவம் போதுமானதாக இல்லாமையும், அனுபவமிக்க பாரம்பரிய மருத்துவர்களின் கருத்துக்கள் பரிசீலிக்கப்படாமையும் இதற்குக் காரணமாக அமைந்துள்ளன.

(iii) ஆம். உள்ளது. சுதேச மருத்துவ முறைகள் பற்றிய தேசிய நிறுவனத்தினால் சுதேச பாரம்பரிய மருத்துவர்களின் அறிவை நிறுவன மட்டத்தில் அபிவிருத்தி செய்வதற்காகப் பயிற்சித் திட்டங்கள் நடாத்தப்படுகின்றன. அதேபோன்று, அரசாங்கப் பல்கலைக்கழகங்களின் கீழுள்ள சுதேச மருத்துவபீடங்கள் (உதாரணம்: கொழும்புப் பல்கலைக்கழகத்தின் சுதேச மருத்துவ பீடம், கம்பஹா விக்கிரமாரச்சி ஆயுர்வேத பல்கலைக்கழகம்) ஊடாகவும் குறிப்பிட்ட சில துறைகள் தொடர்பில் நிறுவன ரீதியான கல்வியைப் பெற்றுக்கொள்ள முடியும்.

(iv) இல்லை. பல்கலைக்கழக மற்றும் நிறுவன ரீதியான கல்வியின்மூலம் பிரதானமாகக் கற்பிக்கப்படுவன, ஆயுர்வேத, சித்த மற்றும் யுனானி மருத்துவக் கல்வியின் கல்விசார் பாடநெறிகளாகும். இலங்கைக்கு உரித்தான பாரம்பரிய சுதேச மருத்துவத்திலுள்ள பரம்பரை பரம்பரையான இரகசிய அனுபவங்கள், விசேட பாரம்பரிய கை வைத்தியங்கள் மற்றும் குருகுலம் சார்ந்த நடைமுறை அறிவு (Tacit knowledge) ஆகியவற்றை முழுமையாகப் பல்கலைக்கழகப் பாடத்திட்டங்கள் ஊடாக மாத்திரம் பெற்றுக்கொள்ள முடியாது.

(v) உண்மையான பாரம்பரியங்களைப் பாதுகாத்துக்கொண்டு, பாரம்பரிய பரம்பரை மருத்துவர்களின்கீழ், குரு - சீட முறையில் நடைமுறை ரீதியாகப் பயிலுதல் மற்றும் ஆயுர்வேத சட்டத்தின் ஏற்பாடுகளின்கீழ் பாரம்பரிய மருத்துவர்களாகத் தகைமை பூர்த்திசெய்துள்ள பாரம்பரிய விண்ணப்பதாரிகள் சட்டத்தின் 55(1) ஆம் பிரிவின் பிரகாரம், செயற்றிறனாக ஆயுர்வேத மருத்துவப் பயிற்சியில் ஈடுபடுவதற்குப் பொருத்தமான அறிவு, அனுபவம் மற்றும் திறமை சம்பந்தப்பட்ட விண்ணப்பதாரிக்கு உள்ளதெனப் பேரவை திருப்தியடைவதைத் தீர்மானிப்பதற்காக, எழுத்துமூல மற்றும் வாய்மொழிப் பரீட்சைகளை நடாத்தி, அவற்றில் சித்தியடையும் விண்ணப்பதாரிகளைப் பதிவு செய்வதற்கு நடவடிக்கை எடுத்தல் மாற்று வழியாகும்.

(இ) பொருந்தவில்லை.

(a) (i) **Ayurvedic system of medicine**

It originated in India and is a system of medicine that is primarily rooted in the Indian subcontinent.

**Siddha system of medicine**

It originated in South India, particularly within the Tamil cultural context and the Tamil Nadu region.

**Unani system of medicine**

It originated in Greece - Greek medicine - and was subsequently developed through Arab and Persian cultures.

(ii) These systems of medicine have been integrated into the culture, beliefs and way of life of Sri Lankan society for centuries, thereby contributing to the development of a distinct identity within the indigenous system of medicine in Sri Lanka.

Furthermore, under the Ayurveda Act, No. 31 of 1961, as amended by the Ayurveda (Amendment) Act, No. 19 of 2023, the term "Ayurveda" includes "the Ayurveda, Siddha, Unani and Deshiya Chikitsa systems of medicines and surgery and any other system of medical indigenous to Asian countries and recognized as such by the governments of such respective countries." Accordingly, these systems are also recognized under the Ayurveda Act as components of the indigenous system of medicine.

(iii) Yes.

In Sri Lanka, there is an indigenous system of traditional medicine known as Hela Vedakama, or Deshiya Chikitsa. Although it has been influenced to some extent by Indian Ayurveda, it encompasses medicinal formulations and treatment methods that are unique to Sri Lanka, including traditional hereditary practices for snakebites, eye diseases, fractures and dislocations, burns and scalds, tumours and wounds, rabies, mental health conditions and skin diseases.

(b) (i) Since mechanisms have been established by the Ayurvedic Medical Council for the registration of traditional medical practitioners under the Ayurveda Act, No. 31 of 1961 and its amendments, regulations have been drafted and referred in accordance with the advice of the Attorney-General. However, as it has been observed that the views and contributions of genuine grassroots-level traditional medical practitioners have not been adequately obtained in formulating these laws and regulations, the relevant mechanisms should be reviewed.

(ii) This situation has arisen because the legislative process was largely been carried out among the members of the Ayurvedic Medical Council, resulting in inadequate representation for traditional medical practitioners and a failure to consider the views of experienced traditional medical practitioners.

(iii) Yes. The National Institute of Indigenous Medicine conducts training programmes to develop the knowledge of indigenous traditional medical practitioners at an institutional level. In addition, institutional education in certain fields can be obtained through the faculties of indigenous medicine established under government universities such as the Faculty of Indigenous Medicine of the University of Colombo and the Gampaha Wickramarachchi Ayurveda University.

(iv) No.

University and institutional education primarily focuses on academic courses in Ayurvedic, Siddha and Unani medicine. However, the inherited and often closely guarded experiential knowledge of indigenous traditional medicine in Sri Lanka, including specialized traditional remedies and practical knowledge acquired through guru-kula traditions - tacit knowledge - cannot be fully acquired solely through university curricula.

(v) An alternative would be to provide practical training under the guidance of genuine hereditary traditional medical practitioners through the “teacher-student system” while preserving authentic lineages and to register applicants who qualify as traditional medical practitioners under the provisions of the Ayurveda Act after conducting written and oral examinations to determine whether the Council is satisfied that the respective applicant possesses the requisite knowledge, experience and skills to practise Ayurveda medicine effectively in accordance with Section 55(1) of the Act.

(c) Does not arise.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.